බලශක්ති අමාත්‍යාංශය
வலுசக்தி அமைச்சு
MINISTRY OF ENERGY

# ප්‍රගති වාර්තාව
# முன்னேற்ற அறிக்கை
# Progress Report 2024

# බලශක්ති අමාත්‍යාංශය
## ප්‍රගති වාර්තාව 2024
### (2024 වර්ෂයේ ප්‍රගතිය සහ 2025 වර්ෂය සඳහා වූ ඉදිරි සැලසුම්)


විදුලිබල අංශය

අංක 437, ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංකය - 011 2574922
ෆැක්ස් - 011 2574741
වෙබ් අඩවිය - www.powermin.gov.lk

බලශක්ති අංශය

අංක 80, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.
දුරකථන අංකය - 011 2370033
ෆැක්ස් - 011 2372115
වෙබ් අඩවිය - www.energymin.gov.lk

# අන්තර්ගතය

| | | පිටු අංකය |
|---|---|---|
| | ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය | VII |
| | ලේකම්තුමාගේ පණිවිඩය | IX |
| | හැඳින්වීම | X |
| පළමු පරිච්ඡේදය | **බලශක්ති අංශය** | |
| | අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර | 1 |
| | 1.1 බලශක්ති අමාත්‍යාංශයේ විෂයන් හා කාර්යයන් | 2 |
| | 1.2. බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ | 3 |
| | 1.3. බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ආයතන | 3 |
| | 1.4 2024 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය | 3 |
| | 1.5 2024 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය | 21 |
| | 1.6 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | 33 |
| දෙවන පරිච්ඡේදය | **ලංකා විදුලිබල මණ්ඩලය** | **34** |
| තෙවන පරිච්ඡේදය | **සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම** | **45** |
| හතරවන පරිච්ඡේදය | **ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය** | **49** |
| පස්වන පරිච්ඡේදය | **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව** | **62** |
| හයවන පරිච්ඡේදය | **ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය** | **67** |
| හත්වන පරිච්ඡේදය | **සී/ස ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම** | **77** |
| අටවන පරිච්ඡේදය | **ශ්‍රී ලංකා එනර්ජිස් පුද්ගලික සමාගම** | **79** |
| නවවන පරිච්ඡේදය | **සී/ස එල් ටී එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම** | **84** |
| දසවන පරිච්ඡේදය | **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව** | **99** |
| එකළොස්වන පරිච්ඡේදය | **ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම** | **107** |
| දොළොස්වන පරිච්ඡේදය | **ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය** | **111** |

# වගු නාමාවලිය

පිටු අංකය


| | | |
|---|---|---|
| වගුව 1.1 | 2024 ඔක්තෝම්බර් මස අවසාන වන විට පාරිභෝගික සංඛ්‍යාව | 4 |
| වගුව 1.2 | ස්ථාපිත ධාරිතාවය 2024 නොවැම්බර් මස දක්වා (මෙ.වො.) | 5 |
| වගුව 1.3 | ආසියා පැසිපික් කලාප බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රකාශිත මිල ගණන් | 22 |
| වගුව 1.4 | ඉන්ධන ආනයනය කිරීමේ දී දරන ලද පිරිවැයෙහි සාමාන්‍ය මාසික අගය 2024 | 23 |
| වගුව 1.5 | ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය - 2024 | 24 |
| වගුව 1.6 | ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය - 2024 | 24 |
| වගුව 1.7 | පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2024.12.31 දිනට | 26 |
| වගුව 1.8 | 2024 වර්ෂය තුල වාර්තා වූ උපරිම සහ අවම වෙළඳපොල මිල ගණන් | 27 |
| වගුව 1.9 | යෝජිත ගබඩා ටැංකි සංවර්ධන ව්‍යාපෘති | 31 |
| වගුව 1.10 | යෝජිත නල මාර්ග සංවර්ධන ව්‍යාපෘති | 32 |
| වගුව 1.11 | ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්හි මූල්‍ය ප්‍රගතිය බලශක්ති අමාත්‍යාංශය වැය ශීර්ෂය 119 | 33 |
| වගුව 2.1 | දැනට ක්‍රියාත්මක ජනන ව්‍යාපෘති වල ප්‍රගතිය | 36 |
| වගුව 2.2 | දැනට ක්‍රියාත්මක සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය | 37 |
| වගුව 2.3 | ටෙන්ඩර් කළ ව්‍යාපෘති | 37 |
| වගුව 2.4 | ජාල පෝෂක ගාස්තු ක්‍රමය යටතේ එන ව්‍යාපෘති. | 38 |
| වගුව 2.5 | දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය. | 39 |
| වගුව 2.6 | බෙදාහැරීම් සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය. | 41 |
| වගුව 2.7 | බෙදාහැරීම් හා ජනන ව්‍යාපෘති. | 42 |
| වගුව 2.8 | සම්ප්‍රේෂණ ව්‍යාපෘති. | 43 |
| වගුව 3.1 | පාරිභෝගික, සේවක සංඛ්‍යාව සහ මූල්‍ය දත්ත 2019 සිට 2024 දක්වා. | 47 |
| වගුව 4.1 | 2024 අගෝස්තු වන විට ක්‍රියාත්මක වෙමින් පවතින හෝ සැලසුම් කරන කර ඇති නමුත් තවමත් ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති පිළිබඳ විස්තර | 50 |
| වගුව 5.1 | නියාමන ක්‍රියාකාරකම්. | 63 |
| වගුව 5.2 | ජාතික පුහුණු පාඨමාලා. | 63 |
| වගුව 5.3 | රෙගුලාසි, රීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම. | 64 |
| වගුව 5.4 | අනාගත නියාමන ක්‍රියාකාරකම්. | 65 |
| වගුව 7.1 | 2024-2025 වාරය සඳහා ගල් අඟුරු සැපයුම් කාල සටහන. | 78 |
| වගුව 7.2 | 2024-2025 වාරය සඳහා අරමුදල් අවශ්‍යතාවය. | 78 |
| වගුව 7.3 | 2024-2025 වාරය සඳහා ගෙවීම් ක්‍රමයේ සාරාංශය | 78 |
| වගුව 9.1 | ප්‍රධාන මෙහෙයුම්වල මූල්‍ය ප්‍රගතිය. | 97 |
| වගුව 10.1 | ඛණිජතෙල් නිෂ්පාදන ආනයන තොරතුරු (2021-2024) | 99 |
| වගුව 10.2 | පිරිපහදුවේ නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) (2021-2024) | 101 |
| වගුව 10.3 | ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදනය 2024. | 101 |
| වගුව 10.4 | සමස්ථ ඉන්ධන අලෙවි කිරීම (2021-2024) | 102 |
| වගුව 10.5 | විදුලි ජනනයට ඉන්ධන අලෙවිය (2021-2024) | 103 |
| වගුව 10.6 | ගුවන්යානා ඉන්ධන අලෙවිය (2021-2024) | 103 |
| වගුව 10.7 | ලිහිසිතෙල් අලෙවිය (2021-2024) | 104 |
| වගුව 11.1 | සමස්ථ ඉන්ධන ගබඩා ධාරිතාවය. | 107 |
| වගුව 11.2 | ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය. | 108 |

# ප්‍රස්තාර / සිතියම්


| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්තාරය 1.1 | ශුද්ධ විදුලි ජනනය 2024 නොවැම්බර් දක්වා | 5 |
| ප්‍රස්තාරය 1.2 | 2024 වර්ෂය තුළ වාර්තා වූ වෙළඳපොළ මිල ගණන් | 27 |
| ප්‍රස්තාරය 4.1 | පුනර්ජනනීය බලශක්ති සඳහා සමුච්චිත ධාරිතා එකතු කිරීම | 49 |
| ප්‍රස්තාරය 10.1 | පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය 2021-2024 | 100 |
| ප්‍රස්තාරය 10.2 | ගුවන් යානා ඉන්ධන අලෙවි කිරීම 2021-2024 | 104 |
| ප්‍රස්තාරය 11.1 | ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය 2024 | 109 |
| සිතියම 1.1 | ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණයේ සිතියම | 30 |
| සිතියම 12.1 | ඛනිජ සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම | 113 |



# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය

බලශක්ති අමාත්‍යවරයා ලෙස 2024 වර්ෂයේ ප්‍රගතිය මෙන්ම 2025 ඉදිරි වැඩසටහන් සහ අපේක්ෂිත වැඩපිළිවෙළ ඇතුළත් මෙම වාර්තාව වෙනුවෙන් පණිවිඩයක් නිකුත් කරන්නේ සතුටිනි.

ගෙවී ගිය වසර - ඉතා දිගුකාලයක් මේ රට අපේක්ෂා කළ දේශපාලන පරිවර්තනයක් සිදු කෙරුණු වසරයි. මෙම දේශපාලන පරිවර්තනය සඳහා දායක වුණු හා එක් රැස් වුණු ප්‍රගතිශීලි බලවේග අතර සාකච්ඡා කෙරුණු කාරණා අතර රටේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධ කථිකාවතක්ද විය. රටේ බලශක්ති ක්ෂේත්‍රයේ හිමිකාරිත්වය හා අධිකාරිත්වය රජයට අයත් විය යුතුය යන මතය හා ජාතික ආරක්ෂාවත් රටේ ස්වෛරීත්වයත් එහි ඇති අනභිභවනීය වැදගත්කමත් වෙනුවෙන් එම පාර්ශවය පෙනී සිටියයේය. අනෙක් පාර්ශවය වසර ගණනාවක් පුරා රටට නුසුදුසු ප්‍රතිපත්ති හා ක්‍රමවේද අනුගමනය කරමින් බලශක්ති ක්ෂේත්‍රයේද දූෂණයට ඉඩ තබමින් හා බලශක්ති ක්ෂේත්‍රය පෞද්ගලීකරණය කරමින්, එම ක්‍රමවේද තුළ ද අයුතු වාසි ලබා ගැනීමෙන් රටේ ආරක්ෂාව සහ ස්වෛරීත්වය අනතුරට හෙලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමත් වෙනුවෙන් පෙනී සිටියේය. එම බලවේග සහ මතවාද පරාජය කරමින් ජනාධිපති අනුර කුමාර දිසානායක ප්‍රමුඛ ජාතික ජන බලවේගය 2024 දී ලද ජයග්‍රහනය රටේ බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලද තීරණාත්මක ජයග්‍රහණයකි.

රටේ ස්වෛරීත්වය හා ජාතික ආරක්ෂාව සුරකෙන පරිදි බලශක්ති ක්ෂේත්‍රයේ හිමිකාරිත්වය තහවුරු කෙරෙන, එහෙත් යල්පැනගිය ක්‍රමවේද හා ආයතනික සැකැස්ම වෙනුවට නව ආයතන සැකැස්මක් සහිත ලොව පිළිගත් නවීන ක්‍රමවේද සහ විශේෂයෙන්ම විනිවිද භාවයෙන් යුත් දියුණු වැඩපිළිවෙලක් සහිත බලශක්ති ක්ෂේත්‍රයක් රටට බිහිකර දීමට මේ සුවිශේෂි ජයග්‍රහණය විසින් ඉඩ කඩ ලබා දී තිබේ.

ජාතික ජනබලවේග නව රජයේ බලශක්ති අමාත්‍යවරයා ලෙස එම ඓතිහාසික කාර්යභාරය ඉටු කිරීමේ වගකිම මා හට පැවරී තිබේ. විදුලි හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරුවරයෙකු වශයෙන් වසර 30කට ආසන්න කාලයක් ලබා ඇති අත්දැකීම් මෙන්ම ප්‍රගතිශීලි දේශපාලනයේ අත්දැකීම් ගුරුකොට ගනිමින්ද රජයේ බලශක්ති ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී මූලිකත්වය ගෙන කටයුතු කිරීමෙන් ලද පරිචය භාවිතා කර ගනිමින් ද මාගේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල ඉහළ නිලතල වලට ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික උගත්කමක් හා අත්දැකීම් සහිත ජාතික කර්තව්‍යකට උරදීමේ සැබෑ උවමනාව සහ උද්‍යෝගය සහිත විද්වතුන් පත් කරමින් එහි පළමු පියවර තැබූ අතර ඉදිරි වසර කිහිපය පමණක් නොව දශක කිහිපයක අනාගතයද සැලකිල්ලට ගනිමින් ඒ සඳහා වන මූලික සැලැස්ම හා වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

විශේෂයෙන්ම විදුලිබල ක්ෂේත්‍රයේ උගතුන් හා ඉංජිනේරුවන් රට හැර යාමේ තත්ත්වය තුළ මතු වුණ පුරප්පාඩු පියවීමට සුදුසු ඉක්මන් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. දැනට සිටින විවිධ ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම සහිත පුද්ගලයන්ට නිසි පිළිගැනීමක් හා ගෞරවයක් ලබා දී තනතුරුවල රඳවා තබා ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් හඳුනාගත් සැලැස්මකට අනුව ගල් අඟුරු හා පොසිල ඉන්ධන භාවිතය අවම කරමින් විශේෂයෙන්ම සූර්ය බලය, සුළං බලය, මුහුදු රළ ආශ්‍රිත පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදන ආදී පුනර්ජනනීය බලශක්ති උත්පාදනය ඉහළ නැංවීම සඳහා කටයුතු කෙරේ. මේ සඳහා ඒ ඒ ක්ෂේත්‍ර වල නවීන තාක්ෂණ දැනුම හා අවශ්‍ය ආයෝජන, සෘජු විදේශ ආයෝජන හරහා ලබා ගැනීම හා පිළිගත් විනිවිදභාවය සහිත ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ද ආරම්භ කර ඇත.

අවසන් වශයෙන් රටේ බලශක්ති ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා සැකසෙන වැඩපිළිවෙල හා එක්වන ලෙස ඔබ සියළු දෙනාටම ආරාධනා කරමි.

**ඉංජිනේරු කුමාර ජයකොඩි**
බලශක්ති අමාත්‍ය



# ගරු ලේකම්තුමාගේ පණිවිඩය

බලශක්ති අමාත්‍යාංශය යටතේ 2024 වසරේදී සිදු කරනු ලැබූ කැපී පෙනෙන සංවර්ධන කටයුතු පිළිබඳවත්, 2025 වසර සඳහා වූ සැලසුම් පිළිබඳවත් ගෙනහැර දක්වන "ප්‍රගති වාර්තාව 2024" සඳහා මෙසේ පණිවිඩයක් එක් කරණු ලබන්නේ මහත් සතුටිනි. මෙය එළිදැක්වෙන්නේ 2025 වසර සඳහා අයවැය විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම සිදුවන තීරණාත්මක මොහොතක ය.

වත්මන් රජය පිහිටුවීමත් සමග එතෙක් පැවැති විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, "බලශක්ති අමාත්‍යාංශය, වශයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කෙරිණි. මෙම නවමු රාමුව යටතේ, "ජාතික පුනරුදය - ජනතා කේන්ද්‍රය බලශක්ති සංක්‍රාන්තියක්, යන මැයෙන් එළිදක්වන ලද රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රධාන ඉලක්ක පනහක් සාක්ෂාත් කරගැනීම සඳහා අප ඇපකැප වී කටයුතු කරන්නෙමු. ඉදිරි වසර පහ තුළ කලාපයේ බලශක්ති පිරිවැය අඩුම මට්ටම කරා රට ගෙන යාමේ පරම අරමුණෙන් යුතුව, බලශක්ති ක්ෂේත්‍රය පරිවර්තනයට ලක්කිරීම කෙරෙහි අපගේ අවධානය යොමු වී ඇති අතර, එම ඉලක්කය සාක්ෂාත් කරගැනීම අපගේ අධිෂ්ඨානය බවට පත් වී ඇත.

මෙම ඉලක්ක සපුරා ගැනීම වළක්වාලමින් මතුවන කුමන හෝ බාධාවකදී ඊට අනුකූලව අලුතින් පනවන ලද 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීමට අවශ්‍යවේ යැයි අපි අපේක්ෂා කරමු. මීට අමතරව, ගැඹුරු අධ්‍යයනයක් සිදුකරමින් සහ වත්මන් පනතට අවශ්‍ය වෙනස්කම් සිදුකරමින් ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම, මෙහෙයවීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන්නෙමු.

විදුලිබලය උත්පාදනය කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පුළුල් කිරීම සම්බන්ධයෙන් රජයේ මූලික අවධානය යොමු වී ඇත. වර්තමානයේ අපගේ පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගාවොට් 3,815 ක් පමණ පවතින අතර, වසර 2030 වන විට මෙය මෙගාවොට් 6,790 දක්වා ඉහළ නැංවීම අපගේ අපේක්ෂාවයි. වසර 2025 වන විට මුළු විදුලි ඉල්ලුම ඒකක බිලියන 17.5 දක්වා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, ඒ අතරින් ඒකක බිලියන 14.5 ක් පුනර්ජනනීය බලශක්තියෙන් (ප්‍රධාන ජල විදුලි බලාගාර ඇතුළුව) සපුරා ගැනීම සිදු කෙරෙනු ඇත. ඉල්ලුමෙහි ඉතිරිය ගල් අඟුරු සහ තාප බලාගාර මගින් සපුරාගැනීමට අපේක්ෂිතය.

ඛනිජ තෙල් කර්මාන්තය සඳහා විධිමත් නියාමන රාමුවක් ස්ථාපිත කිරීම සහ රට තුළ ඉන්ධන සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට මූලික පියවර ගෙන ඇත. ඊට අමතරව, සාධාරණ මිලක් ලබා දීමත් මහජනතාවට උපරිම ප්‍රතිලාභ අත් කර දීමත් අරමුණු කර ගනිමින් ඉන්ධන සඳහා පිරිවැය පාදක මිල සූත්‍රයක් හඳුන්වා දීමට කටයුතු කර ඇත.

2024 වසර තුළ විදුලිබල හා බලශක්ති යන අංශ දෙකම වැදගත් ජයග්‍රහණ අත් කරගැනීමට සමත්ව ඇත. වසර පුරාවට සුරක්ෂිත සහ විශ්වසනීය අන්දමේ ඉන්ධන සැපයුමක් සහ අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා දැරූ ප්‍රයත්නයන් මෙම සාර්ථකත්වය කෙරෙහි බොහෝ සෙයින් ඉවහල් වී ඇත.

මෙම ජයග්‍රහණ වෙනුවෙන් ගරු අමාත්‍යතුමාට, අමාත්‍යාංශයේ සෑම මට්ටමකින් ම කැපවූ නිලධාරීන්ට සහ අපගේ විෂය පථය යටතේ ඇති විවිධ ආයතනවලට ඔවුන්ගේ මග පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පළ කිරීමට කැමැත්තෙමි.

රටේ සුභසිද්ධිය වෙනුවෙන් බලශක්ති ක්ෂේත්‍රයෙහි ප්‍රගතිය පෙරටු කරගනිමින්, අපගේ පාර්ශ්වකරුවන්ගේ අඛණ්ඩ සහයෝගය ද ඇතිව යෝජිත නව මූලාරම්භයන් 2025 වසරේදී මෙන්ම ඉන් ඔබ්බට ද සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අපට හැකි වනු ඇති බව මාගේ විශ්වාසයයි.

**මහාචාර්ය කේ.ටී.එම්. උදයංග හේමපාල**
ලේකම්
බලශක්ති අමාත්‍යාංශය

# හැඳින්වීම

2022 ජූලි 22 දිනැති අංක 2289/43 දරන ගැසට් පත්‍රයට අනුව 2024 නොවැම්බර් මාසය දක්වා මෙම අමාත්‍යාංශය ක්‍රියාත්මක වූයේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය ලෙසයි. විදුලිබල හා ඛනිජ තෙල් යන ක්ෂේත්‍රවලට අදාළ ජාතික ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම සහ අදාළ සියලු ක්‍රියාකාරකම් එක් ඒකාබද්ධ රාමුවක් යටතට ගෙන ඒමේ මූලික අරමුණ ඇතිව, 2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් පත්‍රය යටතේ "බලශක්ති විෂයභාර අමාත්‍යාංශය" ලෙස වැඩිදුරටත් නිල වශයෙන් නම් කරන ලදී. මෙම සංක්‍රාන්තිය විදුලිබල හා බලශක්ති අංශ පරිවර්තනයට ලක් කිරීම අරමුණු කරගත් ප්‍රයත්නයන් අඛණ්ඩව සිදුකිරීම හා පුළුල් කිරීම සහතික කරමින්, නව රජයේ දැක්ම සමඟ සමගාමීව ක්‍රියාත්මක වේ.

වර්තමානයේ, විදුලිබල අංශය යටතේ ආයතන අටක් එනම්, ලංකා විදුලිබල මණ්ඩලය (CEB), ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO), ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA), ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය (SLAEB), ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC), එල්.ටී.එල්. හෝල්ඩින්ග්ස් සමාගම, ලංකා ගල් අඟුරු පුද්ගලික සමාගම හා ශ්‍රී ලංකා එනර්ජීස් පුද්ගලික සමාගම යන ආයතන ක්‍රියාත්මක වේ. ඊට අමතරව, බලශක්ති අංශය යටතට ප්‍රධාන ආයතන හතරක්, එනම්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC), ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL), ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) සහ ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත පුද්ගලික සමාගම (TPTL) යන ආයතන අයත් වේ. ඛනිජ තෙල් අංශය විසින් කළමනාකරණය කරනු ලබන ඉහත ආයතන අතරින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය විසින් පෙරභාග මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය කරනු ලබන අතර සෙසු ආයතන විසින් පසුභාග මෙහෙයුම් කටයුතු කෙරෙහි අවධානය යොමුකරමින් කටයුතු කරනු ලබයි.

2023 වසරේ දී, බලශක්ති ක්ෂේත්‍රයේ දිගුකාලීන ගැටළු විසඳීම සඳහා නොයෙකුත් උපායමාර්ගික තීරණ ගැනීම සිදු කරන ලද අතර, 2024 වසරේ දී මෙම ගැටලුවලට විසඳුම් ලබාදීමේ ප්‍රයත්නයන් තවදුරටත් කඩිනම් කරන ලදී. අමාත්‍යාංශයේ මෙහෙවරට අනුකූලව, බලශක්තිය සඳහා වූ ප්‍රවේශය ඉහළ නංවමින් සහ පරිසරය ආරක්ෂා කරමින් විශ්වසනීය, තිරසාර සහ දැරිය හැකි මිලකට විදුලිය සැපයීම සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කෙරිණි.

රටේ විදුලිබල සැපයුම් අංශයේ කඩයිම් සලකුණක් බවට පත්වෙමින් 2024 අංක 36 දරන විදුලිබල පනත (විදුලිබල ක්ෂේත්‍ර ප්‍රතිසංස්කරණ) බලාත්මක වීම ප්‍රධාන ජයග්‍රහණයක් බවට පත් වූ අතර, ඉන් විදුලිබල අංශයෙහි ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසිණි. ප්‍රතිපත්තිමය මඟපෙන්වීමක් නොමැතිකම නිසා මින් පෙර මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට බාධා එල්ල වී තිබූ අතර **"තොග වෙළඳපොළ"** සහ **"විවෘත ප්‍රවේශය"** වැනි නවීන මෙහෙයුම් සංකල්ප පවා මෙම ප්‍රතිසංස්කරණය යටතේ හඳුන්වා දී ඇත. නියාමනය කරන ලද සහ අන්තර් සම්බන්ධිත ව්‍යුහයකින් සැදුම්ලත් විශේෂඥ සමාගම් සමූහයක් ලෙස විදුලිබල අංශය ක්‍රියාත්මක වීමට නියමිතය.

රජයේ මූලික අවධානය යොමු වී ඇත්තේ විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පුළුල් කිරීම කෙරෙහි ය. වර්තමානයේ අපගේ පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගාවොට් 3,815ක් ලෙස පවතින අතර, වසර 2030 වන විට මෙය මෙගාවොට් 6,790 දක්වා ඉහළ නැංවීම අමාත්‍යාංශයේ අපේක්ෂාව වන්නේ ය. මෙම සංක්‍රාන්තිය සඳහා පහසුකම් සැලසීම පිණිස පුළුල් රාමුවක් සංවර්ධනය කරමින්, වසර 2030 වන විට රටේ විදුලි ඉල්ලුමෙන් 70% ක් පුනර්ජනනීය බලශක්තිය හරහා උත්පාදනය කිරීමේ ප්‍රයත්නයන් සවිබල ගැන්වීමට කටයුතු කර ඇත. එම ප්‍රධාන පියවරයන් අතරට ඇතුළත් වන්නේ:

- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් පහසුකම් සපයනු ලබන, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය විධිමත් කිරීම සඳහා වන සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ආකෘතියක් ස්ථාපිත කිරීම.

- අවම පිරිවැයකින් යුතු බලශක්ති විසඳුම් සඳහා ආයෝජන-හිතකාමී අවශෝෂණ ගාස්තු (feed-in tariffs) සහ සූර්ය පියැසි පද්ධති සඳහා වන ගාස්තු (solar rooftop tariffs) සකස් කිරීම.

- විනිවිදභාවය සහතික කිරීම සහ තරගකාරිත්වය වර්ධනය කිරීම සඳහා ගතික පුනර්ජනනීය බලශක්ති ටෙන්ඩර් ආකෘතියක් සංවර්ධනය කිරීම.

- ලෝක බැංකුව, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වැනි ජාත්‍යන්තර සංවර්ධන ආයතනවල සහාය ඇතිව, මනා ව්‍යුහගත ආයෝජන ආකෘතියක් හරහා පුනර්ජනනීය බලශක්ති ආයෝජනවල අවදානම් අවම කිරීම.

- ලෝක බැංකුවේ විශේෂඥ දායකත්වයන් සමඟින් නව විදුලිබල පනත මගින් නියම කර ඇති පරිදි ඒකාබද්ධ ඉහළ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම උදෙසා පුනර්ජනනීය බලශක්තිය අත්පත් කර ගැනීම සඳහා වූ තරගකාරී සහ විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ආකෘතියක් සංවර්ධනය කිරීමට මූලික ක්‍රියාමාර්ග ගැනීම.

කලාපීය වශයෙන් සංවර්ධනය වන විදුලි ජාලයට ශ්‍රී ලංකාව සම්බන්ධ කිරීම සඳහා පවතින එකම ප්‍රවේශ ස්ථානය වන දකුණු ඉන්දියාවට දිවයිනේ විදුලිබල ජාලය සම්බන්ධ කිරීම පිණිස අවශ්‍ය කෙරෙන ස්ථාවර හා ක්‍රියාකාරී පියවර ගෙන ඇත. මෙම අන්තර් සම්බන්ධතාවය මගින් ශ්‍රී ලංකාවට තරගකාරී කලාපීය මිල ගණන් යටතේ බලශක්තිය, විදුලිය සහ ජාල සේවාවන් වෙත ප්‍රවේශ වීමට ඉඩ සැලසෙනු ඇත.

ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලැබ අක්වෙරළ සුළං බලශක්තිය හා සම්බන්ධ මෑත කාලීන අධ්‍යයනයක් මගින් පෙන්වා දී ඇත්තේ ආසියාව තුළ නැගී එන ප්‍රධාන බලශක්ති අපනයනකරුවෙකු බවට පත්වීමේ ඉහළ විභවයක් ශ්‍රී ලංකාව සතුව පවතින බවයි. ඊට සමගාමීව, ජාත්‍යන්තර විදුලිය අපනයන අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති සම්පත් උපයෝගී කර ගැනීම අරමුණු කරගත් හරිත හයිඩ්‍රජන් මාර්ග සිතියමක් සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී. දිනකට බැරල් 100,000ක (bpd) අවම ධාරිතාවක් සහිතව හම්බන්තොට ප්‍රදේශයේ අපනයනය අරමුණු කරගත් ඛනිජ තෙල් පිරිපහදුවක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී. යෝජිත කොන්දේසි බොහොමයක් සම්බන්ධයෙන් දෙපාර්ශ්වයම අන්‍යෝන්‍ය එකඟතාවයකට පැමිණීමත් සමඟ ව්‍යාපෘති ගිවිසුම සඳහා වූ සම්මුති සාකච්ඡා සිදුවෙමින් පවතී.

මේ වනවිට රෙගුලාසි සංවර්ධනය කෙරෙමින් පවතින බලශක්ති බලවහනය සංකල්පය (power wheeling concept) හඳුන්වාදීම ඉදිරියේදී සිදු කිරීමට නියමිතය. විදුලිබල පද්ධතියේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ විශේෂයෙන් ම විචල්‍ය ස්වභාවයෙන් යුක්ත පුනර්ජනනීය බලශක්තිය විදුලි පද්ධතියට එක්කිරීම වැඩි වශයෙන් සිදුවන විට පද්ධතියේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් බැටරි බලශක්ති ගබඩා පද්ධති ක්‍රියාත්මක කිරීමේ උත්සාහයන්හි නිරත වෙමින් පවතී. වසර 2024 දී, ජාතික විදුලි පද්ධතියට එක්කරන ලද පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගාවොට් 630කි.

2024 අප්‍රේල් මාසයේදී මෙගාවොට් 120ක උමා ඔය ව්‍යාපෘතිය නිම කිරීම, 2024 අගෝස්තු මාසයේදී මෙගාවොට් 350 කෙරවලපිටිය ස්වභාවික ද්‍රව වායු (LNG) විදුලි බලාගාරයෙහි විවෘත චක්‍රීය ජනන යන්ත්‍රය මෙහෙවරෙහි යෙදවීම සහ 2025 වසරේ පළමු කාර්තුව වන විට එහි ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරයේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම මෙන්ම පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘතින් ආරම්භ කිරීම ආදී ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනයන් මඟින් ස්ථාපිත ධාරිතාව ඉහළ නැංවීමට උපකාරී විය. මීට අමතරව, ඉන්දීය රජය සමඟ සහයෝගීත්වයෙන් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබා ඇත.

පසුගිය 2024 වසර තුළ, රටේ බලශක්ති සුරක්ෂිතභාවය ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය විසින් සැලකිය යුතු පියවර ගෙන තිබෙන අතර, මෙම ප්‍රයත්නයන් පිළිබඳව මෙම වාර්තාවේ අදාළ පරිච්ඡේදවල විස්තරාත්මකව දක්වා ඇත.

විදුලිබල උත්පාදනය, ප්‍රවාහනය සහ කර්මාන්ත වැනි ප්‍රධාන අංශවල සහාය සඳහා විශ්වාසනීය ඉන්ධන සැපයුමක් ලබාදීම සහතික කරමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිය අතිශය වැදගත් කාර්යභාරය සාර්ථකව ඉටු කිරීමට සමත්ව ඇත. 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත යටතේ බලය පවරන ලද මෙම සංස්ථාව, දිවයින පුරා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, අපනයනය, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, සැපයීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම ඇතුළු ඛනිජ තෙල් මෙහෙයුම්වල සියලු අංශවල වගකීම දරනු ලබයි. මීට අමතරව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් ටැංකි 99 කින් සමන්විත ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ පිහිටි ටැංකි 12 ක් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් දියත් කර ඇති අතර, එහි කටයුතු දැනට සිදුවෙමින් පවතී. ඒ හා සමානව, ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් සමාගම (TPTL) විසින් එම සංකීර්ණයේම තෙල් ටැංකි 61 ක් සංවර්ධනය කිරීමේ පළමු අදියර ආරම්භ කර ඇත.

ඛනිජ තෙල් බෙදාහැරීම පුළුල් කිරීමේ උත්සාහයක් ලෙස, ඉන්ධන ආනයනය සහ බෙදාහැරීම සඳහා දායකත්වය ලබාදෙමින් සිනොපෙක්, ආර්.එම්. පාර්ක් සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් යන විදේශීය සමාගම් ත්‍රිත්වය ශ්‍රී ලංකා වෙළඳපොළට ඇතුළත් වී සිටියි. තවද, එළැඹෙන වසරේදී බලාත්මක කිරීමට කටයුතු සැලසුම් කරමින් ඛනිජ තෙල් අංශය සඳහා වූ නියාමන ආයතනයක් පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කිරීම සිදුකර ඇත.

2003 දී පිහිටුවන ලද ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ලංකා ඉන්දියානු තෙල් සමාගම සමඟ හවුල්කාරිත්වයෙන් යුතුව, ශ්‍රී ලංකාව පුරා ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම සඳහා පහසුකම් සලසමින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පසුගිය වසර තුළ, සමාගම විසින් ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීමට සහාය වන නළ මාර්ග පද්ධති සහ ඉන්ධන ගබඩා ටැංකි ඇතුළු අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඉදිරි වසර තුළ ද මෙම යටිතල පහසුකම් සංවර්ධනය අඛණ්ඩව සිදු කරගෙන යාමට සැලසුම් කර ඇත.

2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත යටතේ ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය (PDASL) ශ්‍රී ලංකාවේ සියලුම තෙල් හා ගෑස් ගවේෂණ, සංවර්ධන සහ නිෂ්පාදන කටයුතු නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකීමෙන් බැඳී සිටින ව්‍යවස්ථාපිත ආයතනය ලෙස කටයුතු කරයි. තවද, නව ඛනිජ තෙල් සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම 2024 මාර්තු 14 වන දින ගැසට් නිවේදනයක් මගින් නිල වශයෙන් එළි දැක්වීම සිදුකරන ලදී.

ආර්ථික අර්බුදය පහව යමින් පවතින අවධියක විදුලිය හා බලශක්තිය අඛණ්ඩව සැපයීම සිදුකරගෙන යාමේදී මෙම අමාත්‍යාංශය විසින් අත් කරගන්නා ලද ජයග්‍රහණ සහ 2024 වසරේ දෙසැම්බර් මස දක්වා ලබා ඇති ප්‍රගතිය පිළිබඳව පහතින් සවිස්තරව දැක්වේ.

# පළමුවන පරිච්ඡේදය

# බලශක්ති අමාත්‍යාංශය

## දැක්ම

"ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ බලශක්ති කේන්ද්‍රය බවට පත් කිරීම"

## මෙහෙවර

### විදුලිබල අංශය

"ජාතික ආර්ථික සෞභාග්‍ය උදෙසා ඇවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසර හා මිල දැරිය හැකි විදුලිබල සැපයුමක් සහතික කිරීම"

## මෙහෙවර

### බලශක්ති අංශය

"ජාතික අවශ්‍යතා සපිරෙන පරිදි, අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කරමින් ඉන්ධන ආනයනය කළමනාකරණය හා දේශීයව නව බලශක්ති ප්‍රභවයන් බලශක්ති මිශ්‍රණයට එකතු කිරීම සහ නියමිත නීති සහ අණ පනත්වලට අනුකූලව බලශක්ති විෂයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමනය මඟින් පරිසර හිතකාමී තිරසර බලශක්ති සැපයුමක් තහවුරු කිරීම"

## 1.1 බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන්

2024 නොවැම්බර් 25 දිනැති අංක 2412/08 දරන ගැසට් නිවේදනයට අනුව බලශක්ති අමාත්‍යාංශයේ විෂයයන් සහ කාර්යයන් පහත පරිදි වේ;

01. සූර්ය, ජලය, තාපය, ගල් අඟුරු, අපද්‍රව්‍ය සහ සුළං යනා දී මූලාශ්‍රයන් මගින් පුනර්ජනනීය බලශක්ති, විදුලිය සහ අනෙකුත් බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, සංවර්ධනය සහ අධීක්ෂණය.
02. ශ්‍රී ලංකාවේ විදුලිබල අවශ්‍යතා සපුරාලීම සහ බලශක්ති සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම.
03. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම.
04. දිගුකාලීන අවශ්‍යතා පදනම් කරගත් විදුලි ජනන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
05. බලශක්ති සම්ප්‍රේෂණය හා බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.
06. ජනනය කරනු ලබන විදුලි බලය උපරිම කාර්යක්ෂමතාව සහිතව භාවිත කිරීම සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් නිර්මාණය කිරීම.
07. විදුලිය ජනනය සඳහා දරනු ලබන පිරිවැය අඩු කිරීම සහ ජනනයේදී ඇතිවන අවිනිශ්චිතතා ඉවත් කිරීම.
08. පවතින අධික වියදම් සහිත විදුලි උත්පාදන ප්‍රභවයන් අඩු වියදම්, පරිසර හිතකාමී, පුනර්ජනනීය ප්‍රභවයන් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
09. ජාතික පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවල ආයෝජන සඳහා දේශීය සමාගම්වලට සමාන අවස්ථා ලැබෙන බව සහතික කිරීම.
10. කාර්මික අපද්‍රව්‍ය භාවිතයෙන් බලශක්ති උත්පාදනය වැඩි කිරීම.
11. සමුපකාර මූලධර්ම මත පදනම්ව බලශක්ති ඒකක ලෙස ක්ෂුද්‍ර ජාල ස්ථාපිත කිරීම.
12. බලශක්ති ක්ෂේත්‍රයේ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ආයෝජන අවස්ථා ඇති කිරීම.
13. විශේෂයෙන් පවතින ගිවිසුම් අලුත් කිරීම මගින් කුඩා පරිමාණ ජල විදුලිබල උත්පාදනය සඳහා නැවත ආයෝජනය කිරීම දිරිමත් කිරීම.
14. විදුලි බිල යාවත්කාලීන කිරීම සහ ඛනිජ තෙල් සහ ගෑස් සඳහා මිල සූත්‍රය ආදේශය සඳහා වඩාත් සාධාරණ හා විනිවිද පෙනෙන ක්‍රමවේදයක් හඳුන්වාදීම.
15. දිගු කාලීන අවශ්‍යතා මත බලශක්ති උත්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.
16. ආයතනික කළමනාකරණ මට්ටමින් සිදුවන පාඩු සහ විදුලි ජනන හා බෙදාහැරීමේ පද්ධතියට සිදුවන තාක්ෂණික හානි අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
17. විදුලි වාහන භාවිතයට පහසුකම් සැලසීම සහ දිරිගැන්වීම
18. ශ්‍රී ලංකාව බලශක්ති වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම සඳහා කටයුතු කිරීම.
19. හරිතාගාර වායු විමෝචනය පාලනය කිරීම.
20. ග්‍රාමීය විද්‍යුතනය.
21. ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන සහ ස්වාභාවික ගෑස් ආනයනය කිරීම, පිරිපහදු කිරීම, ගබඩා කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම.
22. ඛනිජ තෙල් නිෂ්පාදනය සහ පිරිපහදුව සම්බන්ධ කටයුතු.
23. ඛනිජ තෙල් සහ ස්වාභාවික ගෑස් ගවේෂණය සහ ඒ ආශ්‍රිත කටයුතු.
24. ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රභවයන්ගෙන් ගෑස් සහ අතුරු නිෂ්පාදන නිපදවීමට අදාළ කටයුතු, තොග පවත්වා ගැනීමල නිෂ්පාදනය හා බෙදා හැරීම.
25. ඉන්ධන සැපයීම සහ බෙදා හැරීමට අදාළ වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
26. බලශක්ති සම්පත් පාලනය, නියාමනය සහ උපයෝජනය උදෙසා උචිත බලශක්ති ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
27. තෙල් පිරිපහදු කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පෙට්‍රෝලියම් අතුරුඵල - නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත දිරිමත් කිරීම.
28. ඉන්ධන සැපයීමේ විශ්වසනීයත්වය, අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.

## 1.2 බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ප්‍රධාන අංශ

බලශක්ති අමාත්‍යාංශය පහත සඳහන් අංශවලින් සමන්විත වේ.

- ආයතන හා පරිපාලන අංශය
- සංවර්ධන අංශය
- විදුලිබල හා විදුලිබල ප්‍රතිසංස්කරණ අංශය
- ප්‍රතිපත්ති, තාක්ෂණික හා පර්යේෂණ අංශය
- සැලසුම් අංශය
- ප්‍රසම්පාදන අංශය
- මූල්‍ය අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- විදුලිබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය

## 1.3 බලශක්ති අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

- ලංකා විදුලිබල මණ්ඩලය (CEB)
- සී/ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගම (LECO)
- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA)
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව
- ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
- සී/ස. ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම
- සී/ස. ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම
- සී/ස. එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
- ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම
- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය
- ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් පුද්ගලික සමාගම

## 1.4 2024 වර්ෂය තුළ විදුලිබල අංශයේ කාර්යසාධනය

2024 වසරේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරුණේ පාරිභෝගික අවශ්‍යතා ඉටුකිරීම වෙනුවෙන් සෑම ආකාරයකම ඉල්ලුම සපුරාලීම පිණිස අඛණ්ඩව විදුලිය සහ ඉන්ධන සැපයීම සඳහා රට තුළ බලශක්ති සුරක්ෂිතභාවය ස්ථාවර කිරීම කෙරෙහිය. බලශක්ති ක්ෂේත්‍රයේ කළමනාකරණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වෙනස්කිරීම් හඳුනාගනු ලැබූ අතර ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීති රීති සකස් කරන ලදී. ඒ සමඟම, අනාගත බලශක්ති අර්බුදයක් ඇතිවීම වළක්වා ගැනීම පිණිස විදුලි උත්පාදනයේ ස්ථාපිත ධාරිතාව ඉහළ නැංවීම සඳහා දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීම සිදුකරන ලද අතර විශේෂයෙන්, හයිඩ්‍රජන් සහ න්‍යෂ්ටික බලශක්තිය සඳහා නව ව්‍යාපෘති හඳුනාගන්නා ලදී. විදුලි සම්ප්‍රේෂණ පුළුල් කිරීම් අඛණ්ඩව සිදු කෙරුණු අතර සුහුරු විසඳුම් හඳුන්වාදීමත් සමග බෙදාහැරීමේ ජාල වැඩිදියුණු කිරීම් ද අඛණ්ඩව සිදු කෙරිණි.

2024 වර්ෂය තුළ, ප්‍රධාන ජල විදුලි, කුඩා ජල විදුලි, භූමිය මත ස්ථාපිත කරන - පාවෙන- පියැසි මත සවිකරන සූර්ය පැනල පද්ධතිවල බලශක්තිය විදුලි පද්ධතිය වෙත එක් කිරීමට කටයුතු කිරීම මගින් පුනර්ජනනීය බලශක්ති විදුලිබල උත්පාදනය ඉහළ නැංවීමට පියවර ගැනුණි. බලශක්ති මිශ්‍රණය විවිධාංගීකරණයට නතු කිරීමට සමත් වූ ස්වභාවික ද්‍රව වායු බලාගාරය පද්ධතියට එක් කිරීම තුළින් ජාතික බලශක්ති පද්ධතිය සවිබල ගැන්වීම සිදු කෙරිණි. වසර 2030 වන විට 70%ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවය ඇති කිරීමේ ඉලක්කය සහ වසර 2050 වන විට ශුන්‍ය කාබන් ඉලක්කය කරා ළඟා වීම සාක්ෂාත් කරගැනීමේ අරමුණින්, පුද්ගලික අංශයේ ආයෝජන ද සමගින් ශ්‍රී ලංකාවේ විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සූර්ය පියැසි පද්ධති සහ සූර්ය බලශක්ති උද්‍යාන ස්ථාපිත කිරීම මගින් පුනර්ජනනීය බලශක්ති අංශය තවදුරටත් පුළුල් කිරීමට අමාත්‍යාංශය මැදිහත් වී කටයුතු කරන ලද්දේ එය ජාතික හා ගෝලීය අවශ්‍යතාවයක් ලෙස සලකමිනි. සුළං බලශක්ති උද්‍යාන ද සංවර්ධනය කෙරෙමින් පවතින අතර මූලික අධ්‍යයනයන් සිදුවෙමින් පවතී.

ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රගතිය කරා යන ගමනේදී, මෙතෙක් අත් කර ගෙන ඇති ජයග්‍රහණ සහ අනාගත සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීමේ අරමුණින්, පවත්නා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායන් අන්තර් ආයතනික කමිටුවක සහාය යටතේ සමාලෝචනය කරන ලදී. ප්‍රජා කේන්ද්‍රීය රජයක පරමාර්ථ ඉටු කරනු ලැබීමේ අරමුණින්, මහජන ඉල්ලීම් මත 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුකූලව ඉල්ලුම් කරන ලද සියලුම තොරතුරු කිසිදු ප්‍රමාදයකින් තොරව මහජනතාවට ලබා දීමට 2024 වසරේදී කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) හි මගපෙන්වීම යටතේ, සෞඛ්‍ය අංශයේ දියුණුව සඳහා පරමාණුක බලශක්තිය උපයෝගී කරගනිමින් පිළිකා එන්නත් සඳහා රසායනික ඖෂධ (Fluorodeoxyglucose) (FDG) නිෂ්පාදනය කිරීමට සයික්ලොට්‍රෝන් පහසුකම (cyclotron facility) ස්ථාපිත කිරීම සඳහා 2024 වසරේ සැප්තැම්බර් මාසයේදී අදාළ ආයෝජකයා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමග ගිවිසුමක් අත්සන් තබන ලදී. එමෙන්ම, න්‍යෂ්ටික බලශක්තිය යොදාගනිමින් මෙගාවොට් 300-400 අතර විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට ගෙන යනු ලැබූ අතර, අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ ලේඛන (EOI) සකස් කිරීම සහ අදාළ රෙගුලාසි සම්පාදනය කිරීම වසර පුරාවට සිදු කරන ලදී.

### 1.4.1 විදුලිබල ක්ෂේත්‍රයේ සම්පිණ්ඩනයක්

- 2024 වසරේ සමස්ත විදුලි පාරිභෝගික සංඛ්‍යාව - ලංවිම = 7,717,673

**වගුව 1.1**
**2024 ඔක්තෝබර් මස අවසානය වන විට පාරිභෝගික සංඛ්‍යාව**

| | කාණ්ඩය | ලං.වි.ම. | ලං.වි.පු.ස. | එකතුව |
|---|---|---|---|---|
| 1 | ගෘහස්ථ | 6,080,699 | 515,975 | 6,596,674 |
| 2 | ආගමික ස්ථාන | | 2,731 | 46,946 |
| 3 | කර්මාන්ත | 71,945 | 3,522 | 75,467 |
| 4 | පොදු කාර්යය | 877,776 | 104,139 | 981,915 |
| 5 | හෝටල් | | 88 | 864 |
| 6 | රාජ්‍ය ආයතන | 9,285 | 420 | 9,705 |
| 7 | කෘෂි කාර්මික කටයුතු | 4,061 | | 4,061 |
| 8 | වීදි ආලෝකකරණය | - | 2,041 | 2,041 |
| | එකතුව | **7,088,757** | **628,916** | **7,717,673** |

මූලාශ්‍රය :

- 2024 වසරේ ශුද්ධ විදුලි ජනනය - ගි.වො.පැ. 15,322.814
- විදුලි ජනන මිශ්‍රණය (2024 නොවැම්බර් මස අවසානය වන විට දත්ත) (ගි.වො.පැ. ඒකක)

ගල් අඟුරු - 5,148.526
ජල විදුලි - 6,021.523
තාප - 2,246.760
සුළං - 779.125
සූර්ය - 985.927
වෙනත් - 140.953

ප්‍රස්තාරය 1.1
2024 නොවැම්බර් දක්වා ශුද්ධ විදුලිබල ජනනය




වගුව 1.2
2024 නොවැම්බර් දක්වා - (මෙ.වො)
ස්ථාපිත ධාරිතාවය

| ජනන ප්‍රභවය | ල.වි.ම | නිෂ්පාදකයින් | එකතුව |
|---|---|---|---|
| පුනර්ජනනීය | | | |
| 01. ජල විදුලිය | 1,413.38 | 423.08 | 1,846.46 |
| 02. සුළං | 103.50 | 163.45 | 266.95 |
| 03. සූර්ය-භූමිය මත | - | 153.36 | 153.36 |
| 04. සූර්ය-පියසි මත | - | 1,346.94 | 1,346.94 |
| 05. දුව | - | 26.99 | 26.99 |
| 06. ජෛව ස්කන්ධ | - | 17.08 | 17.08 |
| 07. නාගරික අපද්‍රව්‍ය | - | 10.00 | 10.00 |
| එකතුව | 1,516.88 | 2,140.90 | 3,657.78 |
| පොසිල ඉන්ධන | | | |
| 08. තාප/ද්‍රව තෙල් | 801.00 | 482.00 | 1,283.00 |
| 09. ගල් අඟුරු | 900.00 | - | 900.00 |
| එකතුව | 1,701.00 | 482.00 | 2,183.00 |
| මුළු එකතුව | | | 5,840.78 |

මූලාශ්‍රය : ලං.වි.ම

## 1.4.2 විදුලි උත්පාදනය පුළුල් කිරීම

### අ.) පුනර්ජනනීය බලශක්ති විදුලිය උත්පාදනය

### i. ප්‍රධාන ජල විදුලි ව්‍යාපෘති

- **උමා ඔය ජල විදුලි ව්‍යාපෘතිය (මෙගාවොට් 120)**

උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද්දේ වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සමග ඒකාබද්ධවය. මෙම ව්‍යාපෘතියට උමං මාර්ග දෙකක්,වැලිමඩ ගංගාවේ අතු ගංගාවක හැරවුම් ස්ථානයක් සහිත අතුරු මාර්ගයක්, මෙගාවොට් 120 ක ස්ථාපිත ධාරිතාවක් සහිත භූගත ජල විදුලි බලාගාරයක් සහ වාරිමාර්ග කටයුතු සඳහා හෙක්ටයාර 5,000 ක පමණ ප්‍රදේශයකට ජලය සැපයීම සඳහා ජල හැරවුම් පද්ධතියක් ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ඉරාන රජයෙන් සහ දේශීය මූලාශ්‍ර යන දෙයාකාරයෙන්ම ඇමෙරිකානු ඩොලර් මිලියන 530 ක ආයෝජනයක් සිදු කරන ලදි. මෙම ව්‍යාපෘතිය 2024 අප්‍රේල් 24 වන දින ඉරාන ජනාධිපතිවරයාගේ සහභාගීත්වයෙන් නිල වශයෙන් ආරම්භ කරන ලදී.

- **මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය (මෙගාවොට් 30.5)**

මහනුවර දිස්ත්‍රික්කයේ උලපනේ ප්‍රදේශයේ පිහිටා ඇති මොරගොල්ල ව්‍යාපෘතිය සඳහා උපයෝගී කරගැනෙන්නේ මහවැලි ගඟේ ජලයයි. මෙම ව්‍යාපෘතියෙන් ගිගාවොට් පැය 100.5 ක වාර්ෂික විදුලි නිෂ්පාදනයක් අපේක්ෂා කරනු ලබයි. 2024

වසරේ අවසානය වන විට 84% ක භෞතික ප්‍රගතියක් සහ 84.3% මූල්‍ය ප්‍රගතියක් අත්කර ගැනීමට සමත් වෙමින් මෙම ව්‍යාපෘතිය එහි අවසන් අදියර කරා ළඟා වෙමින් තිබේ. මෙම ව්‍යාපෘතිය 2025 වසරේ දෙසැම්බර් මස වන විට සම්පූර්ණයෙන් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 19,288 කි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ලබාගෙන ඇත.







(විදුලි බලාගාරය සහ වේල්ල ඉදිකිරීම.)

**ii. කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති**

- **සීතාවක ජල විදුලි බලාගාරය**

මෙම කුඩා ජල විදුලි බලාගාරය මෙගාවොට් 7ක බලාගාර දෙකකින් (සමස්තය මෙගාවොට් 14කින්) සමන්විත ඒකාබද්ධ ධාරිතාවකින් යුක්ත වන අතර, වාර්ෂිකව ගිගාවොට් පැය 40ක විදුලිය ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. අනුමැතිය ලබාගැනීම සඳහා මූලික පාරිසරික පරීක්ෂණ (IEE) වාර්තාව මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. 2024 වසර අවසානය වන විට, විදුලි උපකරණ සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අවසන් කර ඇති අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් සහ ලංකා විදුලිබල මණ්ඩලය සමඟ විදුලිය මිලදී මිලදී ගැනීමේ ගිවිසුම (PPA) අත්සන් තැබීමෙන් පසු බලාගාර භූමිය සකස් කිරීම සහ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

**iii. කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘතිවල තත්ත්වය**

ජාතිකව නිර්ණය කරන ලද දායකත්වයන්හි කොන්දේසි විරහිත පියවර සඳහා නියමිත ඉලක්කයෙන් 10ක් සපුරා ගනිමින්, 2024 දෙසැම්බර් වන විට ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන ලද සමුච්චිත කුඩා ජල විදුලිබල ධාරිතාව මෙගාවොට් 422.4 කි. 2024 වසර තුළ කුඩා ජල විදුලි බලාගාර ව්‍යාපෘති දෙකක් සිදු කරන ලද අතර පන්විල, ගලබඩවත්ත ව්‍යාපෘතිය සහ කොළොන්න, කිවුල ව්‍යාපෘතිය පෞද්ගලික ආයෝජන යටතේ ආරම්භ කරන ලදි. එම ව්‍යාපෘති දෙකෙහි සමස්ථ ධාරිතාවය මෙගාවොට් 3.027 ක් වේ.

**iv. සූර්ය බලශක්ති ව්‍යාපෘති**

- **සියඹලාණ්ඩුව භූමිය මත ඉදිකෙරෙන සූර්ය බල උද්‍යානය (මෙගාවොට් 100)**

මෙගාවොට් 100 ක ධාරිතාවයෙන් යුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනට ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදුවන අතර ප්‍රවේශ වීමේ මාර්ග සහ මායිම් සලකුණු කිරීම් වැනි සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. ටෙන්ඩරය

ප්‍රදානය කර ඇති අතර බලශක්ති බලපත්‍රය නිකුත් කර ඇත. 2024.08.02 දින විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් තබා ඇත. ඉඩම් උප-බදු ගිවිසුම සඳහා නීතිපතිවරයාගේ නිරීක්ෂණ ලැබී ඇත. මෙම ව්‍යාපෘතිය Wind Force PLC, සීමාසහිත ලක්ධනවි සමාගම, සහ සිංගප්පූරුවේ The Blue Circle Pvt Ltd සමාගම සමග හවුල්කාරිත්වයෙන් යුතුව ක්‍රියාත්මක වේ.

- **හම්බන්තොට සූර්ය විදුලි බලාගාර ව්‍යාපෘතිය - (මෙගාවොට් 150)**

මෙම ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන ඇති ඉඩම් අත්පත් කර ගැනීම සඳහා මහවැලි සංවර්ධන අධිකාරිය සමඟින් ඉඩම් බදු ගිවිසුම අත්සන් කිරීමට නියමිත ය. 2024.03.13 දින සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් තබන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ නිම කිරීමට අපේක්ෂිත සම්ප්‍රේෂණ මාර්ගයේ සහ උපපොළේ ඉදිකිරීම් කටයුතු ආයෝජකයින් 13 දෙනෙකුගෙන් සමන්විත ඒකාබද්ධ සමාගමක් විසින් සිදු කරගෙන යනු ලැබේ.

- **සාම්පූර් සූර්ය බලාගාර ව්‍යාපෘතිය (මෙගාවොට් 135) - අදියර I ( මෙගාවොට් 50)**

මෙගාවොට් 135ක් දක්වා පුළුල් කිරීමේ හැකියාව ඇති පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති මෙම ද්විත්ව අදියර ව්‍යාපෘතියෙහි, මෙගාවොට් 50 පළමු අදියරේ කටයුතු ලංකා විදුලිබල මණ්ඩලය (CEB) සහ ඉන්දියාවේ ජාතික තාප බල සංස්ථාව (NTPC) එක්ව පිහිටුවා ඇති සීමාසහිත ත්‍රිකුණාමලය විදුලිබල සමාගම (TPCL) විසින් සිදු කරනු ලැබේ. ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් සාකච්ඡා සිදුවෙමින් පවතින අතර, 2023 ජූලි 18 වන දින බලශක්ති බලපත්‍රය නිකුත් කර ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා සාම්පූර් ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම සඳහා වෙන් කර ඇති ඉඩම උපයෝගී කර ගනු ලැබේ. ඉඩම් බදු ගිවිසුම මහවැලි අධිකාරිය සමඟ අත්සන් තැබීමට නියමිත ය. සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සඳහා මේ වනවිටත් මූලික ක්‍රියාමාර්ග ගෙන ඇත.

- **ඔඩ්ඩමාවඩි සූර්ය බලාගාර ව්‍යාපෘතිය - (මෙගාවොට් 100)**

මෙම ව්‍යාපෘතිය නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඔඩ්ඩමාවඩි ප්‍රදේශයේ ක්‍රියාත්මක වේ. බලාගාරයට අමතරව වාලච්චේන දක්වා වූ කි.මී. 15ක දිගින් යුත් සම්ප්‍රේෂණ රැහැන් මාර්ගයක් සහිතව ඉදි කිරීමටත්, විදේශ ඍජු ආයෝජනය යටතේ ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර ඇත. පාරිසරික අනුමැතිය හා තාවකාලික අනුමැතිය ලබා ගෙන ඇත. සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම සඳහා නීතිපතිගේ නිරීක්ෂණ ලබා ගැනීමට නියමිතය.

- **පූනකරි සුළං බලශක්ති ව්‍යාපෘතිය - (මෙගාවොට් 700)**

බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් සහිතව පූනරින් කලපුවේ ඉදි කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය ඍජු විදේශ ආයෝජනය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර, මෙගාවොට් 700 ක ධාරිතාවක් සංවර්ධනය කිරීම සඳහා තාවකාලික අනුමැතිය ලබා දී ඇත.

- **චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව මතුපිට පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘතිය - (මෙගාවොට් 2)**

මෙගාවොට් 1 බැගින් වූ ධාරිතාවක් සහිත පාවෙන සූර්ය බලශක්ති උත්පාදන නියමු ව්‍යාපෘති දෙකක් චන්ද්‍රිකා වැව සහ කිරිඉබ්බන් වැව මතුපිට ඉදිකර තිබෙන අතර, මෙය ශ්‍රී ලංකාවේ පළමු පාවෙන වර්ගයේ සූර්ය බලාගාරයයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොරියාවේ වෙළඳ, කර්මාන්ත සහ බලශක්ති අමාත්‍යාංශය ආසන්න වශයෙන් ශ්‍රී.ලං.රු. මිලියන 1,000ක අරමුදල් ප්‍රදානයක් ලබා දී ඇත. මෙම ව්‍යාපෘතියේ වැඩ නිමකොට 2024 නොවැම්බර් 27 වන දින ජනන කටයුතු ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ විදුලි උත්පාදන අවශ්‍යතා සඳහා

පිරිවැය-ඵලදායී විසඳුමක් ලෙස පාවෙන සූර්ය බලශක්ති තාක්ෂණය හඳුන්වා දීම සහ මෙම තාක්ෂණයේ බලපෑම් හඳුනා ගැනීමයි. මෙම ප්‍රවේශය සාම්ප්‍රදායික සූර්ය බලශක්ති බලාගාර ඉදිකිරීම සඳහා වන භූමි අවශ්‍යතා හා සම්බන්ධ අභියෝගවලට විසඳුම් සපයයි. මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව ගිගාවොට් පැය 3ක විදුලිය නිපදවීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, සෑම වසරකම විදුලි උත්පාදනය සඳහා යොදාග ැනෙන පොසිල ඉන්ධන ලීටර් මිලියන 1ක් පමණ ඉන් ඉතිරි කරදෙමින් රුපියල් බිලියන 0.3 ක පමණ පිරිවැය ඉතිරියක් ලබාදේ. තවද, මෙම සූර්ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් කාබන් විමෝචනය ටොන් 2,100 කින් අඩු කිරීමට දායකත්වය ලබාදේ.

- **ඉන්දියානු ණය ආධාර යටතේ සූර්ය පියැසි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**

මෙම ව්‍යාපෘතිය මගින් ආගමික ස්ථාන 5000කට සූර්ය පියැසි පද්ධති ස්ථාපනය කිරීමට අපේක්ෂිතයි. සූර්ය බල පද්ධති කට්ටල ගෙන්වා බෙදාහැරීම් කටයුතු අවසන් කර ඇති අතර දිවයින පුරා ස්ථාපිත කිරීම් සිදුකෙරෙමින් තිබේ. 2025 වසරේ මාර්තු මස වන විටදී මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

**v. සුළං බලශක්ති ව්‍යාපෘති**

- **මන්නාරම "තම්බපවණි" සුළං විදුලි බලාගාර ව්‍යාපෘතිය - අදියර II - (මෙගාවොට් 50)**

මෙගාවොට් 100ක් සමගින් තම්බපවණි අදියර I සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතී. අදියර II සඳහා අභිප්‍රාය ප්‍රකාශ (EOI) කැඳවීම සිදුකර ඇත. ලැබී ඇති යෝජනා ව්‍යාපෘති කමිටුව/අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් ඇගයීමට ලක් කරමින් පවතී.

- **වේරවිල් සුළං විදුලි ව්‍යාපෘතිය (මෙගාවොට් 210)**

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වෙරවිල් ප්‍රදේශයේ හඳුනාගෙන ඇති භූමි ප්‍රදේශවල පාරිසරික බලපෑම් තක්සේරුව (EIA) සිදු කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) වෙතින් සහාය ලැබී ඇත. පාරිසරික බලපෑම් තක්සේරුව සහ පක්ෂි අධ්‍යයනයන් අවසන් කර ඇති අතර එම වාර්තා මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. අවශ්‍ය අනුමැතින් ලැබීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය ආයෝජනය සඳහා විවෘත වේ.

- **මුල්ලිකුලම් සුළං බලාගාර උද්‍යානය - මෙගාවොට් (50 x 2)**

ව්‍යාපෘතියේ මූලික සූදානම් කිරීමේ කටයුතු අතරට ඉදිකිරීම් භූමි මාර්ග සංවර්ධනය කිරීම, ටර්බයින සවිකරන ස්ථාන එළිපෙහෙළි කිරීම් හා සීමා නිර්ණය කිරීම සහ ඉදිකිරීම් භූමියේ නවාතැන් පහසුකම් සැකසීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් සංවර්ධනය කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති සංවර්ධකයින් සඳහා අවස්ථාව සලසා ඇත. ව්‍යාපෘතියේ මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 284.00 ක් වන අතර එම කටයුතු 2025 දෙසැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂිතය. සුළං බලාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කැඳවනු ඇත.

- **මන්නාරම සුළං විදුලි ව්‍යාපෘතිය (මෙගාවොට් 250)**

මෙගාවොට් 250 ක ස්ථාපිත ධාරිතාවයකින් යුක්ත මෙම ව්‍යාපෘතිය සෘජු විදේශ ආයෝජන අනුග්‍රහය සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කෙරෙමින් පවතී. ශක්‍යතා අධ්‍යයනයන් අවසන් කර ඇති අතර ඉඩම් අත්පත් කර ගැනීම සිදු වෙමින් පවතී. පාරිසරික බලපෑම් තක්සේරුව සඳහා අවසාන තාක්ෂණික ඇගයීම් කමිටුව පවත්වා ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මන්නාරම දූපත සඳහා වැසි ජලය රැස් කිරීමේ පද්ධතියක් සංවර්ධනය කරමින් පවතින අතර ඉන් කලාපයේ සංවර්ධනය සඳහා ද දායකත්වය සැපයෙනු ඇත.

● **පුනරීන් සුළං විදුලි ව්‍යාපෘතිය (මෙගාවොට් 234, අදියර I සහ II)**

පූනරින් අර්ධද්වීපය තුළ මෙගාවොට් 234ක ධාරිතාවයකින් විදුලිය ජනනය කිරීම සඳහා සැලසුම් කරනු ලැබූ මෙම ව්‍යාපෘතිය, පිළිවෙලින් මෙගාවොට් 100 සහ මෙගාවොට් 134 ක් ලෙස අදියර දෙකකින් සංවර්ධනය කිරීමට නියමිත අතර පුද්ගලික ආයෝජන සමඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කෙරේ. ඉඩම් තක්සේරු කිරීම අවසන් කර ඇති අතර ඉඩම් අත්පත් කර ගැනීම සිදුවෙමින් පවතී. පූර්ව ශක්‍යතා අධ්‍යයනයන් ද අවසන් කර ඇති අතර බලශක්ති බලපත්‍රය නිකුත් කර ඇත.

**vi. යාපනය අර්ධද්වීපයේ දූපත් තුනක් සඳහා දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම**

ඩෙල්ෆ්, අනලයිතිව් සහ නයිනතිව් යන උතුරේ දූපත් සඳහා සූර්ය බලය, සුළං සහ ඩීසල් ජෙනරේටර් මඟින් විදුලිය ජනනය සහ ලිතියම්-අයන බැටරි ගබඩා පද්ධති ඇතුළත් දෙමුහුන් ව්‍යාපෘතියක් ලෙස විදුලිය සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. විදුලිබල ආදාන සැලසුම් (Electrical drawings) සඳහා අනුමැතිය ලැබී ඇති අතර සිවිල් ඉදිකිරීම් සැලසුම් (Civil drawings) සමාලෝචනය කෙරෙමින් පවතී. නයිනතිව් සහ ඩෙල්ෆ් හි ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර අනලයිතිව් හි ආරක්ෂිත වැට ඉදිකිරීම අවසන් කර ඇත. සියලුම දූපත්වල ඉදිකිරීම් භූමි එළිපෙහෙළි කිරීම, පිරික්සීම සහ පාංශු පරීක්ෂණය සිදු කර අවසන්ව ඇති අතර උප කොන්ත්‍රාත්කරුවන් හඳුනාගෙන ඇත. උපකරණ සැපයුම්කරුවන් විසින් ද්‍රව්‍ය ඇණවුම් සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටියි. ඉන්දියානු ප්‍රදාන යටතේ වූ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ඇත. මෙම ව්‍යාපෘතිය 2025 වසරේ මැද භාගයේදී නිම කිරීමට සැලසුම් කර ඇත.

2023 දෙසැම්බර් 11 දිනැතිව ලබාදෙන ලද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ඉන්දියාවේ M/S U-Solar Clean Energy Solutμons (Pvt) Ltd. වෙත ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර ව්‍යාපෘතියේ අධීක්ෂණ සහ සුපරීක්ෂණ කටයුතු ඇතුළුව උපදේශන සේවා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙතින් ලබාගැනීම සඳහා පියවර ගෙන ඇත.

**vii. හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධතිය (BESS) ස්ථාපනය කිරීම.**

මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ පළමු බැටරි බලශක්ති ගබඩා පද්ධතිය වන අතර එය හම්බන්තොට ග්‍රිඩ් උපපොළෙහි ස්ථාපනය කෙරෙනු ඇත. එය මෙගාවොට් 5 මෙගාවොට් පැය 10.7ක ධාරිතාවයකින් යුත් නියමු ව්‍යාපෘතියකි. මෙම යෝජිත බලශක්ති ගබඩා පද්ධතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 11.9 ක් වන අතර කොරියාවේ වෙළඳ, කර්මාන්ත සහ බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රදානයක් මත සහ කොරියානු උසස් තාක්ෂණ ආයතනයේ (KIAT) තාක්ෂණික සහාය යටතේ ක්‍රියාත්මක කෙරේ.

ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර කොන්ත්‍රාත්කරුගේ නියෝජිතයින් ලංකා විදුලිබල මණ්ඩලය හා එක්ව සැලසුම් සමාලෝචන සිදු කෙරෙමින් පවතී. සිවිල් ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින අතර 2025 වසරේ මාර්තු/අප්‍රේල් වන විට ඉදිකිරීම් භූමිය වෙත උපකරණ භාර දීම හා එකලස් කිරීම් සිදු කිරීමට නියමිතය.







(බැටරි බලශක්ති ගබඩා පද්ධතියේ ඉදිකිරීම්)

**ආ)පුනර්ජනනීය නොවන බලශක්ති උත්පාදනය**

**i. ස්වභාවික ද්‍රව වායු (LNG) ව්‍යාපෘති**

ශ්‍රී ලංකාව විසින් පැරිස් ගිවිසුමට අනුකූලව සිය ජාතිකව නිර්ණය කළ දායකත්වයන් (Nationaly Determined Contribution) ඉදිරිපත් කරනු ලැබ ඇති අතර වසර 2030 වන විට විදුලි උත්පාදනයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සපුරා ගැනීමට සහ වසර 2050 වන විට විදුලි උත්පාදනය තුළ කාබන් උදාසීනත්වය ළඟා කරගැනීමට කැපවී සිටී.

ජාත්‍යන්තර කැපවීම් මුදුන්පත් කරගැනීම සඳහා සුවිශේෂී දායකත්වයක් සපයන විචල්‍ය ස්වභාවයෙන් යුත් පුනර්ජනනීය බලශක්තීන් වැඩි වශයෙන් එක් වන විට පද්ධතියේ ස්ථාවරත්වය අඩුවන අතර එම ස්ථාවරත්වය පවත්වා ගැනීමටත් ඩීසල් බලාගාර පද්ධතියෙන් ඉවත් වන විට එම ස්ථාන පිරවීමටත් ස්වාභාවික වායු බලාගාර ජාතික පද්ධතියට එක් කිරීම අතවශ්‍ය වේ.

- **කෙරවලපිටියේ මෙගාවොට් 350 ප්‍රතිවායුකරණය කරන ලද ස්වභාවික වායු (RLNG)/ ඒකාබද්ධ චක්‍රීය ඩීසල් බලාගාරය ඉදිකිරීම**

ලක්ධනවි සමාගම විසින් ස්වභාවික ද්‍රව වායු වලින් ක්‍රියාත්මක මෙගාවොට් 350 "සොබාධනවි" ඒකාබද්ධ චක්‍රීය බලාගාරයේ පළමු අදියර කෙරවලපිටියේ ඉදිකරනු ලැබ ඇති අතර 2024 අගෝස්තු මාසයේ දී විවෘත චක්‍රීය වායු ටර්බයිනය බල ගන්වන ලදී. වාෂ්ප ටර්බයිනය 2025 වසරේදී ක්‍රියාත්මක කරවීමට නියමිතය.

- **කෙරවලපිටියේ මෙගාවොට් 300ක ස්වභාවික ද්‍රව වායු (LNG) පාදක දෙවන ඒකාබද්ධ චක්‍රීය බලාගාරය ඉදිකිරීම.**

මෙගාවොට් 350 "සඟස්ධනවි" ස්වභාවික වායු ඒකාබද්ධ චක්‍රීය බලාගාරය කෙරවලපිටියේ ඉදි කිරීමට නියමිත අතර එහි විවෘත චක්‍රීය ටර්බයිනය 2026 වසරේ දී සහ වාෂ්ප ටර්බයිනය 2027 වසරේ දී නිම කිරීමට සැලසුම් කර ඇත. ලක්ධනවි සමාගම සමඟ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම සම්බන්ධයෙන් සම්මුති සාකච්ඡා සිදු කෙරෙමින් පවතී.

- **විදුලිබල උත්පාදනය සඳහා ස්වභාවික ද්‍රව වායු අවශ්‍යතාව ප්‍රසම්පාදනය කිරීම සඳහා පෙට්‍රොනෙට් ඉන්දියාහි යෝජනාව ක්‍රියාත්මක කිරීම.**

වායු බලාගාර ක්‍රියාත්මක කිරීම සඳහා ස්වභාවික ද්‍රව වායුව මිලදී ගැනීම පිණිස පෙට්‍රොනෙට් ඉන්දියා (M/S Petronet India) සහ ලක්දනවි සමාගම (M/s Lakdhanavi Ltd) විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ යෝජනාව අනුව කටයුතු ඉදිරියට සිදුකරගෙන යාමට අමාත්‍ය මණ්ඩලය විසින් 2024.07.15 දින පැවති සිය රැස්වීමේදී අනුමැතිය ලබා දෙන ලදී. ස්වභාවික ද්‍රව වායු සැපයුම ඇතුළුව ස්වභාවික ද්‍රව වායු යටිතල පහසුකම් සඳහා අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා ගැනීම සඳහා ඉන්දියාවේ පෙට්‍රොනෙට් ඉන්දියා සහ එල්. ටී. එල් හෝල්ඩින්ස් සමාගම අතර 2024.08.20 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. 2024.09.05 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා සලකා බැලීමෙන් අනතුරුව එල්. ටී. එල් හෝල්ඩින්ස් සමාගම සහ ඉන්දියාවේ පෙට්‍රොනෙට් සමාගම අතර දැනටමත් ක්‍රියාත්මක කර ඇති අවබෝධතා ගිවිසුම සඳහා ආවරණ අනුමැතිය ලබා දීමට 2024.09.09 දින අමාත්‍ය මණ්ඩල විසින් සිය අනුමැතිය ලබා දෙන ලදී.

**ii. ද්විත්ව ඉන්ධන ධාරිතාව සහිත මෙගාවොට් 200ක අභ්‍යන්තර දහන (IC) එන්ජින්වලින් සමන්විත ස්වභාවික වායු බලාගාරය - කෙරවලපිටිය**

2024.06.11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ඉදිරිපත් කරන ලද යෝජනා සැලකිල්ලට ගනිමින්, ඉදිකිරීම-අයිතිය දැරීම-ක්‍රියාත්මක කිරීම- පැවරීමේ පහසුකමක් (BOOT) වශයෙන් වසර 20 ක් සඳහා ගිවිසුම්ගතව ද්විත්ව ඉන්ධන හැකියාවෙන් යුත් මෙගාවොට් 200 අභ්‍යන්තර දහන එන්ජින්වලින් සමන්විත ස්වභාවික වායු බලාගාරය ඉදි කිරීම සඳහා 2024.06.24 දින අමාත්‍ය මණ්ඩලය විසින් සිය අනුමැතිය ලබා දී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුව කටයුතු සිදුකර ගෙන යාම පිණිස ව්‍යාපෘති කමිටුවක් (PC) සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් (CANC) පත් කර ඇති අතර මෙම ව්‍යාපෘතිය 2028 දී අවසන් කිරීමට නියමිත ය.

**iii. න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන**

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වන්නේ තිරසාර, විශ්වසනීය, ස්ථාවර සහ පරිසර හිතකාමී බලශක්තිය ජනනය කිරීම උදෙසා, න්‍යෂ්ටික බලය මගින් විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා න්‍යෂ්ටික තාක්ෂණය යොදා ගැනීමේදී අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට රජයට සහාය ලබා දීමයි. මූලික වශයෙන් මෙගාවොට් 300-400 ක ධාරිතාවයකින් යුත් න්‍යෂ්ටික බලාගාරයක් හරහා විදුලිය ජනනය කිරීම මෙමගින් අපේක්ෂිත ප්‍රතිඵලයයි. මෙම වැඩසටහනේ මූලික සූදානම් කිරීමේ කටයුතු සඳහා රුපියල් මිලියන 390 ප්‍රතිපාදන අවශ්‍ය බවට ඇස්තමේන්තු කර ඇත.

මෙම ආරම්භක පියවර සඳහා සම්බන්ධවී සිටින සංවිධාන අතරට අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනය (IAEA) සහ බලශක්ති අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව ද ඇතුළත් වේ. මේ දක්වා අත්කරගෙන ඇති ප්‍රගතිය යටතට න්‍යෂ්ටික බලශක්ති වගකීම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතීන් දෙකක් අපරානුමත කිරීම, ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් (IWP) සකස් කිරීම සහ න්‍යෂ්ටික බලාගාර අධ්‍යයනය සඳහා අධීක්ෂණ කමිටුවක් පත් කිරීම ආදිය ඇතුළත් වේ.

**1.4.3 සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් පුළුල් කිරීම**

**i. හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර 1)**

අංක 3585 SRI දරන ආසියානු සංවර්ධන බැංකු ණය (2017.10.24 දින මන්නාරමේ මෙගාවොට් 100 සුළං විදුලි බලාගාරයක් ක්‍රියාත්මක කිරීම සඳහා ණය අංක 3585 SRI යටතේ ලබා දෙන ලද ඇ.ඩො. මිලියන 200ක ණය පහසුකම) වලංගු කාලය 2026.06.30 දක්වා දීර්ඝ කරනු ලැබීම මඟින් ලංකා විදුලිබල මණ්ඩලයට පූර්ණ වශයෙන් මුදල ලබාගැනීමටත් පහත සඳහන් ව්‍යාපෘති ත්‍රිත්වය ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිරි ණය මුදල් උපයෝගී කරගැනීමටත් හැකියාව සැලසී ඇත;

- ජාලක කළමනාකරණ සේවාවන් ආදර්ශනය කිරීම සඳහා වන මෙගාවොට් 3ක ප්‍රකාශ වෝල්ටීයතා සූර්ය බලශක්ති ව්‍යාපෘතිය
- බෙදාහැරීම් ජාල සංවර්ධනය කිරීම සඳහා ද්‍රව්‍ය/උපකරණ ප්‍රසම්පාදනය කිරීම
- ලංකා විදුලිබල මණ්ඩලයෙහි මධ්‍යම පළාත සඳහා සිදුකරනු ලබන උසස් බෙදාහැරීමේ කළමනාකරණ පද්ධතියක් (ADMS) සහ අධීක්ෂණ පාලන දත්ත ප්‍රතිග්‍රහණ (SCADA) පාලන පද්ධතියක සහාය සහිත උසස් බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථාන (ADCC) ව්‍යාපෘතිය

**ii. හරිත බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (අදියර 2)**

- හොරණ-පාදුක්ක කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය (පැකේජය 2 කොටස B2 -A), රුපියල් මිලියන 599.71 ක මුළු පිරිවැයක් සහිතව, 2020 අප්‍රේල් 30 වන දින ආරම්භ කෙරුණු අතර, මූලික වශයෙන් 2024 මාර්තු 31 වන දිනෙන් අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. මෙම ව්‍යාපෘතියට ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (AFD) විසින් අරමුදල්

සපයනු ලබන අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් පරිපාලනය කරනු ලැබ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.

- අම්බලන්ගොඩ කි.වො.132/33 ග්‍රිඩ් උපපොළ ආවර්ධනය, පන්නල කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ ආවර්ධනය සහ කි.වෝ.132/33 මෙ.වෝ.ඇ. 31.5 අමතර තාරාපැවි දෙකක් සැපයුම (පැකේජය 8ඃ කොටස B), මුළු පිරිවැය රු. මිලියන 1739.59 ක් සහිතව 2022 ජූලි 11 වන දින ආරම්භ කෙරුණු අතර, 100% භෞතික ප්‍රගතියක් වාර්තා කරමින් 2024 ජුනි 30 අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලැබේ.

- කෙරවලපිටිය කි.වෝ.220 වහරු අංගනය (පැකේජය 9), රුපියල් මිලියන 2918.7 ක මුළු පිරිවැයක් සහිතව, 2020 අගෝස්තු මාසයේදී ආරම්භ කෙරුණු අතර 2024 මැයි 21 වන දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ද ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන අතර එය නිම කිරීමට ආසන්නව පවතී.

**iii. ත්‍රිකුණාමලය ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා වූ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් සැපයීම යටතේ ආරම්භ කරන ලද සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධනය**

- **හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය කොටස (Lot A) - උපපොළ ඉදිකිරීම**

  වේයන්ගොඩ, නව හබරණ, වාලච්චේන, කොත්මලේ සහ අනුරාධපුර යන ප්‍රදේශවල උපපොළ ඉදි කරන ලද මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 5,847 කි. එය 2018 පෙබරවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර එයට අරමුදල් සපයන ලද්දේ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) විසිනි. මෙම ව්‍යාපෘතිය නිමවා සාර්ථකව බලගන්වා ඇත.

- **හබරණ - වේයන්ගොඩ කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය B කොටස (Lot B) - සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම**

  වේයන්ගොඩ සිට හබරණ දක්වා සම්ප්‍රේෂණ මාර්ගය පුළුල් කෙරෙන මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 10,155 කි. එය 2017 මැයි මාසයේදී ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) අරමුදල් යටතේ ආරම්භ කෙරිණි. හබරණ සිට දඹුල්ල දක්වා වූ කි.වෝ. 220 රැහැන් මාර්ගය කි.මී 126ක් නිම කර ඇති අතර ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙය බලගැන්වීමට සූදානමින් සිටියි.

**iv. විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය**

- මෙම ව්‍යාපෘතිය යටතට මුළු දිවයින පුරා කි.මී. 300 ක දිගින් යුතු කි.වෝ. 33 කුළුණු රැහැන් සහ කි.වෝ. 33 සම්බන්ධන ගැන්ට්‍රි (switching gantries) 13 ක් (පැකේජය 4) ඉදිකිරීම ඇතුළත් වේ. මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 7,314.052 ක් වන අතර එය 2019.10.28 දින සිට ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලැබේ.

  ප්‍රගතිය සම්බන්ධයෙන් ගත් විට, ව්‍යාපෘති ආකෘතිය සැලසුම් කිරීම, කුළුණු නිර්මාණය සහ රැහැන් මිනුම් කටයුතු යන සියල්ල 100%ක් අවසන් කර ඇත. අත්තිවාරම සකස් කිරීම 99.5% ක් ලෙසත් ගැන්ට්‍රි නිර්මාණය 99% ක් ලෙසත් නිමවා ඇත. රැහැන් සඳහා අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය 81.65% ක් අවසන් කර ඇති අතර ගැන්ට්‍රි ද්‍රව්‍ය ප්‍රසම්පාදනය 82.7% ක් අවසන්ව ඇත. කුළුණු ස්ථානගත කිරීම සහ පාංශු පරීක්ෂණය යන දෙකම 100% ක් අවසන් අතර කුළුණු සඳහා අත්තිවාරම් යෙදීම 73% ක් වශයෙන් සහ කුළුණු ඉදිකිරීම 47%ක් වශයෙන් නිම කර ඇත. රැහැන් එළීමේ කටයුතු 30% ක් ලෙසත්, ගැන්ට්‍රි අත්තිවාරම් කටයුතු 76%ක් ලෙසත් සහ ගැන්ට්‍රි ඉදිකිරීම 43% ක් ලෙසත් නිම කර ඇත. සමස්තයක් ලෙස ගත් විට, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 73.82% කි. නොවැළැක්විය හැකි තත්වයන් හේතුවෙන් ණය කාලය තුළ සම්පූර්ණ කළ

නොහැකි වූ පැකේජය 4 සඳහා ණය වලංගු කාලය සහිතව ව්‍යාපෘති කාල සීමාව දීර්ඝ කරන ලදී. 2025 මාර්තු 31 වන දින වන විට පැකේජය 4 යටතේ වැඩ විෂය පථයේ 80% ක භෞතික ප්‍රගතියක් අත් කරගැනීමට අපේක්ෂා කෙරේ.

- මෙම ව්‍යාපෘතිය යටතට පන්නිපිටියේ පිහිටි පන්නිපිටිය ග්‍රිඩ් උපපොළේ මෙ.වෝ.ඇ. 100 බ්‍රේකර් ස්විච ධාරිත්‍රකයක් (Mvar BSC) ස්ථාපනය කිරීම ද ඇතුළත් වන අතර එහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,103.5 කි. මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු 1 වන දින ආරම්භ කෙරුණු අතර 2024 දෙසැම්බර් 21 වන දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතියෙහි පිරික්සුම් කටයුතු සහ බලගැන්වීම අවසන් කර ඇත.

- ඊට අමතරව, බියගම පිහිටි බියගම ග්‍රිඩ් උපපොළේ ස්ථිතික Var පද්ධති (SVS) ස්ථාපනය කිරීම (පැකේජ 07 කොටස A2) සඳහා මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 1,756.34 කි. මෙම ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් 7 වන දින ආරම්භ කෙරුණු අතර ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලැබූ මෙය 2024 මැයි 31 දින අවසන් කරන ලදී. තවද, රුපියල් මිලියන 2,003.208 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සහිත අධීක්ෂණ පාලන දත්ත ප්‍රතිග්‍රහණ (SCADA) පාලන පද්ධතියක සහාය සහිත උසස් බෙදාහැරීමේ පාලන මධ්‍යස්ථානයක් බස්නාහිර පළාත දකුණ 1 සඳහා ස්ථාපිත කිරීම (පැකේජය 10) 2023 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කෙරුණු අතර 2025 මාර්තු වන විට එය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන මෙම ව්‍යාපෘතියෙහි මේ වන විට සමස්ත භෞතික ප්‍රගතිය 77% කි.

**v. විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය අදියර II පැකේජය 2 මෙහෙයුම් ඒකකය 2 (PSRSP PII P2 OU2).**

- ඒකල කාර්මික කලාපයේ කි.වෝ. 132/33 2ං මෙ.වෝ.ඇ. 45 ග්‍රිඩ් උපපොළක් සහ ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම.
- යෝජිත "බලශක්ති විශ්වසනීයත්වය සවිබලගැන්වීමේ" ව්‍යාපෘතිය යටතේ ඒකල කාර්මික කලාපය තුළ කි.වෝ. 132/33 දරන යෝජිත ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්පත් කර ගැනීමට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

**vi. මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ හානි අවමකරණ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන උප ව්‍යාපෘති දෙකකින් සමන්විත වේ. පළමු ව්‍යාපෘතියට කෙරවලපිටිය උපපොළේ සිට කොළඹ වරාය බ දක්වා දෙවන කි.වෝ. 220 භූගත කේබලය ඉදිකිරීම ඇතුළත් වන අතර එහි මුළු පිරිවැය රුපියල් මිලියන 9,119 කි. මෙම ව්‍යාපෘතිය 2020 ජනවාරි මාසයේදී ආරම්භවී 2026 සැප්තැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරිණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සපයනු ලබයි. මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිම කර, ව්‍යාපෘතියෙන් 11.5% ක් අවසන් කරමින් පවතී.

කොළඹ නගර සම්ප්‍රේෂණ ජාල සංවර්ධන ව්‍යාපෘතිය - අදියර 2 සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 30,295 කි. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය 2022 ජනවාරි මාසයේදී ආරම්භ වී 2027 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතව ඇත. මේ වන විට මෙම ව්‍යාපෘතිය ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් වෙන්කිරීමක් බලාපොරොත්තුවෙන් සිටී. ව්‍යාපෘතියේ අපේක්ෂිත නිමැවුම් අතරට කොළඹ G (කිරුළපන) කි.වෝ. 220/132 ග්‍රිඩ් උපපොළ, කොළඹ K (වැල්ලවත්ත) කි.වෝ. 132/11 ග්‍රිඩ් උපපොළ, කොළඹ P (නාරාහේන්පිට) කි.වෝ.132/11 ග්‍රිඩ් උපපොළ සහ කොළඹ Q (රෝහල් චතුරශ්‍රය) කි.වෝ. 132/11 ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම ඇතුළත් වේ. මීට අමතරව, පවතින ග්‍රිඩ් උපපොළවල අවශ්‍ය ආවර්ධන කටයුතු සිදු කරනු ලබන අතර, නව ග්‍රිඩ් උපපොළවල් සඳහා සහාය

පිණිස කි.වෝ. 220 සහ කි.වෝ.132 සම්ප්‍රේෂණ කේබල් ජාලයක් ඉදිකරනු ලැබේ.

**vii.ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධනය (NTDND & EIP)**

- **පැකේජය 01** - යටතේ ගම්පහ, කොළඹ සහ කුරුණෑගල ප්‍රදේශවල සම්ප්‍රේෂණ මාර්ග (කි.වෝ.400, කි.වෝ. 220, සහ කි.වෝ.132) ඉදිකිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 14,623 ක් වන අතර, ව්‍යාපෘතිය 2020 ජනවාරි මාසයේ ආරම්භ වී 2025 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතය. ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා රජය (GoSL) විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයේ. කිරිඳිවැල-කොස්ගම කි.වෝ.132 සම්ප්‍රේෂණ මාර්ගය, 220/132 සහ 132/33 පෝෂක පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය (FC TL), බියගම-කොත්මලේ ආදාන-ප්‍රතිදාන සම්බන්ධතාව සහ අනෙකුත් සම්ප්‍රේෂණ මාර්ගවල ප්‍රගතිය සමඟින් මෙම ව්‍යාපෘතිය භෞතික වශයෙන් 60% ක් නිම කර ඇත.

- **පැකේජය 02** - යටතේ ගම්පහ, කොළඹ, මහනුවර සහ කෑගල්ල යන ප්‍රදේශවල සම්ප්‍රේෂණ මාර්ග (කි.වෝ.400, කි.වෝ. 220, සහ කි.වෝ.132) ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. මුළු පිරිවැය රු. මිලියන 8,531 ක් වන අතර, 2019 මාර්තු මාසයේදී ආරම්භ කිරීමටත් 2025 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමටත් නියමිත ය. මේ සඳහා ද ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලැබේ. කිරිඳිවෙල කි.වෝ.220 උපපොළ, නව කිරිඳිවෙල කි.වෝ.132 ග්‍රිඩ් උපපොළ, කොත්මලේ ග්‍රිඩ් උපපොළ ආවර්ධනය කිරීම සහ කොස්ගම ග්‍රිඩ් උපපොළ ආවර්ධනය කිරීම සහ කොස්ගම ග්‍රිඩ් උපපොළේ නව රැහැන් බහනු මෙහෙවරෙහි යෙදවීම සිදු කෙරෙමින් පවතී. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 71% කි.

- **පැකේජය 03** - යටතේ අනුරාධපුර, මාතලේ, මහනුවර, කෑගල්ල සහ නුවරඑළිය යන ප්‍රදේශවල සම්ප්‍රේෂණ මාර්ග (කි.වෝ.220, කි.වෝ.132) ඉදිකිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 11,253 ක් වන අතර, ව්‍යාපෘතිය 2019 අගෝස්තු මාසයේ ආරම්භ වී 2026 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිත වේ. මෙම ව්‍යාපෘතිය සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සැපයේ. නැවත ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, මෙහි භෞතික ප්‍රගතිය 53%ක් වේ.

- **පැකේජය 04** - යටතේ කොළඹ නගරයේ බෙදාහැරීමේ කේබල් (කි.වෝ.33, කි.වෝ.11, සහ කි.වෝ. 0.4) ඉදිකිරීම ආවරණය කෙරේ. මුළු පිරිවැය රු. මිලියන 7,183 ක් වන අතර, ව්‍යාපෘතිය 2020 සැප්තැම්බර් මාසයේ ආරම්භ වී 2026 දෙසැම්බර් මාසයේදී අවසන් කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය සහ ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයනු ලබයි. නැවත ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, මෙහි භෞතික ප්‍රගතිය 42%ක් වේ.

**viii. විදුලිබල පද්ධතිය සවිබල ගැන්වීම සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් අසියානු සංවර්ධන බැංකුව මඟින්ලබා ගන්නා ලද ණය මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 150 ක ණය මුදලක් වෙන් කර ඇත.

- **පැකේජය 1A** යටතේ මීරිගම කි.වෝ. 220/33 ග්‍රිඩ් උපපොළ (2× මෙ.වෝ.ඇ. 63) සහ පැලියගොඩ කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2× මෙ.වෝ.ඇ. 45) ඉදිකිරීම සහ නව හබරණ, වේයන්ගොඩ, කැලණිය සහ කොටුගොඩ ග්‍රිඩ් උපපොළවල නවීකරණය කිරීම් ඇතුළුව නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත ගෑස් පරිවරණය කරන ලද ස්විච් ගියර් තාක්ෂණයෙන් යුත් (GIS) අභ්‍යන්තර ග්‍රිඩ් උපපොළවල් ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රුපියල් මිලියන 16,408 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 සැප්තැම්බර් සිට 2027 අගෝස්තු දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත.

- **පැකේජය** 1 **B** යටතේ හෝමාගම කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×මෙ.වෝ.ඇ. 45) සහ මීගමුව කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2× මෙ.වෝ.ඇ. 63) ඉදිකිරීම සමඟින් හොරණ, පාදුක්ක, බෝලවත්ත, නව හලාවත සහ කටුනායක ග්‍රිඩ් උපපොළවල නවීකරණය කිරීම් ඇතුළුව, නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත කි.වෝ.132 වායු පරිවරණය කරන ලද ස්විච් ගියර් තාක්ෂණයෙන් යුත් (AIS) බාහිර ග්‍රිඩ් උපපොළවල් ඉදි කිරීම ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රුපියල් මිලියන 10,021 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 සැප්තැම්බර් සිට 2027 අගෝස්තු දක්වා ක්‍රියාත්මක වේ. මේ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත.

- **පැකේජය** 1 යටතේ හම්බන්තොට-මාතර කි.වෝ. 132 බෙදාහැරීම් පරිපථ (DC) සම්ප්‍රේෂණ මාර්ගය (කි.මී. 78), විවිධ ග්‍රිඩ් උපපොළවල් සඳහා කි.වෝ. 132 තනි පරිපථ ආදාන-ප්‍රතිදාන රැහැන් සම්බන්ධතා (SC LILOs) සහ මිරිගම ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 220 බෙදාහැරීම් පරිපථ ආදාන-ප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව (DC LILO) ඇතුළු රැහැන් මාර්ග කිහිපයක් ඉදිකිරීම ඇතුළත්ව නිමකොට භාරදීමේ පදනම මත (turnkey basis) කුළුණු මතින් දිවෙන විදුලි රැහැන් මාර්ග ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 10,025 ක් වන අතර, ව්‍යාපෘති කාලසීමාව 2025 සැප්තැම්බර් සිට 2027 අගෝස්තු දක්වා වේග ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාව ලබාගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ලේඛනය සමාලෝචනය කිරීම සිදු කර ඇත.

- **පැකේජය** 1 යටතේ බද්දේගම කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×මෙ.වෝ.ඇ.45) සහ කලවාන කි.වෝ. 132/33 ග්‍රිඩ් උපපොළ (2×මෙ.වෝ.ඇ. 31.5) ඉදිකිරීම මෙන්ම උපපොළවල් කිහිපයක් වැඩි දියුණු කිරීම ඇතුළුව, නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත කි.වෝ.132 ග්‍රිඩ් උපපොළවල් ඉදි කිරීම සඳහා ප්‍රසම්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. මුළු පිරිවැය රුපියල් මිලියන 10,060 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් සිට 2027 නොවැම්බර් දක්වා ක්‍රියාත්මක කෙරේ.

- **පැකේජය** 4 යටතේ, කැලණිය-කොටුගොඩ බෙදාහැරීම් පරිපථ (DC) සම්ප්‍රේෂණ මාර්ගයේ සිට පෑලියගොඩ ග්‍රිඩ් උපපොළ දක්වා (කි.මී. 2) තනි පරිපථ (SC) ආදාන-ප්‍රතිදාන රැහැන් සම්බන්ධතාව සහිතව භූගත කේබලයක් ඉදිකිරීම ඇතුළුව, නිමකොට භාරදීමේ පදනම (turnkey basis) මත කි.වෝ. 132 භූගත කේබල් සම්ප්‍රේෂණ මාර්ග ප්‍රසම්පාදනය කිරීම සිදුකෙරේ. මුළු පිරිවැය රු. මිලියන 3,567 ක් වන අතර, ව්‍යාපෘතිය 2025 දෙසැම්බර් සිට 2027 නොවැම්බර් දක්වා සිදු කිරීමට සැලසුම් කර ඇත.

- **පැකේජය** 4 **A** යටතේ "සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතා සඳහා අමතර කොටස් සහ මෙවලම්" සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය අංක 3483-SRI සහ 3585-SRI යටතේ ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සමඟින් නව හබරණ-නව අනුරාධපුර කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම සිදු කෙරෙන අතර 2023 ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ කරන ලද මෙහි මුළු පිරිවැය රු. මිලියන 2,140 කි. ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 97%ක් වේ. නව හබරණ-නව අනුරාධපුර කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය සඳහා වූ සිවිල් ඉදිකිරීම් කටයුතු, කුළුණු ඉදිකිරීම සහ රැහැන් එළීම් කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පවතින අතර, මෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,695කි. 2024 නොවැම්බර් සිට 2026 මැයි දක්වා වූ කාලරාමුවක් තුළ ලංකා විදුලිබල මණ්ඩලයේ අරමුදල් යටතේ ක්‍රියාත්මක කෙරේ. කුළුණු, සන්නායක, පරිවාරක සහ ලෝහ වැනි දෘඪ උපාංග වැනි ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම සහ ඉදිකිරීම් භූමිය වෙත භාර දීම සිදු කෙරෙනු ඇති අතර ඉදිකිරීම් භූමිය සකස් කිරීම, මාර්ග අවසර ලබාගැනීම සහ මූලික පාරිසරික පරීක්ෂණ (IEE) නිෂ්කාශන සිදුවෙමින් පවතී. මාර්ග ඉදිකිරීම් කටයුතු සඳහා 2024 අගෝස්තු 21 වන දින ලංසු විවෘත කරන ලදී.

### 1.4.4. ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීම

**i. වසර 2030 වන විට මෙරට ස්ථාපිත ධාරිතාවෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මඟින් ලබාගැනීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම**

විදුලිබල ක්ෂේත්‍රය සඳහා රජය විසින් ගෙන ඇති ජාතික ප්‍රතිපත්ති ඉලක්කය සාක්ෂාත් කර ගැනීම උදෙසා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය කිරීම පසුගාමී වීම මගහරගවා ගැනීමට සහ එය වේගවත් කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් සහ යොමු කිරීම් අදාළ ආයතනය වෙත ලබාදීමට මෙම අමාත්‍යාංශය විසින් පියවර ගෙන ඇත. මෙහිදී සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (SPPA) යටතේ ක්‍රියාත්මක වන මෙගවො 10 හෝ ඊට අඩු ධාරිතාවකින් යුත් සෑම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක්ම ඇගයීම සහ විදුලි ජාලක සබඳතාව ලබාදීම ක්‍රමවත් කිරීම සඳහා යාන්ත්‍රණයක් පිහිටුවා ඇත.

මෙම යාන්ත්‍රණය 2024.04.20 දින සිට බලපැවැත්වෙන අතර මේ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධකයින් ඔවුන්ගේ කාර්ය සාධනය අනුව ශ්‍රේණිගත කිරීමට වෙබ් පදනම් වූ ස්වයං ඇගයීමක් සිදුකළ හැකි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර ඇත.

**ii. සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම (SPPA)**

1999 දී රජය විසින් ගෙන ඇති පරිපාලනමය තීරණයක් මත සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම බලාගාර ධාරිතාවය මෙගාවොට් 10 කට සීමා වී ඇත. ඒ අනුව, 1996 වර්ෂයේ සිට මේ දක්වා බලාත්මකව පැවති සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම සංශෝධනය කිරීම 2024.03.11 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාරව සිදු කර ඇත. මෙහිදී, නීතිපතිගේ නිෂ්කාශන ලබා ගැනීමෙන් අනතුරුව ගිවිසුමෙහි අඩංගු වගන්ති සමාලෝචනය කර ව්‍යාපෘති සංවර්ධකයාට සහ සම්ප්‍රේෂණ බලපත්‍රලාභියාට යන දෙපාර්ශවයටම යෝග්‍ය වන ලෙස සංශෝධනයන් සිදු කර ඇත.

එසේම, ව්‍යාපෘති ආයෝජකයින්ගේ නැඹුරුව වැඩි කර ගැනීම සඳහා සහ ව්‍යාපෘති බැංකුකරණ අංශයන් පිළිබඳ ණය දෙන්නන්ගේ ඇගයීම් ශීඝ්‍රයෙන් වෙනස් වී ඇති හෙයින් පැවති සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමෙහි සිදුවිය යුතු සංශෝධනයන් පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා යෝජනා සමාලෝචනය කර සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට සංශෝධන ඇතුළත් කර ඇත.

**iii. පුනර්ජනනීය බලශක්ති සඳහා වන ගාස්තු සංශෝධනය කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 43(4) ආ වගන්තියේ විධිවිධාන සහ එහි පසු සංශෝධන ප්‍රකාරව, මෙගාවොට් 10 හෝ ඊට අඩු ධාරිතාවයකින් යුත් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, තාක්ෂණය මූලික කරගත්, පිරිවැය පාදක අවශෝෂක ගාස්තු ක්‍රමවේදයක් යටතේ සම්මත විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමකට එළඹීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, 2022 වර්ෂයේදී මෙරට තුළ උද්ගතව තිබූ ආර්ථික පසුබෑම මත පදනම්ව පුනර්ජනනීය බලශක්ති සංවර්ධකයින් වෙත ලබා දී ඇති බලශක්ති මිලදී ගැනීමේ ගාස්තු වර්තමානය වන විට යථාතත්ත්වයට පැමිණ ඇති ආර්ථිකය හමුවේ විද්වත් කමිටුවක් විසින් සමාලෝචනය කිරීමෙන් අනතුරුව 2024.07.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංශෝධනය කර ඇත.

එමෙන්ම, වෙළඳපොලේ පවතින ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් සූර්ය පියැසි පද්ධති මගින් ජනිත විදුලිය මිලදී ගැනීමේ සමතල ගාස්තු විකල්පය (Flat Tariff Option) හඳුන්වා දෙමින් මෙතෙක් පැවති ගාස්තු සංශෝධනය කර ඇති අතර එය 2024.07.01 දින සිට බලාත්මක වේ.

තවද, අවශ්‍ය ස්ථාපනය කිරීම් සහ ප්‍රතිසංස්කරණය කිරීම් සමගින් සවිගැන්වීමෙන් පසු කුඩා ජල විදුලි බලාගාරයකට වසර 40ක් දක්වා ඔරොත්තු දීමේ හැකියාව පවතින බැවින් වළකාලන ලද පිරිවැය මූල ධර්මය යටතේ කුඩා ජල විදුලි බලාගාර සංවර්ධනය සඳහා අත්සන් කරන ලද සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් කල් ඉකුත් වන දිනයේ සිට තවත් වසර 20 ක් දක්වා

දීර්ඝ කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයට 2018.08.28 දිනැතිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමිව ඇත

එම තීරණය ප්‍රකාරව, 2011 වසරේ පටන් සිය වසර 15ක කාල සීමාව සම්පූර්ණ වන සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමක් සහිත කුඩා ජල විදුලි බලාගාර සඳහා විදුලි බලාගාරයේ බලාගාර සාධකය මත පදනම්ව ගාස්තු අයගණන් 2024.03.04 දිනැතිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලබා දී ඇත.

### iv. විදුලි ගාස්තු සංශෝධනය

2023.01.09 සහ 2023.02.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, රාජ්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ට අනුකූලව අර්ධ වාර්ෂික පදනමින් (සෑම වර්ෂයකම ජනවාරි 01 සහ ජූලි 01) පිරිවැය පාදක ගාස්තු ක්‍රමයක් මගින් විදුලි ගාස්තු සමාලෝචනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත.

ගාස්තු සංශෝධන කිරීමේ කාල සීමාව මාස 6 සිට මාස 3 දක්වා (අර්ධ වාර්ෂික සිට කාර්තුමය පදනම දක්වා), එනම් උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ පිරිවැය සැලකිල්ලට ගනිමින් සෑම වසරකම ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල 01 වන දින ගාස්තු සංශෝධනය කිරීමට හැකිවන පරිදි ගාස්තු සංශෝධන සීමා කිරීම සිදු කරන ලදී. ප්‍රතිපත්ති මාර්ගෝපදේශන සංශෝධනය කිරීම සඳහා 2023.10.30 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර විදුලි ගාස්තු සංශෝධනය කාර්තුමය පදනම මත සිදු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් 2023.12.12 දින මහජන උපදෙස් විමසීම සිදු කරන ලදී.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද පිරිවැය දත්ත සහ මහජන උපදෙස් විමසීමේ දී ඉදිරිපත් වූ යෝජනාවන්හි සමාලෝචනය පිළිබඳව සලකා බලමින්, 2024.03.05 දින සිට සමස්ත ගාස්තුව 21.93% කින් අඩු කිරීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම පිණිස, ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් 2024.02.18 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත සටහනක් ඉදිරිපත් කළ අතර, 2024.02.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කෙරිණි.

සිදුකළ අධ්‍යයනයකින් අනතුරුව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ජල විදුලි උත්පාදනය වැඩිවීම සහ නඩත්තු හා පුනරුත්ථාපන කටයුතු හේතුවෙන් ඇති වූ පිරිවැයේ අඩුවීමෙහි වාසිය විදුලි පාරිභෝගිකයින් වෙත ලබා දීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. 2024.06.19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් සලකා බලන ලද අතර 2024 වර්ෂය සඳහා වූ දෙවන විදුලි ගාස්තු සංශෝධනය මඟින් 2024.07.16 දින සිට ක්‍රියාත්මක පරිදි විදුලි බිල්පත 22.5% කින් අඩු කරන ලදී.

### v. විදුලිබල අංශයේ ආයතනික ප්‍රතිසංස්කරණ

2024.04.04 දිනැතිව යොමුකරන ලද අංක 24/0692/621/037-II දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම, අනුමැතිය සඳහා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සහ ඉන් අනතුරුව එම පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව, 2024.04.17 දින ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පරිපූරකයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත 2024.06.06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමෙන් පසු, 2024 ජූනි මස 27 දින පාර්ලිමේන්තු පනතක් බවට පත්ව ඇත.

2024.07.15 දිනැති අංක 24/1421/621/071 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බැලීමෙන් අනතුරුව, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 3 (4) උපවගන්තිය ප්‍රකාරව ජාතික විදුලිබල උපදේශක සභාව (NEAC) පත් කිරීමට සහ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 10 (1) (ආ) උපවගන්තිය ප්‍රකාරව ජාතික පද්ධති මෙහෙයුම්කරු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ජාතික විදුලිබල උපදේශක සභාවෙහි සභාපති/සාමාජිකයින් සහ ජාතික

පද්ධති මෙහෙයුම්කරු හි අධ්‍යක්ෂ මණ්ඩලය 2024.08.01 දින පත් කරන ලදී.

2024.07.22 දිනැති අංක 24/1421/621/071 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බැලීමෙන් අනතුරුව, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ විධිවිධාන අනුව විදුලිබල ක්ෂේත්‍රයේ යෝජිත ප්‍රතිසංස්කරණ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පැවරුම් සැලැස්ම සකස් කිරීමේදී අත්‍යවශ්‍ය පියවරක් වන ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම්වල මූලික තක්සේරුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉටුකරවාග ැනීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

**vi. ලංකා විදුලිබල මණ්ඩලය සතුව පවතින ඉඩම්වල අයිතිය තහවුරු කිරීම**

"ලංකා විදුලිබල මණ්ඩලය සතුව පවතින ඉඩම්වල අයිතිය තහවුරු කිරීම" යන මැයෙන් 2023.01.05 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාළ 2023.01.23 දිනැති අංක 23/0080/621/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලංකා විදුලිබල මණ්ඩලය (CEB) වෙත ඉඩම් කට්ටි විධිමත් ලෙස පවරාදීමේ ක්‍රමවේදයක් පිළිබඳ ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යාංශ දෙකෙහිම ලේකම්වරුන්ට නියෝග කරන ලදී.

### 1.4.5. 2024 වසර තුළ අමාත්‍යාංශය විසින් අත් කරගත් අනෙකුත් ජයග්‍රහණ

i. ඉන්දු - ශ්‍රී ලංකා විදුලිබල ජාල අතර අන්තර් සම්බන්ධතාව ක්‍රියාවට නැංවීම සඳහා වූ ව්‍යවස්ථාපිත නියාමන අනුකූලතාව සහ නිෂ්කාශනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඉන්දියාවේ පවර් ග්‍රිඩ් කෝපරේෂන් ලිමිටඩ් සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවලින් එකඟතාවන් සහ අභිමතය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමෙන් අනතුරුව ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගෙන ඇත.

ii. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම මත, බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල බහු ආංශික තාක්ෂණික ආර්ථික සහයෝගීතාව සඳහා වන එකමුතුව (BIMSTEC) මගින් 2024 වර්ෂයේදී (උක්ත කාල සීමාව තුළ) සිදුකරනු ලැබූ වැඩසටහන් යටතේ ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය සඳහා නියමිතව තිබූ කාර්යයන් ඉටු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ඒ අනුව, 2024.05.28 දින ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා සහ ගරු සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2024.06.11 දිනැති අංක 24/1050/621/052 දරන ඊට අදාළ තීරණය ලබා දී ඇත. එහි සඳහන් පරිදි, ඉඩම්වල අයිතිය පැවරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් සකස් කරන ලද අතර නැවත ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

iii. විදේශ කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම මත, විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දකුණු ආසියාතික කලාපීය සහයෝගීතා සංවිධානය (SAARC) විසින් මෙහෙයවනු ලබන කටයුතු, ක්‍රියාකාරකම් සහ රැස්වීම් සඳහා සහභාගී වීමට සහ එකඟතාව පළ කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම සිදු කර ඇත. විශේෂයෙන් SAARC බලශක්ති මධ්‍යස්ථානය සමඟ ශ්‍රී ලංකාවේ සාමාජිකත්වයට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

iv. විදුලිබල අංශයේ ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් අධීක්ෂණය කිරීම-

විදුලිබල (විදුලිබල) අංශය සඳහා වන ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 5ක් පවතී. ඒවා නම්;

- සූර්ය PV පද්ධති, සුළං, ජලවිදුලි සහ තිරසර ජෛව ස්කන්ධ පාදක විදුලි උත්පාදනය කිරීම් ඉහළ නැංවීම මගින් ජාතික විදුලි උත්පාදන මිශ්‍රණයට ඇති පුනර්ජනනීය බලශක්ති දායකත්වය වැඩි කිරීම (ඉලක්කය: මෙතෙක් පැවති ආකාරයේදී සලකා බලන

ලද පුනර්ජනනීය බලශක්ති ධාරිතාවයට වඩා මෙ.වො. 3,867 වැඩි අතිරේක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් සංවර්ධනය කිරීම, එයින් ආසන්න වශයෙන් මෙ.වො. 950ක් කොන්දේසි විරහිත පදනමින් ද, මෙ.වො. 2,917ක් කොන්දේසි සහිත පදනමින් ද සිදුකෙරේ)- 2024/11/30 දින වන විට මුළු ධාරිතාව සුළං බලාගාර මගින් මෙ.වො. 267 ක්, සූර්ය පියැසි මත සහ භූමිය මත සවිකර ඇති පද්ධතිවල සූර්ය බලශක්තිය මගින් මෙ.වො. 1,460 ක්, තිරසර ජෛව ස්කන්ධ ප්‍රභව මගින් මෙ.වො. 59 ක් සහ ප්‍රධාන ජල විදුලි සහ කුඩා ජල විදුලි බලාගාර මගින් පිළිවෙලින් මෙ.වො.1535ක් සහ මෙ.වො.430ක් ද ලෙස පද්ධතියට එක් කර ඇත

- ජාතික බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය කිරීමේ (EEI&C) වැඩසටහනක් තුළින් බලශක්ති කාර්යක්ෂම උපකරණ, තාක්ෂණයන් සහ පද්ධති වැඩිදියුණු කිරීම් ප්‍රවර්ධනය කිරීම හරහා ඉල්ලුම් පාර්ශ්ව කළමනාකරණ (DSM) ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම.- මේ වනවිට ශීතකරණ 250ක් පරීක්ෂා කර විශ්ලේෂණය කිරීම, සංයුක්ත ප්‍රතිදීප්ත පහන් (CFL) සඳහා, සිවිලිම් විදුලි පංකා සහ LED ලාම්පු සඳහා බලශක්ති ලේබල්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකෙරෙමින් පවතින අතර ජා-ඇල පිහිටි ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී ජල පොම්ප පරීක්ෂා කිරීම් සිදුකරනු ලැබේ.

- දැනට පවතින ඉන්ධන පාදක ඒකාබද්ධ චක්‍රීය බලාගාර ස්වාභාවික වායු (NG) ඒවා බවට පරිවර්තනය කිරීම සහ කොන්දේසි සහිත පියවර වශයෙන් නව ස්වභාවික වායු බලාගාර ස්ථාපිත කිරීම (අවශ්‍ය යටිතල පහසුකම් ලැබුණු පසු)- මෙ.වො.350 සොබාධනවි ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරයේ මෙ.වො. 235 ගෑස් ටර්බයිනය මෙහෙවරෙහි යොදවා තිබෙන අතර මෙ.වො.115 වාෂ්ප ටර්බයින ඒකකය මේ වන විට ඉදි කෙරෙමින් පවතී.

- කොන්දේසි විරහිත පියවර ලෙස සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම් (මෙතෙක් පැවති තත්ත්වය හා සසඳන විට වසර 2030 වන විට 0.5% ක හානි අවමකරණයක් සිදුකිරීම) (ඉලක්කය - වසර 2021 - 2030 අතර ආසන්න වශයෙන් ගි.වො.පැ. 1,848ක බලශක්ති ප්‍රමාණයක් ඉතිරිකිරීම)- ක්‍රියාත්මක වෙමින් පවතී

- වාණිජමය වශයෙන් තවමත් පරිණතභාවයට ළඟා වී නොමැති සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ප්‍රභවයන් සඳහා නියමු පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකිරීම සහ කොන්දේසි සහිත පියවර ලෙස අනෙකුත් විදුලි ජාල ආධාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම- පොම්පකර ජලය ගබඩාකිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය (Pump storage feasibility study) අදියර 1 සහ අදියර 2 සම්පූර්ණ කිරීම, සහ මෙ.වො. 100/ මෙ.වො.පැ. 100 ජාල පරිමාණයේ පළමු බැටරි බලශක්ති ගබඩා පද්ධති ව්‍යාපෘතිය වෙනුවෙන් සඳහා මෙවර ආසියානු සංවර්ධන බැංකුව වෙතින් අරමුදල් සපයා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙගවො 2 ක පාවෙන සූර්ය බල ව්‍යාපෘතියක් කිරි ඉබ්බන් වැව හා චන්ද්‍රිකා වැව යන ස්ථාන වල ක්‍රියාත්මක කිරීම හා දත්ත රැස් කිරීම.

- ඉහත සඳහන් ඉලක්ක 5 න් සෑම එකක්ම, සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සමූහයකින් සහ අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන අඛණ්ඩ අධීක්ෂණයකින් සමන්විත වේ.

**1.4.6. 2025 වසර සඳහා අනාගත සැලසුම්**

**i. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් අරමුදල් සපයනු ලබන කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළේ සිට කොළඹ වරාය ග්‍රිඩ් උපපොළ දක්වා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ කි.වෝ. 220 දෙවන භූගත සම්ප්‍රේෂණ කේබලය ඉදිකිරීම**

කෙරවලපිටිය ග්‍රිඩ් උපපොළේ සිට කොළඹ වරාය ග්‍රිඩ් උපපොළ දක්වා කි.වෝ. 220 දෙවන භූගත සම්ප්‍රේෂණ කේබල් පද්ධතිය ඉදිකිරීම පිණිස ආසියානු යටිතල පහසුකම් ආයෝජන

බැංකුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය (කැ.ඒ) වෙත ඇ.ඩො. මිලියන 52 ක ණයක් ලබා ගැනීම සඳහා 2021.08.31 දින අමාත්‍ය මණ්ඩලය සංදේශයක් ඉදිරිපත් කරන ලදී. 2021.09.13 දින ඊට අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

කෙසේවුවද, රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුකොට ගනිමින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද උපදෙස් අනුව, 2024.11.20 දින ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවෙන් ශ්‍රී ලංකා රජය වෙත ණයක් ලබා ගැනීමට සහ ලංකා විදුලිබල මණ්ඩලය වෙත ණයක් ලෙස ලබා දීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලදී.

**ii. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) ස්වෛරීත්ව මූල්‍යකරණ අනුග්‍රහය යටතේ කි.වෝ. 220 නව හබරණ කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ මාර්ගය ක්‍රියාත්මක කිරීම. පිවිතුරු බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය - I (CEATP - I)**

යෝජිත මෙ.වො.120 සාම්පූර් සූර්ය බලාගාරයේ වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම හා සමගාමීව නව හබරණ සිට කප්පල්තුරෙයි දක්වා කි.වෝ.220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීමට මෙම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ. නව හබරණ කප්පල්තුරෙයි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉංජිනේරු,ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමට ජාත්‍යන්තර තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කරනු ලැබීමට, සහ මෙම ප්‍රසම්පාදනය කළමනාකරණය කිරීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් (CAPC) පත් කිරීමට 2024.07.29 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

**iii. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් අරමුදල් සපයනු ලබන "විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය" යටතේ විදුලි සම්ප්‍රේෂණ ජාලය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම.**

පුනර්ජනනීය බලශක්තිය පද්ධතියට අවශෝෂණයට කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන ජාතික විදුලි සම්ප්‍රේෂණ ජාලය සහ ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් නඩත්තු කරනු ලබන බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම සහ නවීකරණය කිරීම වෙනුවෙන් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 200 ක ණය පහසුකමක් ලබා දීමට ගිවිසුම් අත්සන් තබා ඇත.

ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (නිත්‍ය) වලින් ඇමරිකානු ඩොලර් මිලියන 150 ක ණය මුදලක් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබා දෙන අතර, ඇමෙරිකානු ඩොලර් මිලියන 50ක් ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත ලබා දෙනු ඇත.

**iv. ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය සිදුකෙරෙන මහා පරිමාණ ව්‍යාපෘතිවලට "සුළු වියදම් මූල්‍යනය පහසුකම" (SEFF) හරහා අනුග්‍රහය ලබාගැනීම සහ ඌනපූරණය කිරීම**

ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය සිදු කෙරෙන මහා පරිමාණ ව්‍යාපෘති සඳහා සහාය වීම පිණිස කුඩා පරිමාණයේ ක්‍රියාකාරකම් මාලාවක් සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීමට සුළු වියදම් මූල්‍යනය පහසුකම යටතේ අපේක්ෂා කරයි. යෝජිත මූල්‍ය පහසුකමේ විෂය පථය කොටස් දෙකකට බෙදා ඇත, එනම්.

ක්‍රියාකාරකම 1 - ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුද සන්දර්භය තුළ, මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතිය කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරමින්, ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය සිදුකරනු ලබන ව්‍යාපෘතින්හි තිරසරභාවය සහතික කිරීම සඳහා වන හදිසි පශ්චාත් ව්‍යාපෘති ඉදිකිරීම් නිම කිරීමේ පහසුකම් (ඇ.ඩො. මිලියන 15).

ක්‍රියාකාරකම 2- රට තුළ පුනර්ජනනීය බලශක්තිය සම්බන්ධ ප්‍රයත්නයන් සවිබල ගැන්වීම සඳහා වන අනුපූරක ව්‍යාපෘති - සැලසුම් කෙරෙන ව්‍යාපෘති සඳහා සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති පිළියෙල කිරීමේ සහාය ලබාදීම, පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම

සඳහා විදුලි පද්ධතියට සම්බන්ධිත බලශක්ති ගබඩා කිරීම, ඩිජිටල් විසඳුම් සහ පුනර්ජනනීය බලශක්ති පුරෝකථනය වැනි නව තාක්ෂණයන් ප්‍රදර්ශනය කෙරෙන නියමු ව්‍යාපෘති, මුහුදු ජල නිර්ලවණකරණ පවිත්‍රාගාරවලට සහාය ලබාදෙන සූර්ය ප්‍රකාශ වෝල්ටීයතා පද්ධති වැනි බහුආංශික මැදිහත්වීම් පිළිබඳ නියමු ව්‍යාපෘති, මෙහෙයුම් හා නඩත්තු (O&M) සිදුකෙරෙන නිම කර ඇති ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති සඳහා ධාරිතා ගොඩනැගීම සහ අතිරේක සහාය සැපයීම, වත්කම් කළමනාකරණය කිරීම සහ වැදගත් අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම (ඇ.ඩො.මිලියන 15).

සුළු වියදම් මූල්‍යනය පහසුකම යටතේ ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (නිත්‍ය) වලින් ඇ.ඩො. මිලියන 30ක ණය මුදලක් වාරික දෙකකින් මහා භාණ්ඩාගාර ඇපකර යටතේ සෘජුවම ලබාගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත බලය පැවරීමට තීරණය කර ඇත.

## 1.5 2024 වර්ෂය තුළ බලශක්ති අංශයේ කාර්යසාධනය

සමස්තයක් වශයෙන් ගත් කල ජනතාවගේ අවශ්‍යතා දිනෙන් දින ඉහළ යමින් පවතින අතර එම අවශ්‍යතා සපුරාලීම සඳහා ඉවහල්වන සාධක අතරින් ඛනිජ තෙල් ප්‍රමුඛස්ථානයක් ගන්නා බැවින්, රටෙහි ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලමින් කාර්යක්ෂම සේවයක් පාරිභෝගික ජනතාව ඇතුළු පාර්ශ්වකරුවන් වෙත සැපයීම අරමුණු කර ගනිමින් අවශ්‍ය ප්‍රතිපත්තිමය මගපෙන්වීම මෙම අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදී. 2024 වර්ෂය තුළ ගෝලීය ඉන්ධන මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි දක්වන ලද බලපෑම, දේශීය ඉන්ධන ඉල්ලුම සපුරාලීමට දක්වන ලද දායකත්වය, ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඛනිජ තෙල් ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධනයට අමාත්‍යාංශය ගනු ලැබූ ක්‍රියා මාර්ගවලට අදාළ කාර්යසාධනය සහ 2025 වර්ෂය තුළ ඉටු කිරීමට අපේක්ෂිත සැලසුම් මෙම පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇත.

### 1.5.1 බලශක්ති (ඛනිජ තෙල්) අංශය ලුහුඬින් - 2024

| | |
|---|---|
| සමස්ත පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය | - මෙ.ටො. 3,229,095 |
| සමස්ත බොරතෙල් ආනයනය | - මෙ.ටො. 1,518,726 |
| සපුගස්කන්ද පිරිපහදුවේ නිෂ්පාදනය | - මෙ.ටො. 1 ,445,529 |
| සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල ආනයන පිරිවැය | - ඇ.ඩො.මි. 3,265,151 |
| සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන වල අලෙවිය | - මෙ.ටො. 4,470,060 |
| ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව | - 1,434 |
| ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ත ගබඩා ධාරිතාවය | - මෙ.ටො. 440,147 |

### 1.5.2 ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

#### i. ගෝලීය ඛනිජ තෙල් මිල ප්‍රවනතා

ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජු බලපෑමක් සිදු කරන අතර, 2024 වසර තුළ ආසියා පැසිෆික් කලාපයේ බොරතෙල් සහ පිරිපහදු ඉන්ධන මිලෙහි පහත හැසිරීම් නිරීක්ෂණය කළ හැකිය.

වගුව 1.3
ආසියා-පැසිෆික් කළාප බොරතෙල් සහ පිරිපහදු කළ නිෂ්පාදන ප්‍රකාශිත මිල ගණන් - 2024

| මාසය | බැරලයක මිල (ඇමරිකන් ඩොලර්) | | | | |
|---|---|---|---|---|---|
| | පෙට්‍රල් 92 ඔක්ටේන් | පෙට්‍රල් 95 ඔක්ටේන් | ඔටෝ ඩීසල් | සුපර් ඩීසල් | බොරතෙල් |
| ජනවාරි | 91.195 | 95.978 | 102.832 | 101.162 | 83.32 |
| පෙබරවාරි | 95.591 | 100.161 | 106.523 | 104.983 | 77.68 |
| මාර්තු | 97.142 | 101.440 | 103.859 | 102.875 | 79.06 |
| අප්‍රේල් | 102.126 | 106.472 | 104.705 | 103.522 | 80.99 |
| මැයි | 91.130 | 95.498 | 97.318 | 95.753 | 84.52 |
| ජූනි | 87.935 | 93.078 | 98.085 | 97.642 | 89.14 |
| ජූලි | 92.134 | 96.541 | 99.303 | 98.994 | 83.93 |
| අගෝස්තු | 84.702 | 88.938 | 92.214 | 90.692 | 82.52 |
| සැප්තැම්බර් | 78.448 | 82.858 | 84.329 | 83.358 | 83.80 |
| ඔක්තෝබර් | 79.755 | 85.932 | 87.915 | 87.426 | 77.94 |
| නොවැම්බර් | 79.088 | 84.509 | 89.230 | 89.098 | 73.41 |
| දෙසැම්බර් | 81.352 | 84.640 | 88.473 | 88.905 | 74.87 |

මූලාශ්‍රය : S&P global commodity insights

2024 වර්ෂය තුළ ඉහත සඳහන් සිංගප්පූරු ප්ලැට්ස් (Singapore Platts) මිළගණන් සැළකිල්ලට ගැනීමේදී,

- බොරතෙල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 89.14 ක් ජූනි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 73.41 ක් නොවැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 80.93 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 102.23 ක් අප්‍රේල් මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 78.45 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 88.38 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- පෙට්‍රල් 95 ඔක්ටේන් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 106.47 ක් අප්‍රේල් මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 82.86 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර පෙට්‍රල් 95 ඔක්ටේන් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 93 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- ඔටෝ ඩීසල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 106.52 ක් පෙබරවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 84.33 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර ඔටෝ ඩීසල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 96.23 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.
- සුපර් ඩීසල් බැරලයක ඉහළම අගය වන ඇමරිකන් ඩොලර් 104.98 ක් පෙබරවාරි මාසයේදීත් අවම අගය වන ඇමරිකන් ඩොලර් 83.36 ක් සැප්තැම්බර් මාසයේදීත් වාර්තා වූ අතර සුපර් ඩීසල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකන් ඩොලර් 95.36 ක් ලෙස වසර තුළ හඳුනා ගන්නා ලදී.

### ii. ගෝලීය මිල ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල කෙරෙහි ඇති කරන ලද බලපෑම

ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් ආනයනික ඛනිජ තෙල් නිෂ්පාදන මත රඳා පවතින බැවින් ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් දේශීය ඉන්ධන මිල කෙරෙහි සෘජුවම බලපෑමක් ඇති කරනු ලැබේ. පෙට්‍රල් 92 ඔක්ටේන් සහ ඔටෝ ඩීසල් සඳහා ඉහළ දෛනික අලෙවියක් පවතින බැවින් එම ඉන්ධනවල ගෝලීය මිල උච්චාවචනයන් සෘජුවම දේශීය ඉන්ධන මිල කෙරෙහි බලපෑමක් ඇති කරනු ලැබේ. කෙසේවෙතත්, පෙට්‍රල්

95 ඔක්ටේන් සහ සුපර් ඩීසල්වල දෛනික අලෙවිය සුළු ප්‍රමාණයක් වන බැවින් ජාත්‍යන්තර මිල වෙනස් වූ පමණින්ම දේශීය මිල වෙනස් වීමක් දක්නට නොලැබේ. 2024 වර්ෂය තුළදී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඉන්ධන ආනයනය කිරීමේ දී මාසිකව දරන ලද පිරිවැයෙහි (Landed Cost) සාමාන්‍යය සැලකිල්ලට ගත් විට පෙට්‍රල් 92 ඔක්ටේන් බැරලයක් සඳහා ඇමරිකන් ඩොලර් 108.34 ක උපරිම පිරිවැයක් (Landed Cost) අප්‍රේල් මාසයේදීත් ඇමරිකන් ඩොලර් 83.66 ක අවම පිරිවැයක් (Landed Cost) සැප්තැම්බර් මාසයේදීත් දරා ඇත. තවද ඔටෝ ඩීසල් බැරලයක් සඳහා ඇමරිකන් ඩොලර් 109.51 ක උපරිම පිරිවැයක් (Landed Cost) මාර්තු මාසයේදීත් ඇමරිකන් ඩොලර් 86.82 ක අවම පිරිවැයක් (Landed Cost) සැප්තැම්බර් මාසයේදීත් දරා ඇත.

වගුව 1.4
**ඉන්ධන ආනයනය කිරීමේදී දරන ලද පිරිවැයෙහි සාමාන්‍ය මාසික අගය - 2024**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

| මාසය | බැරලයක සාමාන්‍ය ආනයන පිරිවැය (Landed Cost) (ඇ.ඩො.) | |
|---|---|---|
| | පෙට්‍රල් 92 ඔක්ටේන් | ලංකා ඔටෝ ඩීසල් |
| ජනවාරි | 94.73 | 106.95 |
| පෙබරවාරි | 100.28 | 106.95 |
| මාර්තු | 105.44 | 109.51 |
| අප්‍රේල් | 108.34 | 109.32 |
| මැයි | 102.29 | 101.34 |
| ජුනි | 93.17 | 103.23 |
| ජූලි | - | - |
| අගෝස්තු | 89.93 | 94.99 |
| සැප්තැම්බර් | 83.66 | 86.82 |
| ඔක්තෝබර් | 84.97 | 86.82 |
| නොවැම්බර් | 84.30 | 91.85 |
| දෙසැම්බර් | 87.27 | 92.30 |

මූලාශ්‍රය : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### 1.5.3 2024 වර්ෂය තුළ දේශීය ඛනිජ තෙල් සැපයුම සඳහා දක්වන ලද දායකත්වය

#### i. ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය සහ අලෙවිය

ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ විදේශ විනිමය අර්බුදය සමනය වීම සමඟම 2024 වසරේදී ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන කටයුතු විධිමත් විය. ඒ අනුව දේශිය ඛනිජ තෙල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2024 වර්ෂය තුළ දී බොරතෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදන 08 කින් මෙට්‍රික් ටොන් 4,747,821 ක ප්‍රමාණයක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව ඇතුළු ප්‍රධාන සැපයුම්කාර ආයතන පහ (05) විසින් ආනයනය කර සපයන ලද අතර ඒ සඳහා ඇමරිකන් ඩොලර් මිලියන 3,265,151 ක් වැය කර ඇත.

#### ii. ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජාතික ආර්ථිකයේ සියළු අංශයන්හි එනම් ප්‍රවාහන, විදුලි බල සැපයුම, කර්මාන්ත, කෘෂිකර්ම, ධීවර යනාදී අංශයන්හි ක්‍රියාකාරීත්වය බලශක්තිය සැපයුම මත රඳා පවතින බැවින් එම අංශවල සුමට ක්‍රියාකාරීත්වයක් පැවතීම සඳහා ඉල්ලුමට සරිලන සැපයුමක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව එක් එක් ඉන්ධන සැපයුම්කරු විසින් 2024 වර්ෂයේ දී ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය සඳහා දක්වන ලද දායකත්වය පහතින් දැක්වේ. 2024 වසරේදී සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය මෙට්‍රික් ටොන් 4,470,063 ක් විය.

වගුව 1.5
බනිජ තෙල් නිෂ්පාදන ආනයනය - 2024

| නිෂ්පාදනය | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | | ලංකා ඉන්දියානු තෙල් සමාගම | | සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම | | ආර්.එම්. පාර්ක් පුද්ගලික සමාගම | | යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන) | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන) | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන) | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන) | නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන පිරිවැය (ඇ.එ.ජ.ඩො. මිලියන) |
| බොරතෙල් | 1,518,726 | 982.729 | - | - | - | - | - | - | - | - |
| ලංකා ඔටෝ ඩීසල් | 547,378 | 381.099 | 286,197 | 213.325 | 151,884 | 114.96 | 104,270 | 75.577 | 15,137 | 11.334 |
| ලංකා සුපර් ඩීසල් | 26,945 | 19.805 | 11,140 | 8.366 | 6,067 | 4.75 | 6,283 | 4.839 | 2,958 | 2.227 |
| පෙට්‍රල් - 92 ඔක්ටේන් | 585,708 | 470.652 | 269,701 | 216.917 | 149,277 | 124.484 | 100,070 | 77.981 | 15,059 | 12.322 |
| පෙට්‍රල් - 95 ඔක්ටේන් | 19,540 | 16.706 | 12,570 | 10.538 | 5,133 | 4.311 | 5,926 | 5.136 | 2,937 | 2.518 |
| ගුවන් යානා ඉන්ධන | 315,811 | 245.417 | - | - | - | - | - | - | - | - |
| අඩු සල්ෆර් දැවිතෙල් (180 **CTS)** | 35,468 | 21.293 | 332,900 | 211.892 | 186,199 | - | - | - | - | - |
| මැරීන් ගෑස් තෙල් | - | - | 34,537 | 25.973 | - | - | - | - | - | - |
| එකතුව | **3,049,576** | **2,137.701** | **947,045** | **687.011** | **498,560** | **248.505** | **216,549** | **163.533** | **36,091** | **28.401** |

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම, යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම

වගුව 1.6
බනිජ තෙල් නිෂ්පාදන අලෙවිය - 2024

| නිෂ්පාදනය | අලෙවි ප්‍රමාණය (මෙ.ටො.) | | | | | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|
| | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ලංකා ඉන්දියානු තෙල් සමාගම | සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම | ආර්.එම්. පාර්ක් සමාගම | යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම | |
| පෙට්‍රල් - 92 ඔක්ටේන් | 804,419 | 253,821 | 157,631 | 81,710 | 17,064 | 1,314,645 |
| පෙට්‍රල් - 95 ඔක්ටේන් | 20,893 | 14,583 | 4,355 | 2,974 | 632 | 43,437 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,025,160 | 279,474 | 170,385 | 82,395 | 14,760 | 1,572,174 |
| ලංකා සුපර් ඩීසල් | 23,531 | 9,621 | 5,482 | 3,880 | 707 | 43,221 |
| ලංකා භූමිතෙල් | 134,580 | - | - | - | - | 134,580 |
| ලංකා කර්මාන්ත භූමිතෙල් | 4,134 | - | - | - | - | 4,134 |
| ලංකා රසායනික නැප්තා | 101,541 | - | - | - | - | 101,541 |
| ලංකා දැවි තෙල් 800 | 6 | - | - | - | - | 6 |
| ලංකා දැවි තෙල් 1500 (වැඩි සල්ෆර්) | 116,652 | - | - | - | - | 116,652 |
| ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්) | 155,816 | 306,262 | - | - | - | 462,078 |
| ලංකා දැවි තෙල් සුපර් | 155,857 | - | - | - | - | 155,857 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ගුවන් යානා ඉන්ධන | 468,158 | - | - | - | - | 468,158 |
| සොල්වන්ට් (SBP) ද්‍රාවණය | 1,161 | - | - | - | - | 1,161 |
| ද්‍රවීකෘත ඛනිජ තෙල් වායු | 19,676 | - | - | - | - | 19,676 |
| ලංකා AV ගෑස් | 132 | - | - | - | - | 132 |
| මැරීන් ගෑස් තෙල් | - | 32,608 | - | - | - | 32,608 |
| **එකතුව** | **3,031,716** | **896,372** | **337,853** | **170,959** | **33,163** | **4,470,063** |

මූලාශ්‍රඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම, යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම

### 1.5.4 2024 වර්ෂය තුළ ඉටු කරන ලද නියාමන කාර්යයන්

- **ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නව නියාමකයෙකු හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය සඳහා මෙතෙක් පුළුල් නියාමන යාන්ත්‍රණයක් නොතිබූ අතර, පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල්, ගුවන් යානා ඉන්ධන තෙල්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු (LPG) සහ ලිහිසි තෙල් ඇතුළු ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය, පිරිපහදු කිරීම, බෙදා හැරීම සහ අලෙවි කිරීම ඇතුළත් ඛනිජතෙල් කර්මාන්තය දැනට පවතින නීති රාමුව තුළ ක්‍රියාත්මක වේ. වර්තමානයේ ඛනිජ තෙල් වෙළඳපොළ ක්‍රියාකාරකම් පුළුල්වීමත් සමඟම නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීම හේතුවෙන්, නිෂ්පාදනවල ගුණාත්මකභාවය පවත්වාගෙනයාම සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ස්වාධීන නියාමකයෙකු සහ ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාවය පැන නැඟී ඇත.

ඒ අනුව, අංක 24/0691/621/038 හා 2024.04.25 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පසුභාග ඛනිජ තෙල් කර්මාන්තයට අදාළව ඵලදායී සහ කාර්යක්ෂම නියාමන යාන්ත්‍රණයක් හඳුන්වාදීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව විසින් පහත යෝජනා ඉදිරිපත් කරන ලදී.

- පසු භාග ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සහ අධීක්ෂණය සඳහා "ශ්‍රී ලංකා ඛනිජ තෙල් කර්මාන්ත නියාමන කොමිෂන් සභාවක්" පිහිටුවීම,
- ඛනිජ තෙල් කර්මාන්තය සඳහා නියාමන පනතක් සම්මත කිරීම,

අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීම සම්බන්ධයෙන් නව රජයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඛනිජ තෙල් කර්මාන්තය සඳහා ස්ථිර නියාමකයෙකු පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

- **ඉන්ධන පිරවුම්හල් ඉදි කිරීම සහ මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යාම පිළිබඳ මාර්ගෝපදේශ හඳුන්වා දීම.**

වර්ෂ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ විධිවිධාන ප්‍රකාරව ඛනිජ තෙල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආනයනය සහ බෙදාහැරීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) විසින් පමණක් සිදු කරන ලදී. කෙසේ නමුත් වෙළඳපොළ ලිහිල්කරණයත් සමඟ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (CPC) අමතරව, ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC)" සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම (Sinopec), ආර්.එම්.පාර්ක් පුද්ගලික සමාගම සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් ලංකා පුද්ගලික සමාගම යන ආයතන මඟින් ද ඉන්ධන ආනයනය සහ බෙදාහැරීම සිදු කරනු ලැබේ.

නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීමත් සමගම, ඉන්ධන පිරවුම්හල් ස්ථාපනය කර පවත්වාගෙන යාමේ අවම ප්‍රමිතීන් ආරක්ෂා කර ගැනීමට පහත ක්ෂේත්‍ර සඳහා මාර්ගෝපදේශ

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලදී.

- ඉන්ධන පිරවුම්හල් ස්ථානගත කිරීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල් ඉදිකිරීමේ නිර්ණායක
- ඉන්ධන පිරවුම්හල්වල මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමේ නිර්ණායක

මෙම මාර්ගෝපදේශ අනුගමනය කරන ලෙසට ඉන්ධන සැපයුම්කාර ආයතන දැනුවත් කර ඇති අතර, මහජනතාවගේ දැන ගැනීම සඳහා අමාත්‍යාංශ වෙබ් අඩවියේ මාර්ගෝපදේශ පළ කරන ලදී. තවද මෙම මාර්ගෝපදේශ අනුව නව ඉන්ධන සැපයුම්කාර ආයතන කටයුතු කරන්නේද යන්න පිළිබඳව අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

- **ඛනිජ තෙල් නිෂ්පාදන ඍජුවම පාරිභෝගික ආයතන වෙත සැපයීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම**

ඉන්ධන සැපයුම්කාර ආයතන විසින් දිවයින පුරා පිහිටි ඉන්ධන පිරවුම්හල් මඟින් සහ ඍජුවම පාරිභෝගික ආයතන වෙත ඉන්ධන බෙදාහැරීම සිදු කරනු ලැබේ. ඉන්ධන පිරවුම්හල් ස්ථාපිත කිරීම සඳහා බලශක්ති අමාත්‍යාංශයේ විධිමත් අනුමැතිය ලබා ගනු ලැබුවද ඍජුවම පාරිභෝගික ආයතන වෙත ඉන්ධන තොග සැපයීම සඳහා අනුමැතියක් අමාත්‍යාංශයෙන් ලබා නොගන්නා ලදී. 2023 ඔක්තෝබර් 31 වන විට ඉන්ධන සැපයුම්කාර ආයතන විසින් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන 3385 ක් පමණ පවත්වාගෙන යනු ලබන බව අමාත්‍යාංශයට නිරීක්ෂණය විය.

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන මඟින් සැලකිය යුතු ඉන්ධන ප්‍රමාණයක් දෛනිකව බෙදාහැරීම සිදු කරනු ලබන බැවින් පාරිභෝගික සේවා මධ්‍යස්ථාන පිහිටුවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඒ අනුව, දැනට ලියාපදිංචි වී ඇති පාරිභෝගික සේවා මධ්‍යස්ථාන අතරින් තවදුරටත් පවත්වා ගෙන යායුතු මධ්‍යස්ථාන සහ නව ආයතන ලියාපදිංචි කිරීම සඳහා අවම නිර්ණායක හඳුන්වා දීමට අමාත්‍යාංශය විසින් කටයුතු කරන ලදී. අවම නිර්ණායක සම්පූර්ණ කරනු ලබන පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සඳහා ඉන්ධන සැපයුම්කාර ආයතන මාර්ගයෙන් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලදී. 2024.12.31 දිනට ක්‍රියාත්මක පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව පහත වගුවේ පරිදි වේ.

වගුව 1.7
**පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව - 2024.12.31 දිනට**

| සැපයුම්කාර සමාගම | පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 1042 |
| ලංකා ඉන්දියානු තෙල් සමාගම | 170 |
| සිනොපෙක් එනර්ජි ලංකා සමාගම | 13 |
| එකතුව | **1,225** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම

- **ඉන්ධන මිල සූත්‍රය ක්‍රියාත්මක කිරීම**

දිගුකාලීනව පැවති අක්‍රමවත් ඉන්ධන මිලකරණ ක්‍රමවේදය තුළින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ දුන් අතර, කලින් කලට සිදු කරන ලද මිල සංශෝධනයන් මඟින් ද ඉන්ධන මිලෙහි විශාල උච්චාවචනයන් එකවර සිදු කරනු දක්නට ලැබිණි. මෙම තත්ත්වයන් මගහරවා ගැනීම අරමුණු කර ගෙන 2022 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි පිරිවැය ආවරණය වන මිලකරණ සූත්‍රයක් මඟින් ඉන්ධන මිල තීරණය කිරීමට රජය මූලික පියවර ගන්නා ලදී.

2024 වර්ෂයේ දී අවස්ථා එකොළහකදී (11) ඉන්ධන මිල සංශෝධනය කරන ලදී. 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ඉන්ධන මිල ගණන්වලට සාපේක්ෂව 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ඉන්ධන මිල ගණන් සැලකිල්ලට ගැනීමේ දී, පෙට්‍රල් (ඔක්ටේන් 92) 11% කින් ද පෙට්‍රල් (ඔක්ටේන් 95) 17% කින් ද ඔටෝ ඩීසල් 17% කින් ද සුපර් ඩීසල් 31% කින් ද සහ භූමිතෙල් 20% කින් ද ලෙස මිල ගණන්හි අඩුවීමක් දක්නට ලැබේ.

වගුව 1.8
2024 වර්ෂය තුළ වාර්තා වූ උපරිම සහ අවම වෙළෙඳපොළ මිල ගණන්

| නිෂ්පාදනය | උපරිම මිළ | අවම මිළ |
|---|---|---|
| පෙට්‍රල් (ඔක්ටේන් 92) | රු. 371.00 (පෙබරවාරි/මාර්තු/අප්‍රේල්) | රු. 309.00 (දෙසැම්බර්) |
| පෙට්‍රල් (ඔක්ටේන් 95) | රු. 464.00 (ජනවාරි) | රු. 371.00 (නොවැම්බර්/දෙසැම්බර්) |
| ඔටෝ ඩීසල් | රු. 363.00 (පෙබරවාරි/මාර්තු/ අප්‍රේල්) | රු. 283.00 (නොවැම්බර්) |
| සුපර් ඩීසල් | රු. 475.00 (ජනවාරි) | රු. 313.00 (නොවැම්බර්/දෙසැම්බර්) |
| භූමිතෙල් | රු. 262.00 (පෙබරවාරි) | රු. 183.00 (ඔක්තෝබර්/නොවැම්බර්) |

මූලාශ්‍ර: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ප්‍රස්තාරය 1.2
2024 වර්ෂය තුළ වාර්තා වූ වෙළෙඳපොළ මිල ගණන්















### 1.5.5 ඛනිජ තෙල් ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති

- **අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම**

හම්බන්තොට ආශ්‍රිතව අපනයන අභිමුඛ ඛනිජ තෙල් පිරිපහදුවක් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකසුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් 2023.02.24 දින සුදුසුකම්ලත් ආයෝජකයන් වෙතින් අභිලාෂ කැඳවන ලද අතර ඒ සඳහා ආයෝජකයින් හත්දෙනෙකු (07) සිය අභිලාෂ ප්‍රකාශ කරන ලදී. ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීමට ලක් කිරීමෙන් පසු විස්තරාත්මක යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආයතන දෙකක් සුදුසුකම් ලබන ලදී. එම ආයතන දෙක අතරින් චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් (M/s China Petroleum and

Chemical Corporation) සමාගම පමණක් විස්තරාත්මක යෝජනාව ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘති ඇගයීම් කමිටුව හා අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුව විසින් මෙම විස්තරාත්මක යෝජනාව සලකා බැලීමෙන් අනතුරුව, පිරිපහදුව ඉදිකර පවත්වාගෙන යාමට චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් ආයතනය සමග ගිවිසුම් ගත වීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව චයිනා පෙට්‍රෝලියම් සහ කෙමිකල් කෝපරේෂන් ආයතනය සමග ගිවිසුම් ගත වීම සඳහා සාකච්ඡා වට හතරක් පවත්වන ලද අතර සාකච්ඡා අවසන් අදියරේ පවතී.

**ව්‍යාපෘතියේ ප්‍රධාන ලක්ෂණ**

- අපේක්ෂිත ධාරිතාවය - දිනකට අවම බොරතෙල් බැරල් ලක්ෂයක් පිරිපහදු කිරීම
- අපේක්ෂිත ආයෝජනය - ඇ.එ.ජ.ඩො. බිලියන 1.5 ත් 2 ත් අතර
- ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂිත කාලය - (2024 - 2028)

මෙම ව්‍යාපෘතිය මගින් රට තුළ ඉන්ධන සුරක්ෂිතතාවය තහවුරු කිරීම, නව රැකියා අවස්ථා උදාකිරීම, ඛනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිත නව කර්මාන්ත අවස්ථා බිහිවීම මෙන්ම විදේශ විනිමය වාසියක් මෙරටට ලබා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය**

ත්‍රිකුණාමලයේ චීන වරායේ ඉහළ ටැංකි අංගනය, යටත් විජිත යුගයේ නැව් සඳහා ඉන්ධන සැපයීමට බ්‍රිතාන්‍ය රජය විසින් ඉදිකර ඇති අතර එය මෙ.ටො. 10,000 බැගින් වූ ටැංකි අනූ නවයකින් (99) සමන්විත ය. මෙම ඉන්ධන ගබඩා ටැංකි සංවර්ධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/2285/325/050 දරණ 2022.01.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් වසර 50 ක කාලයක් සඳහා පහත සඳහන් ආකාරයට බදු දීමට තීරණය විය.

- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) - ඉන්ධන ටැංකි 24
- ලංකා ඉන්දියානු තෙල් සමාගම (LIOC) - ඉන්ධන ටැංකි 14
- ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගම (TPTL) - ඉන්ධන ටැංකි 61

- **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ටැංකි 24 සංවර්ධනය කිරීමේ ප්‍රගතිය**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ත්‍රිකුණාමල ඉන්ධන තෙල් ටැංකි 24 සංවර්ධනය කිරීම සඳහා ඩොලර් මිලියන 20 ක් ඇස්තමේන්තු කර ඇති අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මූල්‍යනය කරමින් අදියර දෙකක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

2024.12.31 දින වන විට පහත කාර්යයන් නිම කර ඇත.

- අදියර-1 ටැංකි යාන්ත්‍රික පිරිසිදු කිරීම (ටැංකි 12)
- අදියර-2 ටැංකි යාන්ත්‍රික පිරිසිදු කිරීම (ටැංකි 09)
- ටැංකි ස්වස්ථතාව පරීක්ෂාව
- භූගෝලීය සහ ඡායාරූපමිතික ක්ෂේත්‍ර සමීක්ෂණය
- ජල නල මාර්ගය ඉදිකිරීම



යෝජිත පිරිපහදුවේ ආකෘතියක්

සිතියම 1.1
ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණයේ සිතියම




- **ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගමට අයත් ටැංකි සංවර්ධනය කිරීමේ ප්‍රගතිය**

ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇති ඉන්ධන ටැංකි 61 සංවර්ධනය කිරීමේ මූලික පියවර වශයෙන් පහත සඳහන් කටයුතු දැනටමත් සිදු කර ඇත.

- ඉන්ධන ටැංකි දහයක් (10) සඳහා ප්‍රවේශය ලබා දීමට අවශ්‍ය වන භූමි ප්‍රදේශය පිරිසිදු කිරීම
- බියුරෝ වෙරිටාස් ලංකා පුද්ගලික සමාගම වෙතින් මෙම තෙල් ටැංකි දහය (10) සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගැනීම
- ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇති අතර මෙහිදී දිගුකාලීන හා කෙටිකාලීන ලෙස සංවර්ධන උපාය මාර්ග හඳුනා ගැනීම

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීම සඳහා අභිලාශ කැඳවන ලද අතර ආයතන 05 ක් සිය යෝජනා ඉදිරිපත් කරන ලදී. අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ව්‍යාපෘති කමිටුව සහ සාකච්ඡා සම්මුති කමිටුව යෝජනා ඇගයීම් සිදු

### 1.5.6 ඉදිරි සැලසුම්

දේශීය බලශක්ති ඉල්ලුම සපුරාලීමේ දී පොසිල ඉන්ධන තවදුරටත් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන අතර, දේශීය බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ ගෝලීය බලශක්ති සැපයුමට ශ්‍රී ලංකාව දායක කිරීම අරමුණු කරගෙන 2025 වර්ෂය තුළ දී පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

- **පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ස්ථිර නියාමකයෙකු පත්කිරීම**

වර්තමානයේ ඛනිජ තෙල් වෙළඳපොළ ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟම නව තරඟකාරී ආයතන වෙළඳපොළට පිවිසීම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදනය, ගුණාත්මකභාවය පවත්වාගෙන යාම සහ පාරිභෝගික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ස්වාධීන නියාමකයෙකු සහ ශක්තිමත් නියාමන රාමුවක අවශ්‍යතාවය පැන නැගී ඇත. ඒ අනුව පසුභාග ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය සඳහා ස්ථිර නියාමකයෙකු පත්කිරීමට සැලසුම් කර ඇත.

- **සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම සහ නව පිරිපහදුවක් ඉදිකිරීම**

ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 25% ක් පමණ සපුගස්කන්ද පිරිපහදුව මඟින් සපයන

අතර විදේශ විනිමය මත වැඩි පීඩනයක් ඇති කරමින් ඉතිරි 75% ක් වූ පිරිපහදු ඛනිජ තෙල් අවශ්‍යතාවය ආනයනය මින් සපුරාලීමට සිදුව ඇත. දේශීය ඛනිජ තෙල් අවශ්‍යතාවය මෙරට පිරිපහදු මඟින් නිපදවීම අපගේ ප්‍රධාන අරමුණක් වන අතර ඒ සඳහා සපුගස්කන්ද පිරිපහදුව නවීකරණය කිරීම හෝ නව පිරිපහදුවක් ඉදිකිරීම ශක්‍යතාවය අනුව සිදු කරනු ඇත.

- **ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීම**

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් එළඹ ඇති ගිවිසුම් සලකා බලමින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි විසිහතර (24) සහ ත්‍රිකුණාමල ඛනිජ තෙල් පර්යන්ත පුද්ගලික සමාගම (TPTL ආයතනය) සතු ටැංකි හැට එක (61) ජාතික ආර්ථිකයට වාසිදායක ව්‍යාපාරික ආකෘතීන් යටතේ සංවර්ධනය කිරීමට පියවර ගැනීම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ටැංකි විසිහතර (24) සංවර්ධනය කිරීමට 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 4010 ක් වෙන් කර ඇත.

- **විද්‍යුත් වාහන ආරෝපනය සඳහා දිවයින පුරා ආරෝපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

ඉන්ධන පිරවුම්හල් ආශ්‍රිතව විද්‍යුත් වාහන ආරෝපන මධ්‍යස්ථාන පිහිටුවීමට ඉහළ විභවතාවයක් පවතින බවට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිදු කරන ලද අධ්‍යයනයක් අනුව අනාවරණය විය. ඒ අනුව දිවයින පුරා පිහිටි විභවතාවයක් සහිත ඉන්ධන පිරවුම්හල් ආශ්‍රිතව විද්‍යුත් වාහන ආරෝපන මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා සැලසුම් කර ඇති අතර 2025 වර්ෂය සඳහා රුපියල් මිලියන 100 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් මේ වෙනුවෙන් වෙන්කර ඇත.

- **ඉන්ධන ගබඩා ධාරිතාවය පුළුල් කිරීම**

රට තුළ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ඉන්ධන ගබඩා ධාරිතාවයක් පවත්වා ගත යුතුය. මෙම අවස්ථාව වන විට ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම මෙට්‍රික් ටොන් 440,147 ක සමස්ත ගබඩා ධාරිතාවයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙම ධාරිතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා පහත පරිදි නව ගබඩා ටැංකි ඉදි කිරීමට සැලසුම් කර ඇත.

වගු අංක 1.9
යෝජිත ගබඩා ටැංකි සංවර්ධන ව්‍යාපෘතිය

| විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය | අරමුදල් සම්පාදනය |
|---|---|---|
| කොලොන්නාව ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 64,000 කින් යුත් ටැංකි 06 ක් ඉදි කිරීම | රු.මිලියන 3374 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) |
| කොලොන්නාව ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 22,000 කින් යුත් ටැංකි 02 ක් ඉදි කිරීම | රු.මිලියන 1470.4 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) |
| මුතුරාජවෙල ඛනිජ තෙල් ගබඩා පර්යන්තය තුළ සමස්ත ධාරිතාවය ඝණ මීටර් 40,000 කින් යුත් ටැංකි 03 ක් ඉදි කිරීම | රු.මිලියන 3496 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) |

- **ඉන්ධන ප්‍රවාහන නල මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම**

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නල මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතී. මේ හේතුවෙන් ඉන්ධන කාන්දුවීම් මෙන්ම ඉන්ධන ගොඩබෑම සඳහා වැඩි කාලයක් සහ පිරිවැයක් දැරීමට සිදුව ඇත. එබැවින් ඉන්ධන ගොඩබෑම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම සඳහා නල මාර්ග ඉදිකිරීම සැලසුම් කරන ලදී.

වගු අංක 1.10
යෝජිත නල මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

| විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය | අරමුදල් සම්පාදනය |
|---|---|---|
| කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා අඟල් 18 ක විෂ්කම්භයකින් යුත් නල මාර්ගයක් ඉදිකිරීම | රු.මිලියන 2852.5 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) |
| කොලොන්නාව පර්යන්තයේ සිට කැළණිතිස්ස බලාගාරය දක්වා අඟල් 12 විෂ්කම්භයකින් යුත් නල මාර්ගයක් ඉදිකිරීම. | රු.මිලියන 1444 | ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (CPSTL) |
| ගුවන් යානා ඉන්ධන ප්‍රවාහනය සඳහා මුතුරාජවෙල සිට කටුනායක ගුවන් තොටුපොළ දක්වා නල මාර්ග යක් ඉදිකිරීම | රු.මිලියන 18000 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) |

## 1.6 2024.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

වගුව 1.11

2024 ප්‍රාග්ධන ප්‍රතිපාදනයන්හි මූල්‍ය ප්‍රගතිය, බලශක්ති අමාත්‍යාංශය - වැය ශීර්ෂය 119

| | වියදම් විස්තරය | | වෙන් කරන ලද ප්‍රතිපාදනය (රුපියල් මිලියන) | මූලධන වියදම් | |
|---|---|---|---|---|---|
| | | | | 31.12.2024 දිනට මුළු වියදම | % |
| | මෙහෙයුම් ක්‍රියාකාරකම් | | | | |
| | අමාත්‍ය කාර්යාලය | | | | |
| 1 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | ගොඩනැගිලි | 1.5 | - | - |
| | | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1.5 | - | |
| | | වාහන | 6 | 3.67 | 61 |
| 2 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | ලීබඩු හා කාර්යාලීය උපකරණ | 1.5 | 0.04 | 3 |
| | | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1.5 | 0.79 | 53 |
| | මුළු එකතුව | | **12** | **4.50** | **37** |
| | ආයතන හා පරිපාලන සේවා | | | | |
| 1 | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | ගොඩනැගිලි | 1 | 0.25 | 25 |
| | | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 0.68 | 0.67 | 98 |
| | | වාහන | 1 | 0.59 | 59 |
| 2 | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | ලීබඩු හා කාර්යාලීය උපකරණ | 1.2 | 0.88 | 73 |
| | | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2 | 1.6 | 80 |
| | | මෘදුකාංග වැඩිදියුණු කිරීම | 0.5 | - | - |
| | මුළු එකතුව | | **6.39** | **3.99** | **62** |
| | සංවර්ධන ක්‍රියාකාරකම් | | | | |
| 1 | ශ්‍රී.ලං.වි.ම මඟින් විදේශධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති වල ණය උපයෝජනය | | 30000 | 15437 | 51 |
| 2 | කොළඹ නගරයේ අපද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් විදුලිය උත්පාදන කිරීමේ ව්‍යාපෘතිය | | 2110 | 2110 | 100 |
| 3 | බලශක්ති අංශයේ ප්‍රධාන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ධාරිතා සංවර්ධන වැඩසටහන | | 22 | 0.56 | 3 |
| 4 | කොරියානු රජයේ ප්‍රධාන යටතේ ඉදිවන බැටරි බලශක්ති ගබඩා පද්ධති | | 2379 | - | - |
| 5 | රජයේ ගොඩනැගිලි අඩු ආදායම්ලාභී නිවාස ආගමික ස්ථාන සහ ජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා සූර්ය බල විදුලි පහසුකම් ස්ථාපනය කිරීම | | 5840 | 5353 | 92 |
| 6 | කුඩා දූපත් වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදි කිරීම | | 3600 | 328 | 9.1 |
| 7 | ශ්‍රී ලංකා බලශක්ති වැඩසටහන | | 1210 | 526 | 43 |
| 8 | චන්ද්‍රිකා වැව හා කිරිඉබ්බන් වැවෙහි 1MW පාවෙන සූර්ය බලශක්ති වැඩසටහන | | 1228 | 1143 | 93 |
| 9 | බලශක්ති කාර්යක්ෂමතාව සඳහා මධ්‍යගත වායු සමීකරණ පද්ධති ඉදි කිරීම | | 122 | 92 | 75 |
| 10 | බලශක්ති මෙවලම් නව්‍යකරණය කිරීමේ වැඩසටහන සඳහා වායු සමීකරණ රසායනාගාර ඉදි කිරීම | | 218 | 101 | 46 |
| 11 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ ධාරිතාවය හා හැකියාව පුළුල් කිරීම | | 743 | 662 | 89 |
| 12 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයෙන් ලැබෙන පරිත්‍යාග | | 114 | 99 | 87 |
| 13 | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | | 50 | 50 | 100 |
| 14 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය | | 20 | 16 | 80 |
| 15 | ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමණ සභාව | | 2 | 0.025 | 1 |
| | මුළු එකතුව | | **47,658** | **26,114** | **55** |

## දෙවන පරිච්ඡේදය

# ලංකා විදුලිබල මණ්ඩලය

1. **හැඳින්වීම**

ලංකා විදුලිබල මණ්ඩලය (CEB), රාජ්‍ය ව්‍යවසායක් ලෙස 1969 අංක 17 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති අතර ශ්‍රී ලංකාවේ විදුලිය ජනනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම නියාමනය කිරීම සඳහා කිහිප වරක් සංශෝධනය කර ඇත. 2013 අංක 31 දරන පනතින් සංශෝධිත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ ලංකා විදුලිබල මණ්ඩලය ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) යටතට පත් කරන ලදී. 2024 ජූනි 27 වන දින අනුමත කරන ලද 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත යනු නවතම ප්‍රතිසංස්කරණය වන අතර, එය ක්‍රියාත්මක වන දිනය මේ දක්වාද ප්‍රකාශයට පත්කොට නොමැත.

පසුගිය වසර 15 තුළ ශ්‍රී ලංකාවේ විදුලිය ඉල්ලුම වාර්ෂිකව 3.6% ක සාමාන්‍යයකින් වර්ධනය වී ඇති අතර, උපරිම ඉල්ලුම වාර්ෂිකව 1.7% කින් ඉහළ ගොස් ඇත. 2023 දී, ශුද්ධ ජනනය ගිගාවොට් පැය 15,576 ක් වූ අතර එය 2022 ට සාපේක්ෂව 2.3% ක අඩුවීමකි. 2023 දී උපරිම ඉල්ලුම මෙගාවොට් 2,415 ක අගයකට ළඟා වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 10.8% ක අඩුවීමකි. 2024 පළමු මාස දහය සඳහා, ශුද්ධ ජනනය ගිගාවොට් පැය 15,322 ක් වූ අතර උපරිම ඉල්ලුම මෙගාවොට් 2,673 ක් විය. මෙය පෙර වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 11% ක පහත වැටීමකි.

2. **මුහුණ පෑ අභියෝග සහ අනුගමනය කළ උපාය මාර්ග**

**විදුලිබල පද්ධති මෙහෙයුම් කටයුතුවලට අදාළ තාක්ෂණික අභියෝග හා ක්‍රමෝපායික මැදිහත්වීම්**

2024 වසර තුළදී, විදුලි අංශයේ සංකීර්ණ මෙහෙයුම් සහ උපාය මාර්ගික භූමි දර්ශනය කළමනාකරණය කිරීමේදී අභියෝග කිහිපයකට මුහුණ දීමට සිදුවිය. ලක්විජය විදුලි බලාගාරයේ (LVPS) ඒකක 02 හි අනපේක්ෂිත බිඳවැටීමක් වෙස්ට්කෝස්ට් විදුලි බලාගාරයේ සැලසුම් කළ නඩත්තු කාලසීමාවක් සමඟ සමපාත වූ අතර, සීමිත තාප උත්පාදනයත් සමඟ ඉල්ලුම සැලකිලිමත්ව කළමනාකරණය කිරීමට සිදු විය.

කාලගුණ දත්ත ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ජල විදුලි ජලාශවල පෝෂක ප්‍රදේශ සඳහා නිවැරදි ගලා ඒම් පුරෝකථනය කිරීම අඩාල වූ අතර, උච්චාවචනයන් විසඳීම සඳහා ශීඝ්‍ර ප්‍රතිචාර බැටරි ගබඩා කිරීම් යෙදවීමේ සැලසුම් සිදු කරන ලදී.

අඛණ්ඩ පුනර්ජනනීය බලශක්ති ජනනය මගින් ඉල්ලුම් පුරෝකථනය කිරීමට සංකීර්ණතාවයක් එක් කරන ලද අතර, තත්‍ය කාලීන දත්ත එකතු කිරීම හරහා දෘශ්‍යතාව වැඩි දියුණු කිරීමෙන් සහ පද්ධති පාලන මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති ඒකකයක් පිහිටුවීමේ යෝජනාව මගින් මෙය සමනය කරන ලදී.

විශේෂයෙන් දකුණු කලාපයේ විදුලි පද්ධතිය මේවන විට ස්ථායිතා ගැටලුවලට මුහුණ පා සිටී. මෙම අභියෝග විසඳීම සඳහා කොත්මලේ - නව පොල්පිටිය කිලෝවොට් 220 සම්ප්‍රේෂණ මාර්ගය ලබන වසරේ මෙහෙවරෙහි යෙදවීමට සැලසුම් කර ඇත. මෙම නව මාර්ගය මගින් ජාලයේ විශ්වසනීයත්වය සහ ස්ථායිතාව සැලකිය යුතු ලෙස වැඩි දියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදුලි බලාගාර සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍යකරණය ප්‍රධාන අභියෝගයක් වූ අතර, ආධාර සපයන ආයතන සමඟ අඛණ්ඩ සාකච්ඡා පැවැත්වීම සහ රජය මත රැඳියාව අඩු කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන දිරිගැන්වීම මගින් මෙම ගැටලුව විසඳන ලදී. සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය දීර්ඝ අනුමැති ක්‍රියාවලීන් අදාළ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමෙන් කාර්යක්ෂම කරන ලද අතර, මහජන විරෝධතා සහ අභිරුචි කණ්ඩායම්වල විරෝධතා ආශ්‍රිතව සක්‍රීය සම්බන්ධතා සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර අවශ්‍ය විය.

නිතර සිදුවන ප්‍රතිපත්ති වෙනස්වීම් සහ වෘත්තික සංක්‍රමණය හේතුවෙන් විශේෂඥ දැනුම රඳවා ගැනීමේ සහ අඛණ්ඩ ගුණාත්මකභාවය පවත්වාගෙන යාමේ අභියෝගවලට මුහුණ දීමට සිදු වී ඇත. මෙම ගැටලුව විසඳීම සඳහා, ආයතනය තුළ සේවකයන් දිරිගන්වමින් ඔවුන් කාර්යයනට සම්බන්ධ කරගැනීමේ සංස්කෘතියක් නිර්මාණය කිරීමේ වැදගත්කම වාර්තාව තුළ අවධාරණය කෙරේ. මෙයට දක්ෂතා ආකර්ෂණය කර ගැනීම සහ රඳවා ගැනීම සඳහා තරගකාරී වැටුප් ලබා දීම සහ නව තාක්ෂණයන් කෙරෙහි අවධානය යොමු කරන ශක්තිමත් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ. සේවක සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම සහ සහායක වැඩ පරිසරයක් ඇති කිරීම තුළින්, ආයතනය විසින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, අඛණ්ඩතාව සහතික කිරීම සහ උපාය මාර්ගික අරමුණු සමඟ ශ්‍රම බලකායේ හැකියාවන් පෙළගැස්වීම අරමුණු කරනු ලබයි.

ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) ව්‍යාපෘති සංවර්ධනය සැලකිය යුතු අභියෝගවලට මුහුණ දී ඇත. ප්‍රධාන වශයෙන් 2023 අනුමත කළ එකතු කළ අගය මත බදු පනත හේතුවෙන් විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා එකතු කළ අගය මත බදු සහනය ඉවත් කිරීම නිසා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම යටතේ නීති වෙනස්වීමකට තුඩු දී ඇත. ඊට අමතරව, රටේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් මෙම මුලපිරීම සඳහා විදේශ ණය මූල්‍යකරණය ලබා ගැනීම වඩ වඩාත් අපහසු වී ඇත. මෙම අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, ඉදිකිරීම් කටයුතු බාධාවකින් තොරව ඉදිරියට කරගෙන යා හැකි වන පරිදි එකතු කළ අගය මත බදු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම ඇතුළත් උපාය මාර්ගයක් ක්‍රියාත්මක කර ඇත. තවද, දැනට නිසි පරිශ්‍රමය දැරෙමින් පවතින අතර දේශීය බැංකු සමූහයක් ණය මූල්‍යකරණය සැකසීමේ ක්‍රියාවලියේ නිරතව සිටී.

**විදුලි අංශය කළමනාකරණයට අදාළ මූල්‍ය අභියෝග සහ උපාය මාර්ගික ප්‍රතිචාර**

ලංකා විදුලිබල මණ්ඩලයට මෑත වසරවලදී බාහිර සාධක වන ආර්ථික සීමා, ගාස්තු ව්‍යුහයන් සහ මෙහෙයුම් අකාර්යක්ෂමතා හේතුවෙන් විවිධ මූල්‍ය අභියෝගවලට මුහුණ පෑමට සිදුවිය. ඉහළ මූල්‍ය පිරිවැය සහ බැංකු සීමා කිරීම්වල සිට දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය (legacy debts) පියවීම් සහ විදේශ විනිමය හිඟයන් දක්වා විහිදෙන මෙම අභියෝග මගින් කාර්යක්ෂම ලෙස විදුලි උත්පාදනය සහ සැපයුම පවත්වාගෙන යාම ආශ්‍රිත මණ්ඩලය සතු හැකියාවට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලැබ ඇත. මෙම බාධක ජය ගැනීම සඳහා සම්පත් උපයෝජනය ප්‍රශස්තකරණය, මූල්‍ය බර අවම කිරීම සහ නියාමන පැනවීම් හා අනුගතව කටයුතු කරන බව සහතික කිරීම ඉලක්ක කොටගත් උපාය මාර්ගික ක්‍රියාමාර්ග ගණනාවක් ලං.වි.ම. විසින් ගෙන ඇත. ලං.වි.ම. විසින් මුහුණ පාන ලද ප්‍රධාන මූල්‍ය අභියෝග සහ ඒවාහි ප්‍රතිවිපාක සමනය පිණිස ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග පහත සටහන මගින් ගෙනහැර දක්වනු ලබයි.

| මුහුණ පෑ අභියෝග | ක්‍රියාත්මක කරන ලද උපාය මාර්ග |
|---|---|
| **අයක්‍රම ආදායම් උපයෝජනය:** ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ (PUCSL) මග පෙන්වීම් ප්‍රකාර අයක්‍රම ප්‍රතිශෝධනයන්ගෙන් ලැබෙන ආදායම ආශ්‍රිත උපරිම උපයෝජනයක් සහතික කිරීම | ශුන්‍යපාදක අයවැයකරණය යොදා ගනිමින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අවසර ලබාදී ඇති ආදායම වෙත මුදල් යෙදවීම සීමාවීම; ත්‍රෛමාසික ගැලපීම්ද සහිතව නොකඩවා මෙහෙයුම් වියදම් සහ මූලධන වියදම් අධීක්ෂණය |
| **ඉහළ මූල්‍ය පිරිවැය:** සැපයුම්කරුවන්ගේ ගාස්තු නොපියවීම හේතුකොට ගෙවන්නට සිදුවූ ප්‍රමාද ගාස්තු සහ ඉහළ කාරක ප්‍රාග්ධන ණය පිරිවැය. | දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය (legacy debts) පියවීම සඳහා ජලවිදුලි උපයෝජන තත්ත්වයන් සහ අඩුවූ පොළී අනුපාතික තත්ත්වයන්ගෙන් ලත් ලාභ උපයෝජනය කරන ලදි. පොළී අනුපාත අවම කරනු පිණිස ණය වාරයන් පිළිබඳ නැවත සාකච්ඡා කරන ලදි. |
| **තොග සැපයුම් ගනුදෙනු ගිණුම (BSTA):** මෙහෙයුම්කරණය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අවශ්‍යතාවනට අනුගත වීම නොකඩවා සිදු කිරීම | 2023 නොවැම්බර් මාසය වනවිට නිත්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් තොග සැපයුම් ගනුදෙනු ගිණුම වෙන් කරන ලදි; ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නව මග පෙන්වීම් මත පදනම්ව මෙහෙයුම් කටයුතු තාර්කිකකරණය කරන ලදි. |

| | |
|---|---|
| **මෙහෙයුම් වියදම්/ මූලධන වියදම් (OPEX/CAPEX) කළමනාකරණය:** ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අයකුම තීරණ මගින් පනවා ඇති පරිදි දැඩි මෙහෙයුම් වියදම්/ මූලධන වියදම් කළමනාකරණය. | අවසර ලබාදුන් ආදායම් සීමාවනට අනුගතව කටයුතු කළ යුතු බවට සීමා පැනවීම් සහ අනුමත වැය කාණ්ඩ වෙත අයවැය උපයෝජනය සීමා වීම. මෙම පරාමිතීන්ගෙන් පරිබාහිර ඕනෑම වියදමක් අත් හිටුවන ලදි. |
| **බැංකුකරණ සීමාවන්:** රජයේ බැංකු සමගින් සිදුකරන බැංකු පහසුකම් සීමා වීම හේතුකොට මූල්‍ය නම්‍යශීලීත්වය සීමා සහිත වීම. | මහජන බැංකුව සහ රජයේ බැංකු මත රඳා පැවැත්ම අවම කරමින් සෙසු වාණිජ බැංකු සමග විකල්ප මූල්‍ය පහසුකම් ලබාගැනීමේ හැකියාව පිළිබඳ සාකච්ඡා කරන ලදි. |
| **දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය (legacy debts) පියවීම:** පසුගිය දශකය පුරා පිරිවැය පිළිබිඹු කරන අයකුම නොපැවතීම හේතුකොට ඇතිවූ ණය කළමනාකරණය. | ලාභ, අනු ආයතන විකිණීම සහ දැනට ක්‍රියාත්මක ප්‍රතිව්‍යුහගතකරණ ප්‍රයත්නයන් හරහා දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය (legacy debts) කොටසක් පියවන ලදි. |
| **ගල් අඟුරු මිලදීගැනීම සඳහා ණය ලබා නොදීම:** ගල් අඟුරු ප්‍රසම්පාදනයට සඳහා මහජන බැංකුවෙන් කෙටි කාලීන ණය නොලැබීම හේතුවෙන් ප්‍රසම්පාදනයට බලපෑම් ඇතිවීම. | ගාස්තු ගෙවීමේ ප්‍රමාදයන් වළකාලනු පිණිස ලංකා බැංකු මූල්‍ය ලේඛන සහ නැව්තොග සඳහා දෛනික අරමුදල් වෙන් කිරීම භාවිතයෙන් ගල් අඟුරු ප්‍රසම්පාදන ගෙවීම් කළමනාකරණය කරගන්නා ලදි. |
| **ණය ශ්‍රේණිගතකරණයෙන් පහත වැටීම:** විදුලිබල ජනන යටිතල පහසුකම් සඳහා මූල්‍යකරණය කෙරෙහි වූ බලපෑම සහ මූල්‍ය ගාස්තු වාරික අගය ඉහළ යාම. | අරමුදල් කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සඳහා මුදල් සංචිතකරණය සහ වැයකිරීම සඳහා ප්‍රමුඛතාවය ලබාදෙ ලදී මූල්‍ය ධාරා සීමාකරණයන් පහසුකරනු පිණිස ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් සඳහා උපරිම ණය කාල සීමාවන් පිළිබඳ සාකච්ඡා කරන ලදි. |
| **විදේශ විනිමය (FOREX) හිඟවීම:** විදේශ විනිමය හිඟවීම හේතුකොට ගල් අඟුරු ප්‍රසම්පාදනයට අදාළ අවදානම් | විදේශ විනිමය අවශ්‍යතාවයන් සඳහා මහජන බැංකුව වෙත රඳා පැවැත්ම අවම කරවමින් විවිධ බැංකු හරහා විකල්ප විදේශ විනිමය අවස්ථා පවත්නේද යන කරුණ විමසා බලන ලදි. |
| **මෙහෙයුම් මූල්‍ය ධාරාව:** මූල්‍ය ධාරා අභියෝග සහ ඉතිරිව පවත්නා පාරිභෝගික ණය කළමනාකරණය. | දැඩි ණය පියවීම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර අයකර ගැනීමේ ප්‍රගතිය නොකඩවා අධීක්ෂණය කරන ලදි. අඛණ්ඩ විදුලිය සැපයුමක් පවත්වාගෙන යනු පිණිස අත්‍යවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදෙන ලදි. |
| **භාණ්ඩ තොග ලේඛන කළමනාකරණය:** ගල් අඟුරු, ඉන්ධන, අමතර කොටස් සහ බෙදාහැරීමේ ද්‍රව්‍ය වැනි තීරණාත්මක යෙදවුම් තොග පවත්වාගෙන යාම. | අතිරේක සාමාන්‍යාධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ භාණ්ඩ ලේඛන මට්ටම් සමාලෝචනය කරමින්, තොග රඳවා ගැනීමේ කාල පරිච්ඡේදය මාස තුනකට අඩු කරමින් යල්පිනූ භාණ්ඩ ඉවත් කිරීම සඳහා වැඩ කටයුතු සැලසීම සිදුකරන ලදි. |

## 3. සංවර්ධන කටයුතු ආශ්‍රිත ප්‍රගතිය

### අ. ජනන ව්‍යාපෘතිවල ප්‍රගතිය

වගුව 2.1
දැනට ක්‍රියාත්මක ජනන ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රගතිය | කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| 1 | මෙ.වො. 31 මොරගොල්ල ජල විදුලි බලාගාරය | ඉදිකිරීම් කටයුතු අවසන් අදියරෙහි සිදු කෙරෙමින් පවතී | 2025 දෙවන කාර්තුව |
| 2 | කෙරවලපිටිය මෙ.වො. 350 සොබාදනවි ස්වභාවික වායු සංයුක්ත චක්‍රීය බලාගාරය | ඉදිකිරීම් කටයුතු අවසන් අදියරෙහි සිදු කෙරෙමින් පවතී | වායු ටර්බයිනය 2024 අගෝස්තු මස මෙහෙවරෙහි යොදවන ලදි. |
| 3 | කොළොන්නාව මෙ.වො. 100 /100 පැ.මෙ.වො. බැටරි ගබඩාකරණ පද්ධතිය | අරමුදල් යොමු කරන ලදි යෝජනා ඉල්ලුම් ලේඛන සැකසුම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය | 2026 |
| 4 | කෙරවලපිටිය මෙ.වො. 350 සහස්දනවි ස්වභාවික වායු සංයුක්ත චක්‍රීය බලාගාරය | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් ආශ්‍රිත සාකච්ඡා කටයුතු සිදු වෙමින් පවතී | විවෘත චක්‍රීය -2026<br>සංයුක්ත චක්‍රීය -2027 |
| 5 | මෙ.වො. 200 ස්වභාවික වායු අභ්‍යන්තර දහන ඇන්ජින් විදුලි බලාගාරය | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව පත්කොට ඇත. | 2028 |
| 6 | කැළණිතිස්ස මෙ.වො. 130 වායු ටර්බයිනය | ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව නවතා ඇත | 2030 |

වගුව 2.2

දැනට ක්‍රියාත්මක සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රගතිය | කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| 1 | සියඹලාණ්ඩුව මෙ.වො. 100 සූර්ය විදුලි ව්‍යාපෘතිය | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම, සම්ප්‍රේෂණ ගිවිසුම හා ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම අත්සන් කොට ඇත. | 2025 අවසන් කාර්තුව |
| | | සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම් සිදු කෙරෙමින් පවතී. | |
| 2 | මන්නාරම මෙ.වො. 250 සුළං විදුලි ව්‍යාපෘතිය | විදුලි බලාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමට අපේක්ෂිතය. නීතිපති නිෂ්කාශනය ලැබීමට නියමිතය. | 2027 දෙවන කාර්තුව |
| 3 | පූනරින් මෙ.වො. 234 සුළං විදුලි ව්‍යාපෘතිය | විදුලි බලාගාරය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා වන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමට අපේක්ෂිතය. නීතිපති නිෂ්කාශනය ලැබීමට නියමිතය. | 2027 දෙවන කාර්තුව |
| | | සම්ප්‍රේෂණ පහසුකමට අදාළ විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට අදාළ සාකච්ඡා සහ මිල සාකච්ඡා සිදු කෙරෙමින් පවතී. | |
| 4 | සාම්පූර් මෙ.වො. 50 සූර්ය විදුලි ව්‍යාපෘතිය | ප්‍රසම්පාදන කමිටුව / අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව විසින් සංවර්ධක යෝජනාව අගයමින් පවතී. | 2026 අවසන් කාර්තුව |
| 5 | මන්නාරම මෙ.වො. 50 සුළං විදුලි ව්‍යාපෘතිය | ප්‍රසම්පාදන කමිටුව / අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව විසින් සංවර්ධක යෝජනාව අගයමින් පවතී. | 2026 අවසන් කාර්තුව |

වගුව 2.3

ටෙන්ඩර් කළ ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | බලාගාර සංඛ්‍යාව | මුළු ධාරිතාවය (මෙ.වො.) | ප්‍රගතිය | කටයුතු අවසන් වනු ඇතැයි අපේක්ෂිත දිනය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | **2024** | **2025** | **2026** |
| 1 | මෙ.වො. 90 X 1 සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය | 50 | 50 | මෙහෙවරෙහි යොදවන ලද - මෙ.වො. 1 x 45 බලාගාර | | 5 | |
| 2 | මෙ.වො. 10 පොළොන්නරුව සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය | 1 | 10 | ඉදි කෙරෙමින් පවත්නා - මෙ.වො. 1 x 5 බලාගාර | 10 | | |
| 3 | මෙ.වො. 30 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 1-5) | 2 | 5 | මෙහෙවරෙහි යොදවන ලදි | | 5 | |
| | මේවෝ 30 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය | 9 | 27 | විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලදුව, ඉදි කෙරෙමින් පවතී | | | 27 |
| 4 | මෙ.වො. 40 බිම නංවන ලද / පාවෙන සූර්ය පැනල විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො. 5 පරිමාණයෙන්) | 8 | 40 | අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතය | | 30 | 10 |

| අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | බලාගාර සංඛ්‍යාව | මුළු ධාරිතාවය (මෙ.වො.) | ප්‍රගතිය | කටයුතු අවසන් වනු ඇතැයි අපේක්ෂිත දිනය | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | මන්නාරම මෙ.වො20 සුළං විදුලි බලාගාර ටෙන්ඩරය (මෙ.වො 2.5-10 පරිමාණයෙන්) | 4 | 20 | අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත, විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමට නියමිතය | | 20 | |
| 6 | මෙ.වො. 70, ප්‍රත්‍යාවර්ථ ධාරා බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො1-5, ප්‍ර.ධා.) | 12 | 51 | අභිප්‍රාය ලිපි අත්සන් කොට ඇත ව්‍යාපෘති 6ක විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කොට (මෙ.වො. 26) ඉතිරි ව්‍යාපෘති 6 සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට නියමිතව ඇත. | | 51 | |
| | මෙ.වො. 70, ප්‍රත්‍යාවර්ථ ධාරා බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො1-5, ප්‍ර.ධා.) ප්‍රති-ටෙන්ඩර් කළ | 7 | 19 | ව්‍යාපෘති 6ක අභිප්‍රාය ලිපි අත්සන් කොට, එක් ව්‍යාපෘතියක අභිප්‍රාය ලිපිය අත්සන් කිරීමට නියමිතව ඇත. | | | 19 |
| 7 | මෙ.වො. 165, බිම නංවන ලද සූර්ය පැනල විදුලි බලාගාර (මෙ.වො 1-5, ප්‍ර.ධා.) | - | 165 | ටෙන්ඩර් ඇගයුම් කටයුතු සම්පූර්ණ කොට ඇත, එය පිරිනැමීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමට නියමිතව ඇත. | | | 165 |

**වගුව 2.4**
**ජාල පෝෂක ගාස්තු ක්‍රමය යටතේ එන ව්‍යාපෘති**

| ව්‍යාපෘති තාක්ෂණය | 2024 වසර | | 2025 වසර | 2026 වසර |
|---|---|---|---|---|
| | මෙහෙවරෙහි යොදවා ඇති (මෙ.වො.) | මෙහෙවරෙහි යෙදවීමට නියමිත (මෙ.වො.) | මෙහෙවරෙහි යෙදවීමට නියමිත (මෙ.වො.) | මෙහෙවරෙහි යෙදවීමට නියමිත (මෙ.වො.) |
| සූර්ය පැනල | 10 | 15 | 150 | 150 |
| සුළං | - | - | 10 | 10 |

## ආ. සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන් ප්‍රගතිය

දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය වගුව අංක - 2.5හි දක්වා ඇත.

වගුව 2.5
දැනට ක්‍රියාත්මක සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය

| ව්‍යාපෘතිය/ ශාඛාව | පැකේජය | පිරිවැය (ශ්‍රී ලං.රු. මිලියන) | 2024-10-31 දිනට භෞතික ප්‍රගතිය | කටයුතු අවසන් කෙරෙන දිනය |
|---|---|---|---|---|
| මහ කොළඹ සම්ප්‍රේෂණ සහ හානි අවමකරණ ව්‍යාපෘතිය | කෙරවළපිටිය සිට කොළඹ L දක්වා දෙවන කි.වෝ. 220 කේබලය ඉදිකිරීම | 13,055 | ~ | අගෝස්තු 2026 |
| | බැටරි බලශක්ති ගබඩාකරණ පද්ධතිය | 4,419 | 35.00% | දෙසැම්බර් 2025 |
| ත්‍රිකුණාමලය ගල් අඟුරු විදුලි ව්‍යාපෘතිය | හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය A කොටස උපපොළ ඉදිකිරීම | 6,958 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | හබරණ - වේයන්ගොඩ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘතිය B කොටස සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 17,770 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| හරිත විදුලිබල සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධන ආයෝජනය (අදියර 2) | පැකේජය 2/ B2 A කොටස - පාදුක්ක - හොරණ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 600 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | ව්‍යා.කළ.ඒ. 2-පැකේජය 8/B කොටස - අම්බලන්ගොඩ කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය, පන්නල කි.වෝ. 132/33 කොටුමා උපපොළ විශාලනය හා කි.වෝ. 132/33 මෙ.වෝ.ඇ. 31.5 අමතර තරාපැවි 2ක් සැපයුම | 1,740 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | "පැකේජය 9 : කෙරවළපිටිය කි.වෝ. 220 ස්විච්චිකරණ ස්ථානය" | 2,919 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය නංවාලීමට සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP)ඃ පැකේජය 7- A1 කොටසඃ පන්නිපිටිය කොටුමා උපපොළෙහි මෙ.වෝ.ඇ. 100 කැඩුම් ස්විච්චිකරණ ධාරිත්‍රකය ස්ථාපනය | 1,104 | 95.00% | දෙසැම්බර් 2024 |
| | විදුලි සැපයුම්හි විශ්වසනීයත්වය නංවාලීමට සහාය වීමේ ව්‍යාපෘතිය (SESRIP)ඃ පැකේජය 7- A2 කොටසඃ බියගම කොටුමා උපපොළෙහි ස්ථිතික වාර පද්ධතිය ස්ථාපනය | 1,681 | 100.00% | මැයි 2024 |
| ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය | පැකේජය 1ඃ කි.වෝ. 400, කි.වෝ. 220 සහ කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම | 13,003 | 84.00% | දෙසැම්බර් 2025 |
| | පැකේජය 2 ඃකොටුමා උපපොළ ඉදිකිරීම සහ විශාලනය | 7,418 | 91.00% | දෙසැම්බර් 2025 |
| | පැකේජය 3ඃ සම්ප්‍රේෂණ මාර්ග ඉදිකිරීම (කි.වෝ. 220, කි.වෝ. 132) | 12,000 | | කොන්ත්‍රාත්තුව අවසන් |
| | පැකේජය 4ඃ බෙදාහැරීමේ උපපොළ සහ කේබල ඉදිකිරීම (කි.වෝ. 33, කි.වෝ. 11, කි.වෝ. 0.4) | 4,594 | | කොන්ත්‍රාත්තුව අවසන් |

| | | | | |
|---|---|---|---|---|
| සම්ප්‍රේෂණ ඉදිකිරීම් ව්‍යාපෘති සම්ප්‍රේෂණ ව්‍යාපෘති | මැදගම - අම්පාර කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | 3,206 | 45% | ජනවාරි 2025 |
| | වික්ටෝරියා - රන්ටැඹේ කි.වෝ. 220 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම | 1,400 | 6% | දෙසැම්බර් 2024 |
| | අතුරුගිරිය - කොලොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය විශාලනය | 170 | 20% | ජුනි 2024 |
| | කොලොන්නාව - පන්නිපිටිය කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය නැවත ඉදිකිරීම | 960 | 10% | ජුනි 2024 |
| | කැළණිතිස්ස - කොලොන්නාව කි.වෝ. 132 සම්ප්‍රේෂණ මාර්ගය උස් කිරීම | 702 | 9% | අප්‍රේල් 2024 |
| | නව අනුරාධපුර කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 2x50 ප්‍රතිචාරකය සහ මන්නාරම කොටුමා උපපොළේ මෙ.වෝ.ඇ. 1x50 ප්‍රතිචාරකය ස්ථාපනය | 1,463 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | වගවත්ත කොටුමා උපපොළ (මෙ.වෝ.ඇ. 2x45 තරාපැවිය ද්විත්ව බස්බාර් සහිතව) ඉදිකිරීම | 1,898 | 99.00% | දෙසැම්බර් 2023 |
| | කැළණිතිස්ස කි.වෝ. 132 ගෑස් පරිවරණිත උපපොළ දීර්ඝ කිරීම | 464 | 98.00% | මාර්තු 2024 |
| | නව පොල්පිටිය ස්විච්චිකරණ ස්ථානයේ කීවෝ 220 ද්විත්ව බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග දෙකක් ඉදිකිරීම | 291 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | කොටුගොඩ විශාලන කටයුතු | 73 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | බලන්ගොඩ විශාලන කටයුතු | 67 | 55.00% | පෙබරවාරි - 2025 |
| | අතුරුගිරිය විශාලන කටයුතු | 15 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | රත්මලාන කොටුමා උපපොළේ කි.වෝ. 33 පෝෂක ස්ථාන දෙකක් ඉදිකිරීම | 148 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | රන්ටැඹේ ස්විච්චිකරණ ස්ථානයේ කි.වෝ. 220 ගෑස් පරිවරණිත උපපොළ ඉදිකිරීම | 2,809 | 6.00% | දෙසැම්බර් 2026 |
| | වික්ටෝරියා විදුලි බලාගාරයේ කි.වෝ.220 1 1/2 බ්‍රේකර් පද්ධතියක් ඉදිකිරීම | 229 | 80.00% | අප්‍රේල් 2025 |
| | රන්දෙණිය (උමා ඔය ජලවිදුලි ව්‍යාපෘතිය) ආශ්‍රිත කි.වෝ.132 ස්විච් අංගනය ඉදිකිරීම | 350 | 100.00% | කටයුතු සම්පූර්ණයි |
| | අම්පාර කොටුමා උපපොළේ කි.වෝ. 132 තනි බස්බාර් සම්ප්‍රේෂණ මාර්ග ස්ථානය ඉදිකිරීම | 85 | 8.00% | මාර්තු -2025 |
| | කොටුමා උපපොළ 14ක පැරණි ස්ථිතික පිළියවනයන් මාරු කිරීම | 212 | 28.00% | මාර්තු -2025 |
| | මතුගම කොටුමා උපපොළේ කි.වෝ. 33 පාර්ශ්වය ප්‍රතිසංස්කරණය | 595 | 9.00% | දෙසැම්බර්-2025 |
| | ආනියාකන්ද කොටුමා උපපොළ විශාලනය | 353 | 14.00% | දෙසැම්බර්-2025 |
| | චුන්නාකම් කොටුමා උපපොළ විශාලනය | 610 | 14.00% | දෙසැම්බර්-2025 |
| | නාඩුකුඩා කොටුමා උපපොළ විශාලනය | 1,526 | 5.00% | සැප්තැම්බර්-2025 |
| | කුකුළේගඟ ස්විච්චිකරණ අංගනය විශාලනය | 306 | 3.00% | අගෝස්තු-2025 |
| | නව අනුරාධපුර කොටුමා උපපොළ විශාලනය | 600 | 3.00% | ජුනි-2025 |

| | | | | |
|---|---|---|---|---|
| සම්ප්‍රේෂණ ව්‍යාපෘති | භාණ්ඩ ලබාගැනීම | 4,381 | 98.00% | මාර්තු 2025 |
| | සාම්පූර්-කප්පල්තුරේ සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පැකේජ 4□5□6□10 සහ 11ට අදාළ සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතාවයන් සඳහා අමතර කොටස් සහ මෙවලම් ලෙස ද්‍රව්‍ය/ උපකරණ ලබාගැනීම" | 3,400 | 12% | දෙසැම්බර්-2025 |
| විදුලි පද්ධති බලගැන්වීමේ සහ පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධකරණ ව්‍යාපෘතිය | පැකේජය 4A: ආසියානු සංවර්ධන බැංකු ණය අංක 3483-SRI සහ 3585-SRI ට අදාළ පැකේජ අංක 4□6□10 සහ 12 යටතේ සම්ප්‍රේෂණ ජාල අවශ්‍යතාවයන් සඳහා අමතර කොටස් සහ මෙවලම් ලෙස ද්‍රව්‍ය ලබාගැනීම | 3,633 | ලංසු කැඳවීමේ කාල සීමාව ඇතුළත | 2025 |

## ඇ බෙදාහැරීම් සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය

බෙදාහැරීම් සංවර්ධන වැඩසටහන් කටයුතු වලට අදාල ප්‍රගතිය වගුව 2.6 හි දක්වා ඇත.

**වගුව 2.6**
**බෙදාහැරීම් සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය**

| | කාර්යය | ඒකකය | බෙ.අ.1 | | | බෙ.අ.2 | | | බෙ.අ.3 | | | බෙ.අ.4 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2024 ඉලක්කය | 2024 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු) | 2025 ප්‍රක්ෂේපණය | 2024 ඉලක්කය | 2024 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු) | 2025 ප්‍රක්ෂේපණය | 2024 ඉලක්කය | 2024 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු) | 2025 ප්‍රක්ෂේපණය | 2024 ඉලක්කය | 2024 ප්‍රගතිය (ජනවාරි - අගෝස්තු) | 2025 ප්‍රක්ෂේපණය |
| 1 | මැ.වෝ. කුලුණ | කි.මී. | 11 | 1 | 12 | 60 | 26 | 66 | 19 | 6 | 26 | 11 | 4 | 7 |
| 2 | මැ.වෝ. කණුව (ලින්ක්ස්, රැකුන්, එල්ම් සහ භුගත) | කි.මී. | 105 | 49 | 142 | 222 | 124 | 154 | 36 | 13 | 67 | 50 | 34 | 61 |
| 3 | මැ.වෝ. කණුව (ගුවන් බන්ධිත කේබල හෙවත් ABC) | කි.මී. | 20 | 0 | 10 | 5 | 3 | 6 | 2 | 0 | 8 | 8 | 5 | 9 |
| 4 | අ.වෝ (ගුවන් බන්ධිත කේබල) | කි.මී. | 74 | 34 | 94 | 394 | 136 | 350 | 141 | 128 | 167 | 35 | 20 | 41 |
| 5 | මැ.වෝ. ප්‍රති-සන්නායකකරණය සහ පරිවර්තනය සම්පූර්ණ කළ යුතු (කුලුණ) | කි.මී. | 4 | 0 | 12 | 10 | 0 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 6 | මැ.වෝ. ප්‍රති-සන්නායකකරණය සහ පරිවර්තනය සම්පූර්ණ කළ යුතු (කණුව) | කි.මී. | 65 | 31 | 174 | 97 | 25 | 110 | 53 | 31 | 12 | 18 | 10 | 25 |
| 7 | අ.වෝ. පරිවර්තනය සම්පූර්ණ කළ යුතුව ඇත (පියසර සිට ගුවන් බන්ධිත කේබල දක්වා) | කි.මී. | 310 | 28 | 275 | 650 | 274 | 555 | 606 | 67 | 134 | 410 | 218 | 408 |
| 8 | ඉදිකිරීමට නියමිත බෙදාහැරීමේ උපපොළ (බෙදාහැරීමේ/ රිං/ රේඩියල් / නැවත බෙදාහැරීම) | ඒකක | 215 | 164 | 333 | 490 | 222 | 362 | 110 | 77 | 84 | 100 | 666 | 93 |
| 9 | ඉදිකළ යුතුව ඇති ප්‍රාථමික උපපොළ | ඒකක | 3 | 1 | 1 | 3 | 0 | 3 | 1 | 1 | 0 | 1 | 1 | 3 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | විශාලනය කළ යුතුවන ප්‍රාථමික උපපොළ | ඒකක | 5 | 3 | 2 | 3 | 2 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 11 | ඉදිකළ යුතුවන මැසි | ඒකක | 6 | 1 | 5 | 16 | 8 | 18 | 11 | 3 | 6 | 1 | 1 | 4 |
| 12 | විශාලනය / වෙනස් කළ යුතුවන මැසි | ඒකක | 2 | 0 | 1 | 11 | 1 | 6 | 0 | 0 | 0 | 1 | 0 | 0 |
| 13 | ස්ථාපනය කළ යුතුවන ස්වයං ප්‍රතිවැසුම්කරණයන් (අලුත් මැසිවලට හැර) | ඒකක | 22 | 8 | 14 | 37 | 31 | 40 | 15 | 7 | 20 | 14 | 5 | 13 |
| 14 | වෙනත් (නිශ්චිතව දක්වන්න) | ඒකක | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 6 | 2 | 10 |

සටහන : පිරිවැය ගෙවනු ලබන කාර්යයන් සහ විදුලිය සැපයුමේ විශ්වසනීයත්වය ප්‍රවර්ධන සහාය ව්‍යාපෘතිය යටතේ එන කාර්යයන් ඇතුළත් නොකරන ලදි.

## 4. ආයතනයේ මූල්‍ය තත්ත්වය

2024 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් වූ මාස දහයක කාලය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය (CEB) රුපියල් බිලියන 113.3 ක ශුද්ධ ලාභයක් (පාලිත සමාගම් විකිණීමෙන් ලද ලාභ හැර) වාර්තා කර ඇත. පසුගිය දශකය පුරා පහළ බැස තිබූ ලංකා විදුලිබල මණ්ඩලයෙහි මූල්‍ය කාර්යසාධනයේ මෙම වැඩිදියුණුව බොහෝ දුරට කාර්තුමය වශයෙන් සමාලෝචනය කර සංශෝධනය කරන ලද පිරිවැය-පිළිබිඹු කරන ගාස්තු ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් සිදු වී ඇත.

ජල විදුලි නිෂ්පාදනය ඉහළ යාම සහ ගල් අඟුරු හා ඉන්ධන මිල පහළ යාම හේතුවෙන් සෘජු ජනන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වීම ශුද්ධ ලාභය ශක්තිමත් කිරීමේ ප්‍රධාන සාධකයක් විය. තවද, රටේ පැවති ආර්ථික පසුබෑම ක්‍රමික ව යථාවත් වීම විදුලි ඉල්ලුම කෙරෙහි ධනාත්මකව බලපා ඇති අතර, එය සමස්ත ආදායම් වර්ධනයට දායක වී ඇත.

අතීතයේදී, පිරිවැය-පිළිබිඹු කරන ගාස්තු ක්‍රමයක් නොතිබීම සහ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ගාස්තු එකතු කිරීමේ ක්‍රියාවලියේ බාධා ඇති වීම ලංකා විදුලිබල මණ්ඩලයෙහි මුදල් ප්‍රවාහයන්ට දැඩි බලපෑමක් ඇති කළ අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) ඇතුළු ප්‍රධාන සැපයුම්කරුවන්ට ගෙවීම් ප්‍රමාද විය. මෙම ප්‍රමාදයන් හේතුවෙන් පොලී ගෙවීම් ඉහළ යාමට හේතු විය. කෙසේ වෙතත්, පිරිවැය-පිළිබිඹු කරන ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු, ලංකා විදුලිබල මණ්ඩලයෙහි මුදල් ප්‍රවාහය වැඩිදියුණු වූ අතර, එමගින් දීර්ඝ කාලයක් ගෙවීම් ප්‍රමාද වූ ණය (legacy debts) වලින් කොටසක් පියවීමට හැකි විය. මෙය ප්‍රමාද ගාස්තු හේතුවෙන් දැරීමට සිදු වූ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය. ඊට අමතරව, පොලී අනුපාත පහළ යාම මූල්‍ය පිරිවැය තවදුරටත් අඩු කිරීමට හේතු විය.

## 5. 2025 ඉදිරි සැලසුම්

වගුව 2.7
බෙදාහැරීමේ ජනන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රගතිය | කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනය |
|---|---|---|---|
| 1 | ජාතික පද්ධති පාලක මධ්‍යස්ථානයේ පුනර්ජනනීය බලශක්ති පාලක හා නිරීක්ෂක ඒකකය | අරමුදල් යොදවා ඇත. යෝජනා ඉල්ලුම් ලේඛනය සැකසීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිතය. | 2026 |
| 2 | මහව මෙ.වො. 600 පොම්ප ගබඩා විදුලි බලාගාරය | ශක්‍යතා අධ්‍යයන කටයුතු සපුරා ඇත. ව්‍යාපෘතිය අනුමැතිය පිණිස ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරේ. | 2034 |

වගුව 2.8

සම්ප්‍රේෂණ ව්‍යාපෘති

| | Project | Expected Year of Completion | Total Cost Estimate (LKR Million) | Financial Commitment Required for the Year 2025 (LKR Million) |
|---|---|---|---|---|
| **1** | DGM (සම්ප්‍රේෂණ ව්‍යාපෘති) | | | |
| | **පිරිසිදු බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය - 1 (CEATP -1)** | | | |
| | ලොට් – A<br>I නව හබරණ SS සිට කප්පල්තුරේ GS දක්වා 220kV ද්විත්ව පරිපථ සම්ප්‍රේෂණ මාර්ගය | 2027 | 12,863 | 1,950 |
| | ලොට් – B<br>II. නව හබරණ 220/132 kV ස්විචින් ස්ටේෂන් (2x220kV transmission line bays) | | | |
| | II. Modification of Kappalthurai 220/33 kV Grid Sub Station. | | | |
| | **පිරිසිදු බලශක්ති අවශෝෂණ සම්ප්‍රේෂණ ව්‍යාපෘතිය - 1I (CEATP- II)** | | | |
| | ලොට් A - (i) 132/33 kV 2 X 31.5 MVA වැලිමඩ ජාල උපපොල ඉදි කිරීම | | | |
| | (ii) 132/33 kV 2 X 31.5 MVA කිරියන්කල්ලිය ජාල උපපොල ඉදි කිරීම | | | |
| | (iii) Augmentation of New Chilaw GS | | | |
| | (iv) Augmentation of Puttalam GS | 2027 | 16,674 | 1,668 |
| | (v) Augmentation of Badulla & Laxapana GS | | | |
| | (vi) Augmenation of Samanalawewa & Embilipitiya GS | | | |
| | ලොට් B - (i) සමනල වැව අඹිලිපිටිය 132kV TL ධාරිතාවය වැඩි කිරීම | | | |
| | (ii) ධාරිතාවය වැඩි කිරීම - 74.5km ක ලක්ෂපාන 132kV TL වැඩි කිරීම | | | |
| | ලොට් C - පුත්තලම හලාවත ප්‍රතිසංස්කරනය කිරීම 132kV TL | | | |
| | **SKTDP** | | | |
| | සාම්පූර් ඉදි කිරීම - කප්පල්තුරේ 220kV ද්විත්ව පරිපථ ඔබ සහ සාම්පූර් 220/33kV GS එකතු කිරීම | 2026 | 7,896 | 7,106 |
| | **බල පද්ධති විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PSRSP): Ph II P 2 – මෙහෙයුම් ඒකක 1 (OU 01)** | | | |
| | වාරියපොල 220/132kV SS, ඉදි කිරීම, වාරියපොල - කුරුණෑගල 132kV ද්විත්ව පරිපථය 22km TL ඉදි කිරීම, හබරණ වේයන්ගොඩ 220kV TL සිට වාරියපොල 220kV TL දක්වා ඉන් අවුට් සම්බන්ධතාවය ඉදි කිරීම to 132kV GS KusSV3 (31km) | 2027 | 7,710 | 771 |
| | **බලශක්ති පද්ධති විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (PSRSP): Ph II P 2 - OU 02** | | | |
| | (i) ඒකල 132/33kV GS, කොටුගොඩ, කැලණිය සිට කි.මී. 4ක් දුරින් ද්විතුව ඇතුලත සහ පිටත සම්බන්ධතාවය 132kV TL | 2027 | 3,897 | 556 |
| | (ii) යක්කල 132/33kV GS, 132kV ද්විත්ව පරිපථ TL කිරිදිවැල GS සිට යෝජිත යක්කල GS දක්වා ආසන්න වශයෙන් 10km | | 3,226 | 479 |

| | | | | |
|---|---|---|---|---|
| | බලශක්ති පද්ධති විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය **(PSRSP): Ph II P 2 - OU 03**<br>132/11kV Kandy City GS, ඉදි කිරීම, Kandy City GS, සඳහා 6 km TL ඉදිකිරීම සහ උකුවෙල GSs වැඩිදියුණු කිරීම | 2027 | 6,150 | 900 |
| | Construction of 132/33kV,31.5MVA Weligama GS | 2027 | 3,824 | 520 |
| | Conductor Upgrading of Mannar - Vavuniya 220kV Transmission Line | 2026 | 690 (with Taxes) | 460 |
| 2 | GCT & DLRP Colombo City Transmision Network Development Project - Phase 2 | 2027 | 30,295 | - |
| 3 | Construction of Pannipitiya-Panadura 132kV Transmission Line with 2xZebra | 2027 | 2,020 | 406 |
| 4 | Construction of Panadura T- Matugama 132kV Transmission Line with 2xZebra | 2027 | 2,766 | 734 |
| 5 | Construction of Laxapana - Wimalasurendra 132kV Transmission Line with Zebra | 2027 | 683 | 181 |
| 6 | Reconstruction of Balangoda - Deniyaya -Galle 132kV Transmission Line with Zebra | 2027 | 6,439 | 1,708 |
| 7 | Installation of 300 Mvar STATCOM Unit at PADDUKA GSS | 2027 | 11,290 | 2,994 |
| 8 | Construction of Dehiwala - Ratmalana 132kV Underground Cable | 2027 | 4,679 | 1,241 |
| 9 | New Habarana-VAVUNIYA-N-COLLECTOR (220kV operational Stage) Transmission Line with 4xMoose | 2027 | 36,067 | 9,565 |
| 10 | Reconstruction of New Laxapana - Balangoda 132kV Transmission Line with Zebra | 2027 | 2,845 | 2,264 |
| 11 | Capacity enhancement of 132kV Lynx transmission lines to Zebra - Laxapana Complex | 2027 | 1,444 | 383 |
| 12 | Construction of Weligama 132/33 kV grid substation | 2027 | 2,423 | 643 |
| 13 | Development of New Habarana - PSPP- Kirindiwela 400kV Transmission Network | 2027 | 35,335 | 9,371 |
| 14 | Replacing Thulhiriya Capacitor Banks | 2027 | 154 | 123 |

# සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම

1. හැඳින්වීම

සීමාසහිත ලංකා විදුලි පුද්ගලික සමාගම (LECO) වර්ෂ 1982 අංක 17 සහ වර්ෂ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ වර්ෂ 1983 සංස්ථාපිත සීමිත වගකීම් සහිත සමාගමකි. එහි මූලික අරමුණ වන්නේ මීගමුව සිට ගාල්ල දක්වා ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ ප්‍රධාන ආර්ථික කලාපය ආවරණය වන පරිදි එහි බලය ලත් ප්‍රදේශය තුළ විදුලිය බෙදා හැරීමයි. බැඩ පාරිභෝගිකයින් 600,000 කට වඩා ප්‍රමාණයකට විදුලිය බෙදා හැරීම සිදු කරයි. 2009 අංක 20 දරණ විදුලි බල පනත මඟින් ලෙකෝ සමාග මට බෙදා හැරීමේ බලපත්‍රයක් නිකුත් කිරීමත් සමඟ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ නියාමනය යටතට ගෙන එන ලදී.

2. මුහුණ දෙන අභියෝග සහ එවැනි අභියෝග අතික්‍රමණය කිරීමේදී අනුගමනය කරන ලද උපාය මාර්ග

**i. ශ්‍රම බලකායේ සීමාවන් මධ්‍යයේ මෙහෙයුම් ප්‍රශස්ත කිරීම.**

සේවක පුරප්පාඩු පිරවීම සඳහා රජය විසින් පනවා ඇති සීමාවන් හේතුවෙන්, අවම ශ්‍රම බලකායක් සමඟ මෙහෙයුම් පවත්වා ගෙන යාමේදී LECO සැලකිය යුතු අභියෝගයකට මුහුණ දුන්නේය. ඊට ප්‍රතිචාර වශයෙන්, කුඩා කණ්ඩායමක් සමඟින් ඵලදායී ලෙස ක්‍රියා කිරීමට සමාග මට හැකි වන පරිදි අවශ්‍ය වෙනස්කම් හඳුනා ගැනීමට LECO විසින් එහි ක්‍රියාවලි සහ කාර්ය ප්‍රවාහයන් නැවත නිරීක්ෂණය කරන ලදී. මෙම ප්‍රවේශය මඟින් කාර්යය අඛණ්ඩව පවත්වාගෙන යාම පමණක් නොව අතිරේක සාමාන්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමේ අවශ්‍යතාවයකින් තොරව සමස්ත කාර්යක්ෂමතාව ද ඉහළ නැංවීමට හැකි වී ඇත.

**ii. SMS බිල්පත් සහ කඩදාසි රහිත මෙහෙයුම් වෙත සංක්‍රමණය වීම.**

ඉහළ ද්‍රව්‍ය සහ මුද්‍රණ පිරිවැය හේතුවෙන්, සමාගම මුද්‍රිත බිල්පත් අවශ්‍යතාවය ඉවත් කරමින් SMS බිල්පත් වෙත සාර්ථකව සංක්‍රමණය විය. සමස්ථ පාරිභෝගික සංඛ්‍යාවෙන් 98% කට අධික සංඛ්‍යාවක් SMS බිල්පත් සඳහා දැනට ලියාපදිංචි වී ඇති අතර ඔවුන් විසින් මෙම ක්‍රමවේදය හොඳින් පිළිගෙන ඇතිවා පමණක් නොව, එමඟින් සැලකිය යුතු විදේශ මුදල් ඉතුරුම් සහ පාරිසරික තිරසාරභාවයට ද දායක වී ඇත. මීට අමතරව LECO විසින් හඳුන්වා දුන් කඩදාසි රහිත කාර්යාල සංකල්පය වෙත සමාගමේ සේවකයන්ද අනුගත වෙමින් සමාග මේ කාර්ය ප්‍රවාහය සාර්ථක ඉදිරි ගමනක් සඳහා යොමු කර ඇත.

3. උසස් බෙදාහැරීමේ කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම (DMS)

ජාල පාලනය ස්වයංක්‍රීය කිරීම සඳහා අභ්‍යයන්තරව දියුණු කරන ලද උසස් බෙදාහැරීමේ කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දී ඇත. උසස් බෙදාහැරීමේ කළමනාකරණ පද්ධතියට (ADMS) විවිධ හිමිකාර ප්‍රොටෝකෝල ඒකාබද්ධ කිරීමේදී මුහුණ දුන් අභියෝගයක් වූයේ විවිධ නිෂ්පාදකයින්ගේ විවිධ පද්ධති සහ උපාංග අතර බාධාවකින් තොරව සන්නිවේදනය සහ අන්තර් ක්‍රියාකාරීත්වය සහතික කිරීමයි. මෙම හිමිකාර ප්‍රොටෝකෝල බොහෝ විට ආවේණික පිරිවිතරයන් සමඟ පැමිණේ. බෙදාහැරීමේ ජාලය තුළ ඇති සියලුම අංග කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සහ පාලනය කිරීමට හැකි ඒකාබද්ධ පද්ධතියක් නිර්මාණය කිරීම දුෂ්කර කාර්‍යයක් වේ.

මෙම අභියෝගය ජය ගැනීම සඳහා, මෙම හිමිකාර ප්‍රොටෝකෝල ADMS විසින් තේරුම් ගන්නා පොදු භාෂාවකට පරිවර්තනය කිරීමට සහ අනුගත කිරීමට හැකි Custom middle ware විසඳුම් නිර්මාණය කිරීමට අභ්‍යන්තර සංවර්ධන හැකියාවන් යොදා ගන්නා ලදි. මෙම ප්‍රවේශය ADMS සඳහාම පුළුල් වෙනස් කිරීම් අවශ්‍ය නොවී ජාලයට හඳුන්වා දෙන නව උපාංග සහ පද්ධති ඒකාබද්ධ කිරීමේ හැකියාව ඇති, වඩාත් පුළුල් සහ බහුකාර්යය වේදිකාවක් ගොඩනැඟීමට ඉඩ ලබා දෙන ලදී.

### iv. සුහුරු දත්ත කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම (SDMC)

සුහුරු දත්ත කළමනාකරණ මධ්‍යස්ථානය (SDMC) පිහිටුවීම, අප විසින් ජනනය කරන ලද විශාල දත්ත කළමනාකරණය කිරීමේ තීරණාත්මක දියුණුවක් ලබා ගත් අවස්ථාවකි. LECO විසින් ස්ථාපනය කර තිබෙන ජාල නිරීක්ෂක උපාංග සහ ස්මාර්ට් මීටර් (සුහුරු මණු) වල දත්ත මේ මඟින් කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි.මෙම ක්‍රියාවලියේ සැලකිය යුතු අභියෝගය වූයේ විශාල දත්ත පරිමාවක් හැසිරවීමයි.මෙම නිරීක්ෂක උපාංග මඟින් නිපදවන දත්ත මඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ජාල කළමනාකරණය ප්‍රශස්ත කිරීමට සහ පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීමට අනගි මෙහෙයක් ඉටු කරනු ලබයි. කෙසේවෙතත්, සැබෑ අභියෝගය වූයේ ස්වයංක්‍රීය තීරණ ගැනීමේ පද්ධතියක් ජනනය කිරීම සඳහා මෙම දත්ත තත්‍ය කාලීනව ඵලදායි ලෙස සැකසීම, ගබඩා කිරීම සහ විශ්ලේෂණය කිරීමයි.

මෙය මඟහරවා ගැනීම සඳහා, අපි SDMC තුළ ශක්තිමත් දත්ත හැසිරවීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදි. එය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමත් සමඟ, LECO හි මෙහෙයුම් හැකියාවන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරමින්, මෙම දත්ත කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සහ භාවිතා කිරීමට SDMC මඟින් හැකියාව ලබා දෙයි. සුහුරු මණු ස්ථාපනය කිරීම්, හිඟ බිල්පත් හේතුවෙන් සිදු කරනු ලබන විදුලි විසන්ධි කිරීම දුරස්ථව සිදු කිරීම් සහ තත්‍ය කාලීන ජාල නිරීක්ෂණය වැනි ප්‍රධාන ක්‍රියාවලීන් ස්වයංක්‍රීය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමඟින් සේවකයන්ගේ භෞතික මැදිහත් වීමේ අවශ්‍යතාවය අඩු කිරීම මඟින් ජාල මෙහෙයුම් වල ප්‍රතිචාරාත්මක බව බෙහෙවින් වැඩි දියුණු කරයි.

## 3. 2024 වසරේ සංවර්ධන ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

සමාගමේ ජයග්‍රහණ එහි කාර්යසාධනය සහ පාර්ශ්වකරුවන්ට ඉහළ ගුණාත්මක සේවාවක් සඳහා කරන ලද කැපවීම ප්‍රදර්ශනය කරයි.

**මෙහෙයුම්**

- 2024 සැප්තැම්බර් මස වන විට ස්මාර්ට් මීටර් (සුහුරු මණු) 70,000 කට වඩා ස්ථාපනය කර ඇති අතර, මුළු පාරිභෝගික සංඛ්‍යාවෙන් 10% කට වඩා ආවරණය වන පරිදි, දුරස්ථ නිරීක්ෂණ හැකියාවන් හරහා බලශක්ති සහ ණය කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- ප්‍රධාන ක්‍රියාවලි ස්වයංක්‍රීය කිරීම,සිදුවන දෝෂ අවම කිරීම සහ පරිපාලන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) වැඩි දියුණු කරන ලදී.
- නියාමන මිණුම් සලකුණු වලට අනුකූල වීම සහතික කිරීම, බෙදා හැරීමේ පාඩුව (distribution loss) අවම කිරීම මඟින් විදුලි සැපයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අඛණ්ඩ උත්සාහයන් ගැනීම.
- බිඳවැටීම් සඳහා ඒකාබද්ධ මෙහෙයුම් හඳුන්වා දීමෙන් ප්‍රශස්ත ශ්‍රම බලකාය යෙදවීම, එමඟින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
- සේවා සැපයීම වැඩි දියුණු කිරීම සඳහා නව සම්බන්ධතා ඇතුළුව පාරිභෝගික සේවා ඉල්ලීම් සඳහා සැකසුම් කාලය අඩු කිරීම.

**සංවර්ධන වැඩසටහන්**

- E-Billing පාරිභෝගික පදනම තවදුරටත් වර්ධනය වෙමින් පවතින අතර, මේ වන විට ලියාපදිංචි පරිශීලකයින් සංඛ්‍යාව 38,000 ඉක්මවයි.
- ශාඛා සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල සියලුම අභ්‍යන්තර ක්‍රියාවලි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ප්‍රති-ඉංජිනේරුකරණය කර ඇති අතර, සියලුම ස්ථාන හරහා නවීකරණය කරන ලද කාර්ය ප්‍රවාහයන් ක්‍රියාත්මක කර ඇත.
- ආදායම් එකතු කිරීම තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා LECO Self Payment Kiosk ජාලය පුළුල් කර ඇත.
- 33kV බෙදා හැරීමේ වෝල්ටීයතාවයක් සහ නව 132/33 kV ජාල උප පොළක් ලෙස හඳුන්වා දීම ඇතුළුව, විදුලිබල පද්ධතියේ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම අරමුණු කර

ගත්, ADB අරමුදල් යටතේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූලික කටයුතු ආරම්භ කරන ලදී.

ව්‍යාපෘතිය තීරණාත්මක වනු ඇත.

කාර්මික සහ වාණිජ අංශවල ඉහළ ධාරිතාවකින් යුත් විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා 33kV ජාල වෝල්ටීයතාවයක් යෙදවීමට LECO සැලසුම්

## 4. සමාගමේ මූල්‍ය තත්ත්වය

වගුව 3.1
පාරිභෝගික, සේවක සංඛ්‍යාව සහ මූල්‍ය දත්ත - 2019 සිට 2024 දක්වා

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 Budget | 2024 Actual YTD -July |
|---|---|---|---|---|---|---|---|
| පාරිභෝගිකයින් (බිල්පත්) | 568,250 | 576,279 | 591,888 | 594,000 | 597,546 | 612,757 | 600,719 |
| විකුණුම් GWh | 1,647 | 1,624 | 1,603 | 1,560 | 1,583 | 1,654 | 992 |
| සේවක සංඛ්‍යාව | 1,535 | 1,527 | 1,505 | 1,443 | 1,427 | 1,450 | 1,408 |
| පාරිභෝගික / සේවක අනුපාතය | 370 | 377 | 393 | 412 | 419 | 423 | 427 |
| බෙදා හැරීමේ පාඩු (11 Kv) % | 1.61% | 1.34% | 1.94% | 1.49% | 4.01% | 3.99% | 3.43% |
| ආදායම රුපියල් මිලියන | 32,461 | 30,709 | 32,201 | 38,587 | 72,510 | 93,994 | 68,363 |
| මෙහෙයුම් වලින් ලාභය රු මිලියන | 543 | 1,543 | 4,328 | 991 | 4,129 | 3,347 | 7,694 |
| වර්ෂය සඳහා ලාභය රු මිලියන | 2,687 | 1,792 | 3,248 | 1,954 | 4,195 | 3,360 | 4,185 |
| මුළු කොටස් රු. මිලියන | 33,537 | 34,792 | 38,419 | 40,687 | 45,435 | 48,795 | 47,693 |
| සම්පූර්ණ වගකීම් රු. මිලියන | 13,960 | 12,630 | 14,202 | 12,015 | 21,708 | 21,705 | 28,182 |
| මුළු වත්කම් රු.මි | 47,497 | 47,422 | 52,621 | 52,702 | 67,143 | 70,500 | 75,875 |

## 5. 2025 වර්ෂය සඳහා වැඩසටහන් සහ ව්‍යාපෘති

- **ජාල සංවර්ධනය**

33kV බෙදාහැරීමේ වෝල්ටීයතාවයක් ලෙස හඳුන්වාදීම සහ නව 132/33 kV ජාල උපපොළවල් පිහිටුවීම ඇතුළු ජාල යටිතල පහසුකම් සඳහා සැලකිය යුතු වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කරමින් ADB අරමුදල් යටතේ ජාල විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය දියත් කිරීම. මෙම වැඩිදියුණු කිරීම් බෙදා හැරීම් ජාලයේ විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා විදුලි ඇණ හිටීම් වල වාර ගණන සහ කාලසීමාව අඩු කිරීම සහ වඩාත් ස්ථායී සහ ඔරොත්තු දෙන විදුලි බල සැපයුමක් සහතික කිරීම අරමුණු කර ගෙන ඇත. විශේෂයෙන්ම ශීඝ්‍ර සංවර්ධනයක් අත්විඳින ප්‍රදේශවල විශ්වාසනීය විදුලි බල සැපයුම සඳහා වැඩි වන ඉල්ලුම සපුරාලීමේ අරමුණින් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් වලින් ආධාර ලබන මෙම කරයි. මෙම වැඩි දියුණු කිරීම මගින් බෙදා හැරීම් පද්ධතියෙහි ශක්ති හානිය සැලකිය යුතු ලෙස අඩු කිරීමටත්, බල ශක්ති බෙදාහැරීමේ ධාරිතාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමටත්, අනාගත සංවර්ධනයට සහාය විය හැකි වඩාත් ශක්තිමත් යටිතල පහසුකම් ස්ථාපිත කිරීමටත් අපේක්ෂා කෙරේ. ජාලයේ ධාරිතාව ඉහළ නැංවීමෙන්, බැඩ සිය සේවා ප්‍රදේශ හරහා වඩාත් ස්ථාවර සහ විශ්වාසනීය විදුලි බල සැපයුමක් සහතික කරමින් අධිශක්ති භාවිතා කරන්නන්ගේ ඉල්ලීම් සපුරාලීමට වඩා හොඳින් සන්නද්ධ වනු ඇත.

- **ජාල ඩිජිටල්කරණය**

බලශක්ති වෙළඳපොළ සමඟ ට්‍රාන්ස්ෆෝමර් (තරා පැවි) පදනම් වූ ක්ෂුද්‍ර ජාල, නියමු ව්‍යාතියක් ක්‍රියාත්මක කිරීමට LECO අපේක්ෂා කරයි. දේශීය බලශක්ති වෙළෙඳපොළ මෙම තරා පැවි පාදක ක්ෂුද්‍ර ජාලය සමඟ ඒකාබද්ධ කරවීම, මගින් ජාල ප්‍රත්‍යස්ථතාව සහ විශ්වසනීයත්වය වැඩිදියුණුකිරීම මෙම ක්‍රියාදාමයේ අරමුණ

වේ. මෙම ක්ෂුද්‍ර ජාල මගින් විධිමත් බල ශක්ති උත්පාදනයකට සහ පරිභෝජනයකට ඉඩ සැලසෙන අතර, බෙදා හැරීමේ ජාලයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රවේශයට ඇති බාධාවන් වලට ද විසඳුමක් වේ. මෙම ක්ෂුද්‍ර ජාල, බලශක්ති වෙළඳපොළ සමඟ ඒකාබද්ධ වීමෙන්, බල ශක්ති වෙළඳාම සඳහා අවස්ථා ලබා දීම සහ පාරිභෝගිකයින්ට සහ නිෂ්පාදකයින්ට වඩාත් නම්‍යශීලී කාර්යක්ෂම බලශක්ති පරිසර පද්ධතියකට දායක වීම සඳහා අවස්ථාව ලබා දේ.

ජාලඩිජිටල්කරණය, ඉල්ලුම කළමනාකරණය සහ පුනර්ජනනීය බලශක්ති අවශෝෂණය සඳහා සහාය ලබා දීම වෙනුවෙන් ඉල්ලුම කලමණාකරණ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට බැංකු අපේක්ෂා කරයි. ජාල ඩිජිටල්කරණය වැඩි දියුණු කිරීමේ අරමුණින් පුලුල් කරන ලද බලශක්ති කලමණාකරණ උපාය මාර්ග, විශේෂයෙන්ම උපරිම කාල සීමාවන් තුළ විදුලි බල සැපයුම් තත්ත්වයන් සමඟ බල ශක්ති පරිභෝජන රටාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම මෙම නියමු ව්‍යාතියෙහි අරමුණ වේ.මෙම ව්‍යාපෘතිය,මගින් වඩාත් නම්‍යශීලී හා ක්‍රියාත්මක කළ හැකි ඉල්ලුම කළමනාකරණ ක්‍රමවේදයක් සඳහා පුනර්ජනනීය බලශක්තිය හා ඒකාබද්ධ කිරීමට සහය දක්වන අතර එමගින් ජාල ස්ථායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරනු ලබයි. වැඩිවන පාරිභෝගික විදුලි බල අවශ්‍යතාවය අනුව තම ඉල්ලුම කළමනාකරණය කර ගැනීම සඳහා පාරිභෝගික උනන්දුව ඇති කිරීම මඟින්, වියදම් අධික යටිතල පහසුකම් ආයෝජන සඳහා ඇති අවශ්‍යතාවය අඩු කිරීම සහ එමගින් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය උපකාරී වනු ඇත.

- **යටිතල පහසුකම් සංවර්ධනය**

2025 වර්ෂයේ දී මෙහෙයුම් අවශ්‍යතා සඳහා යටිතල පහසුකම් සංවර්ධනයට LECO ප්‍රමුඛත්වය දෙනු ඇත. මෙම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වලට නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නිම කිරීම සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන සහ ශාඛා කාර්යාල ඉදි කිරීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතීන් සැලසුම් කර ඇත්තේ LECO හි මෙහෙයුම් අවශ්‍යතා ප්‍රවර්ධනය සඳහා සහය වීම සඳහා වන අතර එමගින් පාරිභෝගික සේවා සැපයීමේ කාර්යක්ෂමතාව සහ සඵලතාවය වැඩිදියුණුකිරීම අපේක්ෂාවයි. පාරිභෝගිකයින්ට වඩාත් ඵලදායී කඩිනම් සේවාවක් සැපයීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම, ඉක්මන් ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදයක් හා වඩාත් පහසුවෙන් සේවාවක් ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීම LECO හි බලාපොරොත්තුව වේ.

- **පාරිභෝගික සේවා**

ඩිජිටල් වේදිකා සහ ජයස්ඵඉදවී ඒකාබද්ධ කිරීම තුළින් පාරිභෝගික සේවාව වැඩි දියුණු කිරීම හා එමගින් LECO හි ඩිජිටල් පැවැත්ම වැඩිදියුණු කිරීම අරමුණ වේ. මෙම මූල පිරීම පාරිභෝගිකයින්ට පහසුවෙන් සේවාවන් වෙත ප්‍රවේශ වීමට, ගැටළු විසඳා ගැනීමට සහ පැය 24 පුරාම සහාය ලබා ගැනීමට ඉඩ සලසන පරිශීලක-හිතකාමී ඩිජිටල් අතුරුමුහුණත් (user friendly digital interface) පිරිනැමීම මගින් පාරිභෝගික සහභාගිත්වය සහ ප්‍රවේශය වැඩිදියුණු කිරීමට ඉවහල් වනුඇත. මෙම ඩිජිටල් තාක්ෂණයන් උපයෝගී කර ගනිමින්, LECO වඩාත් ප්‍රතිචාරාත්මක, කාර්යක්ෂම සහ පාරිභෝගික කේන්ද්‍රීය සේවා අත්දැකීමක් ලබා දෙමින්, නවීන අපේක්ෂාවන් සමඟ පෙළඟ ැසෙමින් සහ පුද්ගල අන්තර් සම්බන්ධතා සඳහා ඇති අවශ්‍යතාවය අවම කිරීමට අදහස් කරයි.

- **ක්‍රියාවලි පිරිවැය**

එක් එක් ක්‍රියාවලිය සඳහා අදාළ ක්‍රියාවලි පිරිවැය ක්‍රියාවලියේ සියළුම අදියරයන් සඳහා වෙන් වෙන්ව ගණනය කොට ක්‍රියාත්මක කිරීම තුළින් සමාගමේ විනිවිදභාවය සහතික කිරීම අපේක්ෂා කෙරේ. සමාගමේ පවතින සියලුම වියදම් මධ්‍යස්ථාන සඳහා ඉහත ක්‍රියාවලිය මත පදනම්ව වියදම් සැලසුම් කරනු ලැබේ.

- **කාර්ය සාධන කළමනාකරණය**

LECO හි කාර්යක්ෂමතා මට්ටම ඉහළ නැංවීම සඳහා කාර්ය සාධන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර තවදුරටත් සංවර්ධනය කෙරේ.

# හතරවන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

## 1. හැඳින්වීම

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, බලශක්ති කළමනාකරණය, ප්‍රතිපත්ති සංවර්ධනය සහ අරමුදල් කළමනාකරණය යන මූලික අරමුණු හතර පෙරදැරිව, 2007 ඔක්තෝබර් 1 වන දින තිරසාර බලශක්ති සංවර්ධනය සඳහා වන ප්‍රධාන ජාතික ආයතනය ලෙස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (ශ්‍රී ලං.සු.බ.අ.) පිහිටුවන ලදී. මෙම අධිකාරිය 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින් සංස්ථාපනය කරන ලදී. 2030 වන විට 70%ක පුනර්ජනනීය බලශක්ති උත්පාදනයක් සාක්ෂාත් කර ගැනීමේ අභිලාෂකාමී ඉලක්කය ඇතිව, 2050 වන විට කාබන් වලින් ශූන්‍ය රටක් බවට පත් වීම සඳහා ශ්‍රී ලංකාව මුලපුරා ඇත. 2020 වන විට ඉලක්කයෙන් 30% ක් ළඟා කර ගනිමින් සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත් වී ඇත .

## 2. කාර්ය සාධනයේ විශේෂී අවස්ථා දළ විශ්ලේෂණය

2024 දී, ශ්‍රී ලං.සු.බ.අ. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වූ සිය කැපවීම අඛණ්ඩව සිදු කරන ලද අතර, නව පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 2,114 ක සමුච්චිත ධාරිතාවක් ස්ථාපනය කිරීමට පහසුකම් සැලසීය. මෙම ජයග්‍රහණය රටේ මුළු ස්ථාපිත ධාරිතාවෙන් සැලකිය යුතු 50% ක කොටසක් නියෝජනය කරන අතර එය පෙර වසරේ විදුලිබල උත්පාදනයේ වාර්තාගත කොටස වන 39% ට වඩා සැලකිය යුතු වැඩිවීමක් සනිටුහන් කරයි. පුනර්ජනනීය බලශක්ති අංශයේ වර්ධනය ප්‍රස්තාරය 4.1 හි දක්වා ඇත.

මෙගාවොට් 330.1 ක සමස්ත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරන ලද අතර මෙගාවොට් 27.027ක පුනර්ජනනීය ව්‍යාපෘති ආරම්භ කරන ලදී. එයට අමතරව, මෙගාවොට් 233 ක බලශක්ති බලපත්‍රයක් නිකුත් කරන ලද අතර, 4.1 වගුවේ සවිස්තරාත්මකව දක්වා පරිදි මෙගාවොට් 2,717.43 ක ව්‍යාපෘති සඳහා තාවකාලික අනුමැතිය ලබා දෙන ලදී.

ප්‍රස්තාරය 4.1
නව පුනර්ජනනීය බලශක්තිය සඳහා සමුච්චිත ධාරිතා එකතු කිරීම් **(NRE)**



වගුව 4.1
2024 අගෝස්තු වන විට ක්‍රියාත්මක වෙමින් පවතින, ඉදිවෙමින් පවතින හෝ සැලසුම් කර ඇති නමුත් තවමත් ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති පිළිබඳ විස්තර

| පුනර්ජනනීය බලශක්ති ප්‍රභවය | තාවකාලික අනුමැතිය නිකුත් කරන ලද ව්‍යාපෘති | | බලශක්ති බලපත්‍ර නිකුත් කළ ව්‍යාපෘත | | PPA අත්සන් කළ ව්‍යාපෘත | | ආරම්භ කරන ලද ව්‍යාපෘති | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) | ව්‍යාපෘති සංඛ්‍යාව | ධාරිතාව (මෙ.වො) |
| කුඩා ජල විදුලි බලාගාර | 9 | 6.63 | 1 | 0.70 | 3 | 2.7 | 2 | 3.027 |
| සුළං | 15 | 512.50 | - | - | 1 | 10.0 | - | - |
| සූර්ය (ජාල සම්බන්ධිත) | 157 | 2,177.80 | 50 | 222.79 | 49 | 310.9 | 6 | 24.00 |
| සූර්ය PV (වහල) | - | - | - | - | - | - | - | - |
| ජෛව ස්කන්ධ (ඩෙන්ඩ්‍රෝ) | 4 | 20.50 | 3 | 9.50 | 1 | 5.0 | - | - |
| කෘෂිකාර්මික සහ කාර්මික අපද්‍රව්‍ය | | | - | - | 1 | 1.5 | - | - |
| නාගරික ඝන අපද්‍රව්‍ය | - | - | - | - | - | - | - | - |
| මුළු පුනර්ජනනීය බලශක්තිය (මෙ.වො) | **185** | **2,717.43** | **54** | **232.99** | **55** | **330.1** | **8** | **27.027** |

## 3. ප්‍රධාන අභියෝගවලට මුහුණ දීමේ උපාය මාර්ග

### 3.1 රෙගුලාසි බලාත්මක කිරීම

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කළමනාකරණයේදී රෙගුලාසි බලාත්මක කිරීම ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස, බලශක්ති සංරක්ෂණ ගොඩනැගිලි පරිශීලක අත්පොතට අනුකූල වීම සහ බලශක්ති මිණුම් සලකුණු වලට අනුකූල වීම බලශක්ති භාවිතය සෘජුවම අඩු කරයි. කෙසේ වෙතත්, ඵලදායී ප්‍රතිඵල සඳහා එවැනි කාර්යයන් ක්‍රියාත්මක කිරීම රෙගුලාසි මගින් අනිවාර්ය කළ යුතුය.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ වායු සමීකරණ පරීක්ෂණාගාරයක් ස්ථාපිත කිරීම වැනි පරිත්‍යාග ශීලීන්ගේ අරමුදල් සහිත මුලපිරීම්, අභියෝග රැසකට මුහුණ දෙයි. අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම වැනි දිගු ක්‍රියා පටිපාටි, ප්‍රගතියට සැලකිය යුතු ලෙස බාධා කළ හැකිය. මීට අමතරව, ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම බොහෝ විට නව ව්‍යාපෘති දියත් කිරීමේදී සහ උපකරණ ලේබලකරණය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමේදී ප්‍රමාද වීමට හේතු වේ. මෙම ගැටළු විසඳීම සඳහා, නම්‍යශීලී බව වැඩි දියුණු කිරීම සහ සෑම වර්ෂයක් තුළම ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන සහතික කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය වේ. ක්‍රියා පටිපාටි විධිමත් කිරීම සහ ස්ථාවර අරමුදල් ලබා ගැනීම මගින්, බලශක්ති කාර්යක්ෂමතාව සහ තිරසාරභාවය සඳහා සහාය වන වැදගත් ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අපට පහසුකම් සැලසිය හැකිය.

### 3.2 පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් පුනර්ජනනීය බලශක්ති මුලපිරීම් සඳහා ව්‍යාපෘති පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ නංවයි. නොගැලපෙන ප්‍රතිපත්ති නිසා ආයෝජකයින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයන් අනුගමනය කිරීමෙන් වැළකී සිටිය හැකි අතර, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් - විශේෂයෙන් සූර්ය හා සුළං - පවතින විදුලිබල ජාලයට ඒකාබද්ධ කිරීම සංකීර්ණ අභියෝග මතු කරයි. තවද, පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳව සාමාන්‍ය ජනතාව අතර දැනුවත්භාවය සහ අවබෝධය නොමැතිකම මෙම අංශයේ ප්‍රගතියට බාධා ඇති කරයි. මෙම ගැටළු විසඳීම සඳහා, උපායමාර්ගික පියවර කිහිපයක් ක්‍රියාත්මක කළ යුතුය. පළමුව, අනුමැතීන් විධිමත් කිරීමට පුනර්ජනනීය ව්‍යාපෘති සඳහා ඉඩම්

අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් පිළිබඳ ගැඹුරු සමාලෝචනයක් සිදු කිරීම අවශ්‍ය වේ. ඉහළ මට්ටමේ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවක් පිහිටුවීම මගින් වේගවත් තීරණ ගැනීම සහ කොටස්කරුවන් අතර සම්බන්ධීකරණය පහසු කළ හැකිය. ඊට අමතරව, ගැටළු සහ බාධක අධීක්ෂණය කිරීම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකායක් පත් කිරීම මගින් වගවීම සහ ප්‍රගතිය සහතික කළ හැකිය. වඩාත් හිතකර ආයෝජන වාතාවරණයක් ප්‍රවර්ධනය කිරීම සඳහා නීතිමය හිඩැස් හඳුනාගෙන සංශෝධනය කිරීම සහ පවතින මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම ද අත්‍යවශ්‍ය වේ. පුනර්ජනනීය ප්‍රභවයන් සඳහා පහසුකම් සැලසීම සඳහා විදුලිබල ජාලය වැඩිදියුණු කිරීම ඒකාබද්ධ කිරීමේ හැකියාවන් වැඩිදියුණු කරනු ඇති අතරම, පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංරක්ෂණය පිළිබඳ මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම ප්‍රජාව තුළ වැඩි අවබෝධයක් ඇති කර ඔවුන්ගෙන් වැඩි සහයෝගයක් ලබා ගැනීමට හේතු වනු ඇත. මෙම පුළුල් උපාය මාර්ග පවතින අභියෝග අවම කිරීමට සහ පුනර්ජනනීය බලශක්ති මුලපිරීම්වල වර්ධනයට දායක වීමට උපකාරී වේ.

### 3.3 මූල්‍ය ආධාර

සීමිත අරමුදල් සහ අඛණ්ඩ ආර්ථික අර්බුදය 70%ක පුනර්ජනනීය බලශක්ති ඉලක්කය සපුරා ගැනීමට සහ ඵලදායී බලශක්ති කළමනාකරණ මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට සැලකිය යුතු අභියෝග ඉදිරිපත් කරයි. සෙස් සහ රාජ්‍යභාගය පැනවූ විට, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (ශ්‍රී ලං.සු.බ.අ.) සඳහා ස්වාධීන අරමුදල් සපයනු ඇත. මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති දිරිගැන්වීම් සහ අරමුදල් වැඩසටහන් ස්ථාපිත කිරීම සඳහා පුළුල් ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.

### 3.4 සම්පත් කළමනාකරණය

ප්‍රධාන වශයෙන් කුසලතා ඇති මානව සම්පත් සහ අත්‍යවශ්‍ය පහසුකම් නොමැතිකම හේතුවෙන් පුනර්ජනනීය බලශක්ති සහ බලශක්ති කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සැලකිය යුතු අභියෝගවලට මුහුණ පායි. මෙම ගැටළු ඵලදායී ලෙස විසඳීම සඳහා, සූර්ය බල පද්ධති, සුළං බල පද්ධති සහ වහල මත සවිකළ සූර්ය බල පද්ධති වැනි විවිධ සම්පත් වර්ග වලට විවිධාංගීකරණය වන අයුරින් පුනර්ජනනීය බලශක්ති අංශය පුළුල් කිරීම ඉතා වැදගත් වේ. මීට අමතරව, මෙම ක්ෂේත්‍රයේ පුද්ගලයින්ගේ ධාරිතාව සහ සුදුසුකම් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. මානව සම්පත් සහ පහසුකම් සංවර්ධනය කිරීමෙන්, අපට පුනර්ජනනීය බලශක්ති අංශයේ වර්ධනයට වඩා හොඳින් සහාය විය හැකි අතර බලශක්ති කළමනාකරණ මුලපිරීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කළ හැකිය.

## 4. සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති යාවත්කාලීන කිරීම්

සැපයුම් පාර්ශවීය කළමනාකරණය සහ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණය යන ප්‍රාථමික උපාය මාර්ග ද්විත්වය හරහා ශ්‍රී ලං.සු.බ.අ. එහි වැඩසටහන් ක්‍රියාත්මක කරයි. සම්පත් වෙන් කිරීම සහ ජාතික පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහන් ඉදිරියට ගෙන යාම සඳහා සැපයුම් පාර්ශවීය කළමනාකරණ ක්‍රියාකාරකම් යොමු වී ඇත. අනෙක් පසින් ගත් කළ ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ ක්‍රියාකාරකම් අවසාන භාවිත අංශ ඃබා-මී\ුජළුදරි* හරහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

### 4.1 සැපයුම් පාර්ශ්ව කළමනාකරණ ක්‍රියාකාරකම්

#### 4.1.1 සූර්යබල සංග්‍රාමය

නිවාස, පූජනීය ස්ථාන, හෝටල්, වාණිජ ආයතන සහ කාර්මික ගොඩනැගිලිවල වහල මත කුඩා ප්‍රමාණයේ ධාරිතාවයකින් යුතු සූර්ය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම දිරිමත් කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙම වැඩසටහන යටතේ, පාරිභෝගිකයින්ට සිය වහලවලින් සෘජුවම විදුලිය ජනනය කර භාවිතා කිරීමට අවස්ථාව ලැබේ. මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව විදුලිබල උත්පාදනය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන ලීටර් බිලියන 4.5 ක පමණ පරිභෝජනය අඩු කිරීමෙන් රුපියල් බිලියන 184 ක් පමණ ඉතිරි කර ගැනීමට අපේක්ෂා කෙරේ. වහල 75,000 කට වඩා භාවිතා

කරමින්, රටේ මුළු වාර්ෂික විදුලි ඉල්ලුමෙන් 12% කට ආසන්න ප්‍රමාණයක් සපුරාලමින් මෙගාවොට් 1,200 ක සමුච්චිත ධාරිතාවක් එකතු කර ගැනීමට මෙම වැඩසටහන සමත් විය. 2024 දී, මෙම වැඩසටහන මෙගාවොට් 180 ක නියමිත ඉලක්කය ඉක්මවා යමින් මෙගාවොට් 393 ක් එකතු කිරීමට සමත් විය. 2025 වන විට එමගින් ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 1,000 ක් එකතු වනු ඇතැයි අපේක්ෂා කළ ද මෙම ඉලක්කය 2024 ජූනි වන විට සාක්ෂාත් කර ගන්නා ලදී. අද වන විට, සූර්ය බලශක්ති සැපයුම්කරුවන් 600 ක් පමණ ලියාපදිංචි වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සූර්ය බලශක්ති අංශය තුළ සැලකිය යුතු රැකියා උත්පාදනයක් සිදුවී ඇත.

### 4.1.2 පූනරින් සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, පූනරින් ප්‍රදේශය නිරිතදිග සහ ඊසානදිග මෝසම් දෙකටම නිරාවරණය වීමෙන් ප්‍රතිලාභ ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වසරේ බොහෝ මාස පුරා තද සුළං ඇති වේ. එමගින් මෙය දිවයිනේ සුළං බලශක්ති උත්පාදනය සඳහා වඩාත්ම ගැලපෙන ස්ථානවලින් එකක් බවට පත් කර ඇත. පූනරින් සුළං බල ව්‍යාපෘතියේ ධාරිතාව මෙගාවොට් 234 ක් වන අතර, අපේක්ෂිත වාර්ෂික විදුලි උත්පාදනය ගිගාවොට් පැය 807 කි. මීට අමතරව, එමගින් සෑම වසරකම විදුලි උත්පාදනය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන ලීටර් මිලියන 202 ක් පමණ ඉතිරි කර ගත හැකි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් බිලියන 60 ක පමණ පිරිවැය ඉතිරියක් ලැබේ. තවද, මෙම සුළං-සූර්ය බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කාබන් විමෝචනය ටොන් 588,948 කින් අඩු කිරීමට දායක වනු ඇත. යෝජිත ක්‍රියාත්මක කිරීමේ දිනය 2025 අප්‍රේල් වේ.





(පූනරින් සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය)

පූනරින් සුළං-සූර්ය බල ව්‍යාපෘතිය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, අවශ්‍ය සියලු ව්‍යාපෘති අනුමැතීන් සහ පාරිසරික නිෂ්කාශන ලබා ගෙන ඇත. ගැසට් අංක 38අ හි දක්වා ඇති පරිදි, පෞද්ගලික ඉඩම්වල සන්තකය පැවරීම සාර්ථකව අවසන් කර ඇති අතර, වන්දි ගෙවීමේ කටයුතු දැනටමත් සිදුවෙමින් පවතී. රජයේ ඉඩම් බදු පදනම මත අත්පත් කර ගැනීම සඳහා වන කෙටුම්පත් ගිවිසුම නීතිපතිවරයා වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර, රාජ්‍ය සහ පෞද්ගලික ඉඩම් සඳහා බදු තක්සේරු කටයුතු ද අවසන් කර ඇත. ඊට අමතරව, බලශක්ති බලපත්‍රය ලබා දී ඇති අතර, පූර්ව ව්‍යාපෘති සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට ශ්‍රී ලං.සු.බ.අ. විසින් සංවර්ධකයාට අවසර දී ඇත. ඉඩම් අත්පත් කර ගැනීම තවමත් සිදු කෙරෙමින් පවතී.

### 4.1.3 මන්නාරම අදියර - II සුළං බල ව්‍යාපෘතිය

කල්පිටිය අර්ධද්වීපයේ සිට මන්නාරම දූපත දක්වා වයඹ දිග වෙරළ තීරයේ ඇති සැලකිය යුතු සුළං සම්පත් විභවය සැලකිල්ලට ගත් කළ මෙම කලාපය දිවයිනේ සුළං බල උත්පාදනය සඳහා වඩාත් කැපී පෙනෙන ස්ථානයක් බවට පත්වී ඇත. එකක් මෙගාවොට් 5.2 ක ධාරිතාවයකින් යුත් ටර්බයින 52 කින් සමන්විත වන මන්නාරම අදියර- II සුළං බල ව්‍යාපෘතිය මගින් මෙගාවොට් 250 ක ධාරිතාවක් අපේක්ෂා කරන අතර අපේක්ෂිත වාර්ෂික විදුලි උත්පාදනය ගිගාවොට් පැය 876 කි. මීට අමතරව, මෙම ව්‍යාපෘතිය මඟින් සෑම වසරකම විදුලිබල උත්පාදනය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන ලීටර් මිලියන 219 ක් පමණ ඉතිරි කර ගැනීමට පුරෝකථනය කර ඇති අතර එමඟින් රුපියල් බිලියන 66 ක පමණ පිරිවැයක් ඉතිරි වේ. තවද, කාබන් විමෝචනය ටොන් 639,305 කින් අඩු කිරීමට මෙම සුළං බල

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම දායක වනු ඇත. යෝජිත ක්‍රියාත්මක කිරීමේ දිනය 2025 අප්‍රේල් වේ.





(මන්නාරම සුළං බල ව්‍යාපෘතිය)

මන්නාරම සුළං බල ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. ඉඩම් කට්ටි 27 ක් සහ ප්‍රවේශ මාර්ග එමගින් අත්පත් කර ගෙන ඇත. පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලද මහජන අදහස් 582 ක් අපි සලකා බැලුවෙමු. සියලුම මහජන අදහස් ඇතුළත් කිරීමෙන් පසු අවසාන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව මන්නාරම දූපත සඳහා ජලාපවහන අධ්‍යයනයක් සැලසුම් කර ඇත. පූර්ව ව්‍යාපෘති සංවර්ධන කටයුතු කරගෙන යාමට ශ්‍රී ලං.සු.බ.අ. සංවර්ධකයාට අවසර ලබා දී ඇත. පාරිසරික බලපෑම් තක්සේරුව සහ ව්‍යාපෘතිය ශ්‍රේෂ්ඨාධිකරණයේ බහුවිධ පෙත්සම්වලට යටත් වී ඇති අතර, ප්‍රතිචාර දැනට සකස් කරමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීම තවමත් සිදුවෙමින් පවතී. මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික බලපෑම් ඇගයීම් අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.

### 4.1.4 සියඹලාණ්ඩුව සූර්ය බල ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව පිරිසිදු හා තිරසාර විදුලිය ගිගාවොට් පැය 180 ක් ජනනය කිරීමට අපේක්ෂා කරන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සෑම වසරකම $CO_2$ විමෝචනය මෙට්‍රික් ටොන් 131,364 ක් පමණ අඩු වේ. මෙම අඩු කිරීම ධනාත්මක පාරිසරික බලපෑමක් ඇති කරයි. මීට අමතරව, මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව ඉන්ධන ලීටර් මිලියන 45 ක් පමණ ඉතිරි කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම සංඛ්‍යා පදනම් වී ඇත්තේ 0.7298 නට $CO_2$/kWh ජාල විමෝචන සාධකයක් සහ කිලෝවොට් පැයට ඩීසල් ලීටර් 4 ක ඉන්ධන ඉතිරිකිරීමේ ඇස්තමේන්තුවක් මත ය.






(සියඹලාණ්ඩුව සූර්ය බලශක්ති ව්‍යාපෘතිය)

සියඹලාණ්ඩුව ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්නව ඇති අතර, ස්ථාන සකස් කිරීම සහ විකල්ප ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම සිදුවෙමින් පවතී. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉඩම් බදු ගිවිසුම පිළිබඳ නිර්දේශය ලැබී ඇත. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන ප්‍රදානය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡා මත පදනම්ව, ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කැබිනට් පත්‍රිකාව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට විධිමත් ලෙස ඉදිරිපත් කර ඇත.

### 4.1.5 මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය

ඔඩ්ඩමාවඩි සූර්ය බල ව්‍යාපෘතිය (මෙගාවොට් 100) සඳහා බලශක්ති බලපත්‍රය ලැබී තිබුණ ද තවමත් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සහ සම්ප්‍රේෂණ මාර්ග ගිවිසුම අපේක්ෂාවෙන් සිටියි. පූනකරි වැව් සූර්ය බල ව්‍යාපෘතිය (මෙගාවොට් 700) කැබිනට් අනුමැතිය ලබාගෙන ඇති නමුත් තවමත් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් පවතී; පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර, ව්‍යාපෘතිය ශ්‍රී ලං.සු.බ.අ. හි ද ලියාපදිංචි කර ඇත. සාම්පූර් සූර්ය බල ව්‍යාපෘතියට (මෙගාවොට් 50) 2023 ජූලි 18 වන දින බලශක්ති බලපත්‍රය ලැබී ඇති අතර, ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් අඛණ්ඩ සාකච්ඡා සමඟින් ලංකා විදුලිබල මණ්ඩලය 2023 ඔක්තෝම්බර් මාසයේදී යෝජනාව සඳහා ඉල්ලීමක් නිකුත් කළේය. අවසාන වශයෙන්, හම්බන්තොට සූර්ය බල ව්‍යාපෘතිය (මෙගාවොට් 150) 2024 මාර්තු මාසයේදී එහි සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කළේය. සම්ප්‍රේෂණ මාර්ගය සඳහා කුළුණු සමීක්ෂණය සිදුවෙමින් පවතින අතර, ඉදිකිරීම් කොන්ත්‍රාත් සාකච්ඡා අඛණ්ඩව සිදුවෙමින් පවතී. ඉදිකිරීම් සහ පැවරීමේ ගිවිසුම අපේක්ෂාවෙන් සිටින අතර, ඉඩම් නිදහස් කිරීමේ අනුමැතිය ලැබී ඉඩම් බදු ලේඛන ඉදිරිපත් කර ඇති අතර, 2025 මාර්තු වන විට එය අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

### 4.1.6 මේරවිල් සුළං බල උද්‍යානය





(මේරවිල් සුළං බල උද්‍යානය)

අපේක්ෂිත වාර්ෂික විදුලි උත්පාදනය ගිගාවොට් පැය 735 ක් වන ටර්බයින 34 කින් සමන්විත මෙගාවොට් 204 ක සුළං බල උද්‍යානයක් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ මේරවිල් හි පිහිටුවීමට ශ්‍රී ලං.සු.බ.අ. සැලසුම් කරයි. මීට අමතරව, මෙම ව්‍යාපෘතිය මඟින් සෑම වසරකම විදුලි උත්පාදනය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන ලීටර් මිලියන 2,943 ක් පමණ ඉතිරි කර ගැනීමට පුරෝකථනය කර ඇති අතර එමඟින් රුපියල් බිලියන 30 ක පමණ පිරිවැය ඉතිරි වේ. තවද, මෙම සුළං බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කාබන් විමෝචනය ටොන් 520,900 කින් අඩු කිරීමට දායක වේ.

මේරවිල් සුළං බල ව්‍යාපෘතියේ කටයුතු සාර්ථකව සිදුවෙමින් පවතී. කුරුළු අධ්‍යයන වාර්තාව සහ පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවේ අවසාන කෙටුම්පත මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ අදහස් වලට ප්‍රතිචාර වශයෙන්, සාකච්ඡා පවත්වා ඇත. ඔවුන්ගේ උපදෙස් සහ නිර්දේශ මත පදනම්ව, නව සුළං ටර්බයින සඳහා විභව ස්ථාන හඳුනා ගැනීම සඳහා අපි වැඩිදුර ක්‍රියාමාර්ග ගනිමින් සිටින්නෙමු.

### 4.1.7 කිරිඉබ්බන් වැව සහ චන්ද්‍රිකා වැවෙහි පාවෙන සූර්ය බලශක්ති ව්‍යාපෘති

ශ්‍රී ලංකාව සඳහා ප්‍රධාන මුලපිරීමක් ලෙස කොරියානු රජය විසින් චන්ද්‍රිකා වැව (විල) සහ කිරිඉබ්බන් වැව (විල) මතුපිට මෙගාවොට් 1 ක ධාරිතාවයකින් යුත් පාවෙන සූර්ය බලශක්ති උත්පාදන නියමු ව්‍යාපෘති දෙකක් ඉදිකරන ලදී. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කොරියාවේ වෙළඳ, කර්මාන්ත සහ බලශක්ති අමාත්‍යාංශය ආසන්න වශයෙන් රුපියල් මිලියන 1,000 ක ප්‍රදාන අරමුදල් ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිවල මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ විදුලි උත්පාදන අවශ්‍යතා සඳහා පිරිවැය-ඵලදායී විසඳුමක් ලෙස පාවෙන සූර්ය බලශක්ති තාක්ෂණය හඳුන්වා දීම සහ මෙම තාක්ෂණයේ බලපෑම් හඳුනා ගැනීමයි. මෙම ප්‍රවේශය සාම්ප්‍රදායික සූර්ය බලශක්ති බලාග ාර සඳහා වන ඉඩම් අවශ්‍යතා හා සම්බන්ධ අභියෝග ආමන්ත්‍රණය කරයි. මෙම ව්‍යාපෘතිය මගින් වාර්ෂිකව ගිගාවොට් පැය 3 ක විදුලිය නිපදවීමට අපේක්ෂා කෙරේ. එයට අමතරව, එය සෑම වසරකම විදුලි උත්පාදනය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන ලීටර් මිලියන 1 ක් පමණ ඉතිරි කර ගන්නා අතර එමඟින් රුපියල් බිලියන 0.3 ක පමණ පිරිවැයක් ඉතිරි වේ. තවද, මෙම සූර්ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කාබන් විමෝචනය ටොන් 2,100 කින් අඩු කිරීමට දායක වේ. කර්මාන්තශාලා ඉදිකිරීම් කටයුතු සාර්ථකව නිම කර ඇත.





(කිරිඉබ්බන් වැවෙහි සහ චන්ද්‍රිකා වැවෙහි පාවෙන සූර්ය බල ව්‍යාපෘති)

### 4.1.8 යාපනයේ කුඩා දූපත් සඳහා දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධතියක් සංවර්ධනය කිරීම

සූර්ය බල පද්ධති, සුළං බලය, ඩීසල් උත්පාදක යන්ත්‍ර සහ ලිතියම්-අයන ගබඩා බැටරි භාවිතා කරන දෙමුහුන් බලාගාර ක්‍රියාත්මක කිරීම හරහා යාපනයේ අනලයිතිව්, ඩෙල්ෆ්ට් සහ නයිනතිව් දූපත් සඳහා විදුලිය ජනනය කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. ඵලදායී උත්පාදන මිශ්‍රණයක් නිර්මාණය කිරීම සඳහා සූර්ය, සුළං සහ ඩීසල් ප්‍රභවයන්ගේ ධාරිතාවන් සහ බැටරි ගබඩා කිරීම ප්‍රශස්ත කර ඇත. නිශ්චිත ධාරිතාවන් පහත පරිදි දක්වා ඇත:

ව්‍යාපෘතිය සාර්ථකව සිදුවෙමින් පවතී. ඩෙල්ෆ්ට් සහ නයිනතිව් දූපත් වල කම්බි දැල් වැටවල් සවි කිරීම සිදු වෙමින් පවතින අතර, අනලයිතිව් දූපතේ එය සාර්ථකව නිම කර ඇත. තවද, දූපත් තුනෙහිම වෘක්ෂලතා, සුන්බුන් සහ භූගත බාධක ඉවත් කිරීම මෙන්ම ස්ථාන සමීක්ෂණ සහ පාංශු පරීක්ෂණ අවසන් කර ඇත. සිවිල් සැලසුම් සමාලෝචනය අවසන් කර ඇති අතර, ද්‍රව්‍ය ඇණවුම් කර ඇත.

| දූපත | ඩීසල් ජෙනරේටර් | PV උත්පාදනය | සුළං උත්පාදනය | බැටරි ගබඩා |
|---|---|---|---|---|
| නයිනතිව් | කිලෝවොට් 300 + කිලෝවොට් 500 | කිලෝවොට් 700 | කිලෝවොට් 200 | කිලෝවොට් පැය 1000 (කිලෝවොට් 550) |
| අනලතිව් | කිලෝවොට් 150 + කිලෝවොට් 300 | කිලෝවොට් 300 | කිලෝවොට් 80 | කිලෝවොට් පැය 550 (කිලෝවොට් 275) |
| ඩෙල්ෆ්ට් | කිලෝවොට් 300 + කිලෝවොට් 500 | කිලෝවොට් 700 | කිලෝවොට් 250 | කිලෝවොට් පැය 800 (කිලෝවොට් 650) |






(යාපනයේ කුඩා දූපත් සඳහා දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධතිය)

### 4.1.9 මූලික අදියරේ ජාතික ව්‍යාපෘති

මෙගාවොට් 114 කරච්චි සුළං බල ව්‍යාපෘතිය, මෙගාවොට් 200 මාන්තෙයි බටහිර සුළං බල ව්‍යාපෘතිය, මෙගාවොට් 50 තුන්කායි සූර්ය බල ව්‍යාපෘතිය සහ මෙගාවොට් 100 දැදුරු ඔය පාවෙන සූර්ය බල ව්‍යාපෘතිය ලෙස මෙගාවොට් 464 ක ඒකාබද්ධ ධාරිතාවක් සහිත නව සුළං සහ සූර්ය බල ව්‍යාපෘති හතරක් හඳුනාගෙන ඇත. මෙම ව්‍යාපෘති දැනට සංවර්ධනයේ මූලික අදියරවල පවතින අතර මුළු ගිගාවොට් පැය 1,169 ක විදුලිය ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම නව මෙගාවොට් 464 ක සුළං සහ සූර්ය බල ව්‍යාපෘති මගින් වාර්ෂිකව ගිගාවොට් පැය 1,169 ක විදුලිය ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, මෙම ව්‍යාපෘති මඟින් විදුලිබල නිෂ්පාදනය සඳහා භාවිතා කරන පොසිල ඉන්ධන පරිභෝජනය වාර්ෂිකව ලීටර් මිලියන 4,676 කින් පමණ අඩු කිරීමෙන් රුපියල් බිලියන 56 ක් පමණ ඉතිරි කර ගැනීමට අපේක්ෂා කෙරේ. තවද, මෙම සුළං බල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කාබන් විමෝචනය ටොන් 828,480 කින් අඩු කිරීමට දායක වනු ඇත.

කරච්චි සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය සඳහා, පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් අවසන් කර ඇති අතර, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ ස්ථාන සංචාරයක් (Joint Site Visit) පවත්වා ඇත. ස්ථාන ආශ්‍රිත ගැටළු විසඳීමට උත්සාහයන් සිදුවෙමින් පවතින අතර, හඳුනාගත් ස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ USAID සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. ව්‍යාපෘතිය සඳහා මූලික අනුමැතිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අතර, ඉන් අනතුරුව අනුමැතිය සඳහා අයදුම්පතක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට (DCC) ඉදිරිපත් කර ඇත.

තුනුක්කායි සූර්ය බල ව්‍යාපෘතිය සම්බන්ධයෙන්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ ස්ථාන සංචාරයක් සිදු කරන ලද අතර, තාක්ෂණික තක්සේරුව සඳහා අදාළ තොරතුරු රැස් කිරීම දැනට සිදුවෙමින් පවතී. මීට අමතරව, නව පිරිසැලසුම් සැලසුම් කිරීම, ස්ථාන වෙනස් කිරීම් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අනුමැතිය අපේක්ෂාවෙන් පසු වේ.

මාන්තෙයි බටහිර සුළං බල ව්‍යාපෘතිය සඳහා, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ ස්ථාන සංචාරයක් අවසන් කර ඇත. දැනට, තාක්ෂණික ඇගයීම සඳහා අදාළ තොරතුරු රැස් කිරීම සිදු වෙමින් පවතින අතර, ඉඩම් ආශ්‍රිත දත්ත රැස් කිරීම ආරම්භ කෙරේ. සුළං ටර්බයින සඳහා වඩාත් සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයන් දැනට සිදු වෙමින් පවතී.





(කරච්චි සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය)

## 4.2 ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ ක්‍රියාකාරකම්

4.2.1 2007 අංක 35 දරන ශ්‍රී ලං.සු.බ.අ. පනතේ 35 (ඈ) සහ (ඉ) වගන්තිවල දක්වා ඇති නියාමන විධිවිධානවලට අනුකූලව, ශ්‍රී ලං.සු.බ.අ. විසින් උපකරණ බලශක්ති ලේබලකරණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. වර්තමානයේ මෙම වැඩසටහන පුළුල් පරාසයක උපකරණ ආවරණය කර ඇත. වායු සමන සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතියේ සංශෝධන අවසන් කර වායු සමන සඳහා නියාමන ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට නියමිත අතර, මේ සඳහා කෙටුම්පත් සැදීම දැනටමත් සිදු කර ඇත. වායු සමන යන්ත්‍ර පරීක්ෂණාගාරය ස්ථාපිත කිරීම අවසන් කර ඇත. පරීක්ෂණාගාරය ආරම්භ කරන ලද අතර, එහි ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව පිළිබඳ ස්ථානීය පුහුණුව පරීක්ෂණාගාර කාර්ය මණ්ඩලයට ලබා දෙන ලදී. විදුලි මෝටර සඳහා කෙටුම්පත් ප්‍රමිතිය අවසන් කර ඇත. USAID හි සහාය ඇතිව විදුලි මෝටර් පරීක්ෂණාගාරයක් සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කිරීම දැනට සිදු වෙමින් පවතී. කිලෝවොට් 10 දක්වා ධාරිතාවක් සහිත විදුලි මෝටර පරීක්ෂා කිරීම සඳහා NERDC හි පරීක්ෂණාගාරයක් ස්ථාපනය කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇත. LED මොඩියුල සඳහා වන කෙටුම්පත් නියාමනය ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කිරීමට නියමිත අතර, මේ සඳහා කෙටුම්පත් සැකසීම දැනටමත් සිදු කර ඇත. තවද, LED මොඩියුල සඳහා ස්වේච්ඡා බලශක්ති ලේබලකරණය වැඩසටහන දැනට ක්‍රියාත්මක වේ. මීට අමතරව, විදුලි බත් පිසින සඳහා කෙටුම්පත් ප්‍රමිතිය අවසන් කර ඇත. NERDC හි ජල පොම්ප සඳහා පරීක්ෂණාග ාරයක් ඉදිකිරීම අවසන් කර ඇති අතර, දැනට මිණුම් සලකුණු පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. රූපවාහිනී සඳහා කෙටුම්පත් ප්‍රමිතිය අවසන් කර ඇත. මිණුම් සලකුණු ස්ථාපිත කිරීම සඳහා වෙළඳපොලේ නිෂ්පාදනවල බලශක්ති කාර්ය සාධනය පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. පාදක විදුලි පංකා සඳහා කෙටුම්පත් ප්‍රමිතිය අවසන් කර ඇති අතර, මොරටුව විශ්ව විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මිණුම් සලකුණු පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. ගෑස් උදුන් සඳහා කෙටුම්පත් ප්‍රමිතිය දැනට අවසන් වෙමින් පවතී. රෙදි සෝදන යන්ත්‍ර, විදුලි තාපන උපාංග සහ විදුලි උදුන් සඳහා කෙටුම්පත් ප්‍රමිතීන් සකස් කිරීම සිදුවෙමින් පවතී. මීට අමතරව, USAID හි සහාය ඇතිව වෙබ් ද්වාරයක් සහ QR කේත භාවිතා කරමින් උපකරණ ලේබල් කිරීමේ වේදිකාව ඩිජිටල්කරණය කිරීම සඳහා, වෙබ් ද්වාරය සඳහා ව්‍යුහය අවසන් කර ඇති අතර වෙබ් ද්වාරය සංවර්ධනය කිරීම සිදු කෙරෙමින් පවතී.

4.2.2 ගොඩනැගිලිවල බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම රටේ තිරසාර බලශක්ති සංවර්ධන උපාය මාර්ගයේ වැදගත් අංගයකි. 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ (උ) වගන්තියේ දක්වා ඇති නියාමන විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලං.සු.බ.අ. විසින් බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි පිළිබඳ කාර්ය සංග්‍රහය (EEBC) ප්‍රකාශයට පත් කරන ලදී. ගොඩනැගිලිවල බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තිකයන්ට මෙම කාර්ය සංග්‍රහය මග පෙන්වීම සපයයි. 2021 දී සංශෝධිත කාර්ය සංග්‍රහය ප්‍රකාශයට පත් කරන ලද අතර, එය ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. USAID ආයතනය විසින් සහාය දක්වන ලද ගොඩනැගිලි අංශයේ වෘත්තිකයන් සඳහා පුහුණු වැඩසටහනක් සහ ගොඩනැගිලි සමාකරණ (Building Energy Simulation) මෘදුකාංග කෙරෙහි අවධානය යොමු කරන ඉංජිනේරුවන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා වෙනම පුහුණු වැඩසටහනක් මෙයට ඇතුළත් වේ. මීට අමතරව, වර්ග මීටර් 5,000 ඉක්මවන බිම් ප්‍රමාණයක් සහ 1,000 kVA ට වැඩි විදුලි බල ඉල්ලුමක් ඇති ගොඩනැගිලි සඳහා කාර්ය සංග්‍රහය පිළිපැදීමට අනිවාර්ය නියාමනයක් කෙටුම්පත් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. ඇගයීම සිදු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය අදාළ ගොඩනැගිලි බලධාරීන්ගෙන් ලබා ගන්නා ලදී. USAID ආයතනය දැනට අරමුදල් සැපයීමට අදහස් කරන සමාගමක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් සිටින අතර ගොඩනැගිලි ඇගයීම සඳහා ලැබුණු ටෙන්ඩර් ඇගයීමේ අදියරේ ද සිටී.

4.2.3 ශ්‍රී ලංකා බලශක්ති තුලනය (Sri Lanka Energy Balance) යනු රටේ බලශක්ති අංශයේ කාර්ය සාධනය ඉදිරිපත් කරන පුළුල් වාර්තාවකි. 2021 වාර්තාව ප්‍රකාශයට පත් කර ඇති අතර,

2022 සඳහා දත්ත රැස් කිරීම අවසන් කර දැනට සම්පාදනය වෙමින් පවතින අතර, 2023 සඳහා දත්ත රැස් කිරීම ආරම්භ කර ඇත.

**4.2.4** තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් මූලස්ථානය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) යන ආයතන සඳහා රෝග-ප්‍රතිරෝධී, බලශක්ති-කාර්යක්ෂම මධ්‍යගත වායු සමන පද්ධති ක්‍රියාත්මක කිරීමේ ADB නියමු ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇත. මෙම නව තාක්ෂණය පිළිබඳ දැනුම බෙදා හැරීම සහ අලුතින් ස්ථාපනය කරන ලද පද්ධති ප්‍රදර්ශනය කිරීම සඳහා, 2024 අප්‍රේල් 4 සහ 5 යන දිනවල කලාපීය වැඩමුළුවක් පැවැත්විණි. මෙම අවස්ථාවට දකුණු ආසියාවේ සහ අග්නිදිග ආසියාවේ වෘත්තිකයන්, තාක්ෂණික විශේෂඥයින් සහ රජයේ බලධාරීන් එක්රැස් විය.






(ADB නියමු ව්‍යාපෘතිය පිළිබඳ කලාපීය වැඩමුළුව)

**4.2.5** කාර්මික හා වාණිජ අංශවල බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් සහ බලශක්ති සේවා සපයන්නන් ලියාපදිංචි කරනු ලැබේ. 2023 ජූලි 4 වන දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2339/09 දරන බලශක්ති පිල් ලකුණු පිළිබඳ රෙගුලාසියට අනුව, බැංකු, මූල්‍ය ආයතන සහ සිල්ලර විකිණුම් වෙළඳසැල් සඳහා බලශක්ති කළමනාකරුවන් 29 දෙනෙකු පත් කර ඇත. සමස්තයක් වශයෙන්, ශ්‍රී ලං.සු.බ.අ. බලශක්ති කළමනාකරුවන් 291 දෙනෙකු පත් කර ඇත. ඊට අමතරව, බලශක්ති දත්ත වාර්තා කිරීම සහ විශ්ලේෂණය පහසු කිරීම සඳහා වෙබ් ද්වාරයක් සංවර්ධනය කර දියත් කර ඇත. වෙබ් ද්වාරය හරහා ආයතන ලියාපදිංචි කිරීම සහ බලශක්ති දත්ත ලබා ගැනීම දැනට සිදුවෙමින් පවතින අතර, දැනටමත් ආයතන ශාඛා 800 කට වඩා ලියාපදිංචි කර ඇත. ලියාපදිංචි කළ බලශක්ති විගණකවරුන්ගේ මුළු සංඛ්‍යාව 25 දක්වා වැඩි වී ඇත. 2024 සඳහා බලශක්ති සේවා සමාගම්වල ලියාපදිංචි කිරීම් අලුත් කිරීම සහ නව සමාගම් ලියාපදිංචි කිරීම අවසන් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසර සඳහා ලියාපදිංචි කර ඇති මුළු බලශක්ති සේවා සමාගම් (ESCos) 31 ක් ඇත. 2025 සඳහා එම සමාගම් ලියාපදිංචිය අලුත් කිරීම ආරම්භ කරන ලදී.

ශ්‍රී ලං.සු.බ.අ. විසින් බලශක්ති කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී; ඒ අනුව බැංකු, සුපිරි වෙළඳසැල් සහ මූල්‍ය ආයතනවල බලශක්ති කළමනාකරුවන් සඳහා බලශක්ති පිල් ලකුණු පිළිබඳ රෙගුලාසිය සහ වෙබ් ද්වාරය පිළිබඳ එක්දින වැඩසටහනක්; මාතර සහ අනුරාධපුර රජයේ රෝහල් සඳහා බලශක්ති කළමනාකරණය සහ NEBP වෙබ් ද්වාරය පිළිබඳ දෙදින වැඩසටහන්; මධ්‍යම පළාතේ රජයේ අංශයේ බලශක්ති කළමනාකරුවන් සඳහා එක්දින වැඩසටහනක්; සහ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ ඉදිකිරීම් කර්මාන්තය සඳහා එක් වැඩසටහනක් පවත්වන ලදී.

**4.2.6** ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, මෝදර යුධ හමුදා කඳවුර, නාලන්දා විද්‍යාලය, පිටිපන ශ්‍රී ලංකා ටෙලිකොම් දත්ත මධ්‍යස්ථානය සහ දික්ඕය, තෙල්දෙණිය, රිකිල්ලගස්කඩ, නාඋල සහ කෝන්ගහගෙදර යන මූලික රෝහල් ඇතුළු ආයතන කිහිපයක බලශක්ති විගණන පවත්වන ලදී. පරිසර අමාත්‍යාංශයේ බලශක්ති විගණනය සිදුවෙමින් පවතී. මෙම විගණන සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ කණ්ඩායමක් සහාය දක්වන ලදී. මෙම විගණන හරහා වාර්ෂිකව මෙගාවොට් පැය 300 ක් පමණ බලශක්ති ඉතිරියක් ඇස්තමේන්තු කර ඇත. උපකරණ බැංකුව සඳහා උපකරණ සහ පුද්ගලික ආරක්ෂක උපකරණ මිලදී ගැනීම

අවසන් කර ඇති අතර, මුළු උපකරණ කුලියට ගැනීමේ දින 1,365 ක් වාර්තා වී ඇත.






(ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහ නාලන්දා විද්‍යාලයේ පවත්වන ලද බලශක්ති විගණනය)

**4.2.7** නියමු ව්‍යාපෘතියක් ලෙස, දිවුලපිටිය ප්‍රාදේශීය සභාව තුළ කාර්යක්ෂම වීදි ලාම්පු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මගින් පවතින සෝඩියම් වාෂ්ප ලාම්පු, රසදිය ලාම්පු සහ තාපදීප්ත ලාම්පු වෙනුවට වොට් 150, වොට් 50 සහ වොට් 20 බලයෙන් යුත් කාර්යක්ෂම LED වීදි ලාම්පු ආදේශ කිරීමට අපේක්ෂා කෙරේ. දැනට, වොට් 150 සහ වොට් 50 LED වීදි ලාම්පු 250 ක් සාර්ථකව ප්‍රතිස්ථාපනය කර ඇත. දෙවන අදියර සඳහා ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. ටෙන්ඩරය ප්‍රදානය ලද තැනැත්තා වොට් 20 LED බල්බවල සපයා ඇති අතර, ස්ථාපනය දිවුලපිටිය ප්‍රාදේශීය සභාව විසින් සිදු කරනු ලැබේ. මේ වන විට, බල්බ 1,100 ක් ස්ථාපනය කර ඇත.

**4.2.8** වර්තමානයේ, වාණිජ හෝටල්, රජයේ ආයතන, රෝහල් සහ කර්මාන්ත ඇතුළුව විවිධ අංශවල ගොඩනැගිලිවල භාවිතා කරන මුළු බල ශක්තියෙන් ආසන්න වශයෙන් 40% සිට 80% දක්වා ප්‍රමාණයක් වායු සමන පද්ධති සඳහා වැය වේ. ඒ අනුව සිසිලන වායු සමන යන්ත්‍ර පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සහ දිගුකාලීන බලශක්ති ඉතිරිකිරීමේ වැඩසටහනක් සංවර්ධනය කිරීමේ වැදගත්කම මතු වී ඇත. මෙම අවශ්‍යතාවයට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ දැනට ස්ථාපනය කර ඇති සිසිලන යන්ත්‍ර ක්‍රියාත්මක වන වායු සමන යන්ත්‍ර පිළිබඳ තොරතුරු රැස් කිරීම අරමුණු කරගත් සිසිලන සමීක්ෂණයක් ශ්‍රී ලං.සු.බ.අ. විසින් පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය මගින් සිසිලන යන්ත්‍රවල බලශක්ති භාවිතය, කාර්යක්ෂමතාව සහ අනෙකුත් අදාළ දත්ත කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මීට අමතරව, පවතින ඒකක වඩාත් කාර්යක්ෂම සිසිලන යන්ත්‍ර මගින් ප්‍රතිස්ථාපනය කිරීමෙන් සාක්ෂාත් කරගත හැකි බලශක්ති ඉතිරිය තක්සේරු කිරීමට අපේක්ෂා කෙරේ.

රට පුරා දැනට ස්ථාපනය කර ඇති සිසිලන යන්ත්‍ර 1,000 ක් පමණ ඇති බවත්, සැලකිය යුතු කොටසක් අවුරුදු 10 සිට 15 දක්වා පැරණි අකාර්යක්ෂම ඒකක බවත් සමීක්ෂණයෙන් හඳුනාගෙන ඇත. මෙම අකාර්යක්ෂම යන්ත්‍ර වඩාත් කාර්යක්ෂම ඒකක සමඟ ප්‍රතිස්ථාපනය කිරීමෙන් වසරකට ගිගාවොට් පැය 70 ක් පමණ ඉතිරි කර ගත හැකි බවත්, එමඟින් කාබන් විමෝචනය ($CO_2$) ටොන් 48,400 කින් අඩු කිරීමට හේතු වන බවත් සමීක්ෂණයෙන් හෙළි විය. මෙම සමීක්ෂණයට අදාළ සවිස්තරාත්මක බලශක්ති විගණන සහ අවසාන බලශක්ති විගණන අවසන් කර ඇත. අවසාන වාර්තාව ලැබී ඇති අතර, පරිසර අමාත්‍යාංශයට එය ඉදිරිපත් කරන ලදී.

## 5. 2025 සඳහා ඉදිරි වැඩසටහන්

පූනරින්, මන්නාරම, සියඹලාණ්ඩුව, කරච්චි, චේරවිල්, තුනුක්කායි, මාන්තයි බටහිර සහ දැදුරු ඔය යන ප්‍රදේශවල ව්‍යාපෘති 2025 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වේ. අපගේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යාපෘති අනුමත කිරීම, ඉඩම් අත්පත් කර ගැනීම, ශක්‍යතා අධ්‍යයන සහ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ අවශ්‍ය අදියරයන් සිදු කරනු ලැබේ.

තේ කර්මාන්ත සහ රෝහල් අංශ සඳහා බලශක්ති පිල් ලකුණු ස්ථාපිත කිරීම පුළුල් කරනු ලබන අතර, මූල්‍ය හා සිල්ලර වෙළඳ අංශ සඳහා පවතින පිල් ලකුණු සංශෝධනය කරනු ලැබේ. ජාතික බලශක්ති පිල් ලකුණු වෙබ් ද්වාරය

හරහා බලශක්ති දත්ත වාර්තා කිරීම තවදුරටත් සිදු කරන අතර බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් සහ බලශක්ති සේවා සපයන්නන් පත් කිරීම දිගටම කරගෙන යනු ඇත. මීට අමතරව, විවිධ සුදුසුකම් මට්ටම් හඳුන්වා දීමෙන් බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පිළිබඳ රෙගුලාසි සංශෝධනය කිරීමෙන් බලශක්ති විගණක පත්වීම් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමට සැලසුම් ක්‍රියාත්මක වේ.

තවද, බලශක්ති භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා ආයතනවලට සහාය වීම සඳහා බලශක්ති විගණන සහ උපදේශන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරන පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ද විවිධ කාර්මික හා වාණිජ අංශ ඉලක්ක කර ගනිමින් පවත්වාගෙන යනු ලැබේ. මීට අමතරව, බලශක්ති සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතන, බලශක්ති කළමනාකරුවන් සහ බලශක්ති සේවා සපයන්නන්ගේ දායකත්වය ඇගයීම සඳහා ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන උළෙල පවත්වනු ලැබේ.

ශ්‍රී ලං.සු.බ.අ. විසින් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක කොටසක් ලෙස, උපදේශන පැවරුමක් භාවිතා කරමින් කාර්මික උද්‍යාන හතරක ත්‍රි-උත්පාදන විභවය පිළිබඳ සීඝ්‍රගාමී තක්සේරුවක් සිදු කරනු ඇත. මෙමගින් ආයෝජන මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන කාර්මික උද්‍යානවල ඉහළ බලශක්ති පරිභෝජනයක් සහිත කර්මාන්තවල තාප සැපයුම, සිසිලනය සහ විදුලි උත්පාදන විභවය පිළිබඳ විස්තර ලබා දෙනු ඇත. දිවා කාලයේ නිපදවන සූර්ය ශක්තිය රාත්‍රී කාලයේ භාවිතා කිරීමට උපකාරී වන නැවත ආරෝපණය කළ හැකි සෝඩියම්-අයන බැටරියක් නිෂ්පාදනය කිරීම සඳහා 'සූර්ය වහල PV සඳහා බලශක්ති ගබඩා කිරීම පහසු කිරීමට නැවත ආරෝපණය කළ හැකි සෝඩියම්-අයන බැටරි යොදා ගැනීම සඳහා තාක්ෂණය සංවර්ධනය කිරීම' පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් පැවැත්වීමට SLINTEC එකඟ වී ඇත. ආයෝජන මණ්ඩල කලාප ඒවායේ ජෛව ස්කන්ධ පරිභෝජනයෙන් ඉහළ මට්ටමක පවතින අතර 2025 දී සැලසුම් කර ඇති ජෛව ස්කන්ධ පරිභෝජන සමීක්ෂණය මගින් මෙම ප්‍රමාණයන් සහ ප්‍රභවයන් පිළිබඳ වර්තමාන තත්ත්වය ලබා දෙනු ඇත. නව තාක්ෂණයන් සහ කාර්යක්ෂම බලශක්ති දාමයන් හඳුන්වාදීම තුළින් විභවය සාක්ෂාත් කර ගැනීම සඳහා ධීවර අංශයේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිළිබඳ අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ කාර්යක්ෂම වීදි ආලෝකකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියමු ව්‍යාපෘතියේ පශ්චාත් අධීක්ෂණය, බලශක්ති ඉතිරිකිරීම් සහ ව්‍යාපෘතියේ අනෙකුත් ප්‍රතිලාභ ඇගයීම සඳහා සිදු කෙරේ.

බලශක්ති ලේබලකරණ වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සැලසුම් කෙරේ:

- පරීක්ෂණාගාර මෙහෙයුම් සහ ඒ ආශ්‍රිත දැනුවත් කිරීමේ මුලපිරීම් සඳහා මූල්‍ය සහාය ලබා ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින්, විදුලි මෝටර සඳහා ස්වේච්ඡා ලේබලකරණ යෝජනා ක්‍රමයක් මෙම අධිකාරිය විසින් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.
- විදුලි බත් පිසින සඳහා පරීක්ෂණාගාරයක් ස්ථාපනය කරනු ලබන අතර, ස්වේච්ඡා ලේබලකරණ වැඩසටහන ශ්‍රී ලං.සු.බ.අ. විසින් දියත් කරනු ලැබේ.
- සැපයුම්කරු දැනුවත්භාවය ඉහළ නංවනු ලබන අතර, ජල පොම්ප සඳහා ස්වේච්ඡා ලේබලකරණ යෝජනා ක්‍රමය ශ්‍රී ලං.සු.බ.අ. විසින් ආරම්භ කරනු ලැබේ.
- රූපවාහිනී සඳහා කෙටුම්පත් ප්‍රමිතිය අවසන් කරනු ලබන අතර, පරීක්ෂණාගාර සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.
- පාදක විදුලි පංකා සඳහා ඉතිරි මිණුම් සලකුණු පරීක්ෂණ සම්පූර්ණ කළ යුතු අතර, පසුව කෙටුම්පත් ප්‍රමිතිය අවසන් කර අවශ්‍ය පරීක්ෂණාගාර උපකරණ මිලදී ගත යුතුය.
- ගෑස් උඳුන් සඳහා කෙටුම්පත් ප්‍රමිතිය සම්පූර්ණ කිරීම අවශ්‍ය වේ.
- පුළුල් දත්ත සමුදායක් සකස් කරනු ලැබේ, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සම්මන්ත්‍රණ ක්‍රියාත්මක කරනු ලැබේ, සහ බලශක්ති ලේබල් සඳහා පූර්ව-නියම කරන

ලද QR කේත වෙබ් වේදිකාවේ පරීක්ෂණ ධාවනයක් ශ්‍රී ලං.සු.බ.අ. විසින් පවත්වනු ලැබේ.

- පරිගණක සඳහා අවශ්‍ය පරීක්ෂණාගාර උපකරණ ශ්‍රී ලං.සු.බ.අ. විසින් මිලදී ගනු ලැබේ.
- රෙදි සෝදන යන්ත්‍ර, විදුලි ජල තාපාංක උපාංග සහ විදුලි උඳුන් සඳහා කෙටුම්පත් ප්‍රමිතීන් ශ්‍රී ලං.සු.බ.අ. විසින් සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම මුලපිරීම් සැලසුම් කර ඇත්තේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ මෙම අංශ හරහා තිරසාර බලශක්ති කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා ය.

# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (සභාව) 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ 2015 ජනවාරි 01 දින පිහිටුවන ලදී. සභාව දැනට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. පනතේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව විසින් කලයුතු කාර්යයන් වනුයේ,

(අ) මහජනතාවගේ, විකිරණ සේවකයන්ගේ, රෝගීන්ගේ හා පරිසරයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා බලපත්‍ර ලබාදීම, පරීක්ෂණ පැවැත්වීම හා ආනයන අපනයන පාලනය මගින් අයනීකරණ විකිරණ සම්බන්ධ කාර්යයන් නියාමනය කිරීම.

(ආ) විකිරණ ප්‍රභව වල ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

(ඇ) පනතේ විධිවිධාන උල්ලංඝනය කිරීම හා බලපත්‍ර වල කොන්දේසි උල්ලංඝනය කිරීම වෙනුවෙන් නීතිමය පියවර ගැනීම.

(ඈ) න්‍යෂ්ටික තාක්ෂණයේ යෙදවුම් වලට අදාලව ප්‍රවේසම, සුරක්ෂිතතාව හා ආරක්ෂණය සම්බන්ධව ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති ගිවිසුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කිරීමට කටයුතු කිරීම.

## 2. මෙම කාල සීමාව තුළ මුහුණ දුන් අභියෝග සහ එවැනි අභියෝගවලට මුහුණ දීම සඳහා අනුගමනය කළ උපාය මාර්ග

**2.1** සැලසුම් සහගත ක්‍රියාකාරකම් සහ නියමිත වේලාවට ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් තරම් විද්‍යාත්මක නිලධාරීන් සහ පරිපාලන කාර්ය මණ්ඩලයක් නොමැතිකම හේතුවෙන් සහ සාධාරණ කාල රාමුවක් තුළ ඉල්ලා සිටින ඇතැම් පරීක්ෂණවලට සහභාගි වීම සභාවට අභියෝගයක් විය. සේවකයින් කිහිප දෙනෙකුගේ ඉල්ලා අස්වීම් සහ විශ්‍රාම යෑම සහ බඳවා ගැනීම් සම්බන්ධයෙන් රජය විසින් පනවා ඇති සීමාවන් මෙම කාර්ය මණ්ඩල හිඟයට හේතුවයි. අනුමත කාඩර තනතුරු 45 ක් තිබුන ද දැනට නියාමන සභාවේ සිටින්නේ සේවකයින් 32ක් පමණි.

කෙසේ වෙතත්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නියාමන සභාවේ සහ පරිපාලන කටයුතු වැඩි දියුණු කිරීමට නියාමන සභාව සිය උපරිම උත්සාහය ගෙන ඇත. කාර්ය මණ්ඩලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී කාර්ය මණ්ඩලයේ කැපවීම සහ නොසැලෙන සහයෝගය හේතුවෙන් ඉහත බාධාවක් මධ්‍යයේ වුව ද අදාල වැඩ කටයුතු කිරීමට නියාමන සභාව උත්සාහ කර තිබේ.

**2.2** 2014 අංක 14 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත අනුව නියාමන සභාව විසින් සෑදිය යුතු නීති, රෙගුලාසි, නියෝග සහ ක්‍රියාපටිපාටි අතරින් 13 ක් සකස් කිරීම සඳහා 2023 වසර අග භාගයේදී නියාමන සභාව විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික ප්‍රධානත්වයෙන් යුතු කමිටු පත් කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේ මේ වන විට ඉහත නීති, රෙගුලාසි ආදිය සෑදීමේ කටයුතු වලින් 60% ක පමණ ප්‍රතිශතයක් නිම කිරීමට නියාමන සභාව සමත් විය.

## 3. 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා ලබා ඇති ප්‍රගතිය

වගුව 5.1
**නියාමන ක්‍රියාකාරකම්**

| අංකය | ක්‍රියාකාරකම | 2024 සඳහා ඉලක්කය | 2024/ ප්‍රගතිය | ප්‍රගති ප්‍රතිශතය | අදහස්/සටහන් |
|---|---|---|---|---|---|
| 01. | නව සහ අලුත් කිරීමේ බලපත්‍ර නිකුත් කිරීම (අයදුම්පත් සැකසීම, වෙනස් කිරීම් නිකුත් කිරීම සහ පවතින බලපත්‍රයට දීර්ඝ කිරීම් ද ඇතුළත් වේ) | 350 | 389 | 111.14% | ඉලක්කය සපුරා ගන්නා ලදී |
| | නිකුත් කරන ලද අන්තර් කාලීන බලපත්‍ර දීර්ඝ කිරීම් | 100 | 138 | ---- | ඉලක්කය සපුරා ගෙන ඇත |
| 02. | විකිරණ අපවිත්‍රතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගත් ආහාර සාම්පල සඳහා නියාමන සහතික නිකුත් කිරීම | 4000 | 3475 | 86.87% | ඉල්ලීම මත රඳා පවතී |
| 03. | විකිරණ පහසුකම් වල නියාමන පරීක්ෂාවන් සිදුකිරීම | 500 | 282 | 56.4% | සේවක හිගය හේතුවෙන් ඉලක්කය සපුරා ගෙන නොමැත |
| 04. | විකිරණශීලී ද්‍රව්‍ය සහ ප්‍රවිකිරණ උපකරණ සඳහා ආනයන/අපනයන අනුමැතියන් ලබාදීම | 480 | 500 | 104.16% | ඉලක්කය සපුරා ගෙන ඇත |
| 05 | විකිරණ පහසුකම් සඳහා අනුමැතිය ලබාදීම | 80 | 94 | 117.5% | ඉලක්කය සපුරා ගෙන ඇත |

වගුව 5.2
**ජාතික පුහුණු පාඨමාලා**

| වැඩසටහන | භෞතික වැඩසටහන | |
|---|---|---|
| | **2024/12/31** දක්වා ඉලක්කය | ප්‍රගතිය |
| රෝග විනිශ්චය එක්ස් කිරණ පහසුකම් අංශ වල සේවය කරනු ලබන සහ කාර්මික හා වෛද්‍ය පහසුකම් වල සේවය කරනු ලබන "ක්‍රියාකරුවන් සඳහා විකිරණ ආරක්ෂණය" පිලිබඳ ජාතික පුහුණු පාඨමාලාව (T/OPU/M/05) (අඛණ්ඩව) | සහභාගිවන්නන් 30 (පෙබරවාරි 7 -9 ) | පුහුණුවන්නන් 20 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පෙබරවාරි 7-9 දක්වා පාඨමාලව පවත්වන ලදී. |
| ජාතික පුහුණු පාඨමාලා III සහ IV කාණ්ඩයේ කාර්මික පහසුකම් (T/OPU/M/04) හි ක්‍රියාකරුවන්/පරිශීලකයින් සඳහා විකිරණ ආරක්ෂණය පිලිබඳ ජාතික පුහුණු පාඨමාලාව | සහභාගිවන්නන් 30 | පුහුණුවන්නන් 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ජූනි 24 -26 දක්වා පාඨමාලව පවත්වන ලදී. |
| විකිරණ චිකිත්සාව/න්‍යෂ්ඨික ඖෂධ පහසුකම් වල ක්‍රියාකරුවන්/පරිශීලකයන් සඳහා විකිරණ ආරක්ෂණය පිලිබඳ ආරක්ෂණය ජාතික පුහුණු පාඨමාලාව (T/OPU/M/04) | සහභාගිවන්නන් 30 | පුහුණුවන්නන් 11 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ජූලි 9 -11 දක්වා පාඨමාලව පවත්වන ලදී. |
| I සහ II කාණ්ඩවල කාර්මික පහසුකම්වල (T/OPU/I/03) "ක්‍රියාකරුවන්/පරිශීලකයින් සඳහා විකිරණ ආරක්ෂණය" පිලිබඳ ජාතික පුහුණු පාඨමාලාව. | සහභාගිවන්නන් 30 | සහභාගිවන්නන් 17 දෙනෙකු සඳහා සැප්තැම්බර් 03 සිට 05 දක්වා පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. |
| රෝග විනිශ්චය එක්ස් කිරණ පහසුකම් (T/OPU/M/05) සහ දන්ත/පශු වෛද්‍ය රෝග විනිශ්චය එක්ස් කිරණ පහසුකම් (T/OPU/M/06) හි "ක්‍රියාකරුවන්/පරිශීලකයින් සඳහා විකිරණ ආරක්ෂණය" පිලිබඳ ජාතික පුහුණු පාඨමාලාව. | සහභාගිවන්නන් 30 | සහභාගිවන්නන් 88 දෙනෙකු සඳහා සැප්තැම්බර් 10 සිට 13 දක්වා පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. |
| SLAERC සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සඳහා IAEA සහයෝගයෙන් පවත්වන සැලසුම් පදනම් තර්ජනය (DBT) ) පිලිබඳ ජාතික වැඩමුළුව | සහභාගිවන්නන් 30 | අගෝස්තු 27 සිට 30 දක්වා සහභාගිවන්නන් 30 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. |
| පළමු ප්‍රතිචාර දක්වන්නන් සඳහා හදිසි සූදානම සහ ප්‍රතිචාර දැක්වීම පිළිබඳ ජාතික පුහුණු පාඨමාලාව | සහභාගිවන්නන් 20 | 2025 දක්වා කල් දමන ලදී |

වගුව 5.3
රෙගුලාසි, රීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම

| අනු අංකය | වැඩසටහන | භෞතික | |
|---|---|---|---|
| | | 2024/12/31 ට ඉලක්කය | ප්‍රගති ප්‍රතිශතය % |
| 01 | අයනීකරණ විකිරණ ආරක්ෂණය සහ විකිරණ ප්‍රභවයන්ගේ ප්‍රවේසම පිළිබඳ නියෝග අවසන් කිරීම | රෙගුලාසිය ගැසට් කිරීම | 70% |
| 02 | (ඇ) විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම | ක්‍රියාත්මක කිරීම | 80% |
| 03 | ජාතික න්‍යෂ්ටික හෝ විකිරණ හදිසි කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම | නියාමන සභාවේ හදිසි ප්‍රතිචාර කණ්ඩායම් පුහුණු කිරීම | 80% |
| 04 | න්‍යෂ්ඨික බලාගාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සපුරාලීම සඳහා නව පරමාණුක බලශක්ති පනත සකස් කිරීම | මූලික කෙටුම්පත් කිරීම අවසන් කිරීම | ***මූලික කෙටුම්පත් කිරීම අවසන් කිරීම |
| 05 | මුද්‍රා සහිත විකිරණශීලී ප්‍රභව සඳහා ජාතික ලේඛනයක් නඩත්තු කිරීම | දත්ත ඇතුලත් කර රෙජිස්ටර යාවත්කාලීන කිරීම | 100% |
| 06 | නියාමන අධිකාරියේ තොරතුරු පද්ධතියේ ඇති ප්‍රභව ලේඛනය යාවත්කාලින කිරීම | RAIS දත්ත පද්ධතියේ තොරතුරු යාවත්කාලීන කිරීම | 100% |
| 07 | මාර්ගගත බලපත්‍ර සහ අනුමත කිරීමේ ක්‍රමය නිකුත් කිරීම | ක්‍රියාත්මක කිරීම | 90% |
| 08 | විද්‍යාත්මක හා අනෙකුත් කාර්ය මණ්ඩලය දේශීය හා විදේශීය පාඨමාලා හා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ව්‍යාපෘති යටතේ පුහුණු කිරීම | රැකියා පුහුණුව ලබාදීම | 100% |
| 09 | ආයතනයේ නිල වෙබ් අඩවියේ බලපත්‍රලාභී පහසුකම් පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීම | භාවිතා කරන්නන්ගේ බලපත්‍ර තොරතුරු යාවත්කාලීන කිරීම | 100% |

***Preparation of the Atomic Energy Act for fulfilling the requirements of operation of NPP

## 4. දැනට ක්‍රියාත්මක ද්විපාර්ශ්වික වැඩසටහන්

(අ) රට තුළ භාවිතා වන ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ප්‍රභවයන් සඳහා සුරක්ෂිතතාව සැපයීම සඳහා නියාමන සභාව එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුවේ ගෝලීය ද්‍රව්‍ය සුරක්ෂිතතා වැඩසටහන සමඟ සම්බන්ධ වී කටයුතු කරන අතර එහි තාක්ෂණික සහාය යටතේ නියාමන සභාව ඉහළ විකිරණශීලී ප්‍රභවයන් භාවිතා කරන පහසුකම්වල ආරක්ෂාව සහතික කිරීම සඳහා භෞතික ආරක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරයි. ඇමරිකා එක්සත් ජනපදයේ බලශක්ති දෙපාර්තමේන්තුවේ අධි විකිරණශීලි ප්‍රභවයන් භාවිතා කරන ස්ථාන 12ක නෛතික ආරක්ෂණ පද්ධති නඩත්තු කිරීම සඳහා නඩත්තු කොන්ත්‍රාත්තු අනුමත කරන ලද අතර එම පද්ධති සියල්ලම කටුකරුන්දේ පුහුණු පාසලේ පිහිටි මධ්‍යම නිරීක්ෂණ මධ්‍යස්ථානයට සම්බන්ධ කරන ලදී.

(ආ) "න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථා සඳහා සූදානම සහ ප්‍රතිචාරය ශක්තිමත් කිරීම" මෙම ව්‍යාපෘතිය යටතෙ කවුන්සිලය ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සි තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතියට සහභාගී වේ

ඇ) විද්‍යාත්මක කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, හදිසි ප්‍රතිචාර සහ සූදානම සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම සහ අවශ්‍ය හදිසි සූදානම සහ ප්‍රතිචාර ලේඛන සකස් කිරීම සඳහා විශේෂඥ මෙහෙයුම් සඳහා කවුන්සිලය පියවර ගෙන තිබේ.

## 5. 2025 සඳහා ඉදිරි වැඩසටහන්

### 5.1 නියාමන ක්‍රියාකාරකම්

වගුව 5.4
අනාගත නියාමන ක්‍රියාකාරකම්

| වැඩසටහන | 2025 සඳහා සිදු කළ යුතු ක්‍රියාකාරකම් |
|---|---|
| 1. රෙගුලාසි, රීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම | 1.1 අයනීකරණ විකිරණ ආරක්ෂණය සහ විකිරණ ප්‍රභවයන්ගේ ආරක්ෂාව පිළිබඳ කෙටුම්පත් රෙගුලාසි සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සහ සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.<br>1.2 විකිරණශීලී මූලාශ්‍රවල ආරක්ෂාව පිළිබඳ රෙගුලාසි රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සහ එහි අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br>1.3 විකිරණ සේවකයින්ගේ සුදුසුකම් සඳහා වන නිර්ණායක සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සහ සිංහල සහ දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම.<br>1.4 බලයලත් පරීක්ෂකවරුන් විසින් පරීක්ෂණ පටිපාටිය ක්‍රියාත්මක කිරීම.<br>1.5 විකිරණශීලී අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන ජාතික ප්‍රතිපත්ති කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.<br>1.6 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ දක්වා ඇති අවශ්‍යතාවයන් වන ප්‍රවේශම් සහිතව විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ රීතිය, ප්‍රවේශම හා සුරක්ෂිතතාව පිළිබඳ ප්‍රතිපත්තිය, නෂ්ටික හෝ විකිරණශීලී ද්‍රව්‍ය හදිසි අවස්ථා කළමණාකරන රීතිය හා බලාත්මක කිරීමේ පටිපාටිය ආදිය ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම. |
| 2. විකිරණ ප්‍රභවයන් සහ විකිරණ පහසුකම් සඳහා බලපත්‍ර ලබා දීම සහ පරීක්ෂා කිරීම | 2.1. නිකුත් කිරීමට සැලසුම් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව (නව සහ අලුත් කිරීම) - 560<br>2.2. පැවැත්වීමට සැලසුම් කර ඇති පරීක්ෂණ ගණන - 500 |
| 3. විකිරණ ආරක්ෂණය පිළිබඳ ජාතික පුහුණු පාඨමාලාව | 3.1. වෛද්‍ය සහ කාර්මික ක්ෂේත්‍රවල බලපත්‍රලාභී පහසුකම්වල ක්‍රියාකරුවන් සහ විකිරණ ආරක්ෂණ නිලධාරීන් සඳහා ජාතික පුහුණු පාඨමාලා පැවැත්වීම - විකිරණ ආරක්ෂණ නිලධාරීන් 40 ක් සහ යන්ත්‍ර ක්‍රියාකරුවන් 80 ක්<br>3.2. ජාතික න්‍යෂ්ටික හෝ විකිරණ හදිසි කළමනාකරණ සැලැස්මේ අවශ්‍යතා අනුව පත් කරන ලද ප්‍රතිචාර කණ්ඩායම් සහ කමිටු සඳහා පුහුණුවීම් පැවැත්වීම |
| 4. අනුමැතිය ලබා දීම සහ සහතික නිකුත් කිරීම | 4.1. විකිරණශීලී ද්‍රව්‍ය සහ ප්‍රකිරණ උපකරණ ආනයනය/අපනයනය සඳහා අනුමැතිය ලබා දීම<br>අනුමත කිරීම් ලබා දීමට ඇස්තමේන්තු කර ඇත - 480<br>4.2. ආහාර පරීක්ෂා කිරීම සඳහා සහතික නිකුත් කිරීම<br>නිකුත් කිරීමට ඇස්තමේන්තු කර ඇති සහතික ගණන - 4000<br>4.3. විකිරණ පහසුකම් සැලසුම් සඳහා අනුමැතිය ලබා දීම.<br>ලබා දීමට ඇස්තමේන්තු කර ඇති අනුමත කිරීම් ගණන - 80 |
| 5. මාර්ගගත බලපත්‍ර සහ අනුමත කිරීමේ පද්ධතිය | මාර්ගගත බලපත්‍ර සහ අනුමත කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සහ තෝරාගත් පහසුකම් කිහිපයකට බලපත්‍ර ලබා දීම සහ ආනයනය සහ අපනයන අනුමැතිය සඳහා එය භාවිතා කිරීම. |
| 6. දත්ත සමුදාය සහ මූලාශ්‍ර ලේඛනය නඩත්තු කිරීම | 6.1. බලපත්‍රලාභීන්ගේ දත්ත ගබඩාව පවත්වාගෙන යාම, පරීක්ෂණ සහ අනෙකුත් අදාළ තොරතුරු.<br>6.2. විකිරණ ප්‍රභවයන් පිළිබඳ ජාතික ලේඛනය නඩත්තු කිරීම |
| 7. බලපත්‍රලාභී පහසුකම් පිළිබඳ තොරතුරු වෙබ් අඩවියේ ප්‍රකාශනය කිරීම | සේවා ලබා ගැනීම සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීම සඳහා මහජන තොරතුරු සඳහා කවුන්සිලයේ වෙබ් අඩවියේ ඇති සියලුම බලපත්‍රලාභී පහසුකම් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම. |
| 8. අධි ක්‍රියාකාරී විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම. අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම | ඉල්ලීම මත පදනම්ව ඉහළ ක්‍රියාකාරී විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා දීම සහ ප්‍රවාහනය අධීක්ෂණය |

### 5.2. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ තාක්ෂණික ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම

තාක්ෂණික සංස්ථා ව්‍යාපෘතිය SRL9013 2022-2023 ව්‍යාපෘති චක්‍රය සඳහා "සූදානම ශක්තිමත් කිරීම සහ න්‍යෂ්ටික හෝ විකිරණශීලී හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම IAEA වෙත ඉදිරිපත් කරන ලද අතර මෙම ව්‍යාපෘතිය හරහා පහත ප්‍රතිඵල සාක්ෂාත් කරගනු ඇත.

(අ) ඉහත ව්‍යාපෘතිය යටතේ, කවුන්සිලයේ නිලධාරීන් කිහිප දෙනෙකු, ප්‍රථමයෙන් ප්‍රතිචාර දක්වන සංවිධාන සහ තාක්ෂණික සංවිධාන සාමාජිකත්ව, විද්‍යාත්මක චාරිකා සහ ජාතික පුහුණුවීම් සහ අභ්‍යාස මගින් පුහුණු කිරීමට කවුන්සිලය සැලසුම් කර ඇත.

(ආ) හදිසි අභ්‍යාස පැවැත්වීම සහ සැබෑ හදිසි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීම. පුද්ගල ආරක්ෂණ උපකරණ, මිනුම් උපකරණ, පුහුණු උපකරණ සහ අපවිත්‍රතාව මැනීමේ උපකරණ මෙම ව්‍යාපෘතිය හරහා ලැබෙනු ඇත

(ඇ) නව පූර්ව අනතුරු ඇඟවීමේ අනාවරක පද්ධතියක් ස්ථාපිත කෙරේ - මෙම පද්ධතිය ජාත්‍යන්තර විකිරණ නිරීක්ෂණ තොරතුරු පද්ධතිය (IRMIS) දත්ත හුවමාරු වේදිකාව සමඟ අනුකූල වන අතර න්‍යෂ්ටික ව්‍යසනයකදී පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීමට උපකාරී වනු ඇත.

# හයවන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය යනු විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රජයේ ප්‍රමුඛතම න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ ආයතනයයි. ශ්‍රී ලංකා පරමාණුක මණ්ඩලය හි කර්තව්‍ය 2014 අංක 40 දරණ පරමාණුක බලශක්ති පනත මගින් පවරා ඇති බලතල වලින් පෙන්වා දී ඇත. ජාතික සංවර්ධන අරමුණු සඳහා න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක මණ්ඩලය අදාළසේවා, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු හරහා න්‍යෂ්ටික තාක්ෂණයේ සාමකාමී යෙදීම් ප්‍රවර්ධනය කර දිරිමත් කරන අතර ආරක්ෂාව, ආරක්ෂාව සහ ගුණාත්මකභාවය සහතික කරමින් නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා විකිරණ ආරක්ෂණ සේවා සපයයි. ශ්‍රී ලංකාවේ වෛද්‍ය, කෘෂිකාර් මික, කාර්මික, බලශක්ති සහ පාරිසරික අංශවල සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබාදිය හැකි බොහෝ ක්ෂේත්‍රවල න්‍යෂ්ටික තාක්ෂණයට පුළුල් පරාසයක යෙදවීම සිදුකරනු ලබයි.

පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය රජයෙන් ඒකාබද්ධ අරමුදල් ලබාගනී. තවද, තාක්ෂණික සහයෝගිතා (TC) ව්‍යාපෘති, කලාපීය සහයෝගිතා ගිවිසුම (RCA) ව්‍යාපෘති සහ සම්බන්ධීකරණ පර්යේෂණ ව්‍යාපෘති (CRPs) හරහා හැකියාවන් සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් තාක්ෂණික සහාය ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයෙන් (IAEA) ලබාගනී. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා න්‍යෂ්ටික විද්‍යාවේ සහ තාක්ෂණයේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා රටේ අදාළ පාර්ශවකරුවන්ගේ සංවිධාන / ආයතනවලට සහයෝගය ලබාදේ.

## 2. මෙම කාලපරිච්ඡේදය තුළ මුහුණදුන් අභියෝග සහ එවැනි අභියෝගවලට මුහුණදීම සඳහා අනුගමනය කරන ලද උපායමාර්ගඃ

| | අභියෝගය | අනුගමනය කරන ලද උපායමාර්ගය |
|---|---|---|
| 1 | සේවකයන් ඉවත්වයාම-රට තුළ පවතින ආර්ථික අර්බුදයෙන් බේරීමට වඩා හොඳ අවස්ථා (දේශීය හෝ විදේශීය) සෙවීම මෙන්ම නව කළමනාකරණ සහකාර බඳවාගැනීම් සඳහා අගමැති කාර්යාලයෙන් අනුමැතිය නොලැබීම | එදිනෙදා මෙහෙයුම් අවශයතා සපුරාලීම සඳහා ආධුනික පුහුණු සේවකයින් සහ උපාධි අපේක්ෂකයින් බඳවාගෙන ඇත. නමුත් එය අපේක්ෂා කළ පරිදි සාර්ථක නොවීය. |
| 2 | උපකරණ තාක්ෂණික දෝෂ සහ අමතර අයිතම, උපාංග, ආදිය නොමැතිකම සේවාසපයන්නන්ගේ සහාය නොලැබීම හේතුවෙන් මුහුණදෙන දුෂ්කරතා. | නවඋපකරණ, අමතර කොටස් සහ විශේෂඥ සහාය මිලදීගැනීම සඳහා IAEA වැනි ජාත්‍යන්තර පරිත්‍යාගශීලී ආයතනවලින් තාක්ෂණික සහාය ලබාගැනීම. |
| 3 | රජය විසින් පනවන ලද අයවැය සීමාවන් | වෑද්දුම්කරුවන් හට (වෙල්ඩර් සුදුසුකම් ලබාදීම, නව න්‍යෂ්ටික විශ්ලේෂණ ශිල්පීය ක්‍රම (උදාඃ මැණික් විශ්ලේෂණය) වැනි නව ආදායම් උත්පාදන සේවාවන් ස්ථාපිත කර ඇත. |
| 4 | මෙහෙයුම් පිරිවැය වැඩිවීම (විදුලිය, දුරකථන, කොන්ත්‍රාත් සේවා, ප්‍රවාහනය ආදිය). | පවතින සම්පත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ හරහා කාර්යමණ්ඩලයට මගපෙන්වීම. |
| 5 | සාමාන්‍ය විශ්ලේෂණ සේවා සඳහා ඇති ඉල්ලුම අඩුවීම (ආයතනික පාලනයෙන් ඔබ්බට) | රසායනාගාර ප්‍රතීතනය, තත්ත්ව සහතික ආදිය හරහා සේවාවන්හි ගුණාත්මකභාවය පවත්වාගෙන ගොස් ඇත. |
| 6 | IAEA වෙතින් ලැබෙන පරිත්‍යාග සඳහා රේගුනිෂ්කාශනය කටයුතු සඳහා අයවැයසීමාවන්. | අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් ආයතනවලින් අරමුදල් වෙන්කිරීම සඳහා සලකා බැලීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කරන ලදී |

| | | |
|---|---|---|
| 7 | ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානයහි ප්‍රධාන පාරිභෝගිකයාගෙන් (ලලාන් රබර්ස් පුද්ගලිකි සමාගමෙන්) නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට බාධා. මාසික පරිමාව බැඳීම් සඳහා ඔවුන් ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය සමඟ එකඟතාවයකට පැමිණ නොමැති අතර, එමගින් ආදායම අහිමි වී ඇත. | ගැටලුවේ මූල හේතුව (ය) හඳුනාගැනීම සඳහා ප්‍රධාන පාරිභෝගිකයා සමඟ වරින්වර සාකච්ඡා කිරීම.<br><br>ගැමා ප්‍රවිකිරණය කෙරෙහි උනන්දුවක් දක්වා ඇති අනෙකුත් විභව ගනුදෙනුකරුවන් සඳහා රැස්වීම්, ස්ථාන නැරඹීම් ආදිය නිතිපතා සංවිධානය කරනු ලැබේ. ඊටඅමතරව, ගැමා ප්‍රවිකිරණය සඳහා නිෂ්පාදන අඛණ්ඩව සැපයීමට හැකියාව ඇති විභව ව්‍යාපාරික හවුල්කරුවන් සොයාගැනීම සඳහා ඉන්දියානු තානාපතිවරයා සමඟ රැස්වීමක් පවත්වනලදී. |

## 3. ප්‍රගතිය /ජයග්‍රහණ

### 3.1 ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය (SLGC)

ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය, බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටා ඇත. එය 2014 දී රටේ කර්මාන්තය සඳහා ගැමා ප්‍රවිකිරණ සේවාව සැපයීම සඳහා ස්ථාපිත කරන ලද රජය සතු එකම ප්‍රවිකිරණ පහසුකම වේ. වර්තමානයේ, ශ්‍රී ලංකාවේ සියලුම රජයේ රෝහල්වල භාවිතා කරන ශල්‍ය අත්වැසුම් විෂබීජහරණය කරන පහසුකම එයයි. ඊටඅමතරව, අනෙකුත් වෛද්‍ය නිෂ්පාදන, ආහාර ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය ආදිය ශල්‍ය අත්වැසුම් හා සසඳන විට අඩු ප්‍රමාණයකින් ප්‍රවිකිරණයකරනු ලැබේ.

වෛද්‍ය සහ ආහාර නිෂ්පාදන සඳහා ප්‍රවිකිරණ සේවාව සැපයීමෙන් 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකා ගැමා මධ්‍යස්ථානය හි උපයන ලද මුළුආදායම රු. මිලියන 26.42 කි.

### 3.2 නිර්-විනාශක පරීක්ෂණ සඳහා වූ ජාතිකමධ්‍යස්ථානය (NCNDT)

නිර්-විනාශක පරීක්ෂණ සඳහා වූ ජාතික මධ්‍යස්ථානය කැලණියේ පිහිටා ඇත.

මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වන්නේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිර්-විනාශක (NDT) සහ ඒ ආශ්‍රිත ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණුව, සහතික කිරීම සහ පරීක්ෂණ සහතික ලබාදීමයි.

- පරීක්ෂණ සේවා සහ නිර්-විනාශක පුහුණුව ලබාදීම: ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදන බලාගාර සඳහා ප්‍රමුඛතම නිර්-විනාශක සේවාසපයන්නා වන්නේ මෙම මධ්‍යස්ථානය වේ. විදුලිබල අංශයේ ඕනෑම හදිසි අවස්ථාවකදී පරීක්ෂාවට සහභාගීවීමට කාර්යමණ්ඩලය සූදානමින් සිටී.

  2024 දී පරීක්ෂණ අංශය විසින් පරීක්ෂණ 197 ක් සිදුකර ඇත.

- මීට අමතරව, නිර්-විනාශක පරීක්ෂණ සඳහා වූ ජාතික මධ්‍යස්ථානය, ශ්‍රී ලංකාවේ නිර්-විනාශක නොවන පරීක්ෂණ සඳහා වන ජාතික සහතික කිරීමේ ආයතනයේ (NCBNDT) ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සපයයි. ISO/IEC 17024 සහ ISO/IEC 9712 හි නවතම සංස්කරණය අනුකූලව හක්භෘඹ තම පාරිභෝගික තෘප්තිය සඳහා විශ්වාසදායක සුදුසුකම් සහ සහතික කිරීමේ සේවා සපයයි. එසේම, හක්භෘඹ යනු නිර්-විනාශක සේවාවේ පුද්ගල සහතික කිරීම සඳහා වන ජාත්‍යන්තර නිර්-විනාශක පරීක්ෂණ කමිටුවේ (ICNDT) බහුපාර්ශ්වික පිළිගැනීමේ ගිවිසුමේ (MRA) උපලේඛන 2 යටතේ ලියාපදිංචි පුද්ගල සහතික කිරීමේ ආයතනයකි (PCB).

- වෙල්ඩින් වැද්දුම්කරුවන්ගේ සුදුසුකම් ලබාදීමේ පහසුකම (WQF): වෙල්ඩින් කලාවේ වෙල්ඩින් ප්‍රජාව ගොඩනැගීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් වෙල්ඩින් වෘත්තිකයන් වන වෙල්ඩින් කාර්මිකයන්, වෙල්ඩින් අධීක්ෂකවරුන් සහ වෙල්ඩින් පරීක්ෂකවරුන් නිර්මාණය කිරීම සඳහා WQF ස්ථාපිත කරන ලදී. මෙම ද්‍ර්‍ය හි වාණිජ ක්‍රියාකාරිත්වය 2021 ජනවාරි මාසයේදී ශ්‍රී ලාංකික වෙල්ඩින් කාර්මිකයන් සඳහා වෙල්ඩර් කාර්යසාධන සුදුසුකම් (WPQ) සේවා පැවැත්වීමෙන් ආරම්භ කරන ලදී. ඒ අනුව, නිර්-විනාශක පරීක්ෂණ සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙහි WQF 2021 ජනවාරි සිට මේ දක්වා ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව උජු සඳහා රජයේ අංශයේ ප්‍රමුඛතම "

පරතරය පිරවීමේ සහ විභාග මධ්‍යස්ථානය" ලෙස සේවය කරයි. මෙම WQF පිහිටුවීමත් සමග එකිනෙකාට උපකාර කරමින් විදේශීය රැකියා අවස්ථා සඳහා දක්ෂ වෙල්ඩින් කාර් මික යන් යැවීමෙන් රටේ ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා රටට විදේශ ප්‍රේෂණ උපයා ගැනීමට අවස්ථාවක් තිබේ. වෙල්ඩින් ක්ෂේත්‍රයේ ඇති පරතරය පිරවීමේ සහ විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සහ කොලෙක්ස් ටෙක් පුද්ගලික ආයතනය අතර අත්සන් කරන ලද ඒකාබද්ධ ව්‍යාපාර ගිවිසුම සහ වෙල්ඩින් කාර් මික ශිල්පීන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ප්‍රදානය කිරීම සඳහා වන "පෙර ඉගෙනුම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය (RPL)" අයදුම්පත් පිළිබඳ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය අතර අත්සන් කරන ලද ගිවිසුම සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. 2024 වසර තුළ ඇමරිකානු යාන්ත්‍රික ඉංජිනේරු සංගමයේ (ASME) බොයිලේරු සහ පීඩන යාත්‍රාකේතය, IX වගන්තියට අනුව සුදුසුකම් ලත් පෑස්සුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව 172 ක් වන අතර හඬු සුදුසුකම් ලත් පෑස්සුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව 36 කි. ISO සහතික කිරීමේ යෝජනා ක්‍රමයට අනුව WQF සිය විෂය පථය පුළුල් කිරීමට ද අපේක්ෂා කරයි.

WQF සේවා ඇතුළුව සියලුම නිර්-විනාශක පරීක්ෂණ සේවාවන් මගින් උපයන මුළුආදායම රුපියල් මිලියන 36.1 කි

### 3.3 ජෛව විද්‍යා අංශයේ න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ (NAT) සේවාව

රට තුළ නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා ආනයනික කිරිපිටිවල විකිරණශීලී දූෂණය පරීක්ෂා කිරීම ගැමා වර්ණාවලීක්ෂ රසායනාග ාරයේදී සිදුකෙරේ. රටට ලැබුණු ආනයනික කිරිපිටිවල වලින් සෞඛ්‍ය අමාත්‍යාංශය (වරාය ආහාර පරීක්ෂක විසින්) විසින් එකතු කරන ලද සාම්පල විශ්ලේෂණය කර ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව (SLAERC) හරහා සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. විශ්ලේෂණ වාර්තා අනුව විකිරණශීලීතා මට්ටම පරමාණුක බලශක්ති නියාමන සභාවහි රෙගුලාසිවලට අනුව ඉක්මවා ගියහොත්, එම බහලුම් ආපසු නැව්ගත කරනු ලැබේ.

2024 වර්ෂය තුළ, ගැමාවර්ණාවලීක්ෂය භාවිතයෙන් විකිරණශීලීතා මිනුම් සඳහා ආනයනික කිරිපිටි සාම්පල 3716 ක් සහ අපනයනය කරන ලද තේ සහ අනෙකුත් නිෂ්පාදන සාම්පල 150 ක් පරීක්ෂා කරන ලදී. සවිස්තරාත්මක විකිරණශීලීතා මිනුම් සඳහා සාම්පල 231 ක් පරීක්ෂා කරන ලදී. පස, ඛනිජ පුරාවිද්‍යාත්මක සාම්පල, මැණික්, මිශ්‍රලෝහ ආදියෙහි විවිධ සාම්පල 84 ක්, X-කිරණ ප්‍රතිදීප්තවර්ණාවලීක්ෂය භාවිතයෙන් බහුමූලද්‍රව්‍ය සංයුතිය සඳහා විශ්ලේෂණය කරන ලද අතර, දළ ඇල්ෆා සහ බීටා මිනුම් සඳහා අපජල සාම්පල 84 ක් පරීක්ෂා කරන ලදී.

සමස්ථානික අනුපාත ස්කන්ධවර්ණාවලීක්ෂ විද්‍යාගාරයේදී ස්ථායී සමස්ථානික සඳහා සාම්පල 300 ක් විශ්ලේෂණය කරන ලදී. වාණිජ සාම්පල ඇතුළුව සාම්පල 1186 ක් ෆූරියර්ට්‍රාන්ස්ෆෝම් අධෝරක්ත වර්ණාවලීක්ෂ ක්‍රමය (ATR-FTIR) භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී.

ගැමා වර්ණාවලීක්ෂ මිතික රසායනාගාරය 2006 සිට ISO IEC 17025:2017 පරීක්ෂණ රසායනාගාර සඳහා වන ජාත්‍යන්තර ප්‍රතීතනය අනුව තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) පවත්වාගෙනයයි. ISO IEC 17025:2017 පරීක්ෂණ රසායනාගාර සඳහා වන ජාත්‍යන්තර ප්‍රතීතනය අනුව දළ ඇල්ෆා බීටා රසායනාගාරය 2023 සැප්තැම්බර් 13 වන දින ප්‍රතීතනය ලබාග න්නා ලද අතර 2024 ජූලි 26 වන දින පළමු නිරීක්ෂණ තක්සේරුව සාර්ථකව නිම කරන ලදී.

න්‍යෂ්ටික විශ්ලේෂණ සේවාවන් මගින් උපයන මුළුආදායම රුපියල් මිලියන 63.3 කි

### 3.4 විකිරණ ආරක්ෂණය, ආරක්ෂාව සහ න්‍යෂ්ටික ආරක්ෂකසේවා

මෙම සේවාව මගින් අයනීකරණ විකිරණවලට අනවශ්‍ය ලෙස නිරාවරණය වීමෙන් මහජනතාවගේ, විකිරණ සේවකයින්ගේ සහ

පරිසරයේ ආරක්ෂාව සඳහා නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා රටට විකිරණ ආරක්ෂණය සහන්‍යෂ්ටික ආරක්ෂාව සඳහා තාක්ෂණික සහ විද්‍යාත්මක සහාය ලබාදේ. සෞඛ්‍ය හා කාර්මික අංශවල විකිරණ සේවකයින්ගේ ආරක්ෂාව සඳහා පුද්ගලික විකිරණමිතික සේවා සහ ද්විතීයික සම්මත මාත්‍රාමිතික රසායනාගාරයේ විකිරණ මිනුම් උපකරණ සඳහා ක්‍රමාංකන සේවා රටෙහි අනිවාර්ය සේවාවන් ලෙස දැක්විය හැක. රටේ විකිරණ ආරක්ෂණය සහ විකිරණ ප්‍රභවයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන්, විකිරණ සේවකයින්, ආරක්ෂක නිලධාරීන් (ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය) යනාදිය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් නිතිපතා පවත්වනු ලැබේ.

■ තොරතුරු සේවා

දැනුවත් කිරීමේ වැඩසටහන් 32ක් (දැනුවත් කිරීම, ආරාධිත දේශන, ප්‍රදර්ශන, වැඩමුළු, රැස්වීම්, රූපවාහිනී වැඩසටහන් ආදිය) පවත්වා ඇති අතර පාර්ශ්වකරුවන් 12,955 දෙනෙකු දැනුවත් කරන ලදී. විද්‍යුත් සඟරා 4ක්, අත්පත්‍රිකා, පෝස්ටර්, ප්‍රදර්ශන සහ පුවත්පත් ලිපි ඇතුළුව ප්‍රචාරක ද්‍රව්‍ය 27ක් සංවර්ධනය කරන ලදී. තවද, දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා රු. 324,934ක ආදායමක් උපයාගන්නා ලදී.

2024 වර්ෂය තුළ සියලුම විකිරණ ආරක්ෂණ සහ තාක්ෂණික සේවාවන් මගින් උපයා ඇති මුළුආදායම රුපියල් මිලියන 33.51 කි.

### 3.5 න්‍යෂ්ටික බල අධ්‍යයනය සහ සැලසුම් වැඩසටහන

ශ්‍රීලංකාව තුළ විදුලි උත්පාදනය සඳහා න්‍යෂ්ටික බල අධ්‍යයනය සහ සැලසුම් කිරීමේ වැඩසටහන තුලින් විදුලි උත්පාදනය සඳහා න්‍යෂ්ටික බලශක්තිය භාවිතා කිරීමේ තීරණාත්මක පියවර ඉදිරියට ගෙනයාම සඳහා ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2024 පෙබරවාරි 12 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී. පාරිසරික සහ තිරසාර ඉලක්ක සමඟ පෙළ ගැසෙමින් රටේ වර්ධනය වන බලශක්ති අවශ්‍යතා සපුරාලමින් ආරක්ෂිත, පිරිසිදු සහ විශ්වාසනීය බලශක්ති ප්‍රභවයක් ලෙස න්‍යෂ්ටික බලශක්තිය සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

- 2024 මාර්තු 04 වන දින, අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික බලශක්ති උත්පාදනය සඳහා උපායමාර්ගික තීරණ අනුමත කරන ලදී.
- ප්‍රධාන බලශක්ති ප්‍රභවයක් ලෙස න්‍යෂ්ටික බලය භාවිතා කිරීම.
- දේශීය සහ විදේශීය රටවල පිහිටා තිබෙන න්‍යෂ්ටික බලශක්ති උත්පාදනය කරන පුද්ගලික සහ රාජ්‍ය ආයතන යන දෙකෙන්ම අභිලාශ කැඳවීමට (EOI) ආරාධනා කිරීම.
- 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත වෙනුවට න්‍යෂ්ටික බලශක්ති උත්පාදනය සඳහා නීති සම්පාදනය කරමින් නව පරමාණුක බලශක්ති පනතක් කෙටුම්පත් කිරීම.

➢ **අනාගත න්‍යෂ්ටික බලාගාරයක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු භූමි භාගයක් තේරීම**

භූවිද්‍යා සහ පතල්කාර්යාංශය (GSMB) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව, විභව ස්ථාන 16ක් හඳුනාගෙන ඇති අතර, මන්නාරම සහ මුලතිව්හි පිහිටි ස්ථාන හොඳින් ඇගයීමෙන් පසු පුල්මොඩේ ප්‍රමුඛඅපේක්ෂකයා බවට පත්විය.

➢ **නෛතිකරාමුව**

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නීති සමාලෝචන කමිටුව 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත සංශෝධනය කරයි. විනිසුරු ශෝභිත රාජකරුණා මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරෙන මෙම ක්‍රියාවලියට මේ දක්වා රැස්වීම් 27කට වඩා වැඩි ප්‍රමාණයක් සහ වියානාහි ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ විශේෂඥයින් සමඟ උපදේශන සිදුකර ඇත.

➢ **ඒකාබද්ධ න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචනය (INIR) අදියර-I මෙහෙයුම**

2022 අප්‍රේල් මාසයේදී පවත්වන ලද, ඒකාබද්ධ න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචනය (INIR) ශ්‍රී ලංකාවේ න්‍යෂ්ටික සූදානම සඳහා ප්‍රධාන නිර්දේශ ලබාදුන්නේය. අවසාන මෙහෙවර වාර්තාව IAEA මහා සම්මේලනය 2022 දී භාරදෙන ලදී.

➢ **සිවිල් වගකීම් පිළිබඳ සම්මුතිය**

න්‍යෂ්ටික හානි සඳහා සිවිල් වගකීම් පිළිබඳ

වියානා සම්මුතියට සහ න්‍යෂ්ටික හානි සඳහා පරිපූරක වන්දි පිළිබඳ සම්මුතියට (CSC) ප්‍රවේශවීමට ශ්‍රීලංකාවේ අමාත්‍ය මණ්ඩල /කැබිනට් මණ්ඩලය 2023 පෙබරවාරි මාසයේදී අනුමැතිය ලබාදුන්නේය,

➢ **ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ ඒකාබද්ධ වැඩ සැලැස්ම (IWP)**
ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමග සහයෝගයෙන් සංවර්ධනය කරන ලද, IWP න්‍යෂ්ටික යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, පුහුණු කිරීම් සහ මෙහෙයුම් ගෙන හැර දක්වයි. 2024 ජනවාරි මාසයේ වියානාහි පැවති IWP රැස්වීමට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආයතනවල නිලධාරීන් හයදෙනෙක් සහභාගීවූහ. 2024 මැයි 30 සිට ජූනි 5 දක්වා පවත්වන ලද අඩවි සහ බාහිර සිදුවීම් සැලසුම්, IAEA SEED (SEED) මෙහෙවර තුලින් න්‍යෂ්ටික බලාගාර ස්ථාන සමාලෝචනය කර, පුල්මොඩේ වෙත ගොස් පාරිසරික හා තාක්ෂණික අංශ තක්සේරු කරන ලදී.

➢ **වත්මන් අභිලාශ කැඳවීම (EOI) ක්‍රියාවලිය**
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (CANC) සහ ව්‍යාපෘති කමිටුව (PC), අභිලාශකැඳවීම (EOI) සමඟින් ආරම්භ වන න්‍යෂ්ටික ප්‍රතික්‍රියාකාරක සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ඇත. න්‍යෂ්ටික වෙළෙන්දන්ගෙන් තොරතුරු සඳහා ඉල්ලීම් (ROI), සුදුසුකම් (RFQ) සහ යෝජනා (RFP) පසුව සිදුකෙරේ.

➢ **නව පරමාණුක බලශක්ති පනත**
නව පරමාණුක බලශක්ති පනත,නීතිපතිවරයා සහ නීති කෙටුම්පත් සම්පාදකයින් විසින් සමාලෝචනය කිරීමට නියමිත, 2025 මුල් කාර්තුව තුල වන විට පනත් කෙටුම්පත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත.

### 3.6 ශ්‍රී ලංකාවේ සයික්ලොට්රෝන් පදනම් කරගත් විකිරණ ඖෂධ නිෂ්පාදන පහසුකමක් ගොඩනැගීම, හිමි කර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත ස්ථාපිත කිරීම

පිළිකා හඳුනා ගැනීම සඳහා ඡෑම සහ ක්‍ෂු පරීක්ෂණ සඳහා විකිරණශීලී ඖෂධයක් වන ෆ්ලෝරෝඩී ඔක්සිග්ලූකෝස් (18F-FDG) භාවිතාකරයි. මෙම ඖෂධය නිෂ්පාදනය කිරීම සඳහා සයික්ලොට්රෝන් නම් විශේෂ උපකරණයක් භාවිතා කරන අතර අවශ්‍ය පහසුකම් ශ්‍රී ලංකාවේ නොමැති බැවින් මෙම විකිරණශීලී ඖෂධය ඉන්දියාවෙන් ආනයනය කෙරේ. එහි විකිරණශීල ක්ෂයවීමේ ස්වභාවය නිසා, එය ඉන්දියාවෙන් ආනයනය කරන විට ඖෂධය 97% ක් පමණ ප්‍රයෝජනය ගත නොහැකි ලෙස ක්ෂයවීම සිදුවේ. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස, පුද්ගලික රාජ්‍ය හවුල්කාරිත්ව ව්‍යාපෘතියක් හරහා පිළිකා රෝග විනිශ්චය සඳහා PET ස්කෑන් (විලෝකන) කිරීම පහසු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සයික්ලොට්රෝන් පදනම් කරගත් විකිරණශීලී ඖෂධ නිෂ්පාදන පහසුකමක් ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී. විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024.02.12 දිනැති අංක 24/0322/621/015 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සලකා බලමින් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව විසින් කරන ලද නිර්දේශ මත, 2024.04.01 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය මත "සයික්ලොට්රෝන පදනම් වූ විකිරණශීලී ඖෂධ නිෂ්පාදන පහසුකමක් පිහිටුවීම ගොඩනැංවීම, හිමිකර ගැනීම සහ ක්‍රියාත්මක කිරීම (BOO) පදනම මත ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදන පහසුකම්" ඇක්සස් ජාත්‍යන්තර පුද්ගලික සමාගම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අනුමැතිය ලබාදී ඇත.

තවද, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඇක්සස් ජාත්‍යන්තර පුද්ගලික සමාගම අතර ගිවිසුම සඳහා ගරු නීතිපතිවරයාගේ අනුමැතියට යටත්ව, එහි ප්‍රකාශිත ආයෝජකයා වන ඇක්සස් ජාත්‍යන්තර පුද්ගලික සමාගම මගින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත 10% ක කොටස් සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා 10% ක කොටස් සහිත නව ඒකාබද්ධ ව්‍යාපාර සමාගමක් (SPV) පිහිටුවීමට අනුමැතිය ලබාදී ඇත. ඊට අමතරව, ඒකාබද්ධ ව්‍යාපාර සමාගමට ශ්‍රී ලංකාවේ තෘය නිශ්චිත අනුපාතවලට විකිණීමට සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙත 2.2% ක මුදලක් ගෙවීමට අවසර ලබාදී ඇත.

2024 නොවැම්බර් 08 වන දින මුල් ගල තැබීම සිදුකරන ලදී. ඉඩම් නිෂ්කාශනය මේ වන විට ආරම්භ කර ඇත. හවුල් ව්‍යාපාර සමාගමක් (ඇක්සස් මෙඩිකල් ට්රේසර්ස් පුද්ගලික සමාගම) සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය වෙනුවෙන් ව්‍යාපෘති අධීක්ෂණ කමිටු සාමාජිකයෙකු නම් කිරීම සිදුකර ඇත. නාගරික සංවර්ධන අධිකාරිය, පළාත්පාලන ආයතන, ජාතික වෛද්‍ය නියාමන අධිකාරිය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව සහ මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් ඉදිකිරීම් බලපත්‍ර අයදුම්කර ඇත. තවද, ආයෝජන මණ්ඩල ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ජනවාරි දෙවන සතියේ ඉදිකිරීම් ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. 2026 මාර්තු වන විට ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් සංවිධානය කර ඇත.

### 3.7 න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය (NST) අධ්‍යාපන වැඩසටහන

අන්තර්ජාතික න්‍යෂ්ටික බලශක්ති ඒජන්සිය මගින් දියත් කරන ලද ජාත්‍යන්තර න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණ ඇකඩමියේ (INSTA) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා රජයේ විශ්වවිද්‍යාල වෙත හඳුන්වා දෙන ලදී. මෙහි සාමාජිකත්වය ලබා ගන්නා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල සඳහා න්‍යෂ්ටික විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රවල ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනික පුහුණුව සඳහා ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය IAEA/INSTA 2025-2026 වසර සඳහා පත්කරගන්නා ලද මෙහෙයුම් කමිටුවේද සාමාජිකත්වය දරයි.

පළමු වරට පවත්වන ලද අන්තර්ජාතික න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලියට අදාල ජාතික සම්භන්ධීකරණ කටයුතු අප ආයතනයේ මැදිහත් වීම මත සිදු කරන ලදී. එසේම මේ සඳහා තෝරා ගන්නා ලද සිසුන් වෙනුවෙන් සතියක පුහුණු වැඩමුළුවක් (සිද්ධාන්ත හා ප්‍රයෝගික ක්‍රියාකාරකම් ඇතුලත්) ආයතනය විසින් ලබා දෙන ලදී. අන්තර්ජාතික න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් තරඟාවලියට සහභාගී වුනු සිසුන් සියලු දෙනා ජයග්‍රහණය කල අතර රන් හා රිදී පදක්කම් දෙකක් ලබා ගන්නා ලදී.

එසේම බස්නාහිර පළාත් භෞතික විද්‍යා ගුරුවරුන්ට පදාර්ථය හා විකිරණ පාඩම වෙනුවෙන් පුහුණු සැසියක් පවත්වන ලද අතර පාසල් සිසුන් සඳහා විද්‍යාගාර නැරඹීමේ අවස්ථාව සලසා දෙන ලදී.

### 3.8 පර්යේෂණ සහ සංවර්ධන ජයග්‍රහණ.

පනත මගින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනිමින් ජනතාවගේ වර්තමාන ජීවන තත්ත්වය නංවාලීම, ස්වාභාවික සම්පත් කළමනාකරණය, පරිසරය ආරක්ෂා කිරීම, කෘෂිකර්මාන්ත සහ ආහාර සුරක්ෂිතතාව, විකිරණ පිරි සැකසීම, විකිරණ ආරක්ෂාව යනාදිය සඳහා න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වල නිරත වේ. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයෙන් (IAEA) තාක්ෂණික සහයෝගීතා වැඩසටහන හරහා ඉහත සඳහන් සේවාවන් සහ පර් යේෂණ කටයුතු සඳහා තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතුව විශේෂිත රසායනාග ාර පහසුකම් සහ දක්ෂ, සුදුසුකම්ලත් සහ කැපවූ න්‍යෂ්ටික විද්‍යාඥයින්ගෙන් සමන්විත වේ.

#### අ. පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිවල අවසන් වාර්තා ඉදිරිපත් කිරීම.

- 'සිලෝන්ටී' සම්භවය පිළිබඳ භූරසායනික සත්‍යාපනය පිළිබඳ නියමු ව්‍යාපෘතිය: මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය අතර ත්‍රිපාර්ශ්වික ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක කරන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ සහාය ලැබිණ.

  සාරාංශයක් ලෙස නිගමනය: භූ රසායනික සලකුණු මගින් සිලෝන්ටී වල සම්භවය සත්‍යාපනය කළහැකි බව නියමු ව්‍යාපෘතිය සාර්ථකව පෙන්වාදී ඇත.

- FTIR-ATR විශ්ලේෂණය භාවිතයෙන් පිටිකළ කිරිවල ඌරුතෙල් මිශ්‍ර කිරීම හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ ක්‍රමයක් සංවර්ධනය

කිරීමඃ පාරිභෝගික කටයුතු අධිකාරියේ ඉල්ලීම පරිදි මෙම ව්‍යාපෘතිය සිදුකරන ලදී.

මෙම පර්යේෂණය IAEA CRP ව්‍යාපෘතිය SRL21090 යටතේ සැලසුම් කර ඇති ක්‍රියාකාරකම්වල කොටසකි.

සාරාංශයක් ලෙස නිගමනයඃ මෙම FTIR-ATR වර්ණාවලීක්ෂ ක්‍රමයට අනුව එම සාම්පල උෆරුතෙල් සමඟ මිශ්‍ර කර නොමැත. සත්‍යාපන ක්‍රමයක් ලෙස මේදය මිශ්‍ර කිරීම හඳුනාගැනීම සඳහා රසායනික ක්‍රම සමඟ වැඩිදුර පරීක්ෂණ අනුගමනය කළයුතුය. මෙම වාර්තා දෙකම 2024 අගෝස්තු 27 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර වැඩිදුර තීරණ සඳහා අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

ආ. අපගේ එක් පර්යේෂණ ව්‍යාපෘතියකට කෘෂිකාර් මික සංවර් ධන පර්යේෂණවල විශිෂ්ටත්වය සඳහා කෘෂිකාර් මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලයේ (CARP) ප්‍රශංසා සහතිකය ලබාගන්නා ලදී. මෙම සම්මාන සහතිකය, ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම යන මාතෘකාව යටතේ වේ. මෙම ව්‍යාපෘතිය, සම්භවය සොයා ගැනීම ව්‍යාජ මිශ්‍රකිරීම හඳුනාගැනීම සහ කිරි නිෂ්පාදන සහ සතුන්ගේ ගුණාත්මකභාවය සහතික කිරීම, ව්‍යුත්පන්න නිෂ්පාදන ආදිය පිලිබඳව සිදුකරන ලදී. පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමඟ එක්ව ව්‍යාපෘතිය සිදුකරන ලදී.

ඇ. සමස්ථානික ජලවිද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාත්මක නිලධාරිනී ආචාර්ය ශකිලා ප්‍රියදර්ශනී මිය සිය ආචාර්ය උපාධිය 2024 වර්ශයේදී සාර්ථකව නිම කරන ලදී. ඇය මෙම අධ්‍යයන කටයුතු සිදුකරනු ලැබුවේ චීන විද්‍යා ඇකඩමියට අනුයුක්තව වන අතර මේ සඳහා ඇය ශ්‍රී ලංකාවේ හඳුනා නොගත් වකුගඩු රෝගය සඳහා නොගැඹුරු භූගත ජලයේ මැග්නීසියම් සහ ෆ්ලෝරයිඩ් වල බලපෑම අධ්‍යයනය කරන ලදී.

ඇ. මොණරාගල දිස්ත්‍රික්කයේ භූගත ජල සම්පත් කෘතිමව නැවත ආරෝපණය කිරීමේ සඵලතාවය අධ්‍යයන සහ හම්බන්තොට මලල ඔය ද්‍රෝණියේ භූගත ජලය නැවත ආරෝපණයවීමේ ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා සමස්ථානික ජල විද්‍යා තාක්ෂණය යොදා ගනිමින් පර්යේෂණ ව්‍යාපෘති සිදුකරන ලදී. මෙම ව්‍යාපෘති සඳහා ජල සම්පත් මණ්ඩලය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග සහයෝගයෙන් කටයුතු සිදු කරනු ලබයි.

ඉ. දේශගුණ විපර්යාස හේතුවෙන් ඇතිවන අභියෝගයන්ට ගැළපෙන අයුරින් ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ ජල පෝෂක ප්‍රදේශ, පහත්බිම් හා අවධානම් ගංගාද්‍රෝණි ආශ්‍රිතව ජීවත් වන කුඩා පරිමාණ ගොවීන්, කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන් නගාසිටුවීම අරමුණුකරගත් GCF ශ්‍රී ලංකා නකල්ස් ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය විසින් කරණු ලබන මහා පරිමාණ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියකි. සමස්ථානික ජලවිද්‍යා සහ ඒ ආශ්‍රිත ශිල්පීය ක්‍රම භාවිතා කරමින් ජලයේ ගුණාත්මකභාවය සහ භූගත ජලය නැවත ආරෝපණය වීමේ යාන්ත්‍රණයන් විමර්ශනය කිරීමේ ප්‍රධාන පාර්ශවකරුවෙකු ලෙස සමස්ථානික ජලවිද්‍යා අංශය දායකත්වය ලබා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය ඉදිරි වසර පහක කාලයක් සඳහා සැලසුම් කර ඇත. ඨක්‍ස නකල්ස් ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය සමස්ථානික ජලවිද්‍යා අංශය අඛණ්ඩව ලබාදෙන අතර න්‍යෂ්ටික තාක්ෂණයේ යෙදවීම් සමඟින් පාංශු කළමනාකරණය සඳහා දායකත්වය ලබා දීමටද සැලසුම් කර ඇත.

ඊ. 2024 වර්ෂය තුලදී විකිරණ පිරිසැකසුම් ශිල්පීය ක්‍රම භාවිතයෙන් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය කිරීම, ප්ලාස්ටික් අපද්‍රව්‍ය මගින් සිදුවන් පරිසර හානිය අවම කිරීම සඳහා ප්ලාස්ටික් අපද්‍රව්‍ය වලින් කාර්මික භාණ්ඩ නිෂ්පාදනය සඳහා ප්‍රතිචක්‍රීකරණය ක්‍රමෝපායන් සංවර්ධනය කිරීම හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් ලැබෙන බහුඅවයන් විවිධ භාවිතයන් සඳහා වැඩිදියුණු කිරීම, මිනිසාගේ සෞඛ්‍යයට තර්ජනයක් වෙමින් ජල මූලාශ්‍රවල පවතින ප්‍රතිජීවක ඇමොක්සිසිලින් හායනය සඳහා ක්‍රමවේද සංවර්ධනය කිරීම ආදිය සිදු කරන ලදී.

ඖ. ශ්‍රී ලංකාවේ බෝතල්කල / ඇසුරුම් කරන ලද ජල කර්මාන්තයේ භාවිතා කරන ජල මූලාශ්‍ර සඳහා අනන්‍යවූ සමස්ථානික සලකුණු (Isotope Fingerprµnt) හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් කරගෙන යනු ලබයි

කෘෂි විද්‍යාත්මක ක්‍රමවේද හා සමස්ථානික ශිල්පීය ක්‍රමවේද යොදා ගනිමින් කෘෂි භෝගවල ජල පරිභෝජන කාර්යක්ෂමතාව නිවැරදිව තක්සේරු කිරීමේ තාක්ෂණය රට තුල දියුණු කිරීම සඳහා අදාල පර්යේෂණ කටයුතු සිදු කරගෙන යයි. මෙමගින් වාරි ජල කළමනාකරණය සිදු කිරීම සඳහා සමස්ථානික දත්ත දායක කර ගැනීම අරමුණ වන අතර සිදු කරගෙන යන මූලික අධ්‍යයනයන් සාර්ථක වී ඇත.

ඕ. න්‍යෂ්ටික ශිල්පීය ක්‍රම භාවිතයෙන් ඉඩම් හායනය අවම කිරීම සහ බෝග ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා පස හා ජලගුණාත්මකභාවය තක්සේරු කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳ සහයෝගී ව්‍යාපෘතියක් පවත්වන ලදී

ඌ. අපගේ විද්‍යාඥයින්ගේ අධීක්ෂණය යටතේ මෙම කාලය තුළ සිසුන් 26ක පිරිසක් (උපාධි අපේක්ෂකයින්, සීමාවාසික පුහුණුවන්නන් සහ පශ්චාත් උපාධිධාරීන්) ඔවුන්ගේ කාර්මික පුහුණුව හෝ උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති සම්පූර්ණ කළහ.

### 3.9 ජාත්‍යන්තර සහයෝගිතා අංශය

**ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සහ අනෙකුත් අදාළ ජාත්‍යන්තර ආයතන හරහා තාක්ෂණික සහයෝගීතාව.**

ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ (IAE) ජාතික සම්බන්ධීකරණ කාර්යාලය ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ (SLAEB) ජාත්‍යන්තර සහයෝගිතා අංශය (ICD) ප්‍රධාන වශයෙන් එහි තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීම දරයි. තාක්ෂණික සහයෝගිතා (TC) වැඩසටහන රටේ සමාජ ආර්ථික සංවර්ධනය කරා ගෙන යන න්‍යෂ්ටික විද්‍යාව සහ තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා වන අතර එය ද්විපාර්ශ්වික ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සාමාජික රටවල් සමඟ කටයුතු කරයි.

අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ නියමයන්ට අනුකූලව ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ පිළිගැනීම ලබා ගැනීම සඳහා මෙන්ම සැලකිය යුතු ආධාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාතික කේන්ද්‍රීය සංවිධානය ලෙස ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයේ හි කාර්ය භාරය මෙම අංශය ඵලදායි ලෙස ඉටු කර ඇත. එනම් රට තුළ න්‍යෂ්ටික තාක්ෂණය ආශ්‍රිත යෙදුම් වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය වෙතින් ලැබෙන සැලකිය යුතු ආධාර සහ විශේෂඥ උපදේශණ සේවා ලබා ගැනීමට කටයුතු කිරීමයි.ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ සිය සාමාජික රටවලට තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති යටතේ සාමාජිකත්ව, විද්‍යාත්මක චාරිකා, පුහුණුව, න්‍යෂ්ටික ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා යොමු වූ විශේෂඥ මෙහෙවර සහ ව්‍යාපෘතිවල සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය උපකරණ වැනි තාක්ෂණික සහාය සපයයි, ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගීතාව හරහා රටට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා මෙම ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම ජාත්‍යන්තර සහයෝගිතා අංශයට පවරා ඇත. පහත සඳහන් භූගෝලීය පදනම් අනුව ක්‍රියාත්මක වන විවිධ ව්‍යාපෘති හරහා එවැනි තාක්ෂණික සහාය ලැබේ.

- ජාතික තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති (TC ව්‍යාපෘති)
- කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති (ගිවිසුම/ ගිවිසුම් නොවන ව්‍යාපෘති)
- අන්තර් කලාපීය තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති

## 4. 2025 වසර සඳහා ඉදිරි සැලසුම්

### අ විදුලි උත්පාදනය සඳහා න්‍යෂ්ටික බලශක්ති අධ්‍යයනය සහ සැලසුම් වැඩසටහන

- න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ සංවිධානය (NEPIO) නැවත ස්ථාපිත කිරීම - මෙහෙයුම් කමිටුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU), 09 ක්‍රියාකාරී කණ්ඩායම් (IAEA සන්ධිස්ථානය ප්‍රවේශය අනුව ගැටළු 19 විසඳීමට.

- හොඳින් ස්ථාපිත සුදුසු න්‍යෂ්ටික බලාගාර නිෂ්පාදනය කරන රටවලින් අභිලාශ ලබාගැනීම (EOI) සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා කමිටුව (ස්‌ක) වෙත ඉදිරිපත් කිරීම සඳහා EOI ලේඛනය සමාලෝචනය කිරීම සඳහා සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපෘති කමිටුව පත්කරන ලදී - තොරතුරු සඳහා ඉල්ලීම (RFI), සුදුසුකම් සඳහා ඉල්ලීම (RFI), යෝජනා සඳහා ඉල්ලීම (RFP)

- 2014 අංක 40 දරන පරමාණුක බලශක්ති පනත වෙනුවට නව පරමාණුක බලශක්ති පනතක් සම්මත කිරීම, එය විදුලිය ජනනය කිරීම සඳහා නව න්‍යෂ්ටික බලශක්ති වැඩසටහන් ඉදිරියට ගෙන යාමට ගැළපේ (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් ලෙස සම්මත කිරීමට සහ ගරුනීතිපතිතුමාගේ සහ නීති කෙටුම්පත් සම්පාදකගේ නිස්කාශන සඳහා)

- ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සහාය ඇති ඒකාබද්ධ න්‍යෂ්ටික යටිතල පහසුකම් සමාලෝචනය (INIR) මෙහෙයුමේ නිර්දේශ 26 ක් සහ යෝජනා 6 ක් (දැනට මධ්‍යස්ථව සංවර්ධනය කර ඇති නිර්දේශ 10 ක් සහ යෝජනා 03 ක්)

- 2025 තුළ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය සහාය ජාතික වැඩමුළු පැවැත්වීම

- ශ්‍රී ලංකාවේ අනාගත න්‍යෂ්ටික බලාගාර ස්ථාපනය සඳහා අඩවි සමීක්ෂණය, ස්ථාන තෝරාගැනීමේ ක්‍රියාවලිය සහඅඩවි ගුනාංගීකරනය සම්පූර්ණ කිරීම

- න්‍යෂ්ටික බලශක්ති අධ්‍යාපන සහ පුහුණු පහසුකම් පිහිටුවීම

- අදාළ මානව සම්පත් සමග ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය ආයතනික ව්‍යුහය යටතේ න්‍යෂ්ටික බල සැලසුම් ඒකකයක් පිහිටුවීම.

### ආ. වැද්දුම්කරුවන්ගේ (වෙල්ඩින්) සුදුසුකම් ලබාදීමේ පහසුකම (WQF)

නිර්-විනාශක පරීක්ෂණ සඳහා වූ ජාතික මධ්‍යස්ථානය හි ස්ථාපිත කර ඇති වෙල්ඩර් කාර්ය සාධන සුදුසුකම් (WPQ) සේවාව, ජාත්යන්තර රැකියා වෙළඳපොළ සඳහා වෙල්ඩර්වරුන් සුදුසුකම් ලැබීමෙන් විදේශ සංචිත ශක්තිමත් කිරීමට සහාය වන ජාතික වශයෙන් වැදගත් සේවාවක් ලෙස පිළිගෙන ඇත. WPQ සේවාවන් රට පුරා ව්යාප්ත කිරීම සඳහා, තෘතීයික හා වෘත්තීය අධ්යාපන කොමිෂන් සභාව (TVEC) සහ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය අතර 2023 මැයි මාසයේදී "වෙල්ඩින් කාර්මිකයින්ට හඬු ප්රදානය කිරීම සඳහා පූර්ව ඉගෙනුම් (RPL) අයදුම්පත් හඳුනාගැනීමේ ක්‍රියාවලිය" පිළිබඳ ගිවිසුමක් අත්සන් කරන ලදී. ඊට අමතරව, විදේශීය රැකියා වෙළඳපොලේ සහතික කළ වෙල්ඩින් කාර්මිකයන් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා නව වෙල්ඩින් කම්හල් සමඟ පහසුකම පුළුල් කිරීමට සහ NCNDT හි හිඩැස් පිරවීමේ සහ විභාග මධයස්ථානයක් ස්ථාපිත කිරීමට පෞද්ගලික ආයෝජකයෙකු වන Kolex Tec (Pvt) Ltd සමඟ ගිවිසුමකට එළඹුණි. Kolex Tec (Pvt) Ltd සමඟ සහයෝගීතාවයේ කටයුතු 2025 දී ද දිගටම පවතිනු ඇත.

### ඇ. ආදායම් උත්පාදනය සඳහා දෛනික සේවාවන් පුළුල් කිරීම

- ISO IEC 17025:2017 පවත්වා ගනිමින් න්‍යෂ්ටික විශ්ලේෂණ පරීක්ෂණ සේවාව සැපයීම වර්තමානයේ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය හි ප්‍රධාන ආදායම්

උත්පාදන මූලාශ්‍රය වේ. පාරිභෝගික පදනම වැඩි කිරීම සඳහා සේවාවන් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත.

- සෞඛ්‍ය සහ කාර්මික අංශවල විකිරණ සේවකයින්ගේ ආරක්ෂාව පුද්ගලික විකිරණමිතික සේවා
- කාර්මික අවශ්‍යතා සඳහා නිර්-විනාශක පරීක්ෂණ පරීක්ෂණ සේවා
- රජයේ රෝහල් සඳහා අවශ්‍ය මුළු ශල්‍ය අත්වැසුම් ප්‍රමාණය විෂබීජහරණය කිරීම සඳහා ගැමා ප්‍රකිරණ සේවාව. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ විශේෂඥ සහාය ලබා ගැනීමෙන්, දේශීය නිෂ්පාදකයින්, අපනයනකරුවන්, ආනයනකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, විවිධ කර්මාන්තවල ගැමා ප්‍රකිරණය යෙදීම පිළිබඳව පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහනක්/වැඩමුළු සංවිධානය කරනු ලැබේ.
- න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන (NST)ඃ න්‍යෂ්ටික විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන (NST)ඃ ශ්‍රී ලංකාවේ ද්විතීයික විෂය මාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ ජාතික වැඩසටහනට අදාලව ජාතික අධ්‍යාපන ආයතනය විසින් 11 ශ්‍රේණියේ සිසුන් සඳහා න්‍යෂ්ටික විද්‍යා හා තාක්ෂණ (NST) තෝරා ගැනීමේ විෂයක් ලෙස හඳුන්වා දීම සඳහා කටයුතු සිදු කරගෙන යයි. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ හි ජාත්‍යන්තර න්‍යෂ්ටික විද්‍යා සහ තාක්ෂණ ඇකඩමියේ (INSTA) සාමාජික ආයතනවල දේශකවරුන් ජාත්‍යන්තරව පුහුණු කිරීමේ අවස්ථා ලැබෙනු ඇත. 2025 දී න්‍යෂ්ටික තාක්ෂණය පිළිබඳ අධ්‍යාපනය සඳහා වන ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ හි ආසියානු ජාලය (ANENT) විසින් සිදු කරන ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට SLAEB අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සිදු කරගෙන යයි.

### ඇ. ඉලක්කගත පර්යේෂණ සංවර්ධන ව්‍යාපෘති

IAEA හි සහාය ඇතිව පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘති සිදු කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍රඃ පාරිසරික කළමනාකරණය සහ තක්සේරු කිරීම්, ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකර්මය, කාර්මික වැඩිදියුණු කිරීම් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, ද්‍රව්‍ය සංවර්ධන, සමස්ථානික ක්‍රම භාවිතයෙන් බෝග ජල ඵලදායිතාව ප්‍රශස්ත කිරීම, කෘෂි ප්‍රදේශවල පාංශු ඛාදනය සහ ජල දූෂණය අධ්‍යයනය. සමුද්‍ර පරිසරයේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් දූෂණය, විවිධ විකිරණ මට්ටම්වල මාත්‍රා තක්සේරුව, උපකරණ සංවර්ධනය සහ නිෂ්පාදනය, විකිරණ ආරක්ෂාව, න්‍යෂ්ටික ආරක්ෂාව ආදිය

i. මොනරාගල දිස්ත්‍රික්කයේ භූගත ජල මට්ටම අඩු වීම, මේ සඳහා අවදානම ඇති කලාප, සහ භූගත ජලය නැවත ආරෝපණය කිරීමේ විභවයක් සහිත ප්‍රදේශ ආදිය හඳුනා ගැනීම සඳහා පුළුල් භූගත ජල අධ්‍යයනයක් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ ද්විපාර්ශ්වික S&T වැඩසටහනට ඉදිරිපත් කර ඇත. ඉන්දියාවේ තමිල්නාඩුවේ ජාතික විද්‍යාලයේ භූ විද්‍යා පර්යේෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2025 දී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ii. සිලෝන් තේ ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමඃ දත්ත පදනම ශක්තිමත් කිරීම සඳහා සහ වාණිජ වශයෙන් සහතික කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කරන ලද දත්ත සැකැස්ම ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීම.

iii. 2024 වසරේ හතරවැනි කාර්තුවේ ආරම්භ වී 2025 දක්වා සිදුකිරීමට යෝජිත අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්වභාවික ජල උල්පත්වල මූලාශ්‍රය අනාවරණය කිරීම ජල සම්පත් මණ්ඩලය සමඟ එක්ව අධ්‍යයනය කිරීමට යෝජිතය.

# සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

## 1. හැඳින්වීම

සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යාපාරික ආයතනයකි. නොරොච්චෝලේ ලක්විජය බලාගාරයට (LVPP) ගල් අඟුරු ආනයනය කිරීම සහ සැපයීම සඳහා පමණක් සමාගම සංස්ථාපිත කරන ලදී. එය ලංකා විදුලිබල මණ්ඩලය (CEB) යටතේ ක්‍රියාත්මක වේ. අපගේ කොටස් හිමියන් පහත සඳහන් අයගෙන් සමන්විත වේ;

- ලංකා විදුලිබල මණ්ඩලය 60%
- භාණ්ඩාගාරය 20%
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය 10%
- ලංකා නැව් සංස්ථාව 10%

ලංවිම වාර්ෂික අවශ්‍යතාවයක් ලෙස නොරොච්චෝලේ බලාගාරය සඳහා ගල් අඟුරු ටොන් මිලියන 2.25ක් LCC විසින් සපයා ගනී. බටහිර වෙරළ තීරයේ නිරිත දිග මෝසම් සමය හේතුවෙන් ගල් අඟුරු සැපයුම සැප්තැම්බර් මාසයේ සිට ලබන වසරේ අප්‍රේල් මාසය දක්වා මාස හතකට සීමා වේ. කෙසේ වෙතත් ජාතික විදුලිබල පද්ධතියට අඛණ්ඩව ගල් අඟුරු සැපයීම සඳහා බලාගාරය වසර පුරා ක්‍රියාත්මක වේ. එබැවින්, අවාරයේ භාවිතා කිරීම සඳහා ගල් අඟුරු ගබඩා කිරීම අනිවාර්ය වේ.

ගල් අඟුරු සැපයුම ප්‍රසම්පදන කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය හේතුවෙන් සෑම විටම කැලැන්ඩර වසර දෙකක් පුරා ව්‍යාප්ත වී ඇත. ඒ අනුව, ගල් අඟුරු අවශ්‍යතාවය සපුරාලීම සඳහා ප්‍රසම්පාදන හා ක්‍රියාකාරී සැලැස්ම ව්‍යුත්පන්න කර ප්‍රක්ෂේපණය කර ඇත. කෙසේ වෙතත්, කාලසටහන් දෙකම බොහෝ දුරට රඳා පවතින්නේ වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය මත වන අතර, එය සෑම වසරකම ජූනි හෝ ජූලි මාසයේදී විදුලි බලාගාර කළමනාකරු විසින් දැනුම් දෙනු ලැබේ.

ගල් අඟුරු ගොඩබෑම / බත්තල් මෙහෙයුම් සහ ගල් අඟුරු රක්ෂණය සඳහා ද ලංකා ගල් අඟුරු සමාගම වගකිව යුතුය. කැබිනට් තීරණය මත පදනම්ව 2024-2025 වාරය සඳහා ගල් අඟුරු ගොඩබෑම / බාර්ජ් මෙහෙයුම CSC විසින් මෙහෙයවනු ලැබේ.

මීට අමතරව, ගල් අඟුරු පරීක්ෂා කිරීම සඳහා ලංකා ගල් අඟුරු සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ සේවා සපයන්නා අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් ඇත. ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය මඟින් සේවා සපයන්නා තෝරා ගනු ලැබේ.

## 2. 2024 හි කාර්ය සාධනය

රටේ වත්මන් මූල්‍ය හා ආර්ථික අභියෝග හේතුවෙන් සැපයුම් කළමනාකරණය කිරීමේ දුෂ්කර උත්සාහය නොතකා, 2024 සැප්තැම්බර් 10 වැනි දින නව ගල් අඟුරු වාරය ආරම්භ කල දින දක්වා LVPP හි ගල් අඟුරු අවශ්‍යතාවයෙන් 100%ක් සුරක්ෂිත කර ගැනීමට අපට හැකි විය..

## 3. 2024-2025 වාරය සඳහා වැඩසටහන්

### අ. ගල් අඟුරු සැපයුම 2024-2025

2024-2025 වාරය සඳහා 2,259,000.00 MT ±10% ක ලංවිම ගල් අඟුරු අවශ්‍යතාවය නැව්ගත කිරීම් 38 කින් සපයනු ලැබේ. යෝජනා, LCC/23/PROP/1 යටතේ නැව්ගතකිරීම් 9 ක් සහ ඉතිරි නැව්ගත කිරීම් 29 ක් ලබා ගනීමට නව දිගුකාලීන ටෙන්ඩරයක් LCC/24/TT/1 ක්‍රියාත්මක කරන ලදී. ලංසුකරුවන් 6 දෙනෙකු විසින් ලංසුලේඛණ ඉදිරිපත් කල අතර ඉන් 3ක් පමණක් අදාල ටෙන්ඩර් කැඳවීමට අනුකූලව ලංසු ඉදිරිපත් කර ඇත. මේ අතරතුර LCC/23/PROP/1හි සැපයුම්කරු වන POTENCIA L.L.C-FZ විසින් මෙම වාරයේ ගල් අඟුරු සැපයුම වෙනුවෙන් යොජනාවක් ඉදිරිපත් කරන ලදී. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලද ලංසු ලියකියවිලි සහ මෙම යෝජනාව ස්ථාවර කැබිනට් ප්‍රසම්පාදන කමිටුව ට සහ රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. අනතුරුව රේඛීය අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කොට එහි අනුමැතිය මත POTENCIA L.L.C-FZ වෙත 2,259,000.00

MT ±10% අදාල නියම හා කොන්දෙසි මත ලබා දී ඇති අතර මෙහිදී එම යෝජනාවේ ආකාරයට නැව් ගාස්තු එකකට USD 30 සිට 27 දක්වා USD 3ක් අඩු කර ඇත.

වගුව 7.1

**2024-2025 වාරය සඳහා ගල් අඟුරු සැපයුම් කාලසටහන**

| සැපයුම් මාර්ගය | ප්‍රමාණය MT ±10% | නැව්ගත කිරීම් ගණන |
|---|---|---|
| යෝජනා, LCC/23/PROP/1 | 540,000 | 09 |
| නව යෝජනා, LCC/23/ PROP/1 | 1,740,000 | 29 |
| 2024-25 වාරය සඳහා ලක්විජය බලාගාරයේ ඉල්ලුම | 2,259,000 | 38 |

**ආ. LIPP ජැටිය දක්වා ගල් අඟුරු ප්‍රවාහනය (භාණ්ඩ ප්‍රවාහනය + නැව් ප්‍රවාහන ගාස්තු + රක්ෂණය)**

**I. පැටවුම් වරායේ සිට පුත්තලම නැංගුරම් පොළට ගල් අඟුරු ප්‍රවාහනය කිරීම**

2024 සැප්තැම්බර් මස මැද සිට ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය ප්‍රමාණය ලබා ගැනීම සඳහා LCC ගල් අඟුරු කාලීන ටෙන්ඩරය සහ ස්ථානීය ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**II. මව් යාත්‍රාවේ සිට බත්තල් මෙහෙයුම දක්වා සහ ජැටියේ ලංවීම වෙත බත්තල් මෙහෙයුම**

2021/22 සහ 2022/23 වාර දෙක සඳහා ලංකා නැව් සහයෝගීතාවයට නැව් ප්‍රවාහන ගාස්තු සහ බත්තල් මෙහෙයුම පිරිනමනු ලැබේ. තවද, ඔවුන් ටෙන්ඩරයක් කැඳවා උප කොන්ත්‍රාත්කරුවෙකු වන ශ්‍රීජී ෂිපින් ඉන්දියා තෝරාගෙන ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2024-2025 වාරය සඳහාද උප කොන්ත්‍රාත්කරුවෙකු වන ශ්‍රීජී ෂිපින් ඉන්දියා තෝරාගෙන ඇත.

**III. ගල් අඟුරු ප්‍රවාහනය සඳහා සමුද්‍ර රක්ෂණය**

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) යටතේ ලැයිස්තුගත කර ඇති සමාගම්වලින් ටෙන්ඩරයක් කැඳවීමෙන් භාණ්ඩ සඳහා රක්ෂණ ආවරණය දේශීයව සිදු කෙරේ. පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී සහ පෙයාර්පස්ට් ඉන්ෂුවරන්ස් වෙත 2023/24 සහ 2024/25 වාර දෙකක් සඳහා රක්ෂණ සම්බන්ධතා ප්‍රදානය කරන ලදී. ඒ අනුව, 2024/25 වාරය අවසානයේ සම්බන්ධතාවය අවසන් වේ.

**IV. ගල් අඟුරු පරීක්ෂා කිරීම සඳහා ස්වාධීන පරීක්ෂණ ඒජන්සිය**

ගල් අඟුරු ප්‍රමාණයේ බර මැනීම සඳහා ගොඩ බෑමේ වරායේ ගල් අඟුරු නියැදීම සහ විශ්ලේෂණය සම්පූර්ණ ප්‍රතීතනය ඇති ස්වාධීන ගල් අඟුරු පරීක්ෂණ ආයතනයක් විසින් සිදු කරනු ලැබේ. මෙය LCC, CEB සහ තෝරා ගන්නා ලද ගල් අඟුරු ස්වාධීන පරීක්ෂක ආයතනය අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමකි.

- **2025 මැයි දක්වා ගල් අඟුරු පරීක්ෂාව COTECNA Inspection India වෙත ප්‍රදානය කර ඇත.**

**ඇ. 2024-2025 වාරය සඳහා ගල් අඟුරු ගෙවීම් යාන්ත්‍රණය**

2024-2025 වාරය සඳහා ගෙවීම් අවසන් කර නොමැත. අරමුදල් අවශ්‍යතාවයේ සාරාංශය පහත පරිදි වේ;

වගුව 7.2

**2024-2025 වාරය සඳහා අරමුදල් අවශ්‍යතාවය**

| ටෙන්ඩර් | නැව්ගත කිරීම් ගණන | අරමුදල් අවශ්‍යතා | |
|---|---|---|---|
| | | USD (මිලියන) | LKR (බිලියන) |
| කාලීණ යෝජනා LCC/23/PROP/1 | 9 | 69 | 21 |
| කාලීණ යෝජනා LCC/23/PROP/1 | 29 | 221 | 69 |
| සම්පූර්ණ අරමුදල් අවශ්‍යතාවය | 38 | 290 | 90 |

වගුව 7.3

**2024-2025 වාරය සඳහා ගෙවීම් ක්‍රමයේ සාරාංශය**

| ටෙන්ඩර් | ගෙවීම් කොන්දේසි |
|---|---|
| කාලීණ යෝජනා, LCC/23/PROP/1 | CFR නියමයන් අනුව එඹ එකකට පෙර මාසයේ මිල දර්ශකයේ සංයුක්ත දර්ශකය ( AP14, ICI1, ICI2, Taman සහ Voshtochny හි සාමාන්‍ය සාමාන්‍යය) මත පදනම් වූ Telegraphic Transition (TT) නියමයන් (MF 0.926) |

# අටවන පරිච්ඡේදය

# ශ්‍රී ලංකා එනර්ජිස් පුද්ගලික සමාගම

## 1. හැඳින්වීම

මෙම වාර්තාව 2024 වසර තුළ ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම මුහුණ දුන් ප්‍රගතිය, ජයග්‍රහණ සහ අභියෝග පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයන අතර, පුනර්ජනනීය බලශක්ති විසඳුම් ඉදිරියට ගෙන යාම සහ ජාතියේ බලශක්ති අංශයට සහාය වීම සඳහා එහි අඛණ්ඩ කැපවීම ඉස්මතු කරයි. ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) 100% රජය සතු අනුබද්ධිත ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා එනර්ජිස් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීමේදී මෙන්ම CEB හි උපාංග නිෂ්පාදන අංශය ලෙසද ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. සමාගමේ උත්සාහයන් තිරසාර බලශක්ති විසඳුම් සහ පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ (GOSL) පුළුල් අරමුණු සමග සමපාත වේ.

## 2. අභියෝග සහ අවදානම්

පුනර්ජනනීය බලශක්ති සමාගමක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්) සමාගම පුනර්ජනනීය බලශක්ති අංශයට ආවේණික අභියෝග සහ අවදානම් කිහිපයකට මුහුණ දෙයි. මේවා පුළුල් ලෙස තාක්ෂණික, මූල්‍ය, නියාමන, පාරිසරික සහ මෙහෙයුම් අභියෝග ලෙස වර්ගීකරණය කළ හැකිය. මෙම අවදානම් අවබෝධ කර ගැනීම ඒවායේ බලපෑම අවම කිරීම සහ සමාගමේ වර්ධනය සහ තිරසාරභාවය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

### i. තාක්ෂණික අභියෝග

- **ජාල ඒකාබද්ධ කිරීමේ ගැටළු:** විචල්‍යතාවය සහ අතරමැදි බව හේතුවෙන් කුඩා ජල විදුලි බලාගාර වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ජාතික විදුලිබල පද්ධතියට ඒකාබද්ධ කිරීමේ දුෂ්කරතා.
- **වයස්ගත යටිතල පහසුකම්:** ටර්බයින සහ සම්ප්‍රේෂණ මාර්ග වැනි පවතින යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම මිල අධික හා කාලය ගතවන විය හැකිය.
- **තාක්ෂණික දියුණුව:** පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්හි වේගවත් දියුණුව සමඟ ඉදිරියට යාම පර්යේෂණ සහ සංවර්ධනය සඳහා අඛණ්ඩ ආයෝජන අවශ්‍ය වේ.

### ii. මූල්‍ය අභියෝග

- **ඉහළ ආරම්භක පිරිවැය:** පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, විශේෂයෙන් ඉදිකිරීම් අතරතුර, සැලකිය යුතු පූර්ව ප්‍රාග්ධනයක් අවශ්‍ය වන අතර එමගින් මූල්‍ය සම්පත් පීඩාවට පත් විය හැකිය.
- **වෙළඳපොළ තරඟකාරිත්වය:** අඩු පිරිවැයක් සහිත සාම්ප්‍රදායික බලශක්ති ප්‍රභවයන් ඇතුළු අනෙකුත් බලශක්ති සැපයුම්කරුවන් සමඟ තරඟ කිරීම ආදායමට බලපෑ හැකිය.
- **ආර්ථික අස්ථාවරත්වය:** මුදල් විනිමය අනුපාත, පොලී අනුපාත හෝ උද්ධමනයේ උච්චාවචනයන් ව්‍යාපෘති මූල්‍යකරණය සහ මෙහෙයුම් පිරිවැයට බලපෑ හැකිය.

### iii. නියාමන සහ ප්‍රතිපත්ති අවදානම්

- **වෙනස් වන ප්‍රතිපත්ති:** රජයේ බලශක්ති ප්‍රතිපත්ති, සහනාධාර හෝ බදු දිරිගැන්වීම්වල මාරුවීම් ව්‍යාපෘති ශක්‍යතාවයට බලපෑම් කළ හැකිය.
- **අනුමත කිරීමේ ප්‍රමාදයන්:** පාරිසරික අනුමැතීන් හෝ විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් වැනි බලපත්‍ර සහ නිෂ්කාශන ලබා ගැනීමෙන් ව්‍යාපෘති කාල නියමයන් ප්‍රමාද විය හැකිය.
- **අනුකූලතා පිරිවැය:** දැඩි පාරිසරික සහ මෙහෙයුම් රෙගුලාසිවලට අනුකූල වීමෙන් ව්‍යාපෘති පිරිවැය සහ සංකීර්ණත්වය වැඩි විය හැකිය.

### iv. පාරිසරික සහ දේශගුණික අවදානම්

- **ජල විද්‍යාත්මක විචල්‍යතාවය:** කුඩා ජල විදුලි ව්‍යාපෘති ස්ථාවර ජල ප්‍රවාහයක් මත රඳා පවතින අතර එය සෘතුමය වෙනස්කම් හෝ

දිගුකාලීන නියාමනයන් මගින් බලපෑමට ලක් විය හැකිය.

- **ස්වාභාවික විපත්:** ගංවතුර, නායයෑම් හෝ වෙනත් ආන්තික කාලගුණික සිදුවීම් යටිතල පහසුකම් වලට හානි කළ හැකි අතර මෙහෙයුම් කඩාකප්පල් කළ හැකිය.
- **ජෛව විවිධත්වය පිළිබඳ ගැටළු:** විභව පාරිසරික හා පාරිසරික බලපෑම් හේතුවෙන් සංවේදී ප්‍රදේශවල පුනර්ජනනීය ව්‍යාපෘතිවලට විරුද්ධත්වයට මුහුණ දිය හැකිය.

**v. මෙහෙයුම් අවදානම්**

- **ශ්‍රම බලකායේ අභියෝග:** පිඹෑ ය්‍යෂ වැනි අනුබද්ධ සමාගම් හරහා කුසලතා ඇති ශ්‍රමය ලබා ගැනීම සහතික කිරීම සහ ශ්‍රම බලකායේ ආරක්ෂාව කළමනාකරණය කිරීම අඛණ්ඩ ප්‍රමුඛතා වේ.
- **සැපයුම් දාම ගැටළු:** ප්‍රතිචක්‍රීකරණය සඳහා ඇලුමිනියම් හෝ ජල විදුලි බලාගාර සඳහා උපකරණ වැනි මූලාශ්‍ර ද්‍රව්‍ය ලබා ගැනීමේ ප්‍රමාදයන් හෝ බාධා කිරීම් කාලරාමුවලට බලපෑම් කළ හැකිය.
- **නඩත්තු අවශ්‍යතා:** කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා කම්හල් සහ පහසුකම් නිතිපතා නඩත්තු කිරීම හොඳින් සැලසුම් කළ උපාය මාර්ගයක් ඉල්ලා සිටී.

**vi. වෙළඳපල අවදානම්**

- **ඉල්ලුමේ උච්චාවචනයන්:** විශේෂයෙන් ආර්ථික පසුබෑම් අතරතුර බලශක්ති ඉල්ලුමේ වෙනස්වීම්, පුනර්ජනනීය ව්‍යාපෘතිවල ආදායමට බලපෑ හැකිය.
- **තරඟකාරී පීඩන:** වෙළඳපොලේ පුනර්ජනනීය බලශක්ති ක්‍රීඩකයින් සංඛ්‍යාව වැඩිවීම සම්පත්, කුසලතා සහ ගනුදෙනුකරුවන් සඳහා තරඟකාරිත්වය වැඩි කරයි.

**vii. ප්‍රජා සහ පාර්ශවකරුවන්ගේ අභියෝග**

- **ප්‍රජා ප්‍රතිරෝධය:** නව ව්‍යාපෘති සඳහා දේශීය විරෝධය, විශේෂයෙන් ඒවා ස්වාභාවික වාසස්ථාන හෝ ජීවනෝපායන් කඩාකප්පල් කරන බව වටහා ගන්නේ නම්.
- **පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන්:** ලාභදායීතාවය පවත්වා ගනිමින් කැරි, රජය සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සමතුලිත කිරීම.

### 3. අවම කිරීමේ උපාය මාර්ග

මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා, සමාගමට:

- ප්‍රතිරෝධී යටිතල පහසුකම් සහ නව්‍ය තාක්ෂණයන් සඳහා ආයෝජනය කළ හැකිය.
- ශක්තිමත් අවදානම් තක්සේරු කිරීම සහ කළමනාකරණ රාමු සංවර්ධනය කිරීම.
- නියාමන ආයතන සහ ප්‍රජාවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම.
- තනි මූලාශ්‍රයක් මත යැපීම අඩු කිරීම සඳහා බලශක්ති කළඹ විවිධාංගීකරණය කරන්න.
- ශ්‍රම බලකායේ පුහුණුව සහ ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් වැඩි දියුණු කරන්න.
- දිගු කාලීන මූල්‍යකරණය සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් සුරක්ෂිත කරන්න.

### 4. සමාගමේ ප්‍රගතිය පිළිබඳ විශේෂ අවස්ථා

පුනර්ජනනීය බලශක්ති සමාගමක් ලෙස අපගේ ප්‍රධාන ජයග්‍රහණ සහ සන්ධිස්ථාන පහත පරිදි වේ.

#### 4.1 කුඹල්ගමුව කුඩා ජල විදුලි බලාගාරය (KMHPP)

මෙය සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් කුඹල්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සහ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම ව්‍යාපෘතිය 2016 සිට ආර්ථිකයට දායක වන අතර සමනලවැව ජලාශයෙන් කාන්දු වන ජලය භාවිතා කරමින් මෙගාවොට් 1.2 ක විදුලි බලයක් ජනනය කිරීම කෙරෙහි මෙම බලාගාරය අවධානය යොමු කරයි. වැඩිවන විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා මෙම බලාගාරයෙන් ජනනය වන විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එකතු කරනු ලැබේ. ඉහත සඳහන් කළ පරිදි, ජල විදුලිය හරිත බලශක්තියක් වන අතර එය හරිතාගාර වායු අඩු කිරීමට දායක වේ. මෙම ව්‍යාපෘතිය පුනර්ජනනීය උත්පාදනය භාවිතා

කිරීමෙන් රටේ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇත. පරිසර හිතකාමී ආකාරයකින් විදුලිය ජනනය කිරීමෙන්, මෙම ව්‍යාපෘතිය රටේ කාබන් පියසටහන අඩු කිරීමට සහ දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීමට උපකාරී වේ.





## 4.2 මිනිස් බල සේවා අංශය

SLE විසින් මෙම අංශය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන්නේ මව් ආයතනයේ (CEB) සහ එහි අනුබද්ධිත ආයතනවල අවශ්‍යතා සඳහා සුදුසු සේවකයින් සැපයීමයි. මෙම ක්‍රියාවලිය ගැඹුරට යමින්, මෙම සේවාව 2015 දී ආරම්භ කරන ලද අතර වර්තමාන සන්දර්භය තුළ ද සැලකිය යුතු ආකාරයකින් එහි දායකත්වය සපයයි.



## 4.3 මීටර ආවරණ නිෂ්පාදන කම්හල

මීටර ආවරණ නිෂ්පාදන කම්හල (MEMP) යනු පොලිකාබනේට් මීටර ආවරණ නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම - (SLE) විසින් පිහිටුවන ලද විශේෂිත පහසුකමකි. මෙම ආවරණ ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූලව ගෘහස්ථ විදුලි ශක්ති මීටර ආරක්ෂිතව ආවරණය කිරීම සඳහා නිර්මාණය කර ඇත. මෙම ආවරණ මිනුම් ඒකකවල ආරක්ෂිත සහ විනිවිද පෙනෙන නිවාස සහතික කිරීම, අහිතකර පාරිසරික තත්ත්වයන්ගෙන් ඒවා ආරක්ෂා කිරීම සහ අනවසර ප්‍රවේශය වැළැක්වීම මගින් තීරණාත්මක අරමුණක් ඉටු කරයි.

MEMP පිහිටා ඇත්තේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සබරගමුව පළාතේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ය. මෙම බලාගාරය 2017 සිට ක්‍රියාත්මක වේ. ඊට අමතරව, මෙම බලාගාරය කාර්මික කලාපයක් තුළ පිහිටා ඇත. එම හේතුව නිසා ප්‍රවාහනය, ජලය සහ විදුලිය වැනි සියලු මූලික අවශ්‍යතා පහසුවෙන් සපුරා ගන්නා ලදී. CEB සහ LECO (ලංකා විදුලි සමාගම) යන දෙකටම අවශ්‍ය පොලිකාබනේට් මීටර කොටු කාර්යක්ෂමව සැපයීමේ පැහැදිලි අරමුණක් ඇතිව මෙම ස්ථානය තෝරාගෙන ඇත. මෙම උපයෝගිතා වලට සමීපව සිටීම ඔවුන්ගේ නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා කොටු කාලෝචිත ලෙස බෙදා හැරීමට සහ අභිරුචිකරණය කිරීමට ඉඩ සලසයි. ජාතියේ විදුලි යටිතල පහසුකම් සඳහා අත්‍යවශ්‍ය මීටර කොටු නිරන්තරයෙන් සැපයීමේ එහි කාර්යභාරය පෙන්නුම් කරමින්, බලාගාරය 2017 සිට ක්‍රියාත්මක වේ.



## 4.4 දැදුරුඔය කුඩා ජල විදුලි බලාගාරය (DMHPP)

විදුලිබල උත්පාදනයට සේවය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද දැදුරුඔය කුඩා ජල විදුලි බලාගාරය, ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්) සමාගමේ සැලකිය යුතු ජයග්‍රහණයක් නියෝජනය කරයි. ජල විදුලි බල උත්පාදනය සඳහා ඇති හැකියාව හඳුනා ගනිමින්, මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා SLE වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කළේය. මෙම ව්‍යාපෘතිය වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාහෝ හි කටුවන්නාව ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇත. ජල විදුලිබල උත්පාදනය සැපයීම සහ ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීම මෙහි අභිප්‍රායන් වේ. පොසිල ඉන්ධන මත යැපීම අඩු කිරීමෙන්, ව්‍යාපෘතියට ධනාත්මක පාරිසරික බලපෑම් ද ඇත. එය වායු දූෂණය සහ හරිතාග ාර වායු විමෝචනය අඩු කිරීමට උපකාරී වන අතර, දේශගුණික විපර්යාසවල බලපෑම් අවම කිරීම සඳහා ජාතියේ උත්සාහයන්ට සැලකිය යුතු දායකත්වයක් සපයයි.



| Plant Summary (January - December 2024) | | |
|---|---|---|
| Installed Capacity | 1.3 | MW |
| Cumulative energy Generated (January-December 2024) | 4.9 | GWH |
| Cum Income | 90.3 | Mn LKR |
| Period of operation | 4 years | Yrs |

## 5. 2025 ඉදිරි සැලසුම්

### 5.1 ඉවතලන ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය (SCALP)

පුනර්ජනනීය බලශක්තිය සහ තිරසාර භාවිතයන් සඳහා වන කැපවීමේ කොටසක් ලෙස, ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම, දැනට එහි ඇලුමිනියම් ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යමින් සිටී. අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදනය සාර්ථකව නිම කිරීමත් සමඟ සැලකිය යුතු ප්‍රගතියක් දැනටමත් ලබා ඇත. ව්‍යාපෘති කාලරාමුවෙහි තීරණාත්මක අදියරක් සනිටුහන් කරමින් ඉදිකිරීම් කටයුතු දැන් සිදුවෙමින් පවතී. අවසාන අදියර වනුයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම වන අතර එමඟින් පාරිසරික තිරසාරභාවය සහ සම්පත් සංරක්ෂණය සඳහා තවදුරටත් දායක වීමට සමාගමට හැකි වේ.





### 5.2 සීතාවක කුඩා ජල විදුලි ව්‍යාපෘති

ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම සීතාවක කුඩා ජල විදුලි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගනිමින් සිටින අතර, 2025 දී නිම කිරීමට ඉලක්ක කර ඇති තීරණාත්මක සන්ධිස්ථාන සමඟ. මූලික අරමුණ වන්නේ මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) අනුමැතිය ලබා ගැනීමයි, පාරිසරික ප්‍රමිතීන් සහ රෙගුලාසි සමඟ පූර්ණ අනුකූලතාවයක් සහතික කරයි. පසුව, අදාළ බලධාරීන් සමඟ සම්මත බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම (SPPA) අවසන් කිරීමට සහ ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය බලශක්ති බලපත්‍රය ලබා ගැනීමට සමාගම සැලසුම් කරයි. මෙම ප්‍රධාන අනුමැතීන් සහ ගිවිසුම් ලබා ගැනීමෙන් පසු, ඉදිකිරීම් ආරම්භ කරනු ලබන අතර, මෙම තිරසාර බලශක්ති මුලපිරීම සාර්ථකව සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් පියවරක් සනිටුහන් කරයි.



### 5.3 ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති කුඩා ජල විදුලි ව්‍යාපෘති

| | | |
|---|---|---|
| 1. | ඉහළ සමනල වැව | 700 KW |
| 2. | වගන්තලේ | 4.6 MW |
| 3. | බ්‍රොඩ්ලැන්ඩ් | 2.0 MW |
| 4. | වික්ටෝරියා | 1.0 MW |

# සී/ස එල් ටී එල් හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම

## 1. හැඳින්වීම

"ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් සමාගම" යනුවෙන් මීට පෙර හඳුන්වන ලද එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) සහ වෙනත් ආයතන තුනක් අතර රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරීත්වය මත පවති. පවත්නා කොටස්හිමි ව්‍යුහයෙන් 35% ක් ලංවිම ද 28% ක් වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම ද ඉතිරි 37% ක ප්‍රමාණය එල්ටීඑල් සමාග මේ සේවකයන් නියෝජනය කරන සමාගම් දෙකක් ද සතුව පවතියි. එල්ටීඑල් හෝල්ඩිංස් සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, පාර්ක් වීදියේ අංක 77 දරන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන අතර දශක හතරකට අධික ආයතනික ගමන්මග තුළ සවිමත් යහපත් මෙන් ම ස්ථාවර ප්‍රගතියක් අත්කර ගනිමින් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයෙහි ප්‍රමුඛ පෙළේ ඉංජිනේරු ආයතනයක් බවට පත්ව තිබේ. පාරිභෝගික කේන්ද්‍රියතාවය, නවීකරණය සඳහා ඇති අශාව, ගුණාත්මකභාවය සඳහා ආශාව, අවංකභාවය සහ ඒකීයභාවය අප සමාග මේ මූලික හරයයන් වන අතර **"ඉංජිනේරුවේදය සහ විද්‍යාව ආශ්‍රයෙන් තිරසර විසඳුම් මඟින් ජීවිත සඵලදායී කිරීමේ අරමුණෙන් එල්ටීඑල් හෝල්ඩිංස්හි අපි ක්‍රියාකරන්නෙමු"**.

විදුලිය බෙදාහරින ට්‍රාන්ස්ෆෝමර නිෂ්පාදනය කරමින් 1980 දශකයේ මුල් භාගයේ දී ස්වකීය ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ මෙම සමාගම පසුකාලීනව විදුලිබල උත්පාදනය, විදුලි යටිතල පහසුකම් සංවර්ධනය, විදුලිබලය බෙදාහැරීමේ ට්‍රානස්ෆෝමර නිෂ්පාදනය කිරීම සහ ලෝහ සින්ක් තුළ ගිල්වීමෙන් ගැල්වනයිස්කිරීම (Hot Dip Galvanizing) ආදී වශයෙන් ශ්‍රී ලංකාවේ විදුලිබල ක්ෂේත්‍රයෙහි සමස්ත අගය- දාමය ආවරණය කරමින් ආයතනයේ ව්‍යාපාරික කටයුතු විවිධ අංශ ඔස්සසේ විවිධාංගීකරණයට බඳුන්ව තිබේ. තවද මෙම සමාගම ශ්‍රී ලංකාව සහ බංගලාදේශය, ටැන්සානියාව, උගන්ඩාව, කෙන්යාව, ඉතියෝපියාව, ඝානාව, ඕමානය, ඉන්දියාව, නේපාලය, ජෝර්දානය, මියන්මාරය, මාලදිවයින් දූපත් සහ ඕස්ට්‍රේලියාව ආදී විදේශීය රටවල විදුලි බලාගාර ආයෝජනය සහ ඉංජිනේරුමය, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු නිම කිරීම සාර්ථක අන්දමින් ඉටු කර තිබේ.

එල්ටීඑල් හෝල්ඩිංස් (පුද්ගලික) සමාගම යනු ශ්‍රී ලංකාවේ විශාලතම ස්වාධීන බලශක්ති නිෂ්පාදකයා වන අතර එහි පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් හරහා ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 520 කට වැඩි විදුලියක් සපයනු ලැබේ.

2021 වර්ෂයේදී විදුලිබල අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලය (ලංවිම) විසින් සමාග මේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාග මක් මෙන් ම බලාගාර මෙහෙයුම් අංශය වන ලක්ධනවි සමාගම වෙත මෙගාවොට් 350 ද්‍රවීකෘත ස්වභාවික වායු මඟින් ක්‍රියාත්මක වන ද්විත්ව චක්‍රීය බලාගාරයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. ව්‍යාපෘතිය සඳහා පිහිටුවා ඇති විශේෂ කාර්ය ඒකකය වන සොබාධනවි සමාගම ලංවිම සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම ද ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සමඟ ඉන්ධන සැපයුම් ගිවිසුම ද සහ ශ්‍රී ලංකා රජය සමඟ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම ද ආයෝජන මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුම ද ආදී වශයෙන් ව්‍යාපෘතිය හා සම්බන්ධ ගිවිසුම් සියල්ල මේ වන විට අත්සන් කර තිබේ. මෙම විදුලි බල ව්‍යාපෘතියේ පළමු පියවර සාර්ථකව අවසන් කර ඇති අතර ජාතික විදුලිබල පද්ධතිය වෙත මෙගාවොට් 212 ක දායකත්වයක් සපයමින් 2024 අගෝස්තු මාසයේ විවෘත චක්‍රීය වාණිජ මෙහෙයුම ආරම්භ කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලයේ ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 350 ක විදුලි බලයක් එක් කරමින් ඒකාබද්ධ චක්‍රීය වාණිජ මෙහෙයුම 2025 වර්ෂයේ මුල් භාගයේ දී ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ.

පාරිසරික, ඉංජිනේරු, මූල්‍ය සහ අනෙකුත් මූලික ව්‍යාපෘති සංවර්ධන කටයුතු කරගෙන යාමට සමාගමට හැකියාව සලසමින් ව්‍යාපෘති ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනැගීම, හිමිකරගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පැවරීම (BOOT) යන පදනම මත කෙරවලපිටියේ දෙවන මෙගාවොට් 350 ද්‍රවීකෘත ස්වභාවික වායු ඒකාබද්ධ චක්‍රීය බලාගාරයට අදාළව අභිප්‍රාය ලිපිය (LOI) නිකුත් කිරීම සම්බන්ධයෙන් සමාගම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ලංවිම සමඟ සාකච්ඡා කරමින් සිටී.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායමේ මගපෙන්වීම යටතේ ජාත්‍යන්තර වශයෙන් දැනුම සහිත බලශක්ති අංශයේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ පසුගිය දශක හතරක කාලය තුළ නව්‍යකරණ මෙන්ම නවීන තාක්ෂණය තුළින් ලබා ගත් විශාල අත්දැකීම් සමගින් වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් සහ මනා ලෙස සම්බන්ධ වූ තරුණ ඉංජිනේරුවන්ගේ කණ්ඩායමෙහි අනුග්‍රහය සහිතව සමාගම දැන් සැලකිය යුතු ලෙස වර්ධනය වී පසුගිය දශක දෙකක කාලය තුළ සාර්ථක ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ගමන් කර තිබේ.

ආසියානු කලාපයේ හොඳම ස්වාධීන බලශක්ති නිෂ්පාදකයා (IPP) සඳහා වන කීර්තිමත් ස්වර්ණ සම්මානය ඇතුළත්ව විශිෂ්ට කාර්යසාධනය සඳහා සමාගම වසර ගණනාවක් පුරා ඉංජිනේරු විශිෂ්ටත්වය සඳහා වන විවිධ සම්මානයන්ට පාත්‍ර වී තිබේ.



**2. මුහුණදුන් අභියෝග සහ එම අභියෝග ජයගැනීමට භාවිතා කළ උපක්‍රමඃ**

**මෙගාවොට් 350 සොබාධනව් ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරය ඉදිකිරීම.**

(අ) රට මුහුණ දී ඇති මූල්‍ය අර්බුදය හේතුවෙන් බලපවත්වන තත්ත්වය මධ්‍යයේ රටක් ලෙස විදුලිය හිඟයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමේ ජාතික වැදගත්කම සැලකිල්ලට ගනිමින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ විදුලිබල මණ්ඩලය විසින් ලබා දුන් සදාචාරාත්මක අනුග්‍රහය සහ සහයෝගය ඇතිව සමාගම විසින් පවතින මූල්‍ය සම්පත් උපයෝගී කර ගනිමින් ඉහත බලාගාරයේ ප්‍රගතිය අඛණ්ඩව සිදු කරන ලදී. සමාගම සද්භාවයෙන් යුතුව ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව කරගෙන ගිය අතර ඉහළ ගාස්තු සංශෝධනය සඳහා ලංවිම අනුමැතිය ලැබීමෙන් පසුව ලංවිමට ඇති හිමිකම් සාධාරණීකරණය කිරීම සඳහා අපගේ SLFM (Sri Lanka Force Majeure) ප්‍රකාශය සලකා බලා ගාස්තු සංශෝධනයට විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම සඳහා අවශ්‍ය සංශෝධන ඇතුළත් කරමින් විධිමත් කරන ලදී.

(ආ) ශ්‍රී ලංකාවේ ක්ෂය වූ සාර්ව ආර්ථික තත්ත්වය සහ එහි ණය ශ්‍රේණිගත කිරීම හේතුවෙන් ආසියානු සංවර්ධන බැංකුව (ඝඊ) සහ අනෙකුත් විදේශීය මූල්‍ය ආයතන සමඟ සාකච්ඡා කරන ලද මුල් ව්‍යාපෘති ණය අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගම රුපියල් බිලියන 44.5 ක ව්‍යාපෘති ණයක් ලබා ගැනීම සඳහා දේශීය බැංකු 9 ක එකමුතුවක් සමඟ සාර්ථකව සාකච්ඡා කර තිබේ. අදාළ ගිවිසුම දැනටමත් අත්සන් කර තිබෙන අතර 2024 දෙසැම්බර් මස මුලදී ව්‍යාපෘති මූල්‍යය අඩු කිරීම අපේක්ෂා කෙරේ.

## 3. සංවර්ධන ව්‍යාපෘතිවල සහ ආයතනික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

### 3.1 කෙරවලපිටිය පිහිටි මෙගාවොට් 300 යුගධනවි ද්විත්ව චක්‍රීය බලාගාරය





| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | යුගදනවි බලාගාරය, කෙරවලපිටිය, ශ්‍රී ලංකාව |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 300 ද්විත්ව චක්‍රීය ඉන්ධ මඟින් ක්‍රියාකරන බලාගාරය |
| එන්ජින් වර්ගය | GT – Frame 9E, ST SC5 |
| ප්‍රත්‍යාවර්තක වර්ගය | GE 9A5 |
| ආකෘතිය | 2:2:1 |
| යන්ත්‍ර නිමැවුම | එක් යන්ත්‍රයකින් මෙගාවොට් 100 බැගින් |
| යන්ත්‍ර සංඛ්‍යාව | 2 GTs & 1 ST |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2010 මැයි මස සිට වසර 25 ක් |

යුගදනවි මෙගාවොට් 300 ඒකාබද්ධ චක්‍ර බලාගාරයේ 14 වන කොන්ත්‍රාත් වර්ෂය 2024 මැයි 9 වන දින නිම කරන ලද අතර ලබා ගැනීමේ හැකියාව 84.15% කි. 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා බලශක්ති අලෙවිය ගිගාවොට් 653.57 ක් වන අතර, සමාලෝචිත කාල සීමාව තුළ දින 193 ක් බලාගාරය ක්‍රියාත්මක කර ඇත. 2024 වර්ෂය සඳහා වාර්ෂික ලබා ගැනීමේ උපයෝජ්‍යතා ඉලක්කය 70% මත පදනම් වී ඇත.

ST (Steam Turbine) ප්‍රධාන පරීක්ෂණය සහ GT02 Hot Gas Path පරීක්ෂණය සඳහා 2024 අප්‍රේල් 17 වැනිදා සිට ජූනි 1 වැනිදා දක්වා බලාගාරයේ නියමිත විවිධ නඩත්තු ක්‍රියාකාරකම් ඇතුළත්ව මෝටර්වල PM හී සැලසුම්ගත පරීක්ෂණ, ක්‍රමාංකන සහ පිරියත BOP වල උපකරණ සැකසීම් කටයුතු සඳහා බලාගාර ඇනහිටී- ම් සමගාමීව සිදු කරන ලදී.

### 3.2 කෙරවලපිටියේ මෙගාවොට් 350 සොබාධනවි ස්වභාවය ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය

ව්‍යාපෘතියේ වැඩ කටයුතු ඉතා ඉහළ මට්ටමකට ගත හැකි පරිදි වේගවත් කර ඇති අතර ව්‍යාපෘති වැඩවලින් 85% කට වැඩි ප්‍රමාණයක් අවසන් කර ඇත. ව්‍යාපෘතියේ පළමු අදියර වන විවෘත චක්‍රීය වාණිජ මෙහෙයුම් 2024 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද අතර ලංවිම ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 212 ක විදුලිය සැපයීම සිදු කරන ලදී. 2025 මුල් භාගයේදී ඒකාබද්ධ චක්‍රීය වාණිජ මෙහෙයුම් සාක්ෂාත් කර ගැනීමට සමාගම අදහස් කරයි.

පහත දැක්වෙන්නේ එම ස්ථානයේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රගති මට්ටම් සහ ප්‍රධාන සිදුවීම් පෙන්නුම් කරන ඡායාරූප කිහිපයකි.









LNG බලාගාර බලගැන්වීම

| | |
|---|---|
| ස්ථාපනය | සොබාධනවි බලාගාරය, කෙරවලපිටිය, ශ්‍රී ලංකාව |
| බලාගාරයේ මුළු ධාරිතාවය | මෙගාවොට් 350 ධාරිතාවයෙන් යුතු ද්‍රවීකෘත ස්වභාවික වායු ද්විත්ව චක්‍රීය බලාගාරය |
| එන්ජින් මාදිලිය | GT – SG5 1200A; SST 3000 |
| ඕල්ටනේටර් වර්ගය | GT – SG5 4000F; SST 100A |
| ආකෘතිය | 1:1:1 |
| යන්ත්‍ර නිමැවුම | GT – මෙගාවොට් 220 + ST - මෙගාවොට් 130 = මෙගාවොට් 50 |
| යන්ත්‍ර සංඛ්‍යාව | 1 GTs & 1 ST |
| ව්‍යාපෘති ගිවිසුම් | 2021 ජූලි මස 19 වන දින අත්සන් තබන ලදී මූලික විදුලි මිලදී ගැනීමේ ව්‍යාපෘතිය පසුව අත්සන් කරන ලදී. |
| විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමේ කාලය | 2024 ජනවාරි මස ආරම්භ වන විවෘත චක්‍රය සඳහා ද 2025 ජනවාරි මස මුල ආරම්භ වන දිවිත්ව චක්‍රය සඳහා ද වසර 20 ක කාලයක් සඳහා ත්සන් තබන ලදී. |

**ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය සහ විශේෂ අවස්ථා**

මේ වන විට රටේ ද්‍රවශීලතා අර්බුදය තරමක් දුරට දියුණු වී ඇති අතර බැංකු එක්සත් ජනපද ඩොලර් අවශ්‍යතා සපුරාලීමට කැමැත්තෙන් සිටී. සොබාධනවි ව්‍යාපෘති ණය ගිවිසුමට අත්සන් කර ඇති අතර ලක්ධනවි දැනටමත් කොටස් දායකත්වය අනුව එහි සීමාවන් ඉක්මවා ගොස් ඇති අතර එහි කාරක ප්‍රාග්ධන දායකත්ව සීමා වලින් බහුතරය අවසන් කර ඇති බැවින් ඊළඟ මාසයේ දී ලංකා රුපියල් වාරික ණය ගතහැකි බවට විශ්වාසයෙන් සිටියි. මූල්‍ය සම්පාදන ක්‍රියවලිය මේ වන විටත් සාක්ෂාත් කර ගෙන ඇති අතර ඒ ගෙන විදුලිබල මණ්ඩලයට නිසි ලෙස දැනුම් දී ඇත.

උපලේඛනගත බැංකු විසින් අනුමත කරන ලද ලංකා රුපියල් බිලියන 44.5 ක් වටිනා සම්මිලිත ව්‍යාපෘති ණය පහත සඳහන් පරිදි වේ.

| බැංකුවේ නම | විශේෂ කරුණු | මුදල රුපියල් බිලියන වලින් |
|---|---|---|
| හැටන් නැෂනල් බැංකුව, සම්පත් බැංකුව, කොමර්ෂල් බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ එන්ඩීබී බැංකුව | බිලියන 6 බැගින් | 36.0 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | | 5.0 |
| කාර්ගිල්ස් බැංකුව | | 2.5 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | 1.0 |
| **එකතුව** | | **44.5** |

ඒකාබද්ධ චක්‍රීය පියවර සඳහා සවිස්තරාත්මක ඉංජිනේරු ක්‍රියාකාරකම් වේගවත් කර ඇති අතර ST (Steam Turbine) සහායක මොඩියුලය, වැඩමුළු ගොඩනැගිල්ල, ST SEE, ට්‍රාන්ස්ෆෝමරය, ST PCC, සිසිලන ජලනල ආධාරක, ST GCB, ජල පවිත්‍රාගාරය සහ Mixed Bed සම්බන්ධ සියලුම සැලසුම් සහ චිත්‍ර සම්පූර්ණ කර ඇති අතර එම වැඩකටුතු අවසන් කිරීමට ආසන්නව ඇත.

### 3.3 රාජ් ලංකා විදුලි බලාගාරය, නටෝර්, බංගලාදේශය

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | රාජ් ලංකා විදුලි බලාගාරය, නටෝර්, බංගලාදේශය |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 52.2 |
| එන්ජින් වර්ගය | W20V32 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2014 ජනවාරි මස සිට වර්ෂ 15 ක් |

රාජ් ලංකා විදුලි බලාගාරයේ 2024 වර්ෂය සඳහා (2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා) වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට්පැය 10.122 ක් වූ අතර එම කාලය සඳහා අත්කරගත් සාමාන්‍ය බලාගාර සාධකය 2.65% ක් වන අතර අත්කරගත් සමස්ත උපයෝජ්‍යතාව 99.85% කි. 2024 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 90% ට වඩා වැඩි අගයක් මත පදනම් වී ඇත. ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ශ්‍රී ලංකාවට අයත් ප්‍රථම තාප බලාගාරය මෙයයි.



### 3.4 ලක්ධනවි බංග්ලා විදුලි බලාගාරය, කොමිලා, බංගලාදේශය

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | ලක්දනවි බංග්ලා විදුලි බලාගාරය, කොමිලා, බංගලාදේශය |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 52.2 |
| ගිගාවොට්එන්ජින් වර්ගය | W20V32 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2014 දෙසැම්බර් මාසයේ සිට වසර 15 ක් |

ලක්ධනවි බංග්ලා බලාගාරයේ 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා 2024 වර්ෂය සඳහා බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 147.183 ක් වන අතර එම කාල සීමාව සඳහා සාමාන්‍ය බලාගාර සාධකය 39.25% ක් වන අතර ලබා ගැනීමේ හැකියාව 88.96% කි. 2024 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 90.00% ට වඩා වැඩි අගයක් මත පදනම් වී ඇත.



### 3.5 ෆෙනි ලංකා විදුලි බලාගාරය, ෆෙනි, බංගලාදේශය

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | ෆෙනි ලංකා විදුලිබලාගාරය, |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 114 |
| එන්ජින් වර්ගය | 18V50 හයක් සහ W20V32 එකක් |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2019 නොවැම්බර් මස සිට වසර 15 ක කාලයක් |

2024 ජනවාරි සිට ඔක්තෝබර් 31 දක්වා ෆෙනි ලංකා බලාගාරයේ බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 345.879 ක් වූ අතර සාමාන්‍ය බලාගාර සාධකය 41.45% ක් විය. අත කරගන්නා ලද උපයෝජ්‍යතාව 91.37% විය. 2024 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 90% ට වඩා වැඩි අගයක් මත පදනම් වී ඇත.

### 3.6 පවන්දනවි සුළං බලාගාරය, නොරොච්චෝලෙ



| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | පවන්දනවි සුළං බලාගාරය, ඉලන්තඩිය, නොරොච්චෝලෙ |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගා වොට් 9.8 |
| ටර්බයිම වර්ගය | G58 |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2012 සැප්තැම්බර් මාසයේ සිට වසර 20 ක් |

2024 ඔක්තෝබර් 31 දක්වා වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 18.94 ක් වන අතර ළඟාකරගත් බලාගාර සාධකය 26% කි. 2024 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 95% මත පදනම් වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ මෙම බලාගාරයෙහි වරින් වර නඩත්තු සේවා ඉටු කරන ලදී.



### 3.7 බෙලිහුල්ඔය පිහිටි නිව්දු කුඩා ජල විදුලි බලාගාරය

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | බෙලිහුල්ඔය නිව්දු කුඩා ජල විදුලිබලාගාරය |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 2.2 |
| ටර්බයිම වර්ගය | Horizontal Turbo Impulse |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2023 මැයි මස සිට වසර 15 ක්<br>1 වන දිගුව 22.05.19 දින කල් ඉකුත් විය.<br>2 වන දිගුව 2038.12.31 දක්වා වලංගු වේ. |

2024 ඔක්තෝබර් 31 දක්වා නිව්දු බලාගාරයේ බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 678 ක් වූ අතර බලාගාර සාධකය 43% කි. 2024 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 95% මත පදනම් වී ඇත. විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2038 දෙසැම්බර් මස 31 දක්වා දීර්ඝ කර තිබේ.




### 3.8 අසුපිනිඇල්ල කුඩා ජලවිදුලි බලාගාරය

| | |
|---|---|
| ස්ථාපිත බලාගාරය | අසුපිනිඇල්ල කුඩා ජලවිදුලි බලාගාරය, අරණායක |
| බලාගාරයේ මුළු ධාරිතාව | මෙගාවොට් 4 |
| වර්බයිම වර්ගය | Horizontal Pelton |
| විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් කාලසීමාව | 2005 නොවැම්බර් මස සිට වසර 15 ක්<br>1 වන දිගුව 2025.10.30 දක්වා වලංගු වේ. |

2024 ඔක්තෝබර් මස 31 දක්වා අසුපිනිඇල්ල බලාගාරයේ වාර්ෂික බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 13.68 ක් වන අතර ළඟාකරගත් ගත් බලාගාර සාධකය 47.5% කි. 2024 වර්ෂය සඳහා වාර්ෂික උපයෝජ්‍යතා ඉලක්කය 95% මත පදනම් වී ඇත. විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම 2025 ඔක්තෝබර් මස 30 දක්වා දීර්ඝ කර තිබේ.



### 3.9 මෙගා වොට් 10 ක ධාරිතාවයෙන් යුතු මකරිගාඩ් ජල විදුලි (පුද්ගලික) සමාගම , නේපාලය

| | |
|---|---|
| ස්ථානය | ජල මූලාශ්‍රය - දුරින් පිහිටි පෙරදිග නේපාලයේ කන්දේශ්වරීහි වර්මෙලියා නදියෙහි සහ ඩර්චුලා දිස්ත්‍රික්ක |
| සමස්ත බලාගාර ධාරිතාව | මෙගාවොට් 10 |
| ටර්බයිම වර්ගය | Horizontal 2 Jet Pelton |
| ජල ප්‍රභවය | වර්ෂය පුරාම වර්ෂාපතනය සහ හිම පතනය |
| විදුලිබල ගිවිසුමේ කාලය | 2023 මාර්තු සිට වසර 30ක් |

බලාගාරයේ වාණිජ ක්‍රියාකාරකම් 2023 මාර්තු මස 11 වන දින සිට සාර්ථකව ක්‍රියාත්මක වේ. 2024 ඔක්තෝබර් 31 වන දින දක්වා බලශක්ති අලෙවිය ගිගාවොට් පැය 47.0 ක් වන අතර

COD (Commercial Operation Date) වලින් 65 % ක් බලාගාර සාධකයක් අත්කරගෙන තිබේ.



### 3.10 සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බල උද්‍යාන පහසුකම

රිවිධනවි (පුද්ගලික) සමාගමේ විශේෂ කාර්ය ව්‍යාපෘතිය) සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100 සූර්ය ෆොටෝවොලටික් උද්‍යාන පහසුකම් සංවර්ධනය සඳහා ආරම්භ කරන ලද අතර කිලෝමීටර 27 ක් පමණ විහිදෙන කිලෝවොට් 132 සම්ප්‍රේෂණ පහසුකම සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. සියඹලාණ්ඩුව සහ ඒ අවට ප්‍රදේශයේ හෙක්ටයාර 220ක භූමි ප්‍රමාණයක මෙම සූර්ය බලාගාරය ස්ථාපිත කරනු ලැබේ.

සමාගම 2024 පෙබරවාරි 08 වැනි දින ලංකා විදුලිබල මණ්ඩලය සමඟ වසර 20ක කාලයක් සඳහා විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමට එළැඹිණි. එසේම විදුලිබල මණ්ඩලය සමඟ සම්ප්‍රේෂණ පහසුකම් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2024 අප්‍රේල් 25 වැනි දින අත්සන් කරන ලදී. ශ්‍රී ලංකා රජය සමඟ ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම 2024 ජූලි 15 වැනි දින අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (SLSEA) සමඟ ඇති ඉඩම් බදු ගිවිසුම ක්‍රියාත්මක කිරීම දැනට සිදුවෙමින් පවතින අතර එම ඉඩම ප්‍රථමයෙන් රජයේ ප්‍රදානයක් හරහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත පැවරිය යුතු බැවින් එය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

සූර්ය බලාගාරය සහ සම්ප්‍රේෂණ පහසුකම යන දෙකෙහිම මූලික කටයුතු සිදු වෙමින් පවතින අතර සූර්ය බල උද්‍යානය සහ සම්ප්‍රේෂණ පහසුකම යන දෙකෙහිම ඉදිකිරීම් කටයුතු සක්‍රීයව සිදුවෙමින් පවතී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන සමාගම වෙත රුපියල් මිලියන 1 100 ක පිරිවැයක් 2024 ඔක්තෝබර් 31 වන විට රිවිධනවි හි කොටස්කරුවන් වන ලක්ධනවි ලිමිටඩ් සහ වින්ඩ්ෆෝර්ස් ලිමිටඩ් විසින් සමානව මූල්‍යකරණය කරන ලදී.

මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ සූර්ය බලශක්ති ව්‍යාපෘතිය වන අතර, පුනර්ජනනීය බලශක්තිය වෙත රට පරිවර්තනය වීමේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. අනාගතයේදී කාබන් සලකුණු අවම කිරීම සඳහා ශ්‍රී ලංකාවට පිරිසිදු, වඩාත් පරිසර හිතකාමී තිරසාර බලශක්තියකට දායක වෙමින් මෙම ව්‍යාපෘතිය නියමිත කාලයේ දී නිම කිරීමට අපි සම්පූර්ණයෙන්ම කැපවී සිටිමු.

### 3.11 ස්වභාවික වායු (LNG) යටිතල පහසුකම් සහ විදුලිබල උත්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම

ස්වභාවික වායු යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අන්තර්කාලීන විසඳුමක් ලෙස විදුලිබල උත්පාදනය සඳහා ස්වභාවික වායු සැපයීම සඳහා වූ යෝජනාව එල්ටීඑල් හෝල්ඩිංග් ලිමිටඩ් සහ ඉන්දීය රජය බහුතර කොටස් ප්‍රමාණයක් හිමි පොදු ලැයිස්තුගත සමාගමක් වන පෙට්‍රොනෙට් එල්එන්ජී ලිමිටඩ් (PLL) ඒකාබද්ධව 2024 මැයි 20 වන දින විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

2024 ජූලි 15 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ඒකාබද්ධ යෝජනාව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, එල්ටීඑල් හෝල්ඩිංග් ලිමිටඩ් සහ පෙට්‍රොනෙට් එල්එන්ජී ලිමිටඩ් අතර 2024 අගෝස්තු 20 වැනි දින මෙම සුවිශේෂී ආරම්භය සඳහා සහයෝගීත්ව අවශ්‍යතා විධිමත් කරමින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

මෙම ව්‍යාපෘතියට ස්වභාවික වායු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ISO බහාලුම් භාවිතයෙන් ඉන්දියාවේ කොච්චින් නගරය සිට ස්වභාවික වායු විශ්වාසනීය සහ බාධාවකින් තොරව සැපයීම සහතික කිරීම ඇතුළත් වේ. අවශ්‍ය සියලුම අනුමැතීන් ලැබීමෙන් පසු මාස 18 ක් ඇතුළත ව්‍යාපෘතිය අවසන් කිරීමට කාලරාමුව සකසා තිබේ. ව්‍යාපෘතියේ සුමට ප්‍රගතිය තහවුරු කිරීම සඳහා පීඑල්එල් (PLL), බලයලත් රාජ්‍ය ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර

ක්‍රියාකාරී සහයෝගීතාවයෙන් මූලික කටයුතු දැනට සිදු වෙමින් පවතී.

මෙම මූලාරම්භය මගින් ශ්‍රී ලංකාවේ බලශක්ති සංක්‍රාන්ති අවස්ථාවට සහයෝගය දැක්වීමේදී එහි කාර්යභාරය ශක්තිමත් කරමින් පිරිවැය කාර්යක්ෂම සහ තිරසර බලශක්ති විසඳුම් ලබා දීමට එල්ටීඑල් ආයතනයේ කැපවීම පිළිඹිබු කරයි. සහස්ධනවි බලාගාරය (කෙරවලපිටිය 3 වන ව්‍යාපෘතිය) ක්‍රියාත්මක කරනු ලබන අතර යුගධනවි, සොබධනවි සහ සහස්ධනවි බලාගාර තුනේම ස්වභාවික වායු භාවිතය මගින් හැකි පරිදි විදුලි අඩු කිරීමෙන් ජනතාවට විශාල සහනයක් ලබා දී ලංවිමට විශාල පිරිවැය ඉතිරියක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

### 3.12 ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනය සහ අලෙවිය




(අඟුලාන ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනාගාරය)




(බෙදාහැරීමට නියමිත ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනාගාරය)





(පහසුකම් සැපයීමේදී ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනයේ අදියර)

2024/01/01 සිට 2024/10/31 කාලසීමාව දක්වා නිෂ්පාදනය පහත සඳහන් පරිදි වේ.

| | | 2024 (ජනවාරි සිට ඔක්තෝබර් දක්වා) සංඛ්‍යාව | 2023 (ජනවරි සිට ඔක්තෝබර් දක්වා) සංඛ්‍යාව | වෙනස (+)/(-) |
|---|---|---|---|---|
| අ) | ලංවිම/ ලෙකෝ වෙත සපයන ලද ට්‍රාන්ස්ෆෝමර් | 1,945 | 1,749 | (+)196 |
| ආ) | වෙනත් දේශීය ගනුදෙනුකරුවන් වෙත සපයන ලද ට්‍රාන්ස්ෆෝමර් | 55 | 28 | (+) 27 |
| ඇ) | වෙනත් රටවල් වෙත අපනයනය කරන ලද ට්‍රාන්ස්ෆෝමර් | 439 | - | (+)439 |
| | **මුළු සංඛ්‍යාව** | **2,439** | **1,777** | **(+)662** |

ග්‍රාමීය විද්‍යුත්කරණයේ ව්‍යාප්තිය සහ විදුලි ඉල්ලුම ඉහළ යැමත් සමඟ ලංවිම වෙත බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර් සැපයුම 196 කින් ඉහළ ගොස් ඇති අතර එය සමාලෝචිත කාලසීමාවට සාපේක්ෂව 11.21% ක වර්ධනයක් පෙන්නුම්

කරයි. මීට අමතරව දේශීය සේවාලාභීන් වෙත බෙදාහැරීමේ ට්‍රාන්ස්ෆෝමර් සැපයුම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 27 ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. එමෙන් ම ජාත්‍යන්තර තරගකාරී ලංසු තැබීම් ප්‍රදානයක් ලබාගෙන ට්‍රාන්ස්ෆෝමර් 439ක් අපනයනය කර ඇත.

**3.12.1 ඇෆ්‍රිකා එනර්ජි එක්ස්පෝ 2024 -රුවන්ඩාව සඳහා සහභාගී වීම**

එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර් සමාගම නොවැම්බර් 4-6 දක්වා රුවන්ඩාවේ කිගාලි සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේ පැවති ඇෆ්‍රිකා එනර්ජි එක්ස්පෝ 2024 හි ප්‍රබල සංකල්පනයක්ඇති කරන ලදී. එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර් නියෝජනය කරමින් සහ අපගේ ටැන්සානියා බලාගාරයේ හැකියාවන් ප්‍රදර්ශනය කරමින් අපි අප්‍රිකාව පුරා විවිධ පාරිභෝගිකයින් සමඟ සම්බන්ධ වීමු. විශිෂ්ටත්වය උදෙසා අපගේ කැපවීම අවධාරණය කරමින් රුවන්ඩාවේ බලශක්ති අමාත්‍යවරයා හමුවීම විශේෂ අවස්ථාවක් විය.

**3.12.2 2025 වර්ෂය සඳහා සැලසුම් කළ වැඩිදියුණුකිරීම්**

- **පීඩන පරීක්ෂාව සඳහා ISO 17025 අවකාශ විශාලනය**

අ) පීඩන පරීක්ෂාව සඳහා ISO 17025 අවකාශ විශාලනය

- **පර්යේෂණ සහ සංවර්ධන**

(අ) පුනර්ජනනීය යෙදවුම් සඳහා 6.8 එම් 800එ සංයුක්ත බලාගාරයක් සංවර්ධනය කිරීම

(ආ) ලංවිම නව පිරිවිතර සපුරා ගැනීමට දේශීය උපයෝග්‍යතාවය සඳහා ෆොටෝ ටයිප් (Photo type) ට්‍රාන්ස්ෆෝමර් සංවර්ධනය කිරීම

(ඇ) යුරෝපීය වෙළඳපොළ කොටස් කිරිම සඳහා ඌෂ්මක ට්‍රාන්ස්ෆෝමර සංවර්ධනය කිරීම.

- වැඩිදියුණුකිරීම් ක්‍රියාත්මක කිරීම

(අ) ISO 50001 (විදුලිබල කළමනාකරණ පද්ධතිය) සහතිකකරණය ආරම්භ කිරීම.

(ආ) කාර්බන් අවම කිරීමේ ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනාගැනීමට ආරම්භක ශුද්ධ ශුන්‍ය රාමුවක් සංවර්ධනය කිරීම සහ මූලික ප්‍රමිතික ස්ථාපනය කිරීම.

- **පුද්ගල වැඩිදියුණුකිරීම**

අ) මානව සම්පත් ඩිජිටල්කරණය

(අ) PID උඳුන් සවිකිරීමේ ව්‍යාපෘතිය

(ආ) ආරක්ෂක කුටිය සහ රියදුරු විවේකාගාර ව්‍යාපෘතිය

**3.12.3 වැඩකිරීම සඳහා විශිෂ්ට ස්ථානයක් සහතිකකිරීම - එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම**

එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් (පුද්) සමාගම 2024 සැප්තැම්බර් සිට 2025 සැප්තැම්බර් දක්වා අඛණ්ඩව දෙවන වසරටත් 2024 සැප්තැම්බර් මාසයේ දී කාර්යය සඳහා සුදුසු ස්ථානය වශයෙන් සහතිකකරණයට පාත්‍ර විය. මෙම සහතික කිරීම විශ්වාසය, ගෞරවය සහ විශිෂ්ටත්වය ගොඩනැගීම සඳහා එල්ටීඑල් කණ්ඩායමේ කැපවීම උද්යෝගිමත්ව කටයුතු කිරීම තෙස්තමේන්තු දරයි.

එල්ටීඑල් සමූහය සුවිශේෂී ජයග්‍රහණ සඳහා ඔවුන්ට සුබ පැතීමට කැමති අතර අනාගතයේදී ද මෙවැනි ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට අපි ප්‍රාර්ථනා කරමු.

**3.13 සපුගස්කන්ද ගැල්වනයිස්කිරීම හා වාන අමතරකොටස් කර්මන්තසාල**



**3.13.1 නිෂ්පාදන තොරතුරු - ගැල්වනයිස් කිරීමේ හා වාන අමතරකොටස් කර්මන්තසාල - 2024/01/01 සිට 2024/10/31 දක්වා කාලපරිච්ඡේදය සඳහා වාර්තා වූ නිෂ්පාදනය**

| ගැල්වනයිසින් ව්‍යාපෘතියේ නිෂ්පාදන නිමැවුම | | |
|---|---|---|
| ගනුදෙනුකරු | 2024 ජනවාරි - ඔක්තෝබර් | 2023 ජනවාරි - ඔක්තෝබර් |
| ලංවිම | 1,557 | 2,177 |
| අපනයන | | |
| දේශීය | 4,811 | 4,343 |
| එකතුව | **6,369** | **6,520** |

| පිරිසැකසුම් ව්‍යාපෘතියේ නිෂ්පාදන නිමැවුම | | |
|---|---|---|
| ගනුදෙනුකරු | 2024 ජනවාරි - ඔක්තෝබර් | 2023 ජනවාරි - ඔක්තෝබර් |
| ලංවිම | 296 | 712 |
| අපනයන | 93 | |
| දේශීය | 512 | 299 |
| එකතුව | **901** | **1,011** |

### 3.13.2 ජයග්‍රහණ

- ශ්‍රී ලංකාවේ උසම MET මාස්ට් වැරරුහැන් ව්‍යාපෘතියට සහාය වූ අතර, එයට MET මාස්ට් කුළුණු හයක් සාර්ථකව නිම කිරීම ඇතුළත් විය. මෙම කාලය තුළ ව්‍යාපෘතිය ලංවවිම වෙත භාර දෙන ලදී.
- SAP ක්‍රියාත්මක කිරීම සාර්ථකව නිම කරන ලද අතර එය 2024 සැප්තැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක විය
- කර්මාන්ත අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ පැවති "Industry Expo 2024" ප්‍රදර්ශනයේ රිදී අනුග්‍රාහකයා ලෙස එල්ටීඑල් ගැල්වනයිසර්ස් (පුද්ගලික) සමාගම සහභාගී විය.
- IESL විසින් සංවිධානය කරන ලද "Techno 2024" ප්‍රදර්ශනයට රිදී අනුග්‍රාහකයෙකු ලෙස එල්ටීඑල් ගැල්වනයිසර්ස් (පුද්) සමාගම සහභාගී වූ අතර උත්සවයේ තේමාව වන "සමෘද්ධිය කරා යන මාවත" සමඟ අනුගත වීම වෙනුවෙන් රිදී සම්මානයක් ලබා ගන්නා ලදී.
- IESL යාන්ත්‍රික ඉංජිනේරු අංශය විසින් සංවිධානය කරන ලද "ලෝහ සඳහා විඛාදන විරෝධී ආලේපන නිර්මාණය" පිළිබඳ CPD වැඩසටහනක දේශනයක් ඉදිරිපත් කිරීමට එල්ටීඑල් ගැල්වනයිසර්ස් (පුද්ගලික) සමාගමට ආරාධනා කරන ලද අතර එය සාර්ථකව පවත්වන ලදී.
- අප්‍රිකානු කලාපය පුරා නව ව්‍යාපාරික අවස්ථා සොයා ගැනීම සඳහා අප්‍රේල් මාසයේදී ඝානා සහ සීෂෙල්ස් වෙත සංචාරයක් සංවිධානය කරන ලදී.

### 3.13.3 2025 වර්ෂය සඳහා සැලසුම්කර ඇති වැඩිදියුණුකිරීම්

1. **ISO 50001:2018 බලශක්ති කළමනාකරණ පද්ධති ක්‍රියත්මක කිරීම**
   බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, බලශක්ති පිරිවැය අඩු කිරීම සහ ජාත්‍යන්තර බලශක්ති කළමනාකරණ ප්‍රමිතීන්ට අනුකූල කිරීම අරමුණු කරගෙන ISO 50001:2018 සහතිකකරණය ක්‍රියාවට නැංවීම සඳහා ව්‍යුහගත සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට නියමිත ය.

2. **කාබන් ශුද්ධ ශුන්‍ය ව්‍යාපෘතිය ආරම්භ කිරීම**
   අපගේ කාබන් භාවිතය අඩු කිරීම සහ මෙහෙයුම් වලදී කාබන් මධ්‍යස්ථභාවය ළඟා කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් ගෝලීය තිරසර ඉලක්ක සමඟ පෙළ ගැසීමට මෙම ව්‍යාපෘතිය දියත් කරනු ලැබේ.

3. **ප්‍රතීතන රසායනාගාරයක් පිහිටුවීම**
   තත්ත්ව පාලන පියවර වැඩිදියුණු කිරීම, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා සහාය වීම සහ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වන විශ්වසනීය පරීක්ෂණ සේවා සැපයීම සඳහා ප්‍රතීතන රසායනාගාරයක් පිහිටුවීමට සැලසුම් කර ඇත.

## 3.14 ආසියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විච්ජියර් ප්‍රයිවට් ලිමිටඩ්, නවදිල්ලිය, ඉන්දියාව

### 3.14.1 කාර්යසාධනයේ විශේෂ අවස්ථා සහ ක්‍රමෝපායික සැලසුම්

එල්ටීඑල් හෝල්ඩිංස් පුද්ගලික සමාගමේ පූර්ණ අයිතිය සහිත පරිපාලිත ආයතනයක් වන ආසියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විච්ජියර් ප්‍රයිවට් ලිමිටඩ් වාර්තාකරණ කාල සීමාව තුළ ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇත. ශක්තිමත් මූල්‍ය

තත්වයක් සමගින්, ආසායාටික් සමාගම 2024 ජනවාරි සිට 2024 ඔක්තෝබර් දක්වා ඉන්දියානු රුපියල් මිලියන 1211.73 ක ප්‍රශංසනීය විකුණුම් ආදායමක් ලබා ගන්නා ලදී. (අපනයනය: ඉන්දියානු රුපියල් මිලියන 634.35; දේශීය: ඉන්දියානු රුපියල් මිලියන 577.38). සමාගම තිරසාර කාර්යසාධනයක් පෙන්නුම් කරමින් බදු පෙර (NPBT) ස්ථාවර ශුද්ධ ලාභයක් ද පවත්වාගෙන ගියේය. 2023/24 මූල්‍ය වර්ෂයේදී ආසියාටික් සමාගම විසින් සැලකිය යුතු අන්දමින් එහි මෙතෙක් වාර්තා කළ ඉහළම පිරිවැටුම වන ඉන්දියානු රුපියල් බිලියන 1.236 (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 14.5) ලබාගැනීම ඓතිහාසික සන්ධිස්ථානයක් විය.



### 3.14.2 පාරිභෝගික තෘප්තිය තුළින් සාර්ථකත්වය

පාරිභෝගික තෘප්තිය ආසියාටික් සමාගමේ ව්‍යාපාරික දර්ශනයේ හරය වේ. සමාගමේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ එහි කණ්ඩායම් ක්‍රියාකාරකම්, කැපවීම සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමේදී විශිෂ්ටත්වය සඳහා නොපසුබට උත්සාහයෙනි. ආසියාටික් සමාගම ලොව පුරා ප්‍රමුඛ පෙළේ උපයෝගීතා වලින් අනුමැතිය ලබා ගනිමින් ගෝලීය වශයෙන් සුවිශේෂී අවස්ථා ස්ථාපිත කර ඇත. එනම්;

- මැද පෙරදිග (DEWA (ඩුබායි)" AADC/ ADEWA (අබුඩාබි)" MEW (ඕමානය සහ කුවේට්)" EWA (බහරේන්)" Kahramaa (කටාර්).
- අප්‍රිකාව ( Eskom (දකුණු අප්‍රිකාව)" KPLC (කෙන්යාව) " EEU (ඉතියෝපියාව)
- ආසියාව සහ යුරෝපය (EAC (සයිප්‍රස්)" ලංවිම (ශ්‍රී ලංකාව)

සමාගම එක්සත් රාජධානිය, උගන්ඩාව, ඝානාව, නේපාලය, බංග්ලාදේශය සහ වෙනත් රටවලට නිෂ්පාදන අපනයනය කරයි.

ආසියාටික් සමාගම විසින් සිය නිෂ්පාදන ඝඩඑබඛ (ජයිපූර්), AVVNL (අජ්මීර්), JdVVNL (ජොද්පූර්), BEST (මුම්බායි), BSES (දිල්ලි), TPDDL (දිල්ලි), MPPVVC (මධ්‍ය ප්‍රදේශය), BESCOM (බැංගලෝර්), KSEB (කේරළ), ඇතුළු ඉන්දියාවේ සියලුම ප්‍රධාන විදුලි බෙදාහැරීමේ සමාගම් වෙත සපයනු ලැබේ. මීට අමතරව දේශීය කොන්ත්‍රාත්කරුවන්ට සහ සෘජු පාරිභෝගිකයින්ට මධ්‍යම වෝල්ටීයතා (MV) පැනල් සැපයීමෙන් රජයේ සහ පෞද්ගලික ව්‍යාපෘති සඳහා පහසුකම් සපයයි.

### 3.14.3 විශේෂ ජයග්‍රණ

ප්‍රථම වරට පුනර්ජනනීය බලශක්තිය කෙරෙහි එහි කළමනාකාරීත්වයේ අවධානයට අනුකූලව අියාටික් සමාගම විසින් රාජස්ථාන් හි සූර්ය බලශක්ති ව්‍යාපෘති දෙකක් සඳහා ප්‍රදාන ලිපියක් (LOA) ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිවලට මෙගාවොට් 8 ක ඒකාබද්ධ ධාරිතාවකින් යුත් සූර්ය බලාගාර ඇතුළත් වන අතර එය වසර 25 ක් සඳහා නඩත්තු කෙරේ. බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම (PPA) 2024 දෙසැම්බර් වන විට අවසන් කිරීමට අපේක්ෂිත අතර ඉලක්කගත ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය 2025 ජූනි වේ.

මෙම සුවිශේෂී ආරම්භය සනිටුහන් කරන්නේ ආසියාටික් හි සූර්ය බලශක්ති ක්ෂේත්‍රයට පිවිසීමයි. මෙම නව ව්‍යාපෘතිය සමඟ සමාගම පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරිකයෙකු ලෙස ස්ථාපිත වීමට සූදානමින් සිටින අතර කාලයත් සමඟ එහි ස්ථාපිත ධාරිතාව වර්ධක ලෙස පුළුල් කිරීමේ අපේක්ෂාව මුදුන්පත් කරනු ලබන සැලසුම්වල අනුබලය ලබා තිබේ.

### 3.14.4 2025 වර්ෂය සඳහා යෝජිත සැලසුම්

ආසියාටික් සමාගම පහත සඳහන් නව ක්‍රියාර්ග ඔස්සේ ඒහි නව්‍යතා පුළ්ල් කිරීමට සැලසුම් කරමින් සිටියි.

අ) **නිෂ්පාදන පුළුල් කිරීම**
පහත නිෂ්පාදන සංවර්ධනයට සහ පරීක්ෂා කිරීමට සමාගම සැලසුම් කරමින් සිටියි.

- කිලෝ වොට් 33 එක්ස් ණසදිනි.
- කිලෝ වොට් 11 Floor-mounted breakers'
- විවෘත මාදිලියේ LV බෙදාහැරීම් පුවරු

**ආ) ඉන්දීය වෙළඳපොළ විනිවිදයාම**

ප්‍රධාන ප්‍රාන්තවල ශක්තිමත් අලෙවි නියෝජිත ජාලයක් උපායමාර්ගිකව ස්ථාපනය කිරීම මගින් දේශීය වෙළෙඳපොළ තුළ ගැඹුරු ලෙස විනිවිදයාමට ආසියාටික් සමාගම සැලසුම් කරයි. වර්ධනය වේගවත් කිරීම සහ පිරිවැටුම සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම අරමුණු කරගනිමින් ප්‍රාදේශීය විකුණුම් කළමණාකරුවන් සහ ඉංජිනේරුවන් පත් කිරීම මගින් මෙම සංකල්පයෙහි ඉදිරි කටයුතු සම්පූර්ණ වන ඇත

**ඇ) ආයතනික සන්නාමකරණය**

සමාජ මාධ්‍ය සමඟ සම්බන්ධවීම සහ ජාතික/ ජාත්‍යන්තර ප්‍රදර්ශන වලට සහභාගීවීම තුළින් සන්නාමය දෘශ්‍යමාන වීම ඉහළ නැංවීම

**ඈ) ධාරිතාව පුළුල්කිරීම**

- කර්මාන්තශාලාවේ හිස් භූමි ප්‍රදේශයේ ඇති ඉඩකඩ තුළ අතිරේක කාර්ය ඉඩපහසුකම් ඇතිකිරීම
- ධාරිතාවය ඉහළ නැංවීම සඳහා නව කම්හල් බදු පදනම මත ලබාදීම.
- පවතින භූමි ඉඩකඩෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීම.
- නිෂ්පාදනනය ඉහළනැංවීම සඳහා ක්‍රියාත්මක කිරීම.

**ඉ) ගෝලීය වෙළඳපොළ පුළුල් කිරීම.**

ජාත්‍යන්තර ව්‍යාපාර ශක්තිමත් කිරීම සඳහා අප්‍රිකානු/ආසියානු වෙලඳපොලවල තවත් අවස්ථා ගවේෂණය කිරීම

ආසියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විස්ජියර් නව්‍යකරණය, පාරිභෝගික කේන්ද්‍රීය භාවිතයන් සහ තිසාර වර්ධනය කෙරෙහි පැහැදිලි අවධානයක් යොමු කරමින් විදුලි සහ ස්විච් ගියර් කර්මාන්තයේ ප්‍රමුඛයා ලෙස අඛණ්ඩව සිටීමට ආසියාටික් ඉලෙක්ට්‍රිකල් සහ ස්විච්ගියර් කටයුතු කරයි.

**4. ආයතනික සමාජ වගකීම් යටතේ කාර්යසාධනය**

- විදුලි, යාන්ත්‍රික, සිවිල් සහ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගෙන් සමන්විත ඉංජිනේරු ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින්ට රැකියා ඉලක්ක කරගත් කාර්මික පුහුණු පහසුකම් පිරිනමනු ලැබේ. දැනට 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ උපාධි අපේක්ෂකයින් 72 දෙනෙකුට පමණ අවශ්‍ය පුහුණු පහසුකම් ලබා දී තිබේ. පුහුණුව සාර්ථකව නිම කළ අභ්‍යාසලාභීන් අප අයතනහෙහි රැකියා අවස්ථා පවතින ස්ථාන අනුව රැකියා සඳහා යොමුකිරීම සලකා බලනු ලැබේ.
- දිවයිනේ දුරබැහැර ප්‍රදේශවල බෞද්ධ විහාරස්ථාන සඳහා ආලෝකකරණ පහසුකම් සපයන ලදී. විශ්වවිද්‍යාල සහ සමාජ සුභසාධන සමිති සඳහා පරිත්‍යාග ප්‍රදානය කර තිබේ. සමාජ වගකීම් සඳහා ස්වේච්ඡා සේවාවන් සැපයීමෙන් සමාගම අඛණ්ඩව තම කීර්තිනාමය වර්ධනය කරගනියි.
- අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම හේමරතන නායක ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම පරිදි එල්ටීඑල් හෝල්ඩින්ග්ස් හි අනුබද්ධිත ආයතනයක් වන ලක්දනව් ලිමිටඩ් ජාතියේ ජාතික බලශක්ති ඉතිරිකිරීම් සහ හරිත බලශක්ති සංකල්පය සඳහා සමාජ වගකීම ඉටුකිරීමක් ලෙස අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධි විහාරස්ථානය සඳහා කිලෝ වොට් 130 (ක) සූර්ය ඡඩ පද්ධතියක් සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා අනුග්‍රහය දැක්වීය
- සමාගම විසින් එහි අනුබද්ධිත සමාගමක් වන ලක්දනව් ලිමිටඩ් මගින් ජනාධිපති ලේකම් කාර්යාලයේ මඟ පෙන්වීම යටතේ සංවිධානය කරන ලද සැමරුම සඳහා 2024 මැයි 23 සිට 26 දක්වා ගංගාරාම විහාරස්ථානයේ පැවති "බුද්ධ රශ්මි ජාතික වෙසක් උත්සවය 2024" සඳහා දායකතත්වය ලබා දී ඇත.
- මොරටුව විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු පීඨයේ තරුණ ඉංජිනේරුවන්

කණ්ඩායමක් වෙනුවෙන්, ෆෝමියුලා භාරත් 2024 ධාවන තරඟයේ "Team FalconE" සඳහා රන් අනුග්‍රාහකත්වය සමාගම විසින් දරන ලදී. ඉන්දියාවේ කොයිම්බතූර් හි පැවති තරඟයේදී තරුණ ඉංජිනේරුවන් කණ්ඩායම තරඟකරුවන් 39 දෙනෙකුගෙන් 10 වන ස්ථානයට පත්විය.

- සමාජ වගකීමක් වශයෙන් "ගිලන් රථයක් සඳහා දායකත්වය සපයන්න " වැඩසටහන සඳහා LTL හෝල්ඩිංග්ස් විසින් 1990 සුව සැරිය පදනමට (ලාභ නොලබන සංවිධානයකි) රුපියල් මිලියන 15 ක කාරුණික පරිත්‍යාගයක් කරන ලදී. සුව සැරිය යනු 2016 ජූලි මාසයේදී ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකාවේ නොමිලේ සේවාවන් සපයන හදිසි ගිලන්රථ සේවාවක් වන අතර එය දිවයින පුරා ගිලන්රථ 297 ක් පමණ යොදවා සමාජයට අද්විතීය සේවාවක් සපයයි. මෙම වැඩසටහන මඟින් දිවයින පුරා ජීවිත රැසක් බේරාගෙන ඇති අතර සාමාන්‍ය ප්‍රතිචාර කාලය මිනිත්තු 15 සිට 32 දක්වා වේ. පරිත්‍යාග කරන ලද අරමුදල් ඇතිමලේ, මන්නාරම සහ සේරුනුවර පිහිටි ගිලන්රථ තුනක් සඳහා ගිලන්රථ නඩත්තු කිරීම, වෛද්‍ය උපකරණ නඩත්තු කිරීම, කාර්ය මණ්ඩල නැවත ප්‍රාණවත් කිරීමේ පුහුණුව සහ කාර්ය මණ්ඩල නිල ඇඳුම් සඳහා භාවිතා කෙරේ. අදාළ ප්‍රදේශවල එවැනි සේවාවක වැදගත්කම සහ අවශ්‍යතාවය හඳුනා ගනිමින් එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම මෙම ස්ථාන හඳුනාගෙන ඇත.




- වත්තල අවරකොටුවේ ගංවතුරෙන් පීඩාවට පත් ප්‍රජාවට සහාය ලබාදීම
  අවරකොටුවේ ගංවතුරෙන් පීඩාවට පත් ප්‍රජාවට අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාග කරමින් ලක්දනව් සමාගම විසින් සිය සහයෝගය ලබා දෙන ලදී. මෙම සංකල්පය සමාජ වගකීම සහ ප්‍රජා සුභසාධනය සඳහා අපගේ අඛණ්ඩ කැපවීමට සාක්ෂියකි. මෙම අත්‍යවශ්‍ය සැපයුම් සැපයීමෙන් ගංවතුරෙන් පසු පදිංචිකරුවන් මුහුණ දෙන පීඩාවන් සමනය කිරීම අපගේ අරමුණයි.

- බෝ නොවන රෝග (NCD) වෛද්‍ය කඳවුරක් පැවැත්වීම
  ලක්දනව් සමාගම 2024 අප්‍රේල් 06 සහ 07 යන දිනවල වත්තල අවරකොටුවේදී බෝ නොවන රෝග (NCD) වෛද්‍ය කඳවුරක් පැවැත්වූ අතර ප්‍රදේශයේ පදිංචිකරුවන් 200 කට අධික සංඛ්‍යාවකට අවශ්‍ය සත්කාර ලබා දෙන ලදී. එයට කොලෙස්ටරෝල්, සීනි මට්ටම සහ අනෙකුත් බෝ නොවන රෝග ආශ්‍රිත පරාමිතීන් සඳහා අත්‍යවශ්‍ය සෞඛ්‍ය පරීක්ෂණ ඇතුළත් වූ අතර සහභාගිවන්නන්ට අත්‍යවශ්‍ය වෛද්‍ය මග පෙන්වීමක් ලබා දෙන ලදී.

## 5. ආයතනයේ සමස්ත මූල්‍ය තත්ත්වය

2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ ජනනය කරන ලද දළ ලාභය පසුගිය වසරේ එම දිනට සාපේක්ෂව 6% ක වැඩිවීමක් ලෙස වාර්තා විය. ක්ෂය වූ විදේශ විනිමය තත්ත්වය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආනයන සඳහා පනවා ඇති සීමාවන් යම්තාක් දුරට ලිහිල් කර ඇති අතර එමගින් සමාගම් සමූහයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීමට ආනයන සඳහා සැලකිය යුතු ප්‍රමාණයකට පහසුකම් සැලසී ඇත.

පහත වගුවේ දක්වා ඇත්තේ පෙර වසරවලට සාපේක්ෂව සමාගමේ ප්‍රධාන මෙහෙයුම්වල මූල්‍ය කාර්ය සාධනයේ සාරාංශයකි:-

වගුව 9.1
ප්‍රධාන මෙහෙයුම්වල මූල්‍ය ප්‍රගතිය

| කාලසීමාව | 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා ලිත් වර්ෂය | 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා | 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් 31 දක්වා ලිත් වර්ෂය |
|---|---|---|---|
| පිරිවැටුම | (රු.මිලියන) | (රු.මිලියන) | (රු..මිලියන) |
| නිෂ්පාදන හා විවිධ සේවා | 12,048. | 13,906. | 8,480. |
| විදුලි බල උත්පාදනය | 38,396. | 42,717. | 48,206. |
| **එකතුව** | **50,444.** | **56,623.** | **56,686.** |
| දළ ලාභය | | | |
| නිෂ්පාදන හා විවිධ සේවා | 9,869. | 4,678. | 2,536. |
| විදුලි බල උත්පාදනය | 3,277. | 14,552. | 13,521. |
| **එකතුව** | **13,146.** | **19,230.** | **16,057.** |

ලාභාංශ ආදායම - 2023/24

පහත විස්තර කර ඇති පරිදි සමාලෝචිත වර්ෂය තුල සමාගම සඳහා අත්‍යවශ්‍ය අරමුදල් සපයමින් සමාගම විසින් වකීය ආයෝජන මගින් ලංකා රුපියල් 877,999,997.00 ක ආයෝජන ආදායමක් ලබා තිබේ:

| එල්ටීඑල් හෝල්ඩිංස් සමූහය විසින් උපයන ලද ලාභාංශ ආදායම | |
|---|---|
| සමාගම | මුදල - ශ්‍රී ලංකා රුපියල් |
| එල්ටීඑල් ට්‍රාන්ස්ෆර්ස් පුද්ගලික සමාගම | 500,000,000.00. |
| එල්ටීඑල් ට්‍රාන්ස්ෆර්ස් පුද්ගලික සමාගම | 300,000,000.00. |
| නිව්දු පුද්ගලික සමාගම | 77,999,997.00. |
| එකතුව | **877,999,997.00.** |

## 6 2025 වර්ෂය සඳහා ඉදිරි සැලසුම්

### (අ) විදුලිබල ව්‍යාපෘති සංවර්ධනය කිරීම - මෙගාවොට් 300 RLNG - II

කෙරවලපිටිය පිහිටි ඒකාබද්ධ චක්‍රීය විදුලි බලාගාරය

ඉහත විදුලිබලාගාරය පිළිබඳ තොරුරු සාරාංශයක් පහත පරිදි වේ.

ලංවිම විසින් ටෙන්ඩරය
ලබාදෙන ලද දිනය - 2021 ජූනි 21
ලංසු බාරදෙනලද දිනය - 2021දෙසැම්බර් 15
තාක්ෂණික සුදුසකම්
ඇගයීම සහ සුදුසුකම්
ලැබීම - 2021 දෙසැම්බර්
මූල්‍ය සුදුසකම් ඇගයීම
සහ සුදුසුකම් ලැබීම - 2022 ජනවාරි 28
මෙගාවොට් 220 විවෘත
චක්‍රය සඳහා සැලසුම් කළ
COP - 2026
මෙගාවොට් 350 සඳහා
සැලසුම් කළ විවෘත සහ
සංවෘත COP - 2027

ලක්ධනවි ආයතනයට පාරිසරික, ඉංජිනේරු, මූල්‍ය සහ අනෙකුත් මූලික ව්‍යාපෘති සංවර්ධන කටයුතු කරගෙන යාමට හැකිවන පරිදි ව්‍යාපෘති ගිවිසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ලංවිම අභිප්‍රාය ලිපිය (LoI) නිකුත් කර තිබේ. සමාගම විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම සම්බන්ධයෙන් ලංවිම සමඟ දීර්ඝ සාකච්ඡාවක නිරතව සිටී.

### (ආ) නව කොටස් නිකුත් කිරීමෙන් එල්ටීඑල් හෝල්ඩිංස් ආයතනයේ හිමිකාරීත්වය ප්‍රතිව්‍යුහගත කිරීම

2022 දෙසැම්බර් මාසයේදී ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව එලල්යීඑල් හෝල්ඩිංස් සමාගමේ හිමිකාරිත්වය ප්‍රතිව්‍යුහගත කිරීම නුදුරේදීම ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒල්ටීඑල් හෝල්ඩිංග්ස් හි අධ්‍යක්ෂ මණ්ඩලය, ඒල්ටීඑල් හි කළමනාකාරිත්වය විසින් කරන ලද නිර්දේශ මත එහි නව ව්‍යාපෘති සඳහා

විශේෂයෙන් කෙරවලපිටියේ මෙගාවොට් 300 ද්‍රවීකෘත ස්වභාවික වායු 2 ඒකාබද්ධ චක්‍රීය බලාගාරය සහ සියඹලාණ්ඩුවේ මෙගාවොට් 100 PV සූර්ය බල උද්‍යානය යන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අරමුදල් රැස් කිරීම සඳහා කොටස් වෙළඳපොළ වෙත අතිරේක කොටස් මිලියන 5.5 ක් නිකුත් කරන ලදී. මෙම ව්‍යාපෘතිවලට අදාළ මූලික කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී.

එල්ටීඑල් හෝල්ඩිස් සමාගගම නියාමන අනුමැතිය ලබාගෙන 2024 අගෝස්තු මාසයේදී CSE වෙත ලැයිස්තුගත කිරීමේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කළද 2024 නොවැම්බර් අවසානයේ ශ්ෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලද නීතිමය පැහැදිලි කිරීම් හේතුවෙන් IPO ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට සිදු වූ අතර මේ වන විට ඉදිරි කටයුතු සඳහා CSE සහ බලශක්ති අමාත්‍යාශයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි. ආකර්ශනීය ග්‍රාහකයින් හඳුනා ගැනීමෙන් අනතුරුව නිල නිකුතුව විවෘත කරන විට ඉහළ ඉල්ලුමක් ඇතිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ඇ) අප්‍රිකාවේ ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනය පුළුල් කිරීම**

ටැන්සානියාවේ තඹ පිරිපහදු කරන සමාගමක් වන "එල්ටීඑල් ට්‍රාන්ස්ෆෝමර්ස් ටැන්සානියා (පුද්) සමාගම" සමඟ සහයෝගයෙන් නව සමාග මක් සංස්ථාගත කිරීමෙන් සමාගම සිය ප්‍රගතිශීලී උපාය මාර්ගයේ සන්ධිස්ථානයක් අත්කර ගෙන ඇත. 2025 දෙවන කාර්තුව තුළ මෙහෙයුම් ආරම්භ කිරීමට හැකි වන පරිදි යන්ත්‍රෝපකරණ සහ උපකරණ ස්ථාපනය කිරීම සඳහා ඉංජිනේරු සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය දැනටමත් යොදවා ඇත.

නැගෙනහිර අප්‍රිකානු කලාපයේ ටෙන්ඩර් සඳහා ශක්තිමත් සහ නිතිපතා සාර්ථක ලංසුකරුවෙකු වීම හේතුවෙන් මේ දක්වා ලබා ඇති අත්දැකීම් අප්‍රිකාවේ එහි පැවැත්ම ස්ථාපිත කිරීමට මාර්ග විවෘත කරනු ඇතැයි එල්ටීඑල් හෝල්ඩිංස් සමාගම විශ්වාස කරයි. එබැවින් ඉහළ මට්ටමේ තරඟකාරිත්වයකට විනිවිද යාම සඳහා සමාගම අඩු වියදම් ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනයක් අත්‍යවශ්‍ය වන ටෙන්ඩර් දිනා ගැනීමේ විභවයන් උපයෝගී කර ගැනීම සඳහා ශක්තිමත් මිලකරණ උපාය මාර්ගයක් ඉදිරිපත් කිරීමට අදහස් කරයි.

# දසවන පරිච්ඡේදය

# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1. හැඳින්වීම

ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කිරීම, අපනයනය කිරීම, පිරිපහදු කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීමට අදාළ ව්‍යාපාරික කටයුතු කර ගෙන යාම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ස්ථාපිත කරන ලද අතර ඊට අයත් කාර්යයන් ඉටු කිරීමට අදාළ නෛතික ප්‍රතිපාදන 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනත මඟින් ලබා දෙන ලදී.

## 2. 2024 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය

දේශීයව අවශ්‍ය වන ඛනිජ තෙල් නිෂ්පාදන ඉල්ලුමෙන් වැඩි ප්‍රතිශතයක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කර සැපයීම සිදු කරනු ලබන අතර ඒ යටතේ පිරිපහදු කළ නිෂ්පාදන ආනයනයට අමතරව බොරතෙල් ආනයනය කර සපුගස්කන්ද පිරිපහදුවේ දේශීයව පිරිපහදු කර ඉන්ධන නිෂ්පාදනය කිරීම ද සිදු කෙරේ. ඒ අනුව 2024 වසර තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ක්‍රියාකාරීත්වයේ ප්‍රගතිය මෙම පරිච්ඡේදය මඟින් ඉදිරිපත් කෙරේ.

### 2.1 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනකරුවා වන අතර සමස්ථ ඉල්ලුමෙන් 68% ක් පමණ ආනයනය කර බෙදාහැරීම සිදු කරනු ලබයි. තවද බොරතෙල් ආනයනය කර පිරිපහදු කර සැපයීම 1969 වර්ෂයේ සිට සංස්ථාවේ තනි අයිතිය යටතේ සිදු කරනු ලබන අතර එමඟින් දේශීය සමස්ථ ඛනිජ තෙල් ඉල්ලුමෙන් 32% ක් පමණ පිරිපහදු කර සැපයීම සිදු කරනු ලැබේ. ඒ අනුව සංස්ථාව විසින් 2021.01.01 දින සිට 2024.12.31 දින දක්වා ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය කර සැපයීමේ ප්‍රගතිය වගු අංක 10.1 මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

වගුව 10.1

**පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2021 - 2024)**

**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

| නිෂ්පාදනය | ප්‍රමාණය (මෙ.ටො) ('000) | | | |
|---|---|---|---|---|
| | **2021** | **2022** | **2023** | **2024** |
| 1. පිරිපහදු කළ නිෂ්පාදන ආනයන ප්‍රමාණය | | | | |
| • ඔටෝ ඩීසල් | 1,254 | 1,267 | 695 | 547 |
| • සුපර් ඩීසල් | 68 | 128 | 24 | 27 |
| • පෙට්‍රල් - 92 ඔක්ටේන් | 893 | 888 | 794 | 586 |
| • පෙට්‍රල් - 95 ඔක්ටේන් | 103 | 46 | 28 | 20 |
| • ජෙට් ඒ-1 | 178 | 269 | 168 | 316 |
| • අඩු සල්ෆර් දැවි තෙල් (180 CST) | 245 | 124 | 124 | 35 |
| • වැඩි සල්ෆර් දැවි තෙල් (180 CST) | 31 | - | - | - |
| • නැප්තා | - | - | 16 | - |
| **එකතුව** | **2,772** | **2,723** | **1,849** | **1,531** |
| 2. බොරතෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණය | | | | |
| • බොරතෙල් | 1,130 | 743 | 1,666 | 1,519 |
| **සමස්ත ආනයන ප්‍රමාණය** | **3,902** | **3,466** | **3,515** | **3,050** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වර්ෂයේ සිට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදන ආනයන ප්‍රමාණයන් සැලකිල්ලට ගැනීමේ දී 2021 සිට 2023 දක්වා වර්ෂවලදී මෙට්‍රික් ටොන් 2,772,000 ක්, මෙට්‍රික් ටොන් 2,723,000 ක් සහ 1,849,000 ක් පිළිවෙලින් ආනයනය කර ඇති අතර 2024 වර්ෂයේ පිරිපහදු කළ නිෂ්පාදන ආනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,531,000 කි.

පිරිපහදු ක්‍රියාවලිය මගින් ඛනිජ තෙල් නිෂ්පාදන 08 කින් මෙට්‍රික් ටොන් 1,445,529 ක් නිෂ්පාදනය කරන ලද අතර එම ප්‍රමාණය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඛනිජ තෙල් සැපයුමින් 49% කට ආසන්න අගයක් ගනී. ඔටෝ ඩීසල්, ද්‍රවි තෙල්, ජෙට් ඒ 1, පෙට්‍රල් 92 ඔක්ටේන් සහ භූමිතෙල් යනු මෙම පිරිපහදු ක්‍රියාවලියෙන් නිපදවෙන ප්‍රධාන නිෂ්පාදනයි. සපුගස්කන්ද පිරිපහදුව මගින් පිරිපහදු කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සංයුතිය පහතින් දක්වා ඇත.

**ප්‍රස්තාරය 10.1**
**පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය (2021 - 2024)**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**




මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

තවද, පසුගිය වර්ෂයන්හි බොරතෙල් ආනයන ප්‍රමාණයන් සලකා බැලීමේදී 2021 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,130,000 ක්, 2022 වර්ෂයේ මෙට්‍රික් ටොන් 743,000 ක්, 2023 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,666,000 ක් ආනයනය කර ඇති අතර 2024 වර්ෂයේ මෙට්‍රික් ටොන් 1,519,000 ක් ආනයනය කරන ලදී.

## 2.2 සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුවේ දායකත්වය

සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව දිනකට ඉන්ධන මෙට්‍රික් ටොන් 5,300 ක පමණ පිරිපහදු ධාරිතාවයකින් යුක්ත වන අතර වසරක උපරිම පිරිපහදු ධාරිතාවය මෙට්‍රික් ටොන් 1,934,500 කි. 2024 වර්ෂයේ බොරතෙල් මෙට්‍රික් ටොන් 1,528,719 ක ප්‍රමාණයක් පිරිපහදු කර ඇති අතර එය උපරිම පිරිපහදු ධාරිතාවයෙන් 79% කි.

වගුව 10.2
පිරිපහදුවේ නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) (2021 - 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

| වර්ෂය | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|
| බොරතෙල් යෙදවුම් ප්‍රමාණය | **1,272,207** | **529,773** | **1,677,033** | **1,528,719** |
| නිෂ්පාදනය | | | | |
| • පෙට්‍රල් -92 ඔක්ටේන් | 124,092 | 38,666 | 171,186 | 150,566 |
| • ලංකා ඔටෝ ඩීසල් | 370,594 | 128,165 | 505,675 | 443,933 |
| • භූමිතෙල් | 98,284 | 25,289 | 49,484 | 72,618 |
| • ජෙට් ඒ 1 | 130,572 | 57,346 | 233,652 | 207,434 |
| • දැවි තෙල් 800 සුපර් | 359,021 | 87,196 | 379,015 | 345,447 |
| • දැවි තෙල් 1500 සුපර් | - | 107,001 | 103,111 | - |
| • දැවි තෙල් 800 නැව්තෙල් | - | - | - | 82,000 |
| • නැප්තා | 106,956 | 30,835 | 129,058 | 121,449 |
| • SBP | 3,037 | 2,690 | 1,524 | 1,267 |
| • තාර | 6,879 | - | - | - |
| • එල්පී ගෑස් | 16,650 | 5,687 | 23,800 | 20,815 |
| නිමැවුම් එකතුව | **1,216,085** | **482,875** | **1,596,505** | **1,445,529** |

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වගුව 10.3
ආනයනික නිමි නිෂ්පාදන සහ දේශීයව පිරිපහදු කළ නිෂ්පාදන - 2024
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

| නිෂ්පාදනය | ආනයනික නිෂ්පාදන ප්‍රමාණය (මෙ.ටො.) | පිරිපහදුවෙන් නිෂ්පාදනය කළ ප්‍රමාණය (මෙ.ටො.) | එකතුව (මෙ.ටො.) |
|---|---|---|---|
| පෙට්‍රල් - 92 ඔක්ටේන් | 585,708 | 150,566 | 736,274 |
| පෙට්‍රල් - 95 ඔක්ටේන් | 19,540 | - | 19,540 |
| ලංකා ඔටෝ ඩීසල් | 507,378 | 443,933 | 951,311 |
| ලංකා සුපර් ඩීසල් | 26,945 | - | 26,945 |
| භූමි තෙල් | - | 72,618 | 72,618 |
| ජෙට් ඒ 1 | 315,811 | 207,434 | 523,245 |
| දැවි තෙල් 800 සුපර් | - | 345,447 | 345,447 |
| දැවි තෙල් 800 නැව්තෙල් | - | 82,000 | 82,000 |
| අඩු සල්ෆර් දැවි තෙල් (180 සීඑ) | 35,468 | - | 35,468 |
| නැප්තා | - | 121,449 | 121,449 |
| SBP | - | 1,267 | 1,267 |
| එල්පී ගෑස් | - | 20,815 | 20,815 |
| එකතුව | **1,530,853** | **1,445,529** | **2,976,382** |

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2.3 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය

ජනගහනයේ වර්ධනයත් සමග වැඩි වන අවශ්‍යතාවලට අනුකූලව ගෘහස්ථ සහ වාණිජ අංශවල පමණක් නොව විදුලිය නිෂ්පාදනය, ප්‍රවාහනය, කර්මාන්ත, ධීවර සහ කෘෂිකාර්මික අංශවල ද ඛනිජ තෙල් පරිභෝජනය ඉහළ ගොස් ඇත. ඒ අනුව, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා පවත්නා ඉල්ලුම සපුරාලීම පිණිස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සියලු අංශයන් ඔස්සේ නිෂ්පාදන අලෙවි කටයුතුවල නිරත වේ.

2024 වර්ෂයේ දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් නිෂ්පාදන වර්ග පහළොවක් (15) ක් අලෙවි කර ඇත. 2022 -2024 කාලය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමස්ථ ඉන්ධන අලෙවිය පිළිබඳ තොරතුරු 10.3 වගුව මගින් දක්වා ඇත. එම තොරතුරු අනුව 2023 වසරට සාපේක්ෂව 2024 වර්ෂයේ පෙට්‍රල් 92 ඔක්ටේන් 18% කින් ද පෙට්‍රල් 95 ඔක්ටේන් 28% කින් ද ඔටෝ ඩීසල් 18% කින් ද හා සුපර් ඩීසල් 21% කින් ද ඉන්ධන අලෙවිය අඩුවී ඇති අතර ලංකා භූමිතෙල් 62% කින් ද ජෙට් ඒ-1 24% කින් ද ඉන්ධන අලෙවිය වැඩිවී ඇත. තවද, 2024 වසරේ දී මෙට්‍රික් ටොන් 3,031,716 ක සමස්ථ ඉන්ධන අලෙවියක් වාර්තා කර ඇති අතර එය පෙර වසරට සාපේක්ෂව 12% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

**වගුව 10.4**
**සමස්ත ඉන්ධන අලෙවිය (2022 - 2024)**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

| නිෂ්පාදන වර්ගය | සමස්ත අලෙවිය (මෙ. ටො.) | | |
|---|---|---|---|
| | **2022** | **2023** | **2024** |
| ලංකා පෙට්‍රල් - 92 ඔක්ටේන් | 964,844.219 | 982,939.25 | 804,419 |
| ලංකා පෙට්‍රල් - 95 ඔක්ටේන් | 55,697.245 | 29,042.01 | 20,893 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,475,577.154 | 1,257,303.75 | 1,025,160 |
| ලංකා සුපර් ඩීසල් | 72,474.383 | 29,809.39 | 23,531 |
| ලංකා භූමිතෙල් | 98,367.966 | 82,724.80 | 134,580 |
| ලංකා කාර්මාන්ත භූමිතෙල් | 5,647.035 | 1,828.13 | 4,134 |
| ලංකා රසායනික නැප්තා | 32,262.861 | 120,093.96 | 101,541 |
| ලංකා දැවි තෙල් 800 | - | 12.51 | 6 |
| ලංකා දැවි තෙල් 1500 (වැඩි සල්ෆර්) | 198,891.936 | 168,800.54 | 116,652 |
| ලංකා දැවි තෙල් 1500 (අඩු සල්ෆර්) | 103,379.876 | 237,192.23 | 155,816 |
| ලංකා දැවි තෙල් - සුපර් | 54,978.319 | 117,198.22 | 155,857 |
| ජෙට් ඒ-1 | 245,796.923 | 377,456.72 | 468,158 |
| ලංකා සොල්වන්ට් (SBP) | 2,701.635 | 1,362.94 | 1,161 |
| එල්.පී.ගෑස් | 5,556.054 | 23,877.74 | 19,676 |
| ලංකා ඒ.වී.ගෑස් | 83.871 | 120.67 | 132 |
| එකතුව | **3,316,259.48** | **3,429,762.86** | **3,031,716** |

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2.4 විදුලි ජනනය සඳහා ඉන්ධන අලෙවි කිරීම

විදුලිය ජනනයට අවශ්‍ය ඉන්ධන සැපයුම් කරනු ලබන එකම සැපයුම්කරුවා ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කරනු ලබන අතර ලංකා විදුලිබල මණ්ඩලයට සහ පෞද්ගලික විදුලිය නිෂ්පාදකයන් වෙත අවශ්‍ය ඉන්ධන සැපයීම සිදු කරනු ලබයි. විදුලිය නිෂ්පාදනය සඳහා 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ඉන්ධන අලෙවිය වගු අංක 10.5 න් දැක්වේ. ඒ අනුව, 2024 වර්ෂයේදී විදුලිය නිෂ්පාදනය සඳහා ඉන්ධන ලීටර් 579,309 ක් සපයා ඇත. එය 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළදී 24% ක අඩුවීමක් පෙන්නුම් කරයි.

2024 වසරේ දී මෙට්‍රික් ටොන් 468,158 ක සමස්ථ ගුවන් යානා ඉන්ධන අලෙවියක් වාර්තා කර ඇති අතර දෛනිකව මෙට්‍රික් ටොන් 1,283 ක පමණ සාමාන්‍ය ඉල්ලුමක් පවතී. 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළදී 24% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2021 - 2024 කාලය තුළදී ගුවන් යානා ඉන්ධන අලෙවිය පිළිබඳ තොරතුරු 10.6 ප්‍රස්තාරය මගින් දක්වා ඇත.

වගුව 10.5
විදුලි ජනනයට ඉන්ධන අලෙවි කිරීම - (2021-2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

| | ලංකා විදුලිබල මණ්ඩලය ලීටර් ('000') | | | | පෞද්ගලික විදුලි නිෂ්පාදකයන් ලීටර් ('000') | | | මුළු එකතුව ලීටර් ('000') |
|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය | ලංකා ඔටෝ ඩීසල් | නැප්තා | දැවි තෙල් | ලංකා සුපර් ඩීසල් | ලංකා ඔටෝ ඩීසල් | දැවි තෙල් | ලංකා සුපර් ඩීසල් | |
| **2021** | 50,259 | 15,407 | 217,481 | - | 69,782 | 256,860 | - | 609,789 |
| **2022** | 86,769 | 46,781 | 181,103 | 12,147 | 115,205 | 123,369 | 5,678 | 571,051 |
| **2023** | 102,877 | 174,136 | 228,885 | - | 3,175 | 256,580 | - | 765,653 |
| **2024** | 44,647 | 147,251 | 206,467 | - | 16,609 | 164,335 | - | 579,309 |

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2.5 ගුවන් යානා ඉන්ධන (ජෙට් ඒ 1) අලෙවිය

ශ්‍රී ලංකාවේ ගුවන් යානා ඉන්ධන එකම සැපයුම්කරු වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ජාතික ආර්ථිකයේ ප්‍රධාන කොටස්කරුවෙකු බවට පත්ව ඇත. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (BIA), මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ (MIA), රත්මලාන ගුවන් තොටුපොළ සහ පලාලි ගුවන් තොටුපොළ යන ගුවන් තොටුපොළ හතර සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගුවන් යානා ඉන්ධන අංශය සිය සේවා සපයනු ලබයි.

වගුව 10.6
ගුවන් යානා ඉන්ධන අලෙවිය - (2021 - 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

| වර්ෂය | ප්‍රමාණය (මෙ.ටො.) |
|---|---|
| 2021 | 223,854 |
| 2022 | 245,838 |
| 2023 | 377,608 |
| 2024 | 468,158 |

මූලාශ්‍රයඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ප්‍රස්තාරය 10.2
ගුවන් යානා ඉන්ධන අලෙවි කිරීම - (2021 - 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව




## 2.6 ලිහිසි තෙල් අලෙවිය

ලිහිසි තෙල් කර්මාන්තය යනු කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින වඩා තරඟකාරී මෙන්ම ක්‍රමෝපායික ව්‍යාපාරයකි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිපෙට්කෝ සන්නාමය යටතේ සිය නිෂ්පාදන අලෙවි කරනු ලබන අතර ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සිය නිෂ්පාදන ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2021 වර්ෂයේ සිට 2024 වර්ෂයේ සිදු කරන ලද ලිහිසි තෙල් අලෙවි ප්‍රමාණයන් 10.6 ප්‍රස්තාර සටහන මඟින් දක්වා ඇත. එම දත්ත අනුව 2022 වර්ෂයේ ලිහිසි තෙල් අංශයෙහි කැපී පෙනෙන පහළයාමක් දක්නට ලැබෙන අතර 2023 හා 2024 වර්ෂයන්හිදී නැවතත් ක්‍රමයෙන් වෙළෙඳපොළ තුළ සිය ව්‍යාපාර ප්‍රකෘතිමත් කර ගැනීමක් දක්නට ලැබේ.

වගුව 10.7
ලිහිසි තෙල් අලෙවිය - (2021 - 2024)
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

| වර්ෂය | ප්‍රමාණය (කි.ලී.) |
|---|---|
| 2021 | 3,809 |
| 2022 | 901 |
| 2023 | 1,310 |
| 2024 | 1,532 |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 2.7 කෘෂි රසායන අලෙවිය

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව දසක පහකට වැඩි කාලයක් කෘෂි රසායන ව්‍යාපාරයේ නිරතය. ගොවීන් තරඟකාරී ආයතන සූරාකෑමෙන් ආරක්ෂා කරමින් සහ සාධාරණ මිලකට විශිෂ්ට කෘෂි රසායන ද්‍රව්‍ය සපයමින් රාජ්‍ය ආයතනයක් ලෙස මිල තීරක පාර්ශ්වයක් වශයෙන් ද ක්‍රියා කරමින් වෙළෙඳපොළ තුළ රැඳී සිටී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 795 ක වටිනාකමක් සහිත කෘෂි රසායන අලෙවි කරන ලදී.

2024 වසර සඳහා වරලත් වෘත්තීය කළමණාකරුවන්ගේ ආයතනය විසින් පිරිනමක ලද Managers Best Management Practices කුසලතා සම්මානය දිනා ගැනීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කෘෂි අංශය සමත් විය.



කුසලතා සම්මානය

2.8 යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවල ප්‍රගතිය

- **පිරවුම්හල්වල විදුලි වාහන ආරෝපණ පහසුකම් ස්ථාපිත කිරීම**

වර්තමානයේ විදුලි වාහන භාවිතය ක්‍රමයෙන් ඉහළ යමින් පවතින බැවින් විදුලි වාහන ආරෝපන සඳහා ආරෝපන මධ්‍යස්ථාන ඇති කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. ඒ අනුව ආරම්භක පියවරක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල් දහයක (10) විදුලි වාහන ආරෝපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා පියවර ගන්නා ලදී. මේ සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 50 ක් වූ අතර ආරෝපිත මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් ප්‍රගතිය පහත පරිදි වේ. තවද 2025 වර්ෂයේදී ඉන්ධන පිරවුම්හල් ආශ්‍රිතව නව ආරෝපිත මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා රුපියල් මිලියන 100 ක් වෙන් කර ඇත.




(විදුලි වාහන ආරෝපන මධ්‍යස්ථාන)

- **සපුගස්කන්ද ඉන්ධන පිරිපහදුව නවීකරණය (නඩත්තු) කිරීම**

ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලමින් බලාගාරයේ ආරක්ෂිත, කාර්යක්ෂම සහ විශ්වාසනීය ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පිරිපහදුව සෑම වසර දෙකකට හෝ වසර තුනකට වරක් නවීකරණය කරමින් යාවත්කාලීන කිරීමට සැලසුම් කර ඇත. පෙර සිදු කරන ලද නවීකරණ කටයුතු 2021 පෙබරවාරි/මාර්තු මාසවලදී සිදු කරන ලද අතර 2024 ජූලි වන විට පිරිපහදුව වසර 3 කට වැඩි කාලයක් ක්‍රියාත්මක කර ඇත. එබැවින් පිරිපහදුවේ නවීකරණ කටයුතු රු. මිලියන 1640 ක් වැය කරමින් 2024 ජූලි 15 වන දින ආරම්භ කර 2024 අගෝස්තු 23 වන දින සම්පූර්ණ කරන ලදි.

පිරිපහදුව නවීකරණය සඳහා සාමාන්‍ය කාලය දින 35 කි. කෙසේ වෙතත්, බොරතෙල් ආසවන ආරෝපණ හීටරය 01F1 (Crude dıstıller charge heater 01F1) සහ ප්ලැට්ෆෝමර් ෆර්නස් 03F1 (Platformer furnace 03F1) හි දඟර ප්‍රතිස්ථාපන (සෙල් 2 සහ සෙල් 3) හි ප්‍රධාන අලුත්වැඩියා කටයුතු පෙර නවීකරණ අවස්ථාවේ නිර්දේශයන්ට අනුව මෙම අදියරේදී සිදු කර ඇත. ඉහත ක්‍රියාකාරකම් හා සම්බන්ධ තාක්ෂණික සංකීර්ණතා හේතුවෙන් නවීකරණ කාලය දින 40 දක්වා දීර්ඝ වූ අතර මෙම ක්‍රියාකාරකම් සඳහා සැලකිය යුතු කාලයක් අවශ්‍ය විය.

පිරිපහදුව තුළ සම්පත් නොමැති විට බාහිරින් ලබා ගන්නා ලද සමහර සේවාවන් හැර ප්‍රධාන නවීකරණ කටයුතු අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි ස්ථිර කාර්ය මණ්ඩලය 860 කට ආසන්න පිරිසක් නවීකරණ කටයුතු සඳහා සහභාගී වූ අතර කුලියට ගත් අර්ධ පුහුණු සහ නුපුහුණු කම්කරුවන් 264 ක් පමණ සහභාගී වූහ. ප්‍රධාන නවීකරණ කටයුතු සාර්ථකව නිම කිරීමෙන් පසු පිරිපහදුව එහි ප්‍රශස්ථ ධාරිතාව දිනකට මෙට්‍රික් ටොන් 5300 ක් යටතේ ක්‍රියාත්මක වන අතර ඉදිරි වසර 3 සඳහා අඛණ්ඩව ජාතියට ඉන්ධන සැපයීම සහතික කෙරේ.



(පිරිපහදුවේ අළුත්වැඩියා අවස්ථාවක්)

3. **2025 වර්ෂයේ ඉලක්ක**

- මුතුරාජවෙල ජෙටි ඒ-1 නල මාර්ගය සහ ටැංකි ව්‍යාපෘතියේ ඉදිකිරීම් ආරම්භ කිරීම
- ත්‍රිකුණාමලයේ ටැංකි 24 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියරේ දෙවන පියවර ආරම්භ කිරීම

- දිවයින පුරා පිහිටි පිරවුම්හල්වල විදුලි වාහන ආරෝපණ මධ්‍යස්ථාන ප්‍රවර්ධනය කිරීම
- අනාගතයේදී ශුද්ධ ශූන්‍ය කාබන් ඉලක්ක කරා ළඟාවීමට පොසිල ඉන්ධන ප්‍රතිස්ථාපනය කළ හැකි හරිත හයිඩ්‍රජන්ල හරිත ඇමෝනියාල ජෛව ඉන්ධනල සූර්යය ශක්තිය ආදී විකල්ප බලශක්ති ඉන්ධන තාක්ෂණයන් පිළිබඳව අධ්‍යයනය සහ ධාරිතා වර්ධනය
- Clean Sri Lanka වැඩසටහන යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් සියළුම ඉන්ධන පිරවුම්හල් වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම

# ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## 1. හැඳින්වීම

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ රාජ්‍ය සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර ආයතන පොදු සමාගම් පනත බවට පරිවර්තනය කිරීමේ පනතේ 2(1) වගන්තිය ප්‍රකාරව විධිමත් ලෙස සංස්ථාපිත සමාගමක් වන අතර, මේ පිළිබඳව 2003.10.13 දිනැති අංක 1310/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති අයුරින්, තෙල් පර්යන්ත, ගබඩා පහසුකම්, නළ මාර්ග සහ ඉන්ධන ප්‍රවාහන වාහන යනාදියෙන් සමන්විත පොදු භාවිත පහසුකම්වල අයිතිය ඇත. මෙම සමාගම ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අනුබද්ධිත සමාග මක් වන අතර මෙහි ප්‍රාග්ධන කොටස්වලින් 2/3 ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් වන අතර ඉතිරිය ලංකා ඉන්දියානු තෙල් සමාග මට අයත් වේ.

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම, ශ්‍රී ලංකාවේ පසුභාග ඛනිජතෙල් නිෂ්පාදන හැසිරවීම කළමනාකරණය කිරීම සඳහා නවීන යටිතල පහසුකම් සහිත තොග වශයෙන් ඛනිජතෙල් ගබඩා කිරීමේ සහ බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල නියැලෙන අතර සෞඛ්‍ය සම්පන්න සහ තරඟකාරී ඉන්ධන ගබඩා කිරීම සහ බෙදාහැරීම මගින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සහාය වීම සඳහා කැපවීම පෙන්නුම් කරමින් පාර්ශවකරුවන්ගේ වටිනා යෝජනා අඛණ්ඩව වැඩි දියුණු කරයි.

## 2. 2024 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්හි ප්‍රගතිය

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම ඛනිජ තෙල් නිෂ්පාදන ගබඩා කිරීම සහ බෙදා හැරීම සිදු කරනු ලබන අතර මෙහිදී ඉන්ධනවල ඉහළ ගුණාත්මකභාවය රැකගනිමින් අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මෙම පරිච්ඡේදයෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ ඉන්ධන ගබඩා කිරීමේ හා බෙදාහැරීමේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඉදිරිපත් කරනු ලැබේ.

### 2.1 ඉන්ධන ගබඩා කිරීම

ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම කොලොන්නාව හා මුතුරාජවෙල ප්‍රධාන පර්යන්ත දෙකක හා ප්‍රාදේශීය තොග ගබඩා 11 ක ඉන්ධන ගබඩා පහසුකම් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව කොලොන්නාව පර්යන්තයේ මෙට්‍රික් ටොන් 224,649 ක ඉන්ධන ගබඩා ධාරිතාවයක් ද මුතුරාජවෙල පර්යන්තයේ මෙට්‍රික් ටොන් 202,358 ක් ද හා ප්‍රාදේශීය තොග ගබඩා 11 හි මෙට්‍රික් ටොන් 13,140 ක් වශයෙන් මෙට්‍රික් ටොන් 440,147 ක සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවයක් රට තුළ පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, මෙම ප්‍රධාන පර්යන්ත දෙක හා ප්‍රාදේශීය තොග ගබඩා 11 මඟින් 2024 වර්ෂය තුළ ඉන්ධන ගබඩා කිරීම සඳහා සක්‍රීය දායකත්වයක් සපයන ලද අතර සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය 11.1 වගුව මඟින් දක්වා ඇත.

වගුව 11.1
සමස්ත ඉන්ධන ගබඩා ධාරිතාවය
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

| නිෂ්පාදනය | ගබඩා ධාරිතාවය (මෙ.ටො.) | | | එකතුව |
|---|---|---|---|---|
| | කොලොන්නාව පර්යන්තය | මුතුරාජවෙල පර්යන්තය | ප්‍රාදේශීය තොග ගබඩා | |
| නැප්තා | 11,996 | - | - | 11,996 |
| ඔක්ටේන් 95 පෙට්‍රල් | 23,197 | - | - | 23,197 |
| ඔක්ටේන් 92 පෙට්‍රල් | 59,321 | 83,857 | 3,346 | 146,524 |
| භූමිතෙල් | 9,813 | - | 680 | 10,493 |

| | | | | |
|---|---|---|---|---|
| ගුවන් යානා ඉන්ධන | 9,484 | - | - | 9,484 |
| ඔටෝ ඩීසල් | 46,074 | 118,501 | 9,114 | 173,689 |
| සුපර් ඩීසල් | 18,319 | - | - | 18,319 |
| දැවි තෙල් | 44,575 | - | - | 44,575 |
| සොල්වන්ට් | 341 | - | - | 341 |
| කාර්මික භූමිතෙල් | 1,529 | - | - | 1,529 |
| **එකතුව** | **224,649** | **202,358** | **13,140** | **440,147** |

මූලාශ්‍රය: ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම

## 2.2 ඉන්ධන බෙදාහැරීම්

2024 වර්ෂය වන විට ඉන්ධන සැපයුම්කාර ආයතන පහක් ඉන්ධන බෙදාහැරීමේ කටයුතුවල නිරත වන අතර ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම එම ආයතනවල ඉන්ධන අවශ්‍යතාවයන් අනුව ඉන්ධන බෙදාහැරීම සිදු කරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ කොළොන්නාව සහ මුතුරාජවෙල යන ප්‍රධාන පර්යන්ත දෙක ඇතුළු ප්‍රාදේශීය ඉන්ධන ගබඩා වෙතින් ඉන්ධන සැපයුම්කාර ආයතන වෙත ඉන්ධන නිකුත් කිරීම සිදු කරනු ලබන අතර 2024 වර්ෂය තුළ ඉන්ධන සැපයුම්කාර ආයතනය වෙත ඉන්ධන බෙදාහැරීම් ප්‍රගතිය වගු අංක 11.2 මගින් දක්වා ඇත.

ඒ අනුව 2024 වර්ෂය තුළ වාර්තා කරනු ලබන මුළු බෙදාහැරීම් ප්‍රමාණය කිලෝ ලීටර් 4,178,575 ක් වන අතර එම බෙදාහැරීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන කිලෝ ලීටර් 3,159,547 ක් ද, ලංකා ඉන්දියානු තෙල් සමාගම් ඉන්ධන කිලෝ ලීටර් 318,331 ක් ද සිනොපෙක් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 439,422 ක් ද ආර්.එම්.පාර්ක් සමාගමේ ඉන්ධන කිලෝ ලීටර් 218,493 ක් ද හා යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාග මේ ඉන්ධන කිලෝ ලීටර් 42,781 කින් ද සමන්විත වේ. ඒ අනුවල ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සමස්ථ ඉන්ධන බෙදා හැරීම්වලින් 76% ක් ලංකා ඛනිජ තෙල් සංස්ථාව සතු ඉන්ධන වන අතර ඉතිරි 24% ක ප්‍රමාණය ලංකා ඉන්දියානු තෙල් සමාගම, සිනොපෙක් සමාගම, ආර්.එම්.පාර්ක් සමාගම සහ යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාගම සතු ඉන්ධනවලින් සමන්විත වේ.

**වගුව 11.2**
**ඉන්ධන බෙදාහැරීමේ ප්‍රගතිය - 2024**
**ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම**

| නිෂ්පාදනය | ප්‍රමාණය (කි.ලී.) | | | | | |
|---|---|---|---|---|---|---|
| | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ලංකා ඉන්දියානු තෙල් සමාගම | සිනොපෙක් එනර්ජි ලංකා පුද්ගලික සමාගම | ආර්.එම්. පාර්ක් සමාගම | යුනයිටඩ් පෙට්‍රෝලියම් පුද්ගලික සමාගම | එකතුව |
| දැවි තෙල් | 339,256 | - | - | - | - | 339,256 |
| ජෙට් ඒ 1 | 557,515 | - | - | - | - | 557,515 |
| ලංකා ඔටෝ ඩීසල් | 1,074,364 | 142,085 | 208,401 | 98,630 | 17,371 | 1,540,852 |
| ලංකා සුපර් ඩීසල් | 27,813 | 3,887 | 6,966 | 4,679 | 832 | 44,178 |
| නැප්තා | 197,241 | - | - | - | - | 197,241 |
| පෙට්‍රල් 92 ඔක්ටේන් | 935,908 | 160,109 | 218,092 | 111,137 | 23,701 | 1,448,947 |
| පෙට්‍රල් 95 ඔක්ටේන් | 27,449 | 12,250 | 5,963 | 4,046 | 878 | 50,586 |
| **එකතුව** | **3,159,547** | **318,331** | **439,422** | **218,493** | **42,781** | **4,178,575** |

ප්‍රස්තාරය 11.1
ඉන්ධන බෙදාහැරීමේ සංයුතිය - 2024
ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම




## 2.3 ඉන්ධන බෙදාහැරීම සඳහා ආශ්‍රිත පහසුකම් සංවර්ධනය

අඛණ්ඩ ඉන්ධන සැපයුමක් සහතික කිරීම පිණිස ඉන්ධන ගබඩා කිරීම සහ බෙදා හැරීම යනු කයුතුවලට යොදා ගනු ලබන ආශ්‍රිත පහසුකම් නව ප්‍රමිතීන්ට හා තාක්ෂණයට අනුගතව පවත්වා ගැනීම සඳහා සංවර්ධනය සහ අලුත්වැඩියා කිරීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හඳුනාගෙන ඇත. ඒ අනුවල පවත්නා යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම් අඛණ්ඩව සිදුකරමින් නව පහසුකම් ඇති කිරීමට කටයුතු කරනු ලැබේ. ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ක්‍රියාත්මක කරන ලද යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි වේ.

- **කොලොන්නාව පර්යන්තයේ ටැංකි හය (06) ව්‍යාපෘතිය**

සමස්ත ධාරිතාවය ඝන මීටර් 64,000 කින් යුතු ටැංකි 06 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රුපියල් මිලියන 2286.8 ක බදු රහිත කොන්ත්‍රාත් මුදලකට 2019.10.24 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2022.01.19 දින කොන්ත්‍රාත්තුව අවසන් කරන ලදී. ඒ වන විට ව්‍යාපෘතියේ සමස්ථ කාර්යසාධනය 18% කි. මෙම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 3374 ක් (බදු රහිත) ඇස්තමේන්තු කර ඇති අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සඳහා ලංසු කැඳවන ලදී. ඉදිරිපත් කරන ලද ලංසු ඇගයීම් අවසාන අදියරේ පවතින අතර 2025 පෙබරවාරි මස වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත. අපේක්ෂිත ව්‍යාපෘති කාලය මාස 24 කි.

- **කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා අඟල් 18 ක විෂ්කම්භයකින් යුතු නළ මාර්ගයක් ඉදිකිරීම**

කොළඹ වරාය සිට කොලොන්නාව පර්යන්තය දක්වා ඉන්ධන ප්‍රවාහනය කරනු ලබන නල මාර්ග පද්ධතිය ඉතා පැරණි හා අබලන් තත්ත්වයේ පවතින බැවින් ඉන්ධන ගොඩබෑම කාර්යක්ෂම කිරීම සඳහා අඟල් 18 ක විෂ්කම්භයකින් යුතු නල මාර්ගයක් ඉදිකිරීම සඳහා සැලසුම් කරන ලදී. ඒ සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 2853 ක් (බදු රහිත) වන අතර අපේක්ෂිත ව්‍යාපෘති කාලය මාස 18 කි.

- **මාගාල්ල ප්‍රාදේශීය තොග ගබඩාවේ ගිනි නිවීම සඳහා වන ජල ගබඩා ධාරිතාවය පුළුල් කිරීම**

මාගාල්ල ප්‍රාදේශීය ඩිපෝවේ ගිනි නිවීම සඳහා

ඝන මීටර් 110,000 ක ධාරිතාවයකින් යුත් ජල ගබඩා ටැංකි ඉදිකිරීමට කටයුතු කරන ලදී. මෙමඟින් ජල ගබඩා ධාරිතාවය ඝන මීටර් 90,000 සිට ඝන මීටර් 200,000 දක්වා වැඩි කිරීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා රුපියල් මිලියන 12 ක් ඇස්තමේන්තු කරන ලදී.

- **කොලොන්නාව පර්යන්තයේ කලාප 6 හි නළ ආධාරක පද්ධතියක් ඉදිකිරීම**

ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ගැන්ට්‍රිවල පෙට්‍රල් පිරවුම් ධාරිතාව ඉහළ නැංවීමට සැළසුම් කර ඇති අතර නව ඉහළ ධාරිතාවකින් යුත් පොම්ප ස්ථාපනය කිරීම මගින් කලාප 07 හි ඇති පෙට්‍රල් පිරවීමේ ගැන්ට්‍රිය වැඩි දියුණු කෙරේ. ඒ සඳහා කොළොන්නාව කලාප 06 හි නව නිපැයුම් පොම්පාගාරය ඉදිකරන ලද නල මාර්ග සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය වන ආධාරක පද්ධතිය සහ ආශ්‍රිත පහසුකම් පද්ධතිය ඉදි කරන ලදී. ඇස්තමේන්තු ගත පිරිවැය රුපියල් මිලියන 76 කි (බදු රහිත).

- **කන්කසන්තුරයෙහි පිහිටි ප්‍රාදේශීය ඉන්ධන තොග ගබඩාව නැවත ස්ථාන ගත කිරීම**

කන්කසන්තුරයෙහි පිහිටි ප්‍රාදේශීය ගබඩාව උතුරු පළාතට ඉන්ධන බෙදාහැරීම සඳහා උපක්‍රමික වශයෙන් වැදගත් වන ගබඩාවකි. මෙම ගබඩාව සිමෙන්ති කර්මාන්ත ශාලාවට අයත් ඉඩමක පවත්වාගෙන ගොස් ඇති අතර එම ගබඩාව දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත. මෙම ප්‍රාදේශීය ගබඩාව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමට අයත් ඉඩමක නැවත ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන ලදී. මෙහි සමස්ත ස්ථාපිත ධාරිතාවය ලීටර් 540,000 ක් පමණ වේ. මේ සඳහා රුපියල් මිලියන 170 ක් (බදු රහිත) ඇස්තමේන්තු කර ඇති අතර අදියර තුනක් යටතේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. 2025 වර්ෂයේ ජනවාරි මාසය තුළදී ඉදිකිරීම් කටයුතු නිමකිරීමට අපේක්ෂිතය.

## 2.4 ශ්‍රී ලංකා වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතන සම්මාන - CPM

- 2024 හොඳම කළමනාකරණ පිළිවෙත් සමාගම් සම්මානය සඳහා කුසලතා සම්මානය කාණ්ඩයඃ විදුලිබල හා බලශක්ති

- 2024 හොඳම කළමනාකරණ පිළිවෙත් සමාගම් සම්මානය සඳහා කාණ්ඩ ජයග්‍රාහකයා
(ප්‍රවාහනය, නැව්ගත කිරීම සහ ප්‍රවර්ධනය)

- 2024 හොඳම කළමනාකරණ පිළිවෙත් සමාගම් සම්මානය සඳහා පිළිගැනීමේ සහතිකය
(රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය)

## 3. 2025 වර්ෂයේ ඉලක්ක

- වෘත්තීය, සෞඛ්‍ය, ආරක්ෂණ සහ පාරිසරික කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම (OHSEMS)

ISO 14000 පාරිසරික කළමනාකරණ පද්ධති පිළිගැනීම සහ ජාත්‍යන්තරව පිළිගත් වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ කළමනාකරණ පද්ධති ප්‍රමිතිය ලබා ගැනීම - OHSAS

- බෙදාහැරීමේ පිරිවැය අවම කිරීම සහ නිෂ්පාදන ප්‍රවාහනය වැඩි දියුණු කිරීම
  - ඛනිජතෙල් නිෂ්පාදන තොග ප්‍රවාහනය සඳහා ප්‍රවාහන වෙළෙන්දන් තෝරා ගැනීමට පොදු ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම
  - කන්කසන්තුරය වෙත වැගන් ප්‍රවාහනය ක්‍රියාත්මක කිරීම
  - තොග ඛනිජතෙල් නිෂ්පාදන ප්‍රවාහනයේ වැගන් ප්‍රවාහනය උපරිම කිරීම

- නිෂ්පාදන පිරවීමේ පහසුකම වැඩි දියුණු කිරීම
  - කළාප 07හි ගැන්ට්‍රි පිරවුම් පහසුකම ඉදි කිරීම
  - කළාප 03 ගුවන් සේවා ගැන්ට්‍රි සංවර්ධනය කිරීම

# ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරිය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් 2021 වසරේ ඔක්තෝබර් මස 8 වන දින, 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත බලාත්මක කිරීමත් සමඟ ඛනිජතෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය (PRDS) ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය (PDASL) බවට පරිණාමය වීම ඉතා සුවිශේෂී සන්ධිස්ථානයකි. ස්වාධීන රාජ්‍ය නියාමන ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණය, සංවර්ධනය සහ නිෂ්පාදන මෙහෙයුම් යන සියලු අංග වල නියාමනය සහ කළමනාකරණයෙහි තීරණාත්මක කාර්යභාරයක් සිදු කරයි.

1960 දශකයේ සිට මන්නාරම, කාවේරි සහ ලංකා යන අක්වෙරළ ද්‍රෝණි තුනෙහි ඛනිජතෙල් හා ස්වාභාවික වායු ගවේෂණ මෙමගින් සිදු කෙරේ. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරිය විසින් ඛනිජතෙල් සම්පත් ගවේෂණය හා උකහා ගැනීමේදී බලශක්ති ක්ෂේත්‍රයට අදාළ සෞඛ්‍යය, ආරක්ෂාව සහ පාරිසරික පිළිවෙත් වලට අනුකූලව සිදු කරන බවට සහතික වී ඇත.

### අරමුණු

- උද්ගාමී ඛනිජතෙල් ක්‍රියාකාරකම් (ගවේෂණය සහ නිෂ්පාදනය) වැඩි දියුණු කිරීම.
- ජාතික ඛනිජතෙල් දත්ත ගබඩාවෙහි දත්ත පරිමාව සහ දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම.
- උද්ගාමී ඛනිජතෙල් ක්‍රියාකාරකම් නියාමනය කිරීම.
- ඛනිජතෙල් මෙහෙයුම් ක්‍රියාත්මක වනවිට එහි අනුක්‍රමික අවධීන්හි දී ජාතික සමාජ ආර්ථික ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම.
- ඛනිජතෙල් මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී පරිසර දූෂණය වැළැක්වීම සහ සෞඛ්‍ය ආරක්ෂණ පාරිසරික අවධානම අවම කිරීමට පියවර ගැනීම.

## 2. 2024 වර්ෂය තුළ ව්‍යාපෘති සහ මෙහෙයුම් කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘති ප්‍රගතිය

- **Schlumberger Holdings II Limited සමාගමෙහි අනුබද්ධිත ආයතනයක් වන Contractor Eastern Eco DMCC සමඟ ශ්‍රී ලංකා රජය විසින් අත්සන් කරන ලද සේවා ගිවිසුම් හතරක් හරහා බහු-සේවාදායක භූ කම්පන දත්ත අත්පත් කර ගැනීම, සැකසීම, අලෙවිකරණය සහ බලපත්‍ර ගිවිසුම ඉදිරියට ගෙන යාම.**

මෙම කාර්යය මූලික වශයෙන් ආරම්භ කර ඇත්තේ "බහු-සේවාදායක" පදනමක් මත ඛනිජතෙල් දත්ත එක්රැස් කිරීම, අලෙවි කිරීම සහ බලපත්‍ර ලබා දීම, 2D හා 3D භූ කම්පන ව්‍යාපෘති ඇතුළුව දත්ත අත්පත් කර ගැනීමේ ව්‍යාපෘති කිහිපයක් ශ්‍රී ලංකාව අවට පවතින තෝරා ගත් අක්වෙරළ ප්‍රදේශවල දියත් කිරීමට හැකි වන පරිදි, රජයට කිසිදු වියදමක් නොමැතිව, සිදු කිරීමටයි. 2018 දී අත්සන් කරන ලද ගිවිසුමෙහි, ඛනිජ තෙල් පද්ධති ආකෘති නිර්මාණය කිරීම, නව දත්ත අර්ථ නිරූපණය කිරීම, උරුම දත්ත නැවත සැකසීම සහ පවතින භූ තාක්ෂණික දත්ත සමුදාය තවදුරටත් යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් වේ. අද වන විට, ඔවුන් විසින් සේවා ගිවිසුම් හතරක් සඳහා ඩොලර් මිලියන 18 ක් ආයෝජනය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රේඛීය කිලෝමීටර් 13,080 ක 2D භූ කම්පන දත්ත සකස් කර සහ නැවත සකස් කර ඇත.

ඔවුන්ගේ 2024 ප්‍රගති ප්‍රකාශ වාර්තාකරණය මත පදනම්ව, පහත සඳහන් ජාත්‍යන්තර උත්සවයන්හි දී ශ්‍රී ලංකාව සැකසූ සහ නැවත සැකසූ දත්ත අඛණ්ඩව අලෙවිකරණය සහ ප්‍රවර්ධනය කිරීමට ඔවුන්ට හැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

- ඉන්දියානු බලශක්ති සතිය - 2024 පෙබරවාරි
- ආසියානු අක්වෙරළ තාක්ෂණික සමුළුව (OTC) 2024 - පෙබ/ මාර්තු 2024
- EAGE 2024, නෝර්වේ - 2024 ජූනි
- IMAGE හොස්ටන් 2024 - 2024 අගෝස්තු
- APGCE KL 2024 - 2024 නොවැම්බර්
- SEAPEX සිංගප්පූරුව - 2024 දෙසැම්බර්

මෙම ප්‍රයත්නයන්ගෙන් ඔබ්බට, 2024 දී Schlumberger හි තාක්ෂණික සහ අලෙවි කණ්ඩායම් ගෝලීය වශයෙන් විභව ආයෝජකයින් රැසක් සමඟ විශේෂයෙන්ම මැලේසියාවේ ඒපීජීසීඊ (APGCE) සහ සිංගප්පූරුවේ සීපෙක්ස් (SEAPEX) වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලදී ඵලදායී ලෙස සම්බන්ධ විය. කැමැත්තක් දක්වන ආයෝජකයින් වෙත දත්ත බලපත්‍ර ලබා දීම සඳහා ශ්‍රී ලංකා ගවේෂණ සැලසුම් දියත් කරන තෙක් ඔවුන් අපේක්ෂාවෙන් සි

- **බෙල්ජිඕ එන්ටර්ප්‍රයිස් සමාගම (Bellgeo Enterprises) සමඟ බහු සේවාදායක ගුවන් ගුරුත්වාකර්ෂණ සහ චුම්බක දත්ත ලබා ගැනීම, සැකසීම, අලෙවිකරණය සහ බලපත්‍ර වැඩසටහන**

2019 දී, Bellgeo Enterprises Limited සමාගම ගුවන් ගුරුත්වාකර්ෂණ සහ චුම්බක දත්ත ලබා ගැනීම, සැකසීම, අලෙවිකරණය සහ බලපත්‍ර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය සමඟ වසර 10 ක බහු සේවාදායක ගිවිසුමකට එළඹුණි. 2018 දී, මන්නාරම සහ කාවේරි ද්‍රෝණියේ තෝරාගත් අක්වෙරළ බිම් කොටස් ආවරණය වන පරිදි රේඛීය 14,000 ක දත්ත අත්පත් කරගැනීම සහ සැකසීම සාර්ථකව නිම කරන ලදී. මෙම සමීක්ෂණය සඳහා ඊකකටැද සමාගම විසින් ඇමරිකානු ඩොලර් 927,000 කට ආසන්න මුදලක් ආයෝජනය කර ඇති අතර, ශ්‍රී ලංකා රජයට කිසිඳු වියදමක් වැය කිරීමට සිදු නොවීය. වර්තමානයේ දී ඔවුන් විසින් සකස් කල දත්ත ප්‍රවර්ධනය කරන අතර කැමැත්තක් දක්වන ආයෝජකයින් වෙත දත්ත බලපත්‍ර ලබා දීම සඳහා ශ්‍රී ලංකා ගවේෂණ සැලසුම් දියත් කරන තෙක් අපේක්ෂාවෙන් සිටි.

## 2.2 මෙහෙයුම් කාර්යසාධනය

- **ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන රෙගුලාසි අවසන් කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම**

2023 සිට දැඩි ප්‍රතිසංස්කරණ කටයුතු මාලාවක් සම්පූර්ණ කර ඇති PDASL විසින් ගැසට් නිවේදන හරහා අක්වෙරළ තෙල් සහ වායු ගවේෂණය සඳහා ස්ථාවර නියාමන රාමුවක් පිහිටුවීම සඳහා 2024 මුල් භාගයේ දී පහත සඳහන් ප්‍රධාන නියෝග තුන අවසන් කර ප්‍රකාශයට පත් කරන ලදී

- ➢ 2024 අංක 1 දරන ඛනිජතෙල් සම්පත් (ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම) නියෝග
  2024 මාර්තු 05 දින ප්‍රකාශයට පත් කරන ලදී
- ➢ 2024 අංක 2 දරන ඛනිජතෙල් සම්පත් (දත්ත බලපත්‍රකරන) නියෝග 2024 මාර්තු 05 දින ප්‍රකාශයට පත් කරන ලදී
- ➢ 2024 අංක 3 දරන ඛනිජතෙල් සම්පත් (ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම්) නියෝග 2024 ජූලි 15 දින ප්‍රකාශයට පත් කරන ලදී

- **ශ්‍රී ලංකාවේ නව ඛනිජතෙල් සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම ප්‍රකාශයට පත් කිරීම**

අංක 1 දරන ඛනිජතෙල් සම්පත් (ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම) නියෝග අනුව සංශෝධන සම්පූර්ණ කර, කිලෝමීටර් 15×15 බිම් කොටස් 918 කින් සමන්විත යාවත්කාලීන කරන ලද ඛනිජතෙල් සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම් කොටස් සිතියම PDASL සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී. එය 2024 මාර්තු 14 වැනි දින ගැසට් නිවේදනය මගින් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

## සිතියම 12.1
## ඛනිජ සම්පත් ගවේෂණ සහ සංවර්ධන බිම්කොටස් සිතියම




Scale 1:1,750,000

**Legend**

- Gulf of Mannar Line
- Palk Strait Line
- Base line proclaimed area
- Well locations

Basins

- Cauvery Basin - Blocks (CB001 - CB069)
- Lanka Basin - Blocks (LB001 - LB559)
- Mannar Basin - Blocks (MB001 - MB294)

| | |
|---|---|
| Coordinate System | : WGS 1984 UTM Zone 44N |
| Projection | : Transverse Mercator |
| Datum | : WGS 1984 |
| False Easting | : 500,000.0000 |
| False Northing | : 0.0000 |
| Central Meridian | : 81.0000 |
| Scale Factor | : 0.9996 |
| Latitude Of Origin | : 0.0000 |
| Units | : Meter |

Note :- This map, prepared on request of Petroleum Development Authority of Sri Lanka, outlines the blocks designated for petroleum joint studies, exploration, development and production. The baseline data source is from "Delimitation of the Outer Edge of the Continental Margin of Sri Lanka under the UNCLOS".

Prepared by: The Survey Department of Sri Lanka
Date : 04/12/2023

- **ඒකාබද්ධ අධ්‍යයන වැඩසටහන මඟින් අක්වෙරළ බිම් කොටස් ගවේෂණය කිරීම**

  2024.07.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට (අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 24/1242/621/065) අනුකූලව ඒකාබද්ධ අධ්‍යයන සඳහා අභිලාශ යෝජනා කැඳවීමට අවශ්‍ය ලියකියවිලි සංශෝධනය කිරීම ආරම්භ කරන ලදී.

- **කාර්ය මණ්ඩලය සහ ක්‍රියාකාරීත්වය - මානව සම්පත් පදනම පුළුල් කිරීම**

  2024 මැයි 01 වන දින සිට ස්ථිර සේවකයින් හය දෙනෙකු (විධායක නිලධාරීන් තිදෙනෙකු, සහායකයින් දෙදෙනෙකු සහ එක් රියදුරෙක්), විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු සහ වැඩ බලන නිලධාරීන් දෙදෙනෙකු (අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ (මුදල්)) ලෙස සීමිත කාර්ය මණ්ඩලයක් සමඟ කටයුතු කරන ලදී. මෙම සීමිත කාර්ය මණ්ඩලය ආයතනයේ කටයුතු වලට විශාල ලෙස දායක විය. හදිසි තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවූ අතර 2023 දී අපේක්ෂකයින් කෙටි ලැයිස්තුගත කරන ලදී. ආයතනයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමත කළ කාර්ය මණ්ඩල තනතුරු කිහිපයක් සඳහා අදාළ නිලධාරීන් කඩිනමින් බඳවා ගැනීම අනිවාර්ය වේ.

**3. 2025 වර්ෂය සඳහා ඉදිරි සැලසුම්**

- ඛනිජ තෙල් හා ස්වාභාවික වායු නව විභවයන් හඳුනාගැනීමට හා පවතින සොයා ගැනීම් තක්සේරු කිරීමට තෝරා ගත් අක්වෙරළ බිම් කොටස් සඳහා අවම වශයෙන් ඒකාබද්ධ අධ්‍යයන ගිවිසුම් දෙකකටවත් එළඹීම.
- දැනට අනාවරණය කරගෙන ඇති ස්වාභාවික නිධි, විශේෂයෙන්ම ඩොරාඩෝ නිධිය සඳහා, මූලික නිෂ්පාදන කටයුතු ඉලක්ක කර ගනිමින් සහ ඊට අතිරේකව පසුභාග ඛනිජතෙල් කර්මාන්තයේ දී විකල්ප ලෙස භාවිතා කළ හැකි හයිඩ්‍රජන් වායුව නිෂ්පාදනය සඳහා සුදුසු ආයෝජකයෙකු සොයා ගැනීම.
- අනාගත ගවේෂණ ක්‍රියාකාරකම් අවශ්‍යතා සහ ආයෝජක අවශ්‍යතා මත පදනම්ව ද්විමාන සහ ත්‍රිමාන බහු-සේවාදායක භූ කම්පන දත්ත ලබාගැනීමේ වැඩසටහන් පැවැත්වීම.
- කර්මාන්ත විශේෂඥයින්ගේ සහාය ඇතිව උද්ගාමී ඛනිජතෙල් කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- අක් වෙරළ ගවේෂණ බිම් කොටස් අලෙවි කිරීම සඳහා අවම වශයෙන් දේශීය සහ ජාත්‍යන්තර ආයෝජක ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය ජාත්‍යන්තර සමාජ මාධ්‍ය ප්‍රමිතීන් හා ප්‍රවනතා සමඟ යාවත්කාලීන කිරීම සහ ශ්‍රී ලංකාවේ උද්ගාමී ඛනිජ තෙල් ආයෝජන අවස්ථා පිළිබඳ තොරතුරු පිරික්සන ආයෝජකයින් සඳහා එය විශ්වාසනීය කේන්ද්‍රස්ථානයක් බවට පරිවර්තනය කිරීම.